# සැලලිහිණි විවරණය.


මුනිදස කුමාරණතුංග

විසිනි.



කොළඹ විද්‍යාසාගර යන්ත්‍රාලයයෙහි මුද්‍රණය කරවා

ප්‍රකාශ කරන ලදී.

2472

# සැලලිහිණි විවරණය

මුනිදස කුමාරණතුංග

විසිනි

卐

කොළඹ විද්‍යාගාර යන්ත්‍රාලයෙහි

මුද්‍රිත යි,

2472

# සංඥාපනය.

**සැළලිහිණි අස්න** යන නමින් පුරාණව්‍යාඛ්‍යානකාරයෝ මේ කාව්‍යය දත් හ. නමුත් සාමාන්‍යව්‍යවහාරයට පැමිණි නම නම් සැළලිහිණි සන්දේශය යනු යි. සන්දේශහාරකයා ගේ නමින් කාව්‍ය නාමය සැලැසුණු බව සුව්‍යක්ත යැ.

මේ කාව්‍යය තොටගමුයෙහි විජයබාහු විහාරාධිපති ශ්‍රී රාහුල ස්ථවිරයන් ගේ කෘතියෙකි. තමන් කළ අන් සියලු ග්‍රන්ථයන්හි සිය නම යෙදූ මේ තෙර හිමියන් මෙහි ලා එසේ නොකළ හෙයින් ඇතැමෙක් "මේ අන්‍යයක්හු ගේ කෘතියෙකැ"යි යෙති.

"ගරුතර නන්නුරු තුනයා නමැති මැ ති
සිහි කැර නිතර මහ පුද පඬුරු දී රැ ති
නො විසිර ඔබට දන්වන ලෙස කී සිතැ ති
සුර වර මඳක් කල් එ පවත් ඇසියැ යු ති"

යන මේ පද්‍යය සාක්‍ෂ්‍ය කොටැ ගෙනැ ඔහු නන්නුරු තුනයා ඇමැතියන් මේ කාව්‍යයා ගේ කර්තෘන් කොටැ දකිත්.

මේ මතය ප්‍රතිෂ්ඨාරහිත යැ. පුරාණව්‍යාඛ්‍යානකාරයෝ—

"රජ ගුරු විජයබා පිරුවන් හිමි පැහැ දී
මෙ මියුරු පදැති සැළ ළිහිණිය අස්න යෙ දී"

යි ඉඳුරා කියති. සන්දේශය කැරුණු වර්ෂ මාස ද ලෝකනාථපුත්‍ර යන් උපන් වර්ෂ මාස පක්‍ෂ නක්‍ෂත්‍ර ද නො පැකිළැ මැ පැවැසීමට පොහොසත් වූ ව්‍යාඛ්‍යානකාරයන් කාව්‍යකර්තෘහු ගේ නාමය වරදවා ලියති යි සිතීමට හෙතු නැත්. කාව්‍යය රහල් හිමියන් ගේ මැ අතැවැස්සකු විසින් ව්‍යාඛ්‍යාත යැ යනු ද ඇතමකු ගේ මතය යි. ව්‍යාඛ්‍යානය කාව්‍යකරණයට අත්‍යාසන්න වූ කාලයෙකැ කැරුණක් බව නම් ප්‍රත්‍යක්‍ෂ යැ. එ හෙයින් කාව්‍යකර්තෘහු එහි පැවැසුණාහු මැ යැ යි නිශ්චය කිරීම යුක්ත යි ආනන්තර සාක්‍ෂ්‍ය යෝ ද ව්‍යාඛ්‍යානකාර මතය ස්ථිර කෙරෙති. "නන්නුරු තුනයා නමැති මැති සිතැති ඔබට දන්වන ලෙස කී" යනු කාව්‍යකර්තෘත්වය ඒ ඇමැති තුමන් මතැ නඟා නම්—

"තාමායුෂ්මාන් මම ච වචනාදාත්මනශ්චොපකර්තුං
බ්‍රූයා එවං තව සහචරෝ රාමගිර්‍ය්‍යාශ්‍රමස්ථඃ"

යනු මෙඝදූතය කාලිදාසයන් විසින් නො වැ යක්‍ෂයා විසින් කැරුණු බව නො කියා ද?

තමන් දෙමටාන ගමැ **කඳවුරු** කුලයට අයත් බව ද, (කාව්‍යශේඛර 1- 23)- **පැරකුම්බා** රජුන් ගේ පුත් තැනැ වැඩුණු බවද, (පඤ්චිකා ප්‍රදීප- මූල ගාථා)- **තොටගමු** වැසි බව ද, (කාව්‍යශේඛර 1- 23 හා පරෙවි සන්දේශ අග)- **විජයබා** පිරුවන් හිමි බව ද (කාව්‍යශේඛර 1- 25, පඤ්චිකා ප්‍රදීප අගැ, බුද්ධිප්පසාදනී අගැ)- **උතුරුමුල රහල්** මහ තෙරුන් මුනුබුරු බව ද (කාව්‍යශේඛර 1-23 බුද්ධිප්පසාදනී අගැ)- **රහල්** හිමියෝ මැ කියති. **චන්ද්‍රභාරතීහු**—

"මෞර්‍ය්‍යකුලාබ්ධිප්‍රභවසුධාංශුඃ"

යනුයෙන් **රහල්** හිමියන් **මෞර්‍ය්‍යකුලයට** අයත් බව පවසත්. එ හෙයින් **ස්කන්ධාවාරවංශය** **මෞර්‍ය්‍ය** වංශයේ ප්‍රභේදයෙකැ යි හඟිති **මෞර්‍ය්‍ය** වංශ නම් කිමෙක් ද යනු ප්‍රසිද්ධ යැ.

**රහල්** හිමියන් ගේ මවුපියෝ කවරහු **ද** යනු නොදන්නා ලද්දෙකි. ඔවුන් හෝ ආචාර්‍ය්‍යෝපාධ්‍යායයන් හෝ ගැනැ කිසිවක් නො කියා—

"නත්තා උත්තරමූලරාහුලමහාථෙරස්ස සික්ඛාගරු"

සි පැවැසීමට බලවත් හෙතු ඇති වියැ යුතු. මෙසේ කියනු ඒ හෙතු අප දන්නා හෙයින් නො වේ; විමැසීමට සුදුස්සන් සිත මෙහෙයනු පිණිස යැ.

**රහල්** හිමියන් ගේ කාලය පිළිබඳ සැකයෙක් නැති. ස වැනි **පරාක්‍රමබාහු** නරේන්ද්‍රයා ගේ රාජ්‍යසමය ශාස්ත්‍රාලෝකයෙන් උද්දීප්ත වියැ. **සිදත්සඟරාවට** පසු වැ පැමිණි නමුදු එ කලැ ව්‍යාකරණඥතය දූෂණයට නොපැමිණියේ යැ. එ හෙයින් **ගිරා සන්දේශය, හංස සන්දේශය, කෝවුල් සන්දේශය, පරෙවි සන්දේශය, සැළලිහිණි සන්දේශය, පැරකුම්බා සිරිත, ගුත්තිලය, කාව්‍යශේඛරය,** බුදුගුණ **අලඞ්කාරය** ආදි කාව්‍යයෝ ශිෂ්ට ප්‍රයෝගඥතයට වහල් වෙති.

මෙබඳු කාලයෙකැ පණ්ඩිතයන් අතර සාම්‍රාජ්‍යයට බුද්ධිමහිම යෙනුදු රාජසම්මානයෙනුදු **රහල්** හිමියෝ අත්‍යර්ථයෙන් ප්‍රමාණ වූ හු. ඔවුන් ගේ ෂඩ්භාෂා පරමේශ්වරත්වය ද ත්‍රිපිටකවාගීශ්වරත්වය ද සමකාල පණ්ඩිතයෝ මැ කීර්තනය කොළෝ. ඒ වර්ණ කථනය අධික නො වන බවට **රහල්** හිමියන් ගේ ග්‍රන්ථයෝ මැ සාක්ෂ්‍ය දරත් ව්‍යාකරණකාරයනට ද වඩා ඔහු ඒ ශාස්ත්‍රයෙහි නිපුණ වූ හ; පුරාණේතිහාසයන් ගේ පරතෙරට ගිය හ; නොකැරුණා වූ ද තර්කන්‍යායයනට ස්වබුද්ධියෙහි අවකාශ කළ හ තත්කාලප්‍රවෘත්ත කාව්‍යයන් ගේ අර්ථ තත්තත්කාව්‍යකර්තෘනට ද වඩා මැනැවින් මෙනෙහි කළ හ. සෙස්ස තබා **පඤ්චිකා ප්‍රදීපය** මැ ඔවුන් ගේ අනුපම වූ ග්‍රන්ථසමරණ ශක්තිය ප්‍රකාශ කෙරේ.

**පරෙවි සන්දේශය සැළලිහිණි සන්දේශය කාව්‍යශේඛරය පඤ්චිකාප්‍රදීපය** බුද්ධිප්‍රසාදනිය යැ යි රහල් හිමියන් ගේ කෘතීහු පස් දෙනෙකි. මොවුන් මේ පිළිවෙළින් මැ කැරුණු බව නිශ්චිත යැ. 'පැරකුම් නිරිඳු සිවු තිස් වන මෙහවුරුදු'යෙහි **කාව්‍යශේඛරය** නිමැවුණු බව එ මැ කියයි 'පැරකුම් රජුට පන් තිස් වන නවම් මස' **සැළලිහිණි** අස්න යෙදුණු සේ තද්ව්‍යාඛ්‍යාන කාරයෝ පවසති. **පරාක්‍රමවර්ෂයෙන්** පන්සාලිස් වැන්නෙහි **පඤ්චිකා ප්‍රදීපය** කැරුණු බව එහි මැ "තසොව වසෙස නවපඤ්චකාසම්ං" යනු දක්වයි **බුද්ධිප්‍රසාදනිය** අනන්තරරාජසමයෙහි සැපැයුණ පරිදි එ මැ හඟවයි. **පරෙවි සන්දේශය** කවර වසෙක කැරිණි ද යනු ඉඳුරා නො කියැවිණ. **විජයබා** පිරුවන් හිමි බවට ද එ වකට නොපැමිණි බව හඟවන—

"ක ද වුරු කුලැ උපන් රුදි තොටගමු පියෙ ස
සෙ ද දත් සියල් කව් නළු මගද සකු බ ස
ක ද සුරිඳුන් වර ලද පසලොස් වය ස
ව ද හල රහල් වැඩි තැන් කලරුවු සදෙ ස

යන **පරෙවිසන්දේශ** පද්‍යයෙන් ඒ කාව්‍යය **සැළලිහිණි** අස්නට පෙරැ බැඳුණු බව හැඟැවෙයි **සැළල සන්දෙස** කැරුණේ ලොකනාථාවට පුත් රුවනක් පතනු පිණිස යැ. **පරෙවි සන්දෙස** ලොකනාථාව ගේ වැඩි මහලු සොහොවුරිය වූ **සඳවතියට** හිමියකු සලස්වා පුතකු ලබා දෙනු පිණිස බැඳුණේ යැ මෙයින් **සැළල සන්දෙසට** පෙරැ මැ පරෙවි සන්දෙස කැරුණු බව ප්‍රත්‍යක්ෂ වෙයි

**සැළල සන්දෙස රහල්** හිමියන් ගේ ඉතර කාව්‍යද්වයයට වඩා රචනාදීප්තියෙන් යුක්ත යැ. සංස්කෘත කාව්‍යයන් ස්වභාෂාවට පෙරළීම මැ පමණැ යි සිතූ බවෙක් මෙයින් නො පැනේ. අනුයායිත්වය නම් බෙහෙවින් පෙනෙන නමුත් ඒ, කාව්‍යනාමයෙන් භාෂාන්තරකරණය පමණ උපයොගකර නො වේ කතෘහු ගේ විරුද නාමයන් අසා, ග්‍රන්ථයා ගේ දීර්ඝත්වය බලා, අර්ථයා ගේ ගුණත්වය හැඟැ, නෙතු මූව අයන, ලොමුදහ ගන්වන, අරසිකයන් ගේ උපහාසට ලක් වන නමුත් සත්‍යය නො කියා හැරිමට මේ නො කැලි.

කාව්‍යයෙහි නුසුදුසු සේ පැනෙන කිහිප තැනක් විවරණයෙහි දක්වූමු. ඉනුදු කිහිපයක් පිළිබඳ වැ මඳ විවාදයෙකුදු ඇති වී යැ. එහි ලා සඳහන් වූ එක් කරුණක් ගැනැ මඳෙක් කියැ යුතු වේ.

මෙහි දස වන පද්‍යයට කළ විවරණයෙහි නවම් මසැ කැරුණු සන්දේශයෙහි ඒ වසන්ත කාලය සේ වැනුණු පරිදි නොයෙදෙන

බව කීම්හ. නවම් මස වසන්තයෙහි ද වියැ හැකි බැවින් ඒ කීම වරදැයි ද වර්ණනය කළ සේ මැනැවැයි ද වාදයෙක් වියැ. නවම් මස ද වසන්තයෙහි වියැ හැකි බව පිළිගනිමු. නමුත් වර්ණනය යෙදෙන සේ නො වැටැහෙයි. තුදුස් වන පද්‍යයෙන් දැක්වුණු නැකැතින් ඍතුව නිශ්චය කැරැ ගැන්ම දුෂ්කර නො වේ. සඳ අස්විද නැකැතැ සිටැ මුදුනට පැමිණියේ යැ. විජය යොගය යෙදුණු හෙයින් සන්ධ්‍යාකාලය යම්තම් ඉක්මිණ මේ ඍතුව නිශ්චය කැරැ ගැන්මට පමණි. මෙය සඳහන් නො කොටැ, "බක් වෙසක් වසත්" යන්න මැ ප්‍රමාණ කොටැ ගැන්මෙන් නම් අප අතින් වරදෙක් වී යැ නමත්වා!

පුරාණ පණ්ඩිතයකු විසින් කරන ලද ප්‍රශස්ත වූ ව්‍යාඛ්‍යානය මේ කාව්‍යයා ගේ පාඨදූෂණය බෙහෙවින් වැළැක්වූ බව පෙනේ. ඇපි දු හැකි තාක් තද්ව්‍යාඛ්‍යානානුගත වූමු නමුත් එය සාවද්‍ය වැ පෙනුණු තන්හි නිවැරැදි යැයි අපට වැටැහුණ මඟ ගැන්මට නොමැළි වූමු. එ බඳු තැන් කිහිපයෙක් මෙහි ලා දැක්වේ.

66 වන පද්‍යයෙහි "නිපරමාදී ලකුණෙන් සපිරි"
79 " "වුවනේ වැජැඹි සිරිසරසවිය"
81 " "සතුරැ සුර අඳුරැ"
88 " "සිරි පින් රුවන් පිරි"
99 " "සිතුමිණ වන් යැදි යැදි හට"
100 " "සකිසැපසමඟසිත්"
" " "සිහිනෙන් නිපන් වන්"
104 " "එ සෙයින්"

මෙහි අවසනැ දැක්වුණු "එ සෙයින්" යන්න වැනි තැනට පුරාණව්‍යාඛ්‍යානයේ කී අර්ථ කිසි සේත් නොගැළැපෙන බව යම් තම් සිංහල දන්නකු හට වුව ද ප්‍රත්‍යක්ෂ වියැ යුතු යැ. මෙබඳු වැරැදි ඇති වීම ව්‍යාඛ්‍යානකාරයන් **රහල්** හිමියන් දුටු කෙනකු නැ යි යන මතය දුර්වල කෙරෙයි. රහල් හිමියන් දුටුවකු විසිනුදු නො පිළිවිසැ කැරුණු ව්‍යාඛ්‍යානයෙකැ එ හිමියන් නොඅනුදත් අරුත් වැනුම් ඇති වියැ නොහැකි නො වේ

අප ගේ විවරණය ආධුනිකයනට හැකි පමණ අර්ථදායක කිරීමට මැ නැත් කළෙම්හ. ඒ තැන කොතරම් සාර්ථක වී ද යනු දත යුත්තෙකි ශොධ්‍යස්ථාන කිහිපයක් මැ පෙනුණෙන් ශුද්ධි පත්‍රයක් යෙදූම්හ

මුනිදාස කුමාරණතුංග.

2472 වප් පුර 7
වෙයන්ගොඩ නිවිටඹුවෙ දී යැ.

# ශුද්ධිපත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 17 | 6 | ධිතෘ | දුහිතෘ |
| 22 | 5 | සබඳිණි | සබඳිති |
| 24 | 18 | අව්‍යක්තයන් | අව්‍යක්තයන් |
| 26 | 16 | පැමිණියේ සැ සි | පැමිණියේ යැ සි |
| 27 | 29 | සැලැකෙණ | සැලැකෙත |
| 32 | 28 | ප්‍රෙඹබ | ප්‍රෙඹඪ |
| 44 | 9 | ඣම්සකඣයා | ධම්සකන්ධයා |
| 53 | 23 | රශ්මියව ද නම් | රශ්මියට ද නම් |
| 72 | 29 | ශී | ශී |
| 85 | 14 | සූචිත | සූචිත |
| 86 | 11 | ප්‍රතිව්‍රතා | පතිව්‍රතා |
| 101 | 22 | ප්‍රතීමාව | ප්‍රතිමාව |
| 103 | 33 | ත්‍රිච්වරය | ත්‍රිචීවරය |
| 113 | 32 | ලිය ශි | ලිය ශී |
| 123 | 24 | යොද | යොදා |
| 127 | 36 | ශීලා | ශිලා |
| 132 | 18 | හැකි | හැකි ද |
| 137 | 1 | ප්‍රණ්‍යය | පුණ්‍යය |
| ,, | 16 | පි යේ | පිතනුයේ |
| 149 | 27 | සිට | සිත |

# සැල ළිහිණි අස්න.

### (1) ආශී.

1. සැරද පුලකල 'කුරු–මිපුරු තෙපලෙන් රදනා
රජ කුල රහසැ මැතිතිය සියති'හි සැල ළිහිණි සඳ.

### (2) කුසල් පැණ හා කමයුතු නිදෙස.

2. පුල් මල් කෙසරු මෙන්—රන් වකි තෙලෙ සරණ යුග
ස පු ම ල් කැලෙ'වි තුඩ මඳ රතිති මනහ ර
තිලු පු ල් දෙලෙ'වි සම් වනි පිය පිය පත ර
මලින් කල රූ එවි—එ බැවින් තුබින් එන වරූ
ති ලූ ද ළද සිදුඹුවො දිගු වරලැ ති ලූ
ති ලූ ද වට බිගු පෙළ අද තඹරූ ති ලූ
ව න දෙවි ලියෝ නොතොළොද සවන අබර ණ
එ න මහැ දුකෙක් නො වී ද සබඳිති කල ණ
ස න හස බැඳුණු තැනැ නොහරන කැරූ දියු ණ
වෙ න සැප කුමට තොප දකිනා එ මැ පම ණ

3. ල ප නො මැ වන් සඳ මෙන් සොම් ගුණ ගිහි ණි
ඹ ප වැඩී ගත හෙල්මැලි සියුමැලි පැමි ණි
සැ ප රිසි දෙන වැනි රස බසැ'ති සිතුම් ණි
තොප දූකුමෙන් අප පින් කල බව දූති ණි

4. මි තු රු තු මෝ දුක් සැප දෙකෙහි මැ පැවැ ති
බි තු සි තු වම් රු මෙන් පිටු නො පාවි ති
සු තු ම තු වැඩ ම තෙපල එ වැනි ගුණ ඇ ති
සි තු නි තු කැරූ අස යහළුව වඩන රු ති

6. ප වි රද කඳ නා ලෝ මූල් දිග'තු බ ර
ලෙ වි තුරූ සුසැදු යස මිණි මුතු මල් පත ර
ස වි සිරි පිරි සුර පුර වන් කැලණි පු ර
දෙ වි මෙ හසුන් විබිසණ සුරිඳුට පව ර

## (3) ජයවඩන පුර වැනුම.

6. ගනවන් මියුරු නද දෙන ගුවනැ වන් වි ට
විලසින් මෙ මා කරවන මිතුර මන් තු ට
එහසුන් පැසුළු පවසමි රස තුසුන් කො ට
අසදුන් න යන මහ සලකුණු මෙ තැන් සි ට

7. පොහොසද් දන ඇති තුනුරුවනැ බැති පෙ මා
මුලුවද් දන සුර පුර පිරි සිරින් හැ මා
ජයවද් දන කැරුමෙන් සුසැදු තම න මා
ජයවද් දන පුරවර දනු මිතුරු තු මා

8. සැදි රත තඹර පෙළ රත තිසරුන් රුවැ‘ ති
විදි දිය දහර ලෙළ දෙන දිගු තරුපටැ‘ ති
රුදි රළ රුළු‘ති හොය දියවන්නා නමැ‘ ති
ඇදි පුර අහන පට සළු සිරි රුපැසි ති ති

9. සමතොළ මුහුළු මහ සමුදුර මෙවුල් බ ර
සුලකළ පුවළ ලක‘ගන සිරි යොවුන් ව ර
තර කළ විසල් වාසල් යතුරු මෙ නුව ර
බැඳැ හළ රුවන් තන පට කියෙලියැ පවු ර

10.* සිහිල් සපු සුවඳ ගෙනැ එන උයන්ව ල
සිහිල් නෙළෙන් හඬවන මිණි කිකිණි කැ ල
විපුල් රත් සෙමෙර බඳ රන් දද සස ල
ළකල් මෙ පුර තුළ වළහා රිවි නැවු ල

11. නර සර හිවි මහල් මෙහි පහ පෙළැ නිතො ර
සුර සිදු විදුදරන් සැදි සඳලු මතහ ර
කර වන මඟුල් කෙළියෙන් නොමැති අවස ර
පුර සිරි බලන ලෙස බට සුර විමන් යු ර

---

* සමහර පොතෙකැ දස වන පද්‍යය ලෙස පෙනෙනුයේ මේ යැ:-

දුවන බඳ කිකිණි හය කුර පහර න ද
සවන තල නිනද ගිජිඳුන් සෙමෙර බ ද
රවන නොයෙක තුරු ජයසක් හඬ නොම ද
දෙවන මුහුද මෙන් ගුම් ගනි පුර නිබ ද

මෙය පුරාන සන්නයෙහි නො ආ බැවින් ද, කාව්‍ය කතිංහු ගේ යෙදුමෙකැ සි නොසිතෙන බැවින් ද පෙළෙහි නො යෙදිණ.

12. සි සි වන වුවන ඉඟ සුග ගත හැකි මුරි නු
තිසි පුළුලු'කුල රිය සක යුරු තිසර ඇ තු
දි සි 'රන ලියෙ'ව් රූ සිරි යුත් මෙ පුර්'හ න
ඇසි පිය හෙළන පමණින් නො වෙති\දෙව්'හ න

13. සො ඳු රු සිය තදන් අනු'තුරු දෙසැ සිරි නු
කි තු රු නිසසරන් සාහදස වෙතැ නොව චි
ඉ සු රු දතද සිය තිකෙලෙස් තැතැ රඳ න
උ තු රු දිගි'ඳු පුර දිති මෙ පුර වැජැඹෙ න

## (4) නිකුත්වීම.

14. උ දේ සැපත් සුර ගුරු අලු කැරැ අව ට
ස දේ මුදුන් පත අස්විද නැකැතැ සි ට
න දේ සිතින් තම කුල දෙවිය සිහි කො ට
යෙදේ ගමන් යහළුව මෙ පුරෙන් තොප ට

15. න ල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙ ඩි
පු ල හෙළ කුසුම ලිය පිය නෙපල රන් කෙ ඩි
ස ල සුදු සෙමෙර සේ සත් ගිජිඳුනො'ද වැ ඩි
බ ල සුබ නිමිති පෙර මඟැ නැකැතවත් වැ ඩි

16. ලො වැ ව් හි දූ සුදු පැහැ සඳ රැසෙ'ව් සැ දි
දෙ න නො ම දූ සිරි සගැ මොක් සැප තිසැ දී
ල ද මූ නි දූ දම් කඳ පහස මත බැ ඳී
ව දු ද ල දූ හිමි තෙමහල් පහයැ රැ ඳි

17. ග න ර න් කොතින් දිලිහෙන මිණි රැස් විහි දු
ප ව ති න් ලෙළෙන පල අගැ මුතු ලැල් සිති දු
ස ඳ තැ න් මිණින් බඳ යුතු බිතු පෙළින් රු දු
එ තැති න් ගොසින් සැණෙකින් රජ විමන් ව දු

18. රි වි බිම් බා යුරු රිවි කුල කමල'කා ර
පි යු ම්' ම් බා නිතොර වැ රැඳි උර මැදු ර
මෙ න ර ම් බා හිමි රූ සිරිනි මනහ ර
පැ රැ කු ම් බා නරනිඳු සඳ දකු මිතු ර

19. උ නු නො වැ බරණ සිවුසැට වොටුනුත් පැලැ දැ
වෙනු මෙන් පසක් උන් සඳැ සී හසුන් මැ දැ
ම නු රජ කුලෙන් පැවැතෙන පිළිවෙළ නො සි දැ
ග නු අවසර එ නිරිඳු සිරි පතුල් වැ දැ.

20. පෙරව සඳ කිරණ පිපි කුමුදු මල් ව පින්
පරව තඹර පෙති ගිලි දිය තලා පි පින්
තරව සිහි ඇති වැ පර තෙරට යන අ පින්
සරව පියාසර සකි කොන්ත ගම් තො පින්

21. ස එ වැ ල් කපුරු දුමැ'තුළැ ලෙළෙන දද පෙ ළ
සු වි ස ල් මිහිගු සක් සත් මිණි හඩ වන ළ
කැරැ ලොල් සතන් පවසන තියු ගී දෙම ළ
ම න ක ල් ඉසුරු කෝවිලැ ලගිනේ ලක ළ

22. වෙ ස ඝන තුඟු තන යුගැ රොන් කොකුම ඟ ර
පි ස එන මඳ පවන් හැදූ විල් ළිහිණි ස ර
ගොස අලුයම් පසතුරැ සවනතෙහි කැ ර
ඈ ස නිදි ගැව හැරැ නැගැ සිටු උදුහි ර

23. උ දු ගිරි කසුන් රිටි වැටැ හිසැ බැබැ ළී
එ දු සහසකර පහතෝ'ව් කරන හෙ ළී
යොදු නුවන් ඉසුරුම කරන පුද තෙ ළී
වි දු පියා තිල'ඹර යන් තො වී මැ ළී

24. සු ර ර ද සමන් සමගින් සුර'ඟන එ ව ර
පැ හැ න ද මඳුරු පරසතු මල් පත ර
කැ රැ පු ද වඳන රැඳි මුනි සිරි පා තඹ ර
ස කි ස ද පෙනේ සමනොළ ගල නැගෙනහි ර

25. ග නේ මිණි බැබැළු කිරණෝ'ව් සත පා ය
ර නේ යට'ගැ සැවුලි'ඳු දද ගල පා ය
අ නේ ලකර කළ පුරැ අප නර පා ය
පෙනේ දකුණැ මහසෙන් දෙව් රද පා ය

26. ව ල දන අදහසින් මෙන් සුර ගඟ අඟ න
න ල බල සසල දළ රළ පෙළ නුබ නැගෙ න
වෙ ල ල'සැ ගැවැසි මුතු සක් පබළු බබළ න
බ ල මහ මුහුද එම සඳ උතුරින් පෙනෙ න

27. ස න් ත න් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙ න
තැ න් තැ න් වලැ මැ සැතැපී සියුමැලි බැවි න
ර න් ව න් කරල් ගෙනැ එන ගිරවුන් අති න
ය න් ම න් තොසින් මහ කොරතුරු නියම දූ න

28. නි ල තුරඟුව නැඟෙමින් රිවි දෙව් සිරි ත
දු ල කැරැ සේ සත් මිණි බරණ කිරණි ත
බ ල සිරි සෙන් සහ යාපා පටුන් ගෙ ත
බ ල සේනානායක සපු කුමරු එ ත

29. අ ග පිපි මල් මලිගිය ලිය කැ ලේ යා
ව ග බැඳැ හෙන රජ හස පුල් වි ලේ යා
ල ග තුරු මල් ගිලිහුණු රෙන'වූ ලේ යා
ම ග බැසැ යව පල හෙළ වැලි තෙ ලේ යා

## (5) මග වැනුම.

30. අ සි රාවණ වුවත් තවතන රිසින් එ න
අ සි රු දහස් දිලි දුනු කොත් සිපත් ගෙ න
කා සි කාවලෙහි දුකැ සෙබළුන් රැකැ සිටි න
ව සි යා කරන් මල් තුරු ගන වන හිසි න

31. නි ම ල් සඳ පහන් වැනි වැලි පිටැ උදු ල
සු පු ල් මල් යහන් ලිය මඬු ලිය ගෙ පෙ ල
එ ක ල් කෙළන වන දෙව් ලිය දුකැ කොම ල
ල ස ල් රුකෙක සැතැපෙව ල පලු සිහිල' ල

32. ම ල් ද ම් සුවඳ දුම් දුන් සොඳ වරල සි නි
කා ල් ගි ම් නිවා සැනැහෙන සිහිලස ර සි නි
කොල් ල ම් ගසින් තිල් ඉවුරැ'ති පොකුණ' සි නි
ව ල් අ ම් බලම දුකැ යා ගන් සහතො සි නි

33. කස්තුරු තිලක සැදි නලලත සුම වා න
පුල් මහනෙල් මල් දම් හිසැ දව වා න
සලෙලුන් යනෝ'නැ නිති කැරැ කෙළි කව වා න
රිවි මුදුනතැ වන මැද වදු සුමු වා න

34. මගැ නි ල මි න් සිටි නා දෙඹ නී පිය ල
පිය ස ල මි න් මල'ගෙහි කෙළැ රෙනිත'ව ල
න තුඩ ල මි න් බිඳු විලිකුන් මියුරු ප ල
ඉසු ඹු ල මි න් ගෙහි සැල දඹ පඳුරුව ල

35. රි වි නැවු ලේ පි පි කා ම ලේ විල් ගැවැ සි
මන කොවු ලේ තුරු ව ද ලේ හඬන නි සි
ව න සැ වු ලේ ම ගැ අ ස ලේ පොර සැලැ සි
ගු රු බැ වු ලේ ය ව අ වු ලේ නො වී කි සි

36. ච ත සි රි  පියුම්රු බැඳි රත්'බරණ යු  රු
ව ට පි රි  සුපුල් දුනුකේ මල් මූරුත තු  රු
බි ඟු පි රි  වැරූ ඔලු'පුලැ'ඹුල'වල තඹු  රු
හි ම ස රි  සිහිල් දිය හෙබ දූකැ යන් මිතු  රු

37. ස ලා දු ලා  පියොවුරු තඹර රෙත් ර  ත
පු ලා නි ලා  උපුලන් ලා ගෙනැ කත  ත
ක ලා පි ලා  තො වැ ඇල් ගෙවි කෙළන ඉ  ත
බ ලා ප ලා  යව අස්වන් ගුරුළු කො  ත

38. බ න් තේ  මරු මිණි දුල පබළු මුතු ප  ට
වැ න් තේ  ගම්'ඹු ගෙලැ පල මල් කුඹුකු ච  ට
ග න් තේ  ත සිත එ බැවින් නො වැදූ කෙළිය  ට
ය න් තේ  මෙළඳ ගොඩ දූකැ මඳ කලක් සි  ට

39. අවට සුපිපි සපු දුනුකේ සල  ලා ත
හඬන තැතින් තැනැ විලිකුළු කිර  ලා ත
පැසී තැම් කරල් රත් හැල් සහ  ලා ත
වඩන මැනැවි මහ වෙල මැදූ වෙර  ලා ත

40. ප ත්  ගත පුල් මල් දෙඹ තුරෙකැ පියක  රු
සි ත්  පිනවා ඉඳැ සැල ලිහිණින් අතු  රු
ග ත්  සරතස හැර විඳැ සුවඳ මඳ ම  රු
කි ත්  සිරිමේ වෙහෙරට වදුව පස් ව  රු

41. සොඳ  මුනි රද පිඹු කළ යස මෙරද ස  ම
පු ද  කළ ඔහු නෙත් නිල් කැලුමෙ'වි බැර  ම
ස ද  පුරු සැදැ වෙලෙන් රැඳි රුසිරු මතර  ම
ව ද  නෙහි තෝ දූ ගප් මහ බෝ පිළි  ම

## (6) කැලණි ගඟ වැනුම.

42. ස ල්  සපු කිණ දෙඹ රැරඟ නා මිදෙ  ලී
පු ල්  එරහැඳි හෝපලු මී අඹ පලො  ලී
පො ල්  පුවකු'ගු රඹ මල බුලත සලිම  ලී
නි ල්  ගත සා සෙවණලු දෙ තෙරැ මතක  ලී

43. ග ව සා  සුපුල් කඹුපුල් මල් නිල් වර  ල
ස ල සා  උකුළු වටැ රසු'දුල මිණි මෙවු  ල
ස ක සා  දෙ තත හර සඳුනින් කැරැ සිහි  ල
දෙ ප සා  ඉසිත නිල් පැහැ නෙතැ දිගු පුළු  ල

44. ම න හර නා මෙණෙවියනි'ඳැ ලවැලි පි — ට
ගෙ' න මිණි වෙණ තත් තිය'ගින් මැදූ රුව — ට
ක ග හෙවැ කියන බුදු ගුණ ගී මියුරු කො — ට
සැ න හෙව කැලණි ගඟ බඩ මද කලක් සි — ට

## (7) සැඳෑ වැනුම.

45. ස පු ම ල් යොහොඹු ලා බැඳැ වරල මනර — ඟ
පැ හැ දු ල් දෙඹ කැකුළු හර කැරැ ලා තන' — ග
රෙ න්'වු ල් නා කුසුම් කනැ ලා කොබෝල් ර — ඟ
ද ඟ ව ල් උයන් කෙළි කෙළැ සලෙළුන් සම — ඟ

46. නු ව නි න් නිල් උපුල් මද හසිති හෙළැ'ඹු — ල
වූ ව නි න් කමල් පැ ලවනතිති රතු'පු — ල
ප ව නි න් අඹුලු රන ලිය වන් ලියන් කැ — ල
රු ව නි න් ලකළ ගඟ දියැ කෙළැ තිඹුණු ක — ල

47. ව දි ම් න් සවස නල හැසිරෙන දිග'තුව — ල
සො බ ම න් සුනිල් මිණි නිල් තුබ තුරැ විපු — ල
ප ත්'ස න් අවර ගිරි නැටියෙන් වැටෙන ක — ල
වි ලි කු න් සුරත් පල වැනි වේ රිවි මඩ — ල

48. ම හ තු න් හසළ තම හට යස පිහිට ලෙ — ස
නි සැ කි න් නොහළ යුතු බව පැමිණෙන වෙහෙ — ස
සු ද න න් පැවැති සිරිතැසි දන්වන විල — ස
නු බ මි න් සමහ ගෙවෙනු ය දහවල් දව — ස

49. සැ දෑ ලෙන් වරුණ දෙව් රද මුහුදු වි — සූ
ස දෑ සහසකර එන මහ වතැ සැලැ — සූ
වි ඳැ උපුල් පිළු මෙන් රත් පටින් වැ — සූ
සැඳැ වලා පෙළ පැළ දිගැ පෙනුණු ප — සූ

50. උ දු ල සොමි කැලුම් තිසයුරු හිමි පුව — ළ
ප හ ළ වන බැවින් තම වෙතැ තිස'ඹු දෙ — ළ
ල ක ළ ගුවන් තල සිරි යහනැ තිකස — ළ
අ තු ළ කුසුම් විලසින් සැදෙන තුරැ වැ — ළ

51. ද න කැ න් ගෙනැ දමන ගොදුරට නො හැකි — ළි ය
ප නි මි න් දිසෙන් ඔවුනො'වුනැ'ගෙහි පෙරැ — ළි ය
ලෙ හෙ ලු න් කෙළනා කැරැ පෙණ පිඩු රළ රැ — ළි ය
ඵ තැ නි න් පියාසර කැරැ දකු මස්නො — ළි ය

## (8) කැලණි පුර නිශ වැනුම.

52. පැ හැ ස ර ණි ය  මිණි පැමිණිය  කොත් අග  ව
බ ද කි කි ණි ය  ද ද ගි හි ණි ය  විමන් ව  ව
තො වැ පැරැණිය  වන රමණිය  විටින් වි  ව
සැ ල ළි හි ණි ය  වදු කැලණිය  පුරවර  ව

53. දි ය  ක ද  ගැඹර පිරි පුවතර මහ සයු  ර
මූ ව  ර ද  ලෙසින් වන අගනි'සි කර තඹ  ර
ම න න ද  කරන මිණි ගණ මෙන් දිසි එ ව  ර
පැ හැ'න ද  පහන් එහි මහ වෙයැ බල මිතු  ර

54. උ ද ය' ග  පියුම්රු පැහැ වැදූමෙන් රුදු  ණු
පෙර දි ග  පෙනෙන සඳ සඳ කැල්මෙන් දිලු  ණු
ම න ර ග  එ පුර සඳකත ගෙහ'ඹින් වැඩු  ණු
සුර  ග ග  පතිනි දම් රුකුමෙහි වැනි දුපු  ණු

55. සු නි ල්  වලා නව සඳ තිලු'පුල් පබ  ළු
වි ම ල්  සක් ගිජිදු කුඹු සිරිවස බැබැ  ළු
වි පු ල්  පුලින රඹ සිකි ගල මූතු ළ ද  ළු
ළ ක ල්  රන ලියන් සරනා බල යහ  ළු

56. ඔ  ද  වැඩි කෙළි මගුල් ලැබැ තුටු තිසා ක  ල
ස  ද  සක් මදෙසිනැ'දූ දෙන දුනු සැන් දුහු  ල
සො ද  පුර'හන පහ සුමුගින් පැහැ උදු  ල
සෙ ද  දුන'ඹර මතු ඇශ රුස් මිණි මෙවු  ල

57. න ව ර  කැරු තොකුම් සඳතෙන් තුනු සිය  ල
ප ව ර  සුවඳ මල් දම් පැලැදැ මතක  ල
බැ හැ ර  සිතු නො ලූ හිමිනඹුවො කෙළි ලො  ල
එ පු ර  ඉඳිති සඳ පානෝ සඳලුව  ල

## (9) පින් කම් වැනුම.

58. මූව ලඹ රඹ වලු බර රන් තැඹිලි  තු රු
සැදි ගෙ උයන් ගෙවමින් වේ මගැ අ  තු රු
කරකැවෙමින් දකුණට අවුදින් මි  තු රු
වදු වෙහෙරට සිහි කැරු නව ගුණ මු  තු රු

59. දිය තෙ ස් පැතිරූ සිරි බුදු ගුණ කියා හැ ම
ස ග'මො ස් ලබනු වස් පිය යුග ඔබා බි ම
සිය ඍ ස් පුරා දුටු මෙන් තුටු වැ මුනි තු ම
ව දු ල ස් තිලක ගෙසි වැඩැ උන් මහ පිළි ම

60. පෙරළ ද ල තිදු දිය කඳ රට බිම් ගල ත
සු ර කු ල හිමි රකිනුව ලකැ මැවූ ස ත
ම ත ක ල ඒ සමුදුරු පැහැයෙන් දිමු ත
වදු ස ල පිළිම හිමි සිරි සරණ සියප ත

61. ශි ලී ය තො දී සැට මහණන් බව මහ' ණ
ම ලි ය දෙව් තෙරිඳු වැඩැ හිඳැ දෙසූ බ ණ
දි ලී ය පස්මහල් පායෙහි මිණි කිර ණ
බැ ලි ය හැකි වි නම් දකැ වැඳැ යා කල ණ

62. පෙරළ උවි ද ගෙනැ ගිරි ද සිඳු සල ත
නැගි පැහැද පෙණ සමු ද සැටි නුමු ත
මෙත උළි ද පැහැ විහි ද තෙ දිගු බි ත
සැදි වට ද ගෙයි වදු ද ගබ දිමු ත

63. දිගු තෙත් නිලු'පුලෙ'වි රත'දර පබල ර ඟ
සි රි ම ත් සුපුන් සඳ වැනි වුවන මනර ඟ
පැහැ පත් ලකළ රන් වන් විලසින් ලොව' ග
වැදූ තොත් පිළිම හිමි වදු පායැ පැළ දි ග

64. අ හ සින් අවුත් මිණිඅස් න'සිදු යැදුම ට
ර හ තන් මැදෙහි මුනි හිඳැ මිණි පලග ;පි' ට
ද හ මුත් දෙසූ තැනැ කළ සැටරියන් තො ට
ම හ ද ගප් හිමින් වදු සොළොස තැන් සි ට

65. ස ව න සතියැ වැසි වසි නා දස දි ගෙ හි
පෙණින සෙවෙනි මුදලිඳු නා දරණ ගෙ හි
ස ව න හිඳිනු දන න'ඳ නා තෙතු යු ගෙ හි
ව ද න මැනැවි පිළිමය නා පිළිම ගෙ හි

66 ස ස රි න් මුදු ලෙව් සදහම් අ මා දී
එ ක හි න් මුනිඳු හුන් වැනි තිපර මා දී
ලකු ණෙන් සපිරි පිළිමය දකැ ස මා දී
වැදැ ග න් මිතුර තුන් සිත නැරැ ස මා දී

67. අප මුනිඳු බුදු වන දිනැ මුරැත් පි ඳු
පැහැ විහිදු දිලි කලදේ යටින් යෙ ඳු
සැදි සිහිදු ඉදු තිල් මිණි සතෝ'තබ ඳු
වැදැ දුම්'ඳු වන පින් පල න අත් බ ඳු

68. වි ව ං ක පැකිලි'ඳු දකුණ'සැ දෙරටුයෙ න
නි ස ං ක යෙන් පුද නන් තුරැ ගොස'සම් න
ක ල ං ක නො වැ කල සුබ ලකුණු බබල න
නි ව ං ක නම් දෙ පිළිම නැමැදැ බැසැ ගෙ න

69. ස ම නො ල ගිරි ගිජ්ඳු දිගු කල සොබෝ'නසැ වි
සි හි ල' ල ගඟැ සිලිල් සතහා මුනි නොගැ වි
පැ හැ දු ල තුන් සිවුරැ ඇඳැ පෙරෙවැ වැඩැ සි වි
නැනැ ක ල සිවුරැ දෑ ගබ වදු නො පැ පි වි

70. නි රි ඳු න් කැලණිතිස් තිවැරැදි රහත් නැ න
සැක යෙන් ලැවූ හුණු තෙල් සැල තුබූ නැ න
බැති යෙන් පිනැ'තියන් කල විසිතුරැ විම න
වැඩැ උන් පිළිම හිමි නමඳින් යහදස න

## (13) දෙව් මැඳුරැ නළු වැනුම්.

71. පි රි සි ද නො දත හැකි මෙ වැඳුම් පින් පඬු රු
මනැ බැඳ රැගෙනැ දෙන ලෙස දූනැ එ සුර වි රු
සු ර ර ද පාය වන් විජයොත් නම් මහ රු
එ මැ ස ද වඩන රජ ගෙට මිතුර වැඩන රු

72. පු ලා සුවඳ මල'වුල් කැරැ වරල් බැ ඳ
දු ලා රන් පතින් සරසා ඇවන් සො ඳ
නි ලා දිගු නුවන් රස'ඳුන් නනා ඇ ඳ
බ ලා සිටු රහන රඟ මඩලැ කල්බ ඳ

73. වි දෙ න ලෙළෙන නරැ බර පුළුලු'කුළැ රැ ඳී
හෙ ල න න ඟ න අනැ නුවන'ඟ බැලුම් දි ඳී
රැ ව න දී ලෙ න අබරණ කැලුම ගනැ යෙ ඳී
සැ ලෙ න ප හ න සිළු වැනි රහන ලිය සැ ඳී

74. ලකල පුළුලු'කුළැ බඳ මිණි මෙවු ල් ලා
සමඟ රන් සලඹ රැවු දී වෙවු ල් ලා
වයන පදට නබමින් පද කම ල් ලා
රඟන ළඳුන් බල රූ සිරි සිඟු ල් ලා

75\. ව ස් දඹු බිගු කොවුල් වීණා නද මිසු රු
රැ ස් වූ සෙයින් සත් සර රස ගී සොඳු රු
අ ස් වන ලියන් දකැ ලිය කිඳුර'ගන යු රු
තො ස් කර න සිත සවනත නුවනත මිතු රු

## (11) දෙව් රද වැනුම්.

76\. මෙ සේ පැවැති අනතුරු ගී රැඟුම් පු ද
තොසේ සිතින් වැඩැ සිටි සුර විමන් මැ ද
ය සේ පතළ දිය තුළැ උතුළු මනන ද
ඈ සේ පුරා දකු විබිසණ සුරිඳු ස ද

77\. පැ මි ණ සිටි අඳුන් ගිරි කුළු මුඳුනැ වෙ ත
රෙහෙ ණ නකත් ගැල සිරි විලසින් දිමු ත
ස ර ණ මුළු ලොවට එ සුරිඳු සිරස ප ත
කා ල ණ කිරුළ දිසි මුතු ලැල් රුවන් යු ත

78\. සු නි ලේ පැහැය හැරැ සුදු වනු යැ ගන වෙ ලේ
වි දු ලේ එයින් වියොවට පැමිණැ වියවු ලේ
නි ස ලේ එ මේ සිරි ගත් සුරිඳු හැම ක ලේ
උ දු ලේ දෙහෝ රන් පට මෙන් නළල් තෙ ලේ

79\. රු වි නේ උතුම් එ සුරිඳු මිණි ඊල මෙ නේ
ස ව නේ රැඳුණු රසු'දුල තෝඹු ගන ර නේ
වු ව නේ වැජැඹි සිරි සරසවිය හැම දි නේ
සොබ නේ කනා කැටපත් යුවල විලසි නේ

80\. නම කල සත හැ ලේ සි හි ලේ සැප සිලි ළි
බිය සෙණ රුපු කැ ලේ තු මූ ලේ දෙන තොත ළි
නලලත ගිරි තෙ ලේ සු නි ලේ රැසිනි'පි ළි
සුර රද දෙ බැම ලේ ග න ලේ සිරි කියෙ ළි

81\. ස තු රු සුර අඳුරු එක පැහැරැ දුරු ක ළ
ම තු රු තඹුරු වන නිරතුරු පුබුදු ක ළ
අ තු රු තුසර සිඳුවන දකුමෙන් පහළ ළ
ළ හි රු සිරින් දිලිහිණි හිමි නෙත් සහ ළ

82\. ය ස ගා න කළ තැනැ තැනැ සිද'ගනන් සැ දි
තොළ ගා එ හිමි දිගු තුගු නැහැයට වොරැ දි
ස ම ගා රදුන් දෙවියන් සෙවුමින් නිසැ දි
මූ ර ගා අහෝ මිණි කාලම වෙහෙස වි දි

83. සිරි සර හිඟුල් විලැ සේ හස වැලෙ'වී ග හ
සුර වර සළෙල රත ලවනතැ දල දුල හ
ම න ග ර සඳ වලා පෙළ කෙලවර පෙනෙ හ
පැහැ සර ල සඳ යුවලෙක් ඇයි නම් එ මෙ හ

84. ක නා මිණි වළලු හැඟි රුස් මල් කැනැ' ති
ම නා දිගු ඇඟිලි නව තඹ ල පලු ඇ ති
ද නා කැමැති දෙන පලඹ'න එ සුර ප ති
දි නා දිමුතු අතු සිරි සුර තුරු පැවැ ති

85. පා නා සෙනෙහෙ සුසිනිඳු මද ලස බැ ල් ම
ගා නා තිමහමේ'වී දෙව'හන හෙත් කැ ල් ම
නා නා සුරිඳු පුළුලු'ර සිරි සඳ ඇ ල් ම
නු නා කෙළන ගල තල වැනි ඉදු නි ල් ම

86. ල කු එ පුළුලු'කුළු වට බිමැ එ සුර වි රැ
වෙ ර එ මිණි කැලුම් පතරින් මෙවුල'තු රැ
හැ ඹු එ සොඳුරැ සුසිලිටු වවොර රඹ තු රැ
බැබැ එ සිලිල් ඉසිනා විලස සිරි දු රැ

87. ව ද නා සුරන් කිරුළ'ගැ රුවනැ කැලුමෙ නා
බ ද නා කොමළ ලතු විලස'ළ රතින් ම නා
ම ඹ නා බැවින් සියපත එ හිමි පතුලෙ නා
බියෙනා ල තඹ හෝ පලු සදිසි මෙවුල නා

88. වෙසෙසින් පහන් පැහැ සර ගැඹුරු පිවිතු රැ
බැ ලු ව න් ඇලුම් කරවන යළි දු බියක රැ
සිරි පි න් රුවන් පිරි එ සුරිඳු සයුරු යු රැ
මු වෙ කි න් කියා නිමැවියැ හැකි ද රූසි රැ

89. ලෙ වි හට තමන් නම් කිව රිසි දෙන වි සි ති
දෙ වි තුර සුරබි සුර මිණි සරි ද කෙලෙ සි ති
ප වි රෝ දුකුදු දුරු ලන පොකුර'ඹ හ සි ති
දෙ වි වේද ඇසෙන පමැණකි වියතුන් බ සි නි

90. ම න් පින වන යස සිරි තෙද නැණ විපු ල
සෙන් සුද ජය රජ බව නනතුරු සිය ල
දෙන් තෙන් පැතු විටැ සුබ වැඩ දිගා බ ල
පි න් නම් සතුන් කළ දෙවි රජ මැ යැ මෙ න ල

91. තු න් ලෝ තමං හතු කල රවුළු සොහොවු රෑ
තු න් කල් බලා රම්'දුව වූ ඉටු මිතු රෑ
තු න්· වේ ඇදුරු පුලතිʻයි කුලැ මිණි මිතු රෑ
තු න් විවෙකෑ මෑ වඳු එ සුරිඳු පා තඹු රෑ

## (12) අස්න.

92. අනතුරු බලා අදහස අවසර විග ස
සුහුසුලු නො වී සලකා පසු පලමු බ ස
පෙරදූරි කොටැ සුරිඳුට තියු වදන් ගො ස
සැල කර ත ගිය කටයුතු සිටැ එක'ත් ප ස

93. තර සර සුතෙර තද තෙද දිමුතු දිවසු ර
පුවතර ගෑ ඹර සමුදුර කැලුම තිල'ඹ ර
සොම්බර ප ව ර තිසයුර නුවණ සුර ගු ර
සුර වර සෑ ර ද විබිසණ නම කැලණි පු ර

94. රජ කුල සුපුල් විලැ රජ හස වන් සර න
පෙරළ මල 'විශා වන් රූසිරින් මත නද න
හැම කල විපුල සව් සැපතින් තොඅඩු ව න
තෙද බල විකුම් ගුණ මිණි බරණින් තෙවු න

95. ගරු තර තන්තුරුතුනාහං තමැති මෑ ති
සිහි කාර නිතර මහ පුද පඬුරු දී රු ති
තොවිසිර ඔබට දන්වන ලෙස කී සිතැ' ති
සුර වර මඳක් කල් එ පවත් ඇසියැ යු ති

96. රිවි කු ල ලමැණි ගොත් පිරිසුදු ගුවන් මෑ ද
පැහැ දු ල සරු කල් පත් සහසකර බ ද
කිවි කා ල ගලව මුතු හර වන් යස පබ ද
සිරි හ ල කුල තිවෙස් දිග පතල තද තෙ ද

97. හ ල දුසිරිත් දුතැ තෙවලා මුනිඳු බ ණ
කෙල පත් සියල් අවි සිප් කාව් තළ සත' ණ
ඹ ල මොල රුපුන් දප මැඩැ පැ උපා නැ ණ
හා ල මුළු ලක් දිව එකා සේ සත් සෙව ණ

98. සත නෙතැ දුන් රෑ සිරි රස අ දුන් ව න
පත තර ලොව පුර'දර සිරි හ දුන් ව න
විකුමෙන් මෙ දඹදිවැ තිරිඳුන් මු දුන් ව න
අප පැරකුම් නිරිඳුට දූ ල දුන් ව න

99. සිරි සඳ වත් සව් සිරි දියුණු වැ රඳ ත
සිතුමිණ වත් යැදි යැදි හට දතින් දෙ ත
සර සවි වත් නුවණින් පහළ වැ පෙනෙ ත
තව සඳ වත් ලෙව් වැසි අදරින් වඳ ත

100. යෙහෙළින් කෙරේ සකි සැප සමඟ සි ත් මේ
කු ලු ණින් දුසිදසුන් වෙතැ වසිත ව ත් මේ
ර කි මි න් පතිනි දම් යහපත් සිරි ත් මේ
සි හි තෙ න් තිපන් වන් දස පින් පැවැ ත් මේ

101. මි හි රි තෙපලැ තන් වැසි කිවි කම් පුරැ දු
ඉ ති රි බැති පෙමැ'ති පෙළ දහමෙහි මුනි දු
නොහැරි පෝයැ අට සිල් රැකුම පිරිසු දු
ස සි රි උලකුඩය දේවී හට පසි දු

102. දි ත් රුපු කිරුළු මල් දම් සුවඳ මී වැ ස
තෙ ත් සිරි පා යුත් සුරිඳුහි තිලෝ ඇ ස
සි ත් පිත වත ඇති ආ සිරි නුවණ ය ස
පු ත් රුවතක් සොඳ දුත මැනැවි තිසි ලෙ ස

103 බිසො ව ට පළමු රත්නාවලී නම් සොඳු රැ
ස හ තු ට දෙවු හිමි දිවැ'සින් කුලුණු පි රැ
මෙ ලක ට ඉසුරු වී පැරකුම් රජ කුම රැ
පළ කොට කිමෙකැ ඔබ සොඳ නෙද බල මහ රැ

104. එ සෙසින් දූ සමන් මහතෙල් කුසුම් ගෙ න
පු ද මි න් එ සුර වර සිරි සරණ වඳිමි න
බු හු ම න් කරන රජ දූ සඳුට මෙ කිය න
දුන පි න් සමඟ යස සිරි වඩි පුත් රුව න

105. මෙ හසු න් සුරිඳු හට සැල කැරැ මෙ සේ යා
ව ඳි මි න් බැතින් පැදකුණු කොටැ නො සේ යා
ද කි මි න් බිසෝ දෙවියන් නො වැ ල සේ යා
කි ය මි න් යදින් සකි සඳ මෙ මැ ලෙ සේ යා

106. පැ හැ ප ත් පුන් සඳෙ'වි කිරි සමුදුරැ පළ ව
සිය ගො ත් බබළවන දෙවි රජ කුමර හ ව
නැ වැ න ත් එකලා වැ අවසර ලැබුණු වි ව
මෙ ප ව ත් කියව සැල කරනුව සුර රදු ව

### (18) ආසි.

107. මේ සි ය ලූ මැ අඳහස කුලුණින් ගිහි ණී
සේ සි ය පත සලසා උදයැ දින මි ණී
තැ සි ය ඉටු මිතුරැ සමගින් සැල ළිහි ණී
වා සි ය පවතු සිතු ලෙස සැපතින් පැමි ණී

## සැල ළිහිණි අස්න නිමි.

---

( පුරාණ සන්නයේ අගැ යෙදුණු කවි. )

පැරකුම් රජුට පන්තිස් වන නවම් ම ස
ම න රම් කැර බඳුතු මේ හසුන් නො වී ල ස
අ සැ දු ම් ලෙසට සිදු කැර කිවිඳු අදහ ස
දෙව් රම් මිතුරැ දිනි ගබ බිසොවට සක ස

ස තිස් වන නවමැ පුර අස්ලිස නැකැ ත
ප හ ස් ලැබැ සුපුත් සඳ නුබ'තුරැ පෙනෙ ත
ස හ ස් සාර කුලට වැඩ වන ලෙස සත ත
වෙ සෙ ස් රජ කුමර විලසින් දූකුම් ප ත

සා ද මු රැ කුල මැඳුරැ මිණි පහනෙ'ව පුසැ දී
නැණ ගුරැ සබස සමය ද දූනුමෙන් වොරැ දී
ර ජ ගුරැ විජයබා පිරැවන් හිමි පැසැ දී
මෙම විපුරැ පද'ති සැල ළිහිණිය අස්න යෙ දී

# සැල ලිහිණි විවරණය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

සම්‍යක්ප්‍රණම්‍යාද්වයවාදිනං ජිනං
ශිෂ්‍යාර්ථසත්කාමපි නාතිවිස්තරාම්
ශ්‍රීරාහුලස්‍ය ප්‍රවරාර්ථශාරිකා-
සන්දේශකාව්‍යස්‍ය කරෝමි දීපිකාම්.

ස්වස්ති. "ශ්‍රී පරාක්‍රමබාහු රාජෝත්තමයාණන් ගේ ධීතෘ වූ ලෝකනාථා දෙවියට පුත්‍රයකු දුන මැනැවැ" යි විභීෂණ දිව්‍ය රාජයනට ආයාචනයක් කරනු කැමැති වූ, තොටගමුවේ ෂඩ්භාෂාපරමේශ්වර ශ්‍රී රාහුල ස්වාමිපාදයෝ, සන්දේශකාව්‍යයක් රචනා කරන්නාහු, පළමු කොටැ මැ ස්වසන්දේශහාරකයාට ආශීර්වාදමුඛයෙන් "සැරද සුලකල'කුරැ" යනාදි පද්‍යය කියත්.

## (1) දූතාශීර්වාදය.

**1. සැරද සුලකල'කුරැ-මියුරැ තෙපලෙන් රඳනා**
**රජ කුල රහසැ මැතිනිය-සියනි'සි සැල ලිහිණි සඳ**

සුලකල අකුරැ මියුරැ තෙපලෙන් රඳනා, රජ කුල රහසැ මැතිනිය, සැල ලිහිණි සඳ, සියන් ඉසි, සැර දෙ.

**සුලකල**-මොනවට හොබවනලද, **අකුරැ**-අක්ෂරයන් ගෙන් යුක්ත වූ, **මියුරැ**- මධුර වූ, **තෙපලෙන්**- වචනයෙන්, **රඳනා**- යුක්ත වූ නො හොත් සිත් සතුටු කරන්නා වූ, **රජ කුල**- රාජ කුලයා ගේ, **රහසැ**- රහස්‍යවිෂයයෙහි, **මැතිනිය**- මන්ත්‍රීන් ගේ ඥානයට බඳු ඥාන ඇති, **සැල ලිහිණි සඳ**- ශාරිකාපක්ෂි චන්ද්‍රය, **සියන් ඉසි**- ස්වකීයයන් හා එක් වැ, **සැර දෙ**- බොහෝ කාලයක් ජීවත් වව.

"පැහැදිලි ලෙස උච්චාරණය කිරීමෙන් ඉතා අලඞ්කෘත වූ අක්ෂරයන් ඇති රසවත් වචනයෙන් යුක්ත වූ නො හොත් සිත් ගන්නා වූ, රජ දරුවන් ගේ රහස් කටයුතුවලැ දී ඇමැතියන් ගේ නුවණට බඳු නුවණ ඇති, උතුම් සැල ලිහිණිය, නෑයන් සමඟ බොහෝ කල් ජීවත් වෙව." මේ මෙහි භාවය යි.

මෙයින් කවිහු තමන් ගේ දූතයාට ආශිර්වාද කළහ. මෙයින් මැ ඒ දූතයා ගේ ගුණ දෙකකුදු වැනූහ. පැහැදිලි ලෙස මිහිරි වචන කියන බව ඉන් පළමු වන ගුණය යි. රජ දරුවන් ගේ රහස් කටයුතුවලැ දී, කියැ යුතු දේ කීම නො කියැ යුතු දේ නො කීම ආදියෙන්, නුවණැති ඇමැතියකු මෙන්, විශ්වාස කළ යුතු බව දෙ වන ගුණය යි. පළමු වන ගුණය ස්වභාවසිද්ධ යැ. දෙ වන ගුණය පුරුදු කැරැවීමෙන් ලැබියැ යුත්තෙකි. සැල ලිහිණින් රජ දරුවන් ගේ රහස් දූත්වීමෙහි යෙදුණු බව ඇතැම් පොත පතින් පෙනේ.

**විස්තර:—**

1. **සැරද**– චිරාර්ථයෙහි යෙදෙන 'සැර' යන නිපාත පදය ද, 'ජීවත් වෙව' යන අර්ථයෙහි යෙදෙන 'දෙ' යන විධික්‍රියා පදය ද එක් වීමෙන් 'සැරද' යනු වී යැ. 'සැර+දෙ'හි තුබූ තත්හි අන්ත්‍යස්වරය පූර්වරූපයට පැමිණේ. 'සැර දෙ' යනු ඉතා පිරිසුදු සිංහල යි. එ හෙයින් ඒ යෙදුම වැරැදි යැ යි කීම නම් සිංහල නොදත් බව හැඟැවීමෙකි. 'සැරද' යනුත් ස්වරපූර්වරූපයෙන් ඉදුරා ලැබෙන බැවින්ද, පැරැකුම්බා සිරිතෙහි–

“ සබ ද  දෙරණඟන දරුමෙහි නන පණිපති පුර  න් ද ර
සර ද  සමය උදිත නිමල හිමකර යසැති සු  න් ද ර
සම ද  වසිරි රජ සමර ජලනිදි මතන ම  න් ද ර
සැර ද  පවර පැරැකුම් බුජ රජ මුනි පුද පුර  න් ද ර ”

යි විවාදරහිත වැ පිළිගත යුතු සේ යෙදුණු බැවින්ද, අතිශයින් ශාස්ත්‍රීය යි. 'සැරද' යි සන්ධි වැ තුබූ තත්හි පද වෙන් කොටැ ව්‍යාඛ්‍යානයෙහි 'සැර දෙ' යි යෙදුණු පමණින් මැ, 'සැරද' යනු අව්‍යක්ත යෙදුමෙකැ යි කීම නොමැනැවි. 'දෙ' (පණ දරීමෙහි) ධාතුව විධානයෙහි නම් ස්වරූපයෙන් සිටි තැනි. ඇතැමෙක් මෙහි 'දිව්' (පණ දරීමෙහි) ධාතු යැ යි කියත්. නමුත් සිංහලයෙහි නම් 'දිව්' ධාතුවෙක් නො ලැබේ. මාතෘභාෂායෙහි 'ජීව' ධාතුවක් වූ පමණින්, සිංහලයෙහි වරනැගෙන සැටි වත් මෙනෙහි නො කොටැ, 'දිව්' ධාතුවක් දක්වීම සිනාවට හෙතු වේ. 'දෙ' ධාතුව වර්තමානයෙහි දේ– දෙති– ඈ විසින් ද, අතීතයෙහි දිනි– දුනු– ඈ විසින් ද වරනැගේ. 'දිව්' ධාතුවත් වර නැගෙනුයේ මේ ලෙස මැ නම්, එහි 'ව' කාරය විකාරයෙකි. 'දි' යන්නෙහි වූ ස්වරය 'එ' බවට පැමිණීම පෙරැළියෙනුත් පෙරැළියෙකි. 'දෙ' ධාතුව දීමෙහි ද යෙදේ.

2. **රඳනා**– 'රඳ' ධාතු යි.

3. **රජ කුල**– රජුන් ගේ කුල. මෙහි 'කුල' යනු වංශය යි.

4. **මැතිනිය**– මැතිත් ගේ නිය වැනි නිය වනුයේ යමකු හට ද හෝ මැතිනිය

5. **ඉයි**– සභාවියෙහි නිපාතපද යි.

6. **සැල ලිහිණි සඳ**– මෙහි 'සඳ' යනු උත්තමාර්ථයෙහි වැටේ. චන්ද්‍ර, වාරණ (හස්ති), සිංහ, වෘෂභ, හංස, යන මේ ආදි නාමයෝ අන්‍ය නාමයන්ට පර වැ යෙදුණාහු, සංස්කෘතයෙහි ද උත්තමාර්ථය ගෙනැ දෙති. මොවුන් ගෙන්

ලැබෙන සඳ, වරණ, සී, වැහැප්, හස්, යන නාමයෝ ද සිංහලයෙහි උපනාමාර්ථ ගෙනැ දෙත්. හිමි සඳ, නර වරණ, නර සී, මුනි වැනැප්, රජ හස්, යනාදිය නිදසුන යි. 'සැලළිහිණිසඳ' යනු එක් සමාස පදයක් ලෙස ද ගනිති. "සැල වූයේ ද යෙ මැ ළිහිණි වූයේ ද එහෙ මැ සැලළිහිණි; සැලළිහිණි වූයේ ද එහෙ මැ සඳ වූයේ ද එහෙ මැ සැලළිහිණිසඳ"යි විග්‍රහවාක්‍ය ද දක්වත්. මෙය නිවැරැදි නමුත්, සිංහලයෙහි නම් ශිෂ්‍යයනට මෙයින් ඇති වනුයේ නුවුවමනා ආයාසයෙකි. 'සැල' යනු 'ළිහිණි' යන්නට විශේෂණ යැ යි ද 'ළිහිණි' යනු 'සඳ' යන්නට විශේෂණ යැ යි ද ගත් කල්හි කාර්ය පිරිමැසේ.

7. වාක්‍යවිභාගය කරන කල්හි 'නෝ' යනු අධ්‍යාහෘත උක්තය යි. 'දෙ' යනු ආඛ්‍යාතය යි. 'සැර' යනු ද 'සියත් ඉති' යනු ද ආඛ්‍යාත විශේෂණ යි. (වාක්‍යවිභාග හා පදවර්ණනා සුභාෂිත විවරණය බලා උගත යුතු. ඇතැමෙක් වාක්‍යවිභාගයට 'වාක්‍යවිග්‍රහ' යනු යෙදත්. කෘදන්තතද්ධිතසමාසයක් විදහා පෑමට මුත්, වාක්‍යයෙකැ අවයව බෙදා දක්වීමට ඒ නම නො යෙදේ.)

8. මේ ගීය යහ ගී විරිතින් බැඳුණෙකි. යහ ගී ලකුණු-

"නව කොළොස් වසමැ- එකොළොස් බැගින් යෙමෙහි
ලුහු බහලෙකින් බැඳියේ- සා ගී යැ මේ නිදසුන්"

යන්නෙන් දක්විණ. විෂම පාදයෙහි හෙවත් ප්‍රථම තෘතීය පාදයෙහි මාත්‍රා නවයෙකින් හා එකොළොස්සෙකින් ද, සම පාදයෙහි එකොළොසෙකින් දූ යි මෙසේ මාත්‍රා සතළිසෙකින් බැඳුණේ යහ ගී නම් වන බව එයින් කියැවෙයි.

## (2) කුශලප්‍රශ්න හා කාර්යනිවේදනය.

2. පුල් මල් කෙසරු මෙන්—රන් වනි තෙලෙ සරණ යුග
සපු මල් කැලෙ'ව් තුඩ මද රතිනි මනහ ර
නිලු'පුල් දෙලෙ'ව් සම වනි පිය පිය පත ර

මලින් කළ රූ එව්—එ බැවින් නුබින් එන වර
නි ලූ ද ලද සිඳු'බුවො දිගු වරලැ නි ලූ
නි ලූ ද වට බිගු පෙල අද නඹරනි ලූ

ව න දෙව් ලිසෝ නොකොලො ද සවන අබර ණ
ඒ න මගැ දුකෙක් නො වී ද සබඳින කල ණ
ස න හස බැඳුණු තැනැ නොහරන කැරැ දිපු ණ
වෙන සැප කුමට නොප දකිනා එ මැ පම ණ

තෙලෙ සරණ යුග, පුල් මල් කෙසරු මෙන් රන් වනි; තුඩ, සපු මල් කැලි එව් මද රතිනි මනහර; පිය පිය පතර, නිල් උපුල් දල එව් සම වනි; මලින් කළ රූ එව්; එ බැවින්, නුබින් එන වර, ලද සිඳුබුවො නිලූ දිගු වරලැ නි ලූ ද? නඹරනිලූ බිගු පෙල අද, වට නි ලූ ද? වන දෙව් ලිසෝ සවන අබරණ නො කොලො ද? එන මගැ දුකෙක් නො වී ද? කලණ සබඳිනි, බැඳුණු තැනැ දිපුණු කැරැ සනහස නොහරන නොප දකිනා එ මැ පමණ; වෙන සැප කුමට?

**තෙලෙ සරණ යුග-මේ (පෙනෙන) පාද යුගලය, පුල් මල් කෙසරු මෙන්-පිපුණා වූ මල්වලැ රෙණු මෙන්, රන් වනි-සවර්ණ**

වණ් යැ; තුඩ-තුණ්ඩය, සපු මල් කැලි එව්-සපු මල් කැකුලක් මෙන්, මඳ රතිනි-මන්ද රක්ත වර්ණයෙන්, මනහර-මනොහර යැ; පිය-ප්‍රිය වූ, පිය පත -පක්ෂපත්‍රයෝ, නිල් උපුල් දල එව්- නිල් මහනෙල් පත්‍ර මෙන්, සම් වනි- ශ්‍යාමවර්ණ යැ; මලින් කළ-පුෂ්ප යෙන් කරන ලද, රූ එව්-රූපයක් වැන්නැ; එ බැවින්-එ හෙයින්, නුබින්-ආකාශයෙන්, එන වරැ-එන්නා වූ කාලයෙහි, ළඳ සිඳු බුවො- තරුණ සිද්ධාඞ්ගනාවෝ, නිලු- නීලවර්ණ වූ, දිගු වරලැ-(ඔවුන් ගේ) දික් වූ කෙශකලාපයෙහි, නි ලූ ද-නො ලා ගත්තු ද? තඹරනිලු- තාමරසනිලය (නෙළුම් මල් වාස) කොට ඇත්තා වූ, බිඟු පෙළ- භෘඞ්ගපඞ්ක්තීහු, අද- අවුත්, වට නි ලූ ද- වට ලා නොගත්තු ද ? වන දෙව් ලියෝ- වනදිව්‍යස්ත්‍රීහු, සවන අබරණ නොකොළො ද-කර්ණාභරණ නොකළාහු ද? එන මඟැ-(තොප) එන්නා වූ මාර්ගයෙහි දී, දුකෙක් නො වි ද-දුඃඛයෙක් නුවූයේ ද? කලණ සබඳිනි -කල්‍යාණමිත්‍රයාණෙනි, බැඳුණු තැනැ- (සිත) බැඳුණා වූ ස්ථානයෙහි, දියුණු කැරැ- ද්විගුණ කොට, සනහස-සෙනහය, නොහරනා-අත් නොහරින්නා වූ, තොප-යුෂ්මතුන්, දකිනා-දර්ශනය කිරීම යැ සි යන, එ මැ-ඒ කාරණය මැ, පමණ-ප්‍රමාණ යැ; වෙන සැප-අන්‍ය සෞඛ්‍යයෙක්, කුමට- කුමකට ද?

"මේ පා යුවළ, පිපි මල් රෙණු මෙන් රන් වන් යැ; තුඩ, සපු මල් කැකුළක් මෙන් මඳ රත් පැහැයෙන් මනොහර යැ; ප්‍රිය වූ පියා පත්, නිල් මහනෙල් පත්‍ර මෙන් නිල් රන් මුසු පැහැ ඇත්තේ යැ; (මෙසේ බලන කලැ තෙපි) මලින් කළ රූපයක් වැන්නැ; එ හෙයින් අහසින් එන කලැ (මේ එන්නේ මලෙකැ යි සිතා) තරුණ සිද්ධාඞ්ගනාවෝ නිල් දික් කෙස් වැටියෙහි නො දූමු වාහු ද? නෙළුම් මල්හි ඉන්නා මී මැසි සමූහයෝ අවුත් වට ලා නොගත්තෝ ද? වනදිව්‍යාඞ්ගනාවෝ කනෙහි ආභරණයක් නොකොළෝ ද? එන මඟැ දී දුකෙක් නො වී ද? කල්‍යාණමිත්‍රයාණෙනි, (සිත) බැඳුණු තන්හි දී දියුණු කොට සෙනහය නොහරින්නා වූ තොප දක්නා වූ ඒ (කාරණය) මැ සැපේ; වෙන සැප කුමට ද?" මේ භාව යි.

මෙසින් දූතයා ගේ රූපවර්ණනය උසස් ලෙස කැරිණ. සැළ ළිහිණියා මලින් කළ රුවක් වැන්නැ. කවර හෙයින් ද? පා දෙක මල් රෙණු මෙන් රන් වන් ද, තුඩ සපු මල් කැකුළක් මෙන් මඳ රත් පැහැ ද, පියා පත් මහනෙල් පත් මෙන් නිල්රන් පැහැ ද, වන හෙයිනි.

මලින් කළ රූපයක් නම්, දුටු දුටු අය "මේ මලෙකැ"යි සිතත් මැ යි. එ හෙයින්, අහසින් එන සැළ ළිහිණියා දූතා, තරුණ

සිදගනනු 'මේ කදිම මලෙකැ'යි කියා අල්ලා කෙස් වැටියෙහි බහා බැඳැ ගැනීම ද නොකළහැකි නො වේ. මී මැස්සන් 'රොන් ගනිමූ' යි සිතමින් වට ලැම ද නොකළහැකි නො වේ. වන දෙව් ලියන් කනෙහි මලක් මෙන් ගසා ගැනීම ද නොකළහැකි නො වේ. එ හෙයින් "එන මඟැ දී මෙ බඳු දුකෙක් නො වී දෑ?" යි පිළිවිසිණ.

ඉක්බිති සැළලිහිණියා නො ලැබියැ හැකි තරම් වූ කල්‍යාණ මිත්‍රයකු බව දැක්විණ. වැදුණු තන්හි සෙනහය දියුණු කරනු විනා හැරීමෙක් මේ දූතයා ගේ නැති. එබඳු කල්‍යාණ මිත්‍රයකු දැකීම අභිමතාර්ථසිද්ධිය වූයේ නම් වෙයි. එ හෙයින් එ මැ සැහෙයි. වෙන සැප කුමට ද?

විසඳුම්:—

1. **රන්වනි**– රන් වන් + යි = රන් වන් + ඉ = රන් වනි. 'ය' යනු අවධාරණාර්ථයෙහි නිපාත යි. මෙ බඳු තන්හි 'ය'කාරය ලොප් වැ 'ඉ' යනු ඉතිරි වෙයි.

2. **තොපල**– 'නුඹ' යන අර්ථයෙහි සර්වනාම පදයෙකි.

3. **සපු මල් කැලි**– 'කැලි' යනු 'කලිකා' ශබ්දයෙන් ආයේ යැ. (මල්) කැකුළ යැ යනු අර්ථ යි.

4. **දෙලෙව්**– දල + එව් = දලෙව් = දෙලෙව්. 'ද' යන්නෙහි වූ ස්වරය පරරූපයට පැමිණියේ යැ.

5. **නිලූ**– මෙ අර්ථ තුනෙකැ යෙදිණ. (1) 'නි ලූ ද' යන දෙ තන්හි වූ 'නි' යනු ප්‍රතිෂේධාර්ථයෙහි වෙයි. 'ලූ' යනු 'ලා' (ලීමෙහි) ධාතුයෙන් වූ කර්තෘකාරක අතීතකාල ප්‍රථම පුරුෂ බහුවචන ආඛ්‍යාතපද යි. (2) 'නිලූ දිගු වරලැ' යන තන්හි 'නිලූ' යනු 'නිල්' යන්නට 'උ'කාරයක් යොදා ගත් තැනි. මේ එළිවැට රැකැ ගන්නා පිණිස කැරිණ. (3) 'තඹරනිලූ' යන තන්හි 'නිලූ' යනු 'වාසස්ථානය යැ' යන අර්ථයෙහි වූ 'නිල' යන්න 'උ'කාර යුක්ත කොටැ ගත් තැනි. 'වරලැ නිල' 'තඹරනිල' යි විසන්ධිරහිත කොටැ ගැණිනි නම්, අර්ථය පැහැදිලි වෙයි. නමුත් මුලැ යෙදුණු 'නිලූ' යනු හා නොවෙනස් කොටැ අනැ ද යෙදීමෙන් ශබ්දාලඞ්කාරය ඇති කරන අර්ථයෙන් මේ පෙරැළිය කැරිණ. මාතෘභාෂා දෙක්හි මැ 'නිලය' යනු ආවාසාර්ථයෙහි වෙයි.

6. **සිදඹුවො**– සිදු + අඹුවෝ. අනන්‍යස්වරය ජන්‍දස රැකැ ගන්නා පිණිස, හ්‍රස්ව කරන ලද. 'සිදු' යනු 'සිද්ධ' නම් දෙව් කොටසට නම් වේ.

7. **බිඟු පෙළ වට නි ලූ ද?**–මෙහි 'ලූ' යන අඛ්‍යාතපදය බහුවචන යි. නමුත් එයින් උක්ත වන්නා වූ 'පෙළ' යනු රූපයෙන් එකවචන වෙයි. 'බිඟු පෙළ' බොහෝ බිඟුන් ගෙන් යුක්ත වනුයෙන් 'පෙළ' යනු අර්ථයෙන් බහුවචන වේ. මෙ බඳු තන්හි උක්තය රූපයෙන් එකවචන වුව දැ, ආඛ්‍යාතය බහුවචනයෙන් යෙදීම සිංහලභාෂාරීති යි.

8. **අද**– 'අවුත්' යන අර්ථයෙහි යෙදෙන පූර්වක්‍රියා නිපාතයෙකි.

9. **එක මගැ දුකෙක් නො වී ද?**– කෙ බඳු දුකෙක් ද? සිදුබු සිඟු පෙළ, වත දෙව් ලිය, යන මොවුන් ගෙන් කී පරිදි දුකෙක්.

10. **වී**– 'වි' ( වීමෙහි ) ධාතුයෙන් සිද්ධ යැ. 'වූ' (වීමෙහි) ධාතු යැ යනු තතු නො විමසා කියැවෙයි.

11. **කලණ සබඳිණි**– මෙහි 'සබඳ' යනු මිත්‍රාර්ථයෙහි වෙයි. තොම හිත් දුරු කොටැ සුමඟට හෙළනුයේ (කලණ) කල්‍යාණමිත්‍ර යි.

12. **සනහස**– 'සනහ' යනු සෙනහයට නම්. 'හ'කාරලොපයෙන් 'සනා' යි ද සිටී. අගැ යෙදුණු 'අස' යනු 'සනහ' යන්නෙහි අර්ථයා ගේ අඩු වැඩි බවක් හෝ වෙනසක් හෝ ඇති කරන්නේ නො වේ. එ හෙයින් 'සනහ' යි කිව ද, 'සනහස' යි කිව ද, අර්ථය නම් එක මැ යැ. 'මුහුලස' 'වරලස' 'සිහිලස' 'සර තස' යනාදි තන්හි දු මේ 'අස' යනු මෙ සේ මැ යෙදේ.

13. 'පුල් මල් කෙසරු මෙන්' යන්නෙන් ඇරැඹුණු දස පෙළට උපජාති නම් දස පද සැහැල්ල යැ යෙත්. එහි ලක්‍ෂණ මෙසේ කීහ :-

"කඩවක්හි පිරියතැ-සිවු පෙදෙහි යම් විරිතක්
බනා බඳ හොත් දන්නේ-උවදු නම් සැහැලි නම්."

" කඩවක් නම් (පද සයෙකින් යුත්) වෘත්තයා ගේ කෙළවරැ, සතර පාද යෙන් යුක්ත වූ යම් කිසි වෘත්තයක් බනා බඳනා ලද නම්, ඒ උපජාති නම් සැහැලි නමැ යි දන්නේ යැ" යනු අර්ථ යි. සැහැලි ද දස, දෙළොස්, තුදුස්, සොළොස්, අටළොස් යනාදි පාදසඞ්ඛ්‍යායෙන් යුක්ත වියැ හැක.' මෙහි දශ පාදයක් වූයෙන් මේ 'දස පද සැහැලි' නම් වේ. 'කඩවක්' නම් මේ යැ:-

" එක් කල හොත් සිතිලි-ගී යුවළක් වන්නේ
කඩවක් නම් ලකුණු මෙහි-සිවුපද හෙයිනි දන්නේ."

සිතිලි ගී දෙකක් එක් කල හොත් කඩවක් නම් වන්නේ යැ; මෙහි ලකුණු සිවුපදයෙ මෙන් දන්නේ යැ" යනු අර්ථ යි. සිතිලි ගී මෙසේ වෙයි :-

" ගීයැ මුල් පද හා-සිවුපද ලකුණු දෙපෙදක්
සිතිලි ගී වෙයි දන්නේ-(නිදසුන් නම් එහි මෙසේ). "

" ගීයෙහි මුල් දෙපදය හා සිවුපද ලකුණු ඇති දෙපදයක් 'සිතිල් ගී' නම් වෙතියි දන්නේ යැ'' යනු අර්ථ යි. මෙසේ ගත් කලැ, දස පද සැහැල්ලෙහි පළමු වන පාද (පේළි) තුන එක් සිතිලි ගීයෙකි. සතර වන පස් වන ස වන පාද එක් සිතිලි ගීයෙකි. මෙ දෙක එක් වූ කලැ කඩවකෙකි. නම් සැහැලි බැඳීමෙහි දී ගැනෙනුයේ සමුද්‍රඝොෂ වෘත්තය මැ නො වේ. ''සිවු පෙදෙහි යම් විරිතක්'' යනුයෙන් කවර සිවුපද වෘත්තයක් වුව ද ගත හැකි බව කියැවිණ. සිතිලි ගීයෙහි දු මෙ මැ නය යි.

8. ල ප නො මැ වන් සඳ මෙන් සොමි. ගුණ ගිහි ණි
ඔ ප වැඩි ගත හෙල්මැලි සියුමැලි පැමි ණි
සැ ප රිසි දෙන වැනි රස බසැ'ති සිතුමි ණි
තොප දුකුමෙන් අප පින් කල බව දැනි ණි

ලප නො මැ වන් සඳ මෙන් සොමි ගුණ ගිහිණි, හෙල්මැලි සියුමැලි පැමිණි ඔප වැඩි ගත, රිසි සැප දෙන සිතුම්ණි වැනි රස බස් ඇති, තොප දුකුමෙන්, අප පින් කල බව දැනිණි.

**ලප නො මැ වන්**-ලාඤ්ඡනවිරහිත වූ, **සඳ මෙන්**-චන්ද්‍රයාට බඳු වූ, **සෝම් ගුණ**-සෞම්‍ය ගුණයෙන්, **ගිහිණ්**-ගහන වූ, **හෙල් මැලි**-කහලාර කුසුමයකට බඳු වූ, **සිසුමැලි පැමිණ්**-සුකුමාර බවට පැමිණියා වූ, **ඔප වැඩි**-කාන්තියෙන් අධික වූ, **ගත**-ශරීරයක් ඇත්තා වූ, **රිසි සැප දෙන**-අභිමත වූ හෙවත් කැමැති වූ සෞඛ්‍යසම්පත්තිය දෙන්නා වූ, **සිතුමිණී** වැනි-චින්තාමාණික්‍යයකට බඳු වූ, **රස බස් ඇති**-මධුර වචන ඇත්තා වූ, **තොප දැකු මෙන්**-යුෂ්මතුන් ගේ දර්ශනයෙන්, **අප පින් කළ බව**-අප විසින් පින් කරන ලද බව, **දුනිණ්**-අවබෝධ වී.

" ලප නැති සඳ මෙන් සෞම්‍ය ගුණයෙන් ගහන වූ, හෙල් මැලි මලකට බඳු සුකුමාරභාවයෙන් යුත් අධිකකාන්ති ඇති ශරීරයක් ඇත්තා වූ, රිසි සැප දෙන සිතුමිණී වැනි රස බස් ඇත්තා වූ තොප දැකීමෙන්, අප විසින් පෙර පින් කරන ලද බව දැනුණේ යැ " යනු භාව යි.

මෙහිනුදු දූතයා ගේ වර්ණනය කැරිණ. දූතයාට මැ කී වචන වන හෙයින් 'තොප' යී මධ්‍යමපුරුෂ සර්වනාම පදය යෙදිණ.

"ලප නො මැ වන් සඳ මෙනැ" යි කීමෙන් මේ දූතයා චන්ද්‍රයාටත් වඩා සෞම්‍යගුණයෙන් යුක්ත බව හැඟැවිණ. ලප හෙතුයෙන් චන්ද්‍රයා ගේ සෞම්‍යගුණයෙහි ඌනත්වයෙක් පැනේ. මොහුට එබඳු දෙෂයක් නැත්තෙන්, මොහු ගේ සෞම්‍යගුණය සර්වසම්පූර්ණ වේ. එ හෙයින්, මේ චන්ද්‍රයාට වඩා සෞම්‍යගුණ ඇත්තේ යැ.

මොහු ගේ රස බස් සිතුමිණී මෙන්, කෙ සේ නම් රිසි සැප දේ ද? සියලු සැපයෙහි පරමාර්ථය චිත්තප්‍රීතිය යි. රස බසින් චිත්ත ප්‍රීතිය අධික ලෙස ඇති වේ. සැපයෙන් ලැබෙන ප්‍රීතිය රස බසින් ඇති වේ නම්, ඒ රස බස් රිසි සැප දෙන්නේ නම්බු වේ මැ යි. මෙ, රස බස් සිතුමිණී මෙන් රිසි සැප දෙන එක් අයුරෙකි. මේ දූතයා, සවකිය මිත්‍ර වූ කාව්‍ය කර්තෘන් ගේ අදහස් වූ පරිදි, මේ සන්දේශය රැගෙනැ ගොස්, තමා ගේ මධුර වචනයෙන් විභීෂණ දෙවියන් ගේ සිත සම්පූර්ණයෙන් දිනා ගෙනැ, නුවණැති ඇමැත්තකු මෙන් කටයුතු නොවරදින සේ කථා කිරීමෙන්, කවීන් ගේ අභිමතාර්ථය සමෘද්ධ වෙයි. අන් කෙබඳු කටයුත්තක් ඇති කලැ ද මෙසේ මැ වෙයි. මේ, රස බස් රිසි සැප දෙන අනෙක් අයුරෙකි.

මේ දූතයා දැක්මෙන් කාව්‍යකර්තෘන් පින් කළ බව කෙ සේ දැනෙයි ද? පින් නම් සැප ගෙනැ දෙන්නේ යැ. සැප ඇති වූ

කලා, එයින් දූතෙනුයේ පෙර පින් කළ බව යි. මේ සැලළිහිණියා දක්මෙන් මධුරවචනශ්‍රවණ අභිමතාර්ථසිද්ධි යනාදි වූ ගණනා වැනියැ හැකි තරම් සැප ඉදුරා පහළ වූ බව පැහැදිලි වෙයි. එයින් දූතෙනුයේ පෙර පින් කළ බව මැ යි.

ටිප්පණි:—

1. **ලප**......සඳ–සඳෙහි සහ ලපයෙක් ඇත යනු ඇතැම් පුරාතනයන් සිතූ පරිදි යි. ඒ ඇති වූ පරිදි ශශජාතකය බලා දත්තේ යැ.

2. **හෙල්මැලි සියුමැලි පැමිණි**– හෙල්මැලි නම් දියෙහි පිපෙන කුඩා පුෂ්පවිශේෂයෙකි. "හෙල්මැලියෙහි සියුමැලි බවට පැමිණියේ යැ" යි කී කලැ "හෙල්මැලියෙහි සියුමැලි බවට සමාන වූ සියුමැලි බැවින් යුක්ත යැ" යනු හැගෙයි.

3. **සිතුමිණි**– සිතූ පැතූ දෙය දීමෙහි පොහොසතැ යි පුරාතනයන් සැලැකූ මැණිකෙකි. නාගමාණික්‍යය ද සිතුමිණෙකැ යනු ඇතැම් තන්හි කියන ලද.

4. **දූතිණි**– 'දන්' ධාතු යි. කර්තෘකාරක, අතීත, එකවචනයෙහි 'ඉණි' ප්‍රත්‍යයය වැ 'දන් + ඉණි' යි සිටි කල්හි, ධාතුස්වරග අනම්‍යාදේශයට පැමිණීමෙන් 'දූතිණි' යනු ලැබේ, (අනම්‍යාදේශය සුභාෂිත විවරණය බලා දත්තේ යැ.) 'දූතුණි' යනු අව්‍යක්තයන් ගේ යෙදුමෙකි. 'උණි' ප්‍රත්‍යයයෙක් සිංහලයෙහි නැති.

5. මේ 'සමුද්‍රඝොෂ' නම් වෘත්තයෙන් බැඳුණේ යැ. මේ වෘත්තයෙහි ලක්ෂණ මෙසේ දක්විණ :—

"දෙසෙන් අවින් යති-අටළොස් මතින් බඳ හොත්
වේ සමුදුරුගොස නම්-නිදසුන් ද දනු මෙ මෙසේ."

මාත්‍රා දශයෙන් ද අවින් ද යති නොවත් නැවැත්ම ඇති වැ, එක් එක් පාදය මාත්‍රා අටළොසෙකින් බැඳිණි නම්, ඒ සමුද්‍රඝොෂ නම් වන බව මෙයින් කියැවෙයි. දූත් කව් කියන සැටි සැලැකූ කලැ, දශයෙන් යති ඇති වන බවෙක් නො පෙනේ. මෙ තැන් පටන් ශ්‍රව්‍යාවසානය දක්වා මේ වෘත්තය වෙයි. මේ විශෙෂය සැලැකියැ යුතු:- පාදාන්තයෙහි යතිය වන හෙයින්, වෘත්තභේදය නොවනු පිණිස, එ තන්හි වූ ගුරු ලඝුවක් සේ ද, ලඝුව ගුරුක් සේ ද, ගිණියැ හැකි වේ.

"යති හෙයිනි කිසි ගුරු-ලුහු වේ ලුහු දු ගුරු වේ"

යනුයෙන් ඒ දක්විණ. මෙසේ ගත් කලැ, ගුරෙකින් අන්ත වූ පාදයෙහි මාත්‍රා එකුන් විස්සක් වුව ද, අටළොස ලෙස ගැනේ. මෙහි මැ—

"සුනිලේ පැහැය හැර සුදු වනු දැ ගත වෙලේ"

යනාදි පද්‍යය නිදර්ශන යි. එසේ මැ ලඝුවෙකින් අන්ත වූ පාදයෙහි මාත්‍රා සත ළොසක් වුව ද අටළොස වැ ගැනේ. මෙහි මැ--

"අවට සුපිපි සපු දුනුකේ සලලාන"

යනාදි පද්‍යය නිදර්ශන වේ. වෘත්තය පිළිබඳ සෙසු විශෙෂයෝ ඒ ඒ තන්හි දක්වෙති,

4. මි තු රු තු   මෝ දුක් සැප දෙකෙහි මැ පැවැ   ති
බි තු  සි තු   වම් රූ මෙන් පිටු නො පාවි   ති
යු තු  ම තු   වැඩ ම තෙපල එ වැනි ගුණ ඇ   ති
සි තු  න තු   කැරැ අස සහළුව වඩන රු   ති

මිතුරු තුමෝ පැවැති දුක් සැප දෙකෙහි මැ. බිතු සිතුවම් රූ මෙන්, පිටු නො පාවිති. එ වැනි ගුණ ඇති, රුති වඩන සහළුව, මතු වැඩ යුතු මි තෙපල, සිතු නතු කැරැ අස.

**මිතුරු තුමෝ**– මිත්‍රෝත්තමයෝ, **පැවැති**– පැවැත්තා වූ, **දුක් සැප දෙකෙහි මැ**– දුඃඛසෞඛ්‍යද්වයයෙහි මැ, **බිතු සිතුවම් රූ මෙන්**– භිත්තියෙහි වූ චිත්‍රකර්මරූපයන් මෙන්, **පිටු නො පාවිති**– පරාඞ්මුඛ නො වෙති හෙවත් පිටු නොපාන්නාහු වෙති. **එ වැනි**– ඒ හා සමාන වූ, **ගුණ ඇති**– ගුණයෙන් යුක්ත වූ, **රුති වඩන**– රුචි (අභිලාෂ) වර්ධනය කරන්නා වූ, **සහළුව**– මිත්‍රයාණෙනි, **මතු**– අනාගතයෙහි, **වැඩ යුතු**– වැඩ ඇත්තා වූ, **මි තෙපල**– මා ගේ වචනය, **සිතු නතු කැරැ**– චිත්තය අවනත කොටැ හෙවත් සිතු නමා, **අස**– ශ්‍රවණය කරව.

"මිත්‍රෝත්තමයෝ (සැබෑ මිත්‍රයෝ) පැමිණියා වූ දුක් සැප දෙක්හි මැ, භිත්තියෙහි අඳනා ලද සිතියම් රූප මෙන්, පිටු නො පාති. එ බඳු ගුණ ඇති, රුචිය වඩන්නා වූ යහළුව, මතු වැඩ යුතු හෙවත් මතු වැඩ සිදු කැරැ දෙන්නා වූ, මා ගේ වචනය, සිතු නමා අසව."

කාව්‍යකර්තෘන් හට අවශ්‍ය කාර්යයක් පැමිණැ සිටි හෙයින්, "සැබෑ මිතුරන් ගේ ස්වභාවය නම් දුක් සැප දෙකෙහි මැ නො හරනා බව යැ" යනු ප්‍රථම කොටැ සිහිපත් කැරැවූහ. කාර්යය කිරීමේ උත්සාහය වඩනු පිණිස, එය මතු වැඩ සිදු කැරැ දෙන කාර්යයක් බව ද කීහ.

ටිප්පණී:—

1. **පැවැති**– 'පවත්' (පැවැත්මෙහි) ධාතු යි. මේ එයින් වූ අතීත කෘදන්ත පද යි.

2. **බිතු සිතුවම් රූ මෙන්**– මෙහි ලා එක් ප්‍රශ්නයෙක් උපදී. ඉදිරි පිටැ සිටින් කලැ බිතු සිතුවම් රූ පිටු නොපාන බව නම් සැබෑ යැ; නමුත් භිත්තියෙහි අනෙක් පසට ගිය කලැ, ඒ රූ පිටු පෑයේ වෙයි; එ හෙයින් මෙහි ලා ගත යුත්තේ, බිතු සිතුවම් රූ පිටු පානා බව ද? නො හොත් පිටු නොපානා බව ද?

"සිතුවම් රුව ඉදිරියෙහි සිටියෙක් භිත්තියෙහි අනෙක් පසට ගියේ නම්, ඔහු රුවට පිටු පෑයේ නම් වෙයි. රුව ඔහුට පිටු පෑයේ නම් නො වෙයි,

මිත්‍ර වූ දෙදෙනකු ගෙන් එකෙක් මිත්‍රධර්මය රක්නේ නො හැර සිටී; අනෙක් තැනැත්තේ මිත්‍රධර්මය නොකැමැති වැ ඔහු හැර යෙයි. දොෂය නම් යන්නාහු අතැ යැ; සිටින්නාහු අතැ නො වේ. එ හෙයින් බිත්තු සිතුවම් රූ පිටු නොපානා බව කවීන් විසින් දක්විණ.” මේ එක් පක්ෂයෙකැ මතය යි.

“මිත්‍රයා ගේ සුඛදුඃඛාදි ඒ ඒ අවස්ථාවනට සුදුසු වන පරිද්දෙන් ඒ ඒ අතට හැරී හැරැසීමට නුසුදුසු වන බැවින්, අසත් මිත්‍රයෝ ද, භිත්තියෙහි චිත්‍ර රූපයෝ ද, සමාන වෙති. සිතුවම් රූ මුහුණ ලූ දෙසැ මැ සිටියැ හැකි වේ නම්, “සුව දුක්” යි දෙකෙක් කුමට ගැනේ ද? මුහුණ ලූ දෙස සුඛාවස්ථාව වැත්තෑ; අනෙක් පස දුඃඛාවස්ථාව වැත්තා. ඒ පසට නොහැරියැ හැකි වන බැවින් බිත්තු සිතුවම් රූ, දුක් සැප දෙකෙහි පිටු නොපානා මිතුරන් හට සමාන නො වේ. එ හෙයින් රූ පිටු පානා බව මෙහි ලා ගත යුත්තේ යැ.” මේ ඉතර පක්ෂයේ මතය යි. දෙ වැනි වැ දක්වුණු මතය යුක්තියුක්ත බව පෙනේ.

3. **පාවිති**– මේ අශුද්ධ පාඨයෙකැ යි හැගේ. ‘පා’ ධාතුව පාං-පාති යනාදීන් වර්තමානයෙහි වරනැගෙනුයේ ‘පාවිති’ යි රූපයක් නො දෙයි. “පිටු නො මැ පාති” යි ගැනිණි නම් දොෂය දුරු වෙයි. ‘පාවිති’ යනු ලෙඛකයකු ගේ භ්‍රමයෙන් පැමිණියේ සැ යි හැගෙතුදු, පිටපත්හි ආ හෙයින් වෙනස් නො කැරිණ. ‘පා + ඉති’ යි සිටි කල්හි ‘ව්’ කාරාගමයක් වතුදු ලැබියැ හැක්කේ ‘පවිති’ යන රූපය යි.

4. **සුනු මනු වැඩ**– මෙහි වැඩ යනු ‘වෘද්ධි’ යන අර්ථ ඇත්තේ යැ. වර්තමාන ව්‍යවහාරයෙහි දාසකර්මාන්තයෙහි වැටේ. පුරාතනභාෂායෙහි වැඩකරුවෙක් නම් හිත සලසන්නෙකි; වර්තමාන ව්‍යවහාරයෙහි දාසයෙකි.

5. **රුති වඩන**– මෙහි ‘රුති’ නම්, මිත්‍රයා නැවැතැ නැවැතැ දක්මටත්, ඔහු හා නිතර එක් වැ විසීමටත්, ඇති වන අභිලාෂය යි. ඒ අභිලාෂය ඇති වනුයේ, මිත්‍රයා ගේ ගුණ සම්පත්තිය හෙතු කොටැ ගෙනැ යැ. ඇතැම් අය ගේ දුර්ගුණත්වය නිසා, ඔවුන් දක්මේ රුචිය හීන වෙයි. උත්තම මිත්‍රයන් කෙරෙහි එබඳු සවභාවයෙක් නැති. ඔවුන් දක්මේ රුචිය දිනෙන් දිනැ මැ වැඩේ.

**5. ප වි රද සඳ නා ලෝ මුල් දිග‘තු බ ර**
**ලෙ වි තුරු සුසැදු යස මිණිමුතු මල් පත ර**
**ස වි සිරි පිරි සුර පුර වන් සැලණි පු ර**
**දෙ වි මෙ හසුන් විබිසණ සුරිඳුට පව ර**

පවු රද සඳ, නා ලෝ මුල්, දිගු අතු බර, ලෙවි තුරු, යස මිණිමුතු මල් පතර සුසැදු, සුර පුර වන් සව් සිර පිරි සැලණි පුරු, පවර විබිසණ සුරිඳුට මෙ හසුන් දෙවු.

**පවු රද**– පර්වත රජ නමැති, **සඳ**– ස්කන්ධයක් ඇත්තා වූ, **නා ලෝ**– නාගලොක නමැති, **මුල්**– මූලයන් ඇත්තා වූ, **දිගු අතු බර**– දිශා නමැති ශාඛාභාරයෙන් යුක්ත වූ, **ලෙව් තුරු**– ලොක නමැති වෘක්ෂයෙහි, **යස**– කීර්ති නමැති, **මිණිමුතු**– ප්‍රබුද්ධ වූ හෙවත් පිපුණා වූ, **මල් පතර**– කුසුමසමූහය, **සුසැදු**– සුසජ්ජිත කළා වූ, **සුර පුර වන්**– දිව්‍යපුරය මෙන්, **සව් සිරි**–

**සකලෛශ්වර්‍ය්‍යයෙන්, පිරි- පිරුණු වූ, කැලණි පුර- කල්‍යාණි පුරයෙහි, පවර- උතුම් වූ, විබිසණ සුරිඳුට-විභීෂණ සුරේන්ද්‍රයාට, මෙ හසුන්- මේ සන්දේශය, දෙවු- දෙනය කරව.**

දිව්‍යපුරය මෙන් සියලු සැපතින් පිරුණා වූ කැලණි පුරයෙහි උතුම් වූ විභීෂණ දෙව් රජාණන් හට මේ සන්දේශය දෙව්. කෙබඳු වූ විභීෂණ නම් දෙව් රජකුට ද? තමා ගේ කිර්තිය සියලු ලෝකයෙහි පතුරුවා හැරියා වූ විභීෂණ දෙව් රජුට යැ.

මේ දෙව් රජු ගේ කීර්තිය ලෝකය පුරා සිටි බව රූපකයෙන් කීහ. ලෝකය ගසෙකි. (මහාමෙරු) පර්වතරජයා ඒ ගසෙහි කඳ යි; නාගලෝකය මුලුයි; (පූර්වදක්ෂිණාදි) දිශාවෝ අතු යි. මේ දෙව් රජු ගේ කීර්තිය ඒ අතුවලැ පිපුණා වූ කුසුමසමූහය යි. මෙබඳු ගසෙක් නම්, සමස්තලෝකය වේ. "මොහු ගේ කීර්තිය එ බඳු ගසෙකැ මල් වී යැ" යි කීමෙන් හැඟැවෙනුයේ, ලෝකයෙහි ඒ කීර්තිය නොගිය අතක් නැති බව යි.

**පිළිසඳණි:—**

1. **පව් රද**– පර්වතවාචී 'පවු' ශබ්දය, 'උ' කාරාන්ත යැ. සිංහල පද්‍යයෙහි 'වි' 'වු' යන දෙඅකුර බොහෙවින් අභෙද සේ සැලැකෙන්, 'ය්' 'යි' දෙක ද එසේ මැ යැ. 'ය්' 'යි' දෙක සො තරම් අභෙද සේ සැලැකෙයි ද යත හොත්, හල් 'ය'කාරය භාෂාවෙහි අභාවිත වූ සේ පෙනේ. 'වු'කාරාන්ත ශබ්දයන් වර නැඟෙන කලැ 'ව' කාරය සාමාන්‍යයෙන් ද්විත්වයට පැමිණේ. 'පවු' ශබ්දය ද පව්ව- පව්වට- පව්වෙන්- පව්වෙහි- ඈ විසින් වරනැඟෙයි. හලන්ත ශබ්දයන් ගේ අන්ත 'ව'කාරය ද්විත්වයට නො පැමිණේ. හලන්ත වූ 'කව්' ශබ්දය වර නැඟෙනුයේ කව- කවට- කවින්- කවෙහි- ඈ විසිනි.

'පවු රද' යනුයෙන් පර්වතයන් ගේ රජ වූ හිමාලය පර්වතය ගැනේ. අන්‍ය පර්වත නාමයක් සමඟ යෙදුණු කලැ, 'පවු රද' යන්නෙහි අර්ථය නම් 'මහා පර්වතය' යනු යි. මෙහි 'පවු රද' යනුයෙන් මහාමෙරුව ගැනිණ. ඒ කවිසමයට විරුද්ධ සේ පෙනේ. ''නා ලෝ මුල්'' යි නො කියැවිණි නම්, මෙ තන්හි දු හිමාලය පර්වතය නො ගත හැක්කේ නො වේ.

2. **නා ලෝ**– මේ මුහු මෙර පත්ලෙහි ඇතැ යි සැලැකෙන දිව්‍යනාගයන් ගේ වාසභූමිය යි.

3. **දිගු අතු බර**– මෙහි දිගු නම් දශ දිශාවෝ යැ. 'අතු බර' යනුයෙන්, අතු, ගණනිනුදු ප්‍රමාණයෙනුදු මහත් බව හැඟැවූහ.

4. **සුසැදු**– 'සු' යා උපසර්ගපූර්ව වූ 'සද' (සැදුම්හි) ධාතු යි. 'සුසැදූ' යන තන්හි අන්ත්‍යස්වරය ඡන්දොහෙතුයෙන් හ්‍රස්ව වී යැ. 'මනා ලෙස සැදුවා වූ' යනු අර්ථ යි.

5. **යස මිණිමුතු මල් පතර**– 'යස' නම් කීර්තිය යි. ඒ සුදු යැ යනු කවි සමය යි. (කවි සමය නම්, වූයේ හෝ නොවූ හෝ වේවා, "මේ මෙ දේ මෙසේ මෙසේ යැ" යි කවීන් විසින් සැරැ ගන්නා ලද සම්මතය යි,

පිපුණු මල් ද, අවිශෙෂ කොටැ දක්වුණු කලැ, සුදු සේ ගැනේ. එ හෙයින් යශ- සට බෙහෙවින් මල් උපමාන කොරෙති. මිණියෙන් මුතු මිණිමුතු. මෙහි 'මිණි' නම් පුෂ්පකොෂය යි. 'මුතු' යනු 'මුක්ත වූයේ යැ' (මිදුණේ යැ) යන අර්ථ ඇත්තේ යැ. 'පතර' නම් සමූහය යි.

6. **දෙව්**- 'දෙවු' යන විධික්‍රියා පදය ද උකාරාන්ත යැ.

7. **සැලළිණි පුර**- මෙහි 'පුර' යනු 'පුරැ' යන තන්හි 'ඇ'කාරය එළි වැට රැකැ ගන්නා පිණිස 'අ'කාර බවට පමුණුවා ගත් තැනි. මේ පෙරැළිය එළිසම කවි හා ඇති වූවෙකි. ගද්‍යභාෂාවට කිසි සේත් අවශ්‍ය වූවෙක් නො වේ. 'ඇ'කාර ශ්‍රුතපාඨය මැ සුඛාවබොධයට ඉවහල් වේ. මෙය උච්චාරණය කිරීමේ දී කට ඇද කළ යුතු බවක් අඟවමින්, ඇතැම්හු සරදම් කොරෙති. ස්වභාවයෙන් මැ ඇද වූ කට නම්, 'අ'කාරය උච්චාරණය කරන කලැ ද, ඇද වේ. 'ඇ'කාරය උසුරුවන කලැ කට ඇද වුව හොත්, ඒ දුස්සාධ්‍ය වූ රොගයෙකි. 'මා අත තුබූ පොත"- "මා අතැ තුබූ පොත" යන දෙ තන්හි අර්ථභෙදය සැලැකීමෙන්, 'ඇ'කාරයා ගේ අවශ්‍යභාවය අවබොධ කළ හැකි වේ.

8. **විභීෂණ සුරිඳුට**- විභීෂණ නම් රාවණ රජු ගේ සහෝදර වූ රාක්ෂයෙකි. මොහු සුරිඳකු වූ පරිදි මතු කියැවෙයි.

## (2) ජයවර්ධනපුරවර්ණනා.

**6. ගන වන් මියුරැ නද දෙන ගුවනැ වන් විට**
**විලසින් මෙ මා කරවන මිතුර මන් තුට**
**එ හසුන් පැසුළු පවසම් රස නුසුන් කොට**
**අස දූන් න යන මගැ සලකුණු මෙතැන් සිට**

ගුවනැ වන් විටැ මියුරැ නද දෙන ගන වන්, විලසින් මෙ මා මන් තුට කර වන මිතුර, එ හසුන්, රස නුසුන් කොටැ, පැසුළු පවසම්. දූන්, මෙ තැන් සිටැ න යන මගැ සලකුණු අස.

**ගුවනැ වන් විටැ**- ආකාශයට පැමිණියා වූ කාලයෙහි, **මියුරැ**-මයූරයනට, **නද දෙන**- සන්තොෂ දානය කරන්නා වූ, **ගන වන්**- මෙඝයක් මෙන්, **විලසින්**- විලාසයෙන්, **මෙ මා**- මේ මා ගේ, **මන්**-සිත, **තුට කරවන**- සතුටට කරවන්නා වූ, **මිතුර**- මිත්‍රය, **එ හසුන්**- ඒ සන්දෙශය, **රස නුසුන් කොටැ**- රස නො සිඳැ හෙවත් රස නැති නො කොටැ, **පැසුළු**- පසු වැ, **පවසම්**- ප්‍රකාශ කෙරෙමි; **දූන්**- මේ කාලයෙහි, **මෙ තැන් සිටැ**- මේ ස්ථානයෙහි සිටැ, **න යන**- නොප යන්නා වූ, **මගැ**- මාර්ගයෙහි, **සලකුණු**- සඞ්කෙතයන්, **අස**- ශ්‍රවණය කරව.

ආකාශයට පැමිණි කල්හි මොනරුනට සන්තොෂය දෙන්නා වූ වලාකුළ මෙන්, ශරීරවිලාසයෙන් මා ගේ සිත තුටු කරවන්නා වූ මිත්‍රය, ඒ සන්දෙශය, රස නැති නො කොටැ හෙවත් රසවත් කොටැ, පසු වැ කියමි. දූන් මෙ තැනැ සිටැ නා යන්නා වූ මාර්ගයෙහි සලකුණු අසව.

මෙයින් කවීහු මාගීවණීනය කිරීමට අවසර ගත්හ. තමන් ගේ මිත්‍රයා චිත්තසන්තොෂය කරවන පරිදි ද වැනූහ. ආකාශ යට පැමිණි-වැසි වලාකුළක් දුටු කලැ මොනරු මහත් සන්තොෂ යට පැමිණෙති; කෙකා හඬ නඟති; පිල් විදහා නටති. වැසි වලා කුළෙහි විලාසයෙන් මැ, ඔවුනට ඒ සන්තොෂය ඇති වේ. එ මෙන් මැ, මේ සැල ළිහිණියා ගේ ශරීරවිලාසයෙන් මැ කාව්‍යකතීෘන් ගේ සන්තොෂය උපදී.

**විසඳුම්:-**

1. **දෙන**– 'දෙ' (දීමෙහි) ධාතුයෙන් මේ නිපන. ඇතැමෙක් 'දා' (දීමෙහි) ධාතුවක් කියති. ඒ සිංහලභාෂායෙහි ලැබෙන්නෙක් නො වේ.

2. **පැසුළු පවසමි**– 'පැසුළු' යනු 'පසු වැ' යන අර්ථයෙහි අව්‍යය පද යි. එ හෙයින් 'පවසමි' යනු අනාගතාර්ථ දෙන්නෙන් වේ. "කවර හෙයින් වර්‍තමාන රූපයෙන් යෙදිණි දූ?" යි ඇසුව හොත්, සිදත්සඟරා විසරණ මැ ප්‍රමාණ කොටැ ගත්තාහු, "මේ පෙරළියෙකැ"යි කියත් මැ යි. සියලු තන්හි මැ මෙසේ වන දෙය පෙරළියෙක් නම්, නොපෙරළි වනුයේ කිමෙක් ද? 'කියනෙමි' යි යෙදිණි නම්, සිදතට මහත් සැනැසිල්ලෙකි. "විශෙෂයෙන් අනාගතාර්ථය දෙන ක්‍රියාප්‍රත්‍යයෙක් සිංහලයෙහි නැතැ" යි ගත් කලැ, මේ පෙරළි දුරු වෙයි.

3. **රස තුසුන් කොටැ**– මෙයින් ගත යුතු අර්ථය 'රසවත් කොටැ යනු යි. යමෙකැ රස සුන් නො කැරිණි නම්, ඒ රසවත් වෙයි.

7. **පොහොසද් දන ඇති තුනුරුවනැ බැති පෙ මා**
**මු ළු ව ද් ද න සුර පුර පිරි සිරින් හැ මා**
**ජ ය ව ද් ද න කැරුමෙන් සුසැදු නම න මා**
**ජ ය ව ද් ද න පුරවර දනු මිතුරු තු මා**

තුනුරුවනැ බැති පෙමා පොහොසත් දන ඇති, පිරි හැමා සිරින් සුර පුර මුළු වද්දන, ජය වද්දන කැරුමෙන් නම න්මා සුසැදු, ජයවද්දන පුරවර, මිතුරු තුමා, දනු.

**තුනුරුවනැ**– රත්නත්‍රයවිෂයයෙහි, **බැති පෙමා**– භක්ති ප්‍රෙම ඇත්තා වූ, **පොහොසත් දන ඇති**– ප්‍රභූජනයා ගෙන් යුක්ත වූ, **පිරි**– පූණී වූ, **හැමා සිරින්**– සියලු ඓශ්වයීයෙන්, **සුර පුර**– දිව්‍යපුරය, **මුළු වද්දන**– මුළු ගන්වන්නා වූ, **ජය වද්දන කැරුමෙන්**– ජයවඩීනය කිරීමෙන්, **නම නමා**– සවකීය නාමය, **සුසැදු**– මොනවට සැදූවා වූ, **ජයවද්දන පුරවර**– ජයවඩීන පුර ප්‍රවරය, **මිතුරු තුමා**– මිත්‍රොත්තමය, **දනු**– ජානනය කරව.

මේ සන්දෙශය ගෙනැ යන්නා වූ දූතයා විසින් යම් පුරයෙ කින් පිටත් වියැ යුතු ද, "ඒ ජයවඩීන පුරය දනුව" යි මෙයින් කීහ. මුල් තුන් පදයෙන් ඒ කෙබඳු පුරයෙක් ද යනු කියැවිණ,

ඒ. ශ්‍රද්ධාවන්ත පූර්වයෙහි රත්නත්‍රයයෙහි භක්ති හා ප්‍රේම ඇත්තා වූ පොහොසත් ජනයෝ ඇත්තාහ. ඒ ජයවර්ධන පුරය පිරුණා වූ සියලු ඓශ්වර්යයෙන් දිව්‍යපුරය මුලු ගන්වයි; හෙවත් පරදවයි. ඒ ජයවර්ධන පුරය ජයවර්ධනය කිරීම හෙතු කොටැ ගෙනැ තුමූ ... නාමය මනා ලෙස සැදූයේ යැ; හෙවත් ජයවර්ධන කර්තෘ ... ඒ පුරයට ජයවර්ධන යන නාමය ඉතා හොබනේ යැ. මේ බඳු වූ ජයවර්ධන පුරවරය, මිත්‍රොත්තමය, දනුව.

**විප්‍රකෘති:—**

1. **තුනුරුවනැ**– තුන් + රුවනැ. 'උ' කාරාගම යි. බුද්ධ ධර්ම සඞ්ඝ යන මොහු තුනුරුවන් නම් වෙති.

2. **මුලු වද්දන**– මුලු වැදීම නම් මුල්ලකට යෑම යි. ප්‍රභූ වූයේ ඉදිරිපත් වෙයි; දීන වූයේ මුලු වදී. "ජයවර්ධන පුරය සුර පුර මුලු වද්දනී" යි කී කලැ, එයින් හැඟෙනුයේ ශ්‍රී සම්පත්තීන් ජයවර්ධන පුරය සුර පුරය පරදවන හෙයින්, සුර පුරය විළි වැදු මුලු ගැන්වෙන බව යි.

3. **ජය වද්දන සැරුමෙන් සුසැදූ නම නමා**– මේ පුරය අන් පුරයන් පරදවා ජය ගනී. මේ පුරයෙහි රජ දරුවෝ අන් රජ දරුවන් පරදවා ජය ගනිති. සිටුහු අන් සිටුන් පරදවා ජය ගනිත්. පඬිහු අන් පඬින් පරදවා ජය ගනිත්. සෙස්සෝ ද එසේ මැ වෙත්. මෙසේ ජයවර්ධනය කරන්නා වූ මේ පුරය තෙමේ මැ තමා ගේ 'ජයවර්ධන' යන නාමය මනා ලෙස සාදා ගත්තේ යැ. මෙයින් 'ජයවර්ධන' යන නාමය මේ පුරයට අන්වර්ථ බව හැඟැවූහ.

4. **සැරුමෙන්**– "කිරුමෙන්" 'කොරුමෙන්' යි තවත් පාඨ දෙකෙක් වේ. 'කොරුමෙන්' යනු සිනා උපදවන්නා වූ මහාඅව්‍යක්ත ශෙද්‍රමෙකි. 'කර' ධාතුයෙන් 'කැරුමෙන්' යනු ලැබේ. 'කොරුමෙන්' යනු ලැබීමට නම් 'කොර' ධාතුවක් ඇති වියැ යුතු යි. ඇතැම් පිටිසර මැහැල්ලෝ නම් "වැඩ කොර නවා," "වැඩ කොළා" යනාදින් 'කොර' ධාතුවක් ද ඇති බව දක්වති. මෙය ශිෂ්ටයනට අනභිමත වන බැවින් නිග්‍රාහ්‍ය යි. 'කිරුමෙන්' යනු ව්‍යාකරණ රීතින් නොලැබියැ හැක්කෙක් නො වේ. 'බණ' 'ගණ' ආදි ගණයට අයත් ධාතූහු බිණීම්-බිණුම්-ගිණීම්-ගිණුම්- ආ විසිනුදු භාවකෘදන්තපදයන් නිපදවත්. මෙ බඳු තන්හි ධාතු මුලැ 'අ'කාරය 'ඉ'කාර බවට පැමිණේ. මෙ නයින් බලන කලැ, 'කර' ධාතුයෙන් නිපදනා 'කිරීම්' යනු මෙන් මැ 'කිරුම්' යනු ද ශාස්ත්‍රීය බව පෙනේ.

5. **ජයවද්දන පුරවර**– දැනට කෝට්ටය යන නමින් ප්‍රසිද්ධ ස්ථානයෙහි අලගක්කෝනාර මන්ත්‍රීශ්වරයන් විසින් කරවන ලද නගරය යි. විස්තර නිකායසඞ්ග්‍රහය බලා දත්තේ යැ.

8\. සැදි රත නඹර පෙළ රන තිසරුන් රුවැ' නි
වි දි දිය දහර ලෙළ දෙන දිගු නරු පටැ' නි
රැ දි රළ රැළැ'නි හොය දියවන්නා නමැ' නි
ඇ දි පුර අගන පෙම සළ සිරි රැපැ යි නි

**රත තඹර පෙළ සැදි, රත තිසරුන් රූ ඇති, විදි දිය දහර ලෙළ දෙන දිගු තරු පට ඇති, රැදි රළ රැළි ඇති, දියවන්නා නම් ඇති හොය, පුර අගන ඇදි පට සළුසිරි නිති ඇර පෑ යි.**

**රත තඹර පෙළ**– රක්තතාමරසපඞ්ක්තියෙන්, **සැදි**– සජ්ජිත වූ, **රන තිසරුන්**– සුවර්ණහංසයන් ගේ, **රූ ඇති**– රූපයන් ඇත්තා වූ, **විදි**– විසිරී ගියා වූ, **දිය දහර**– ජලධාරා නැමැති, **ලෙළ දෙන**– ලීලෝපෙත වූ, **දිගු**– දික් වූ, **තරු පට ඇති**– තරු පටක් ඇත්තා වූ, **රැදි**– රැඳුණා වූ, **රළ රැළි ඇති**– තරඞ්ග නමැති රැළි ඇත්තා වූ, **දියවන්නා නම් ඇති**– දියවන්නා (ජුවන්නා) යන නාමයක් ඇත්තා වූ, **හොය**– නදී තොමෝ, **පුර අගන**– මේ ජයවර්ධනපුර නමැති ස්ත්‍රිය, **ඇදි**– ඇඳ සිටියා වූ, **පට සළු සිරි**– පට්ටවස්ත්‍රයෙකැ ශොභාව, **නිති**– නිරන්තරයෙන්, **ඇර පෑ යි**– ගෙනැ හැර දක්වූ.

මෙසින් නගරය වටා සිටි දියවන්නා නම් හොය වැනිණ. කවර හෙයින් පළමු කොටැ මැ ඒ වැනිණි ද? නගරයක් වැනී මෙහි දී කවිහු ප්‍රථම කොටැ පරිඛාව හෙවත් දිය අගල ද, ඉක්බිති පවුර ද, පසු වැ සෙසු නගරාඞ්ගයනුදු ගනිත්. මේ නගරයෙහි පරිඛාව නම්, ස්වභාවයෙන් පිහිටි දියවන්නාව යි.

රතු නෙළුම් පෙළින් සැදුණා වූ, ස්වර්ණහංසයන් ගේ රූප ඇති, විසුරුණා වූ ජලධාරාව නමැති ලෙළ දෙන්නා වූ දික් වූ තරු පට ඇති, රැඳුණා වූ රළ නමැති රැළි ඇති, දියවන්නා නම් වූ හොය, (මේ ජයවර්ධන) පුරය නමැති ස්ත්‍රිය ඇන්ද වූ පට සළුවෙකැ ආකාරය නිරන්තරයෙන් ගෙනැ හැර දක්වී යැ.

මේ පුරය වටා සිටි දියවන්නා හොය ස්ත්‍රියක විසින් අඳනා ලද පට සළුවක් වැන්නැ. කෙබඳු පටසළුවක් වැනි ද? රතු නෙළුම් මල් (රූප) ඇති, ස්වර්ණහංසයන් ගේ රූප ඇති, දික් තරුපටක් ඇති, රැළි ඇති, පට සළුවක් වැන්නැ. කෙසේ නම් මෙබඳු සළුවක් වැනි වේ ද? හොයෙහි ද රතු නෙළුම් මල් ඇත; ස්වර්ණහංසයෝ ද ඇත්තාහ. එ හෙයින් හොය රත් නෙළුම් මල් රූප හා ස්වර්ණහංසරූප ඇති පට සළුවක් වැනි වේ. හොයෙහි විසුරුණා වූ දිය දහරෙක් ඇත. ඒ සළුයෙහි ලෙළ දෙන්නා වූ දික් වූ තරු පට වැන්නැ. හොයෙහි රළ ඇත. ඒ සළුයෙහි රැළි වැනි වේ. මෙ සෙයින් දියවන්නා හොය ජයවර්ධනපුර නමැති ස්ත්‍රිය හැදැ ගත් පට සළුව වැන්නැ.

විපසුණ්:—

1. **සැදි**– මෙහි 'සැදි' යනු 'සැරසුණා වූ' යන අර්ථ ඇත්තේ යැ.

2. **රන තිසරුන් රූවැති**– 'රන්' යනු විශේෂණ වැ සිටිනා කලැ 'රන'යි සමාසගත ද වෙයි. "ලඞ්කාවෙහි හංසයන් නැත්තෙන් මෙ වර්ණනාව දෙනුවිරෙව නො වේ දැ?" යි ඇතැමෙක් පුළුවුසිති. කවිසමයානුකූල වැ එ සේ කතා වේ. ජලාශයෙක් වී නම්, එහි හංසයන් වැනීම කවිසමය යි,

3. **විදි දිය දහර**– පුරාණ ව්‍යාඛ්‍යානයෙහි "එක් දිශාභාගයෙකින් ආවරණ වශයෙන් බඳනා ලද පාෂාණයෙහි විකීර්ණ වූ ජලධාරාවැ"යි කියන ලද. දිය පහර වැදී ඉවුරු බිඳී යෑම වළකනු පිණිස එක් පසෙකැ බැඳි ගලක් ඇති බව ද, හොය එහි වැදීමෙන් දිය දහරක් ඇති වන බව ද, මෙයින් පෙනේ.

4. **දියවන්නා**– මේ දුන් 'ජුවන්නා' යන නාමයෙන් දනේ. 'දිය වන්නා' යනු මැ ග්‍රාමීණ ව්‍යවහාරයෙහි 'ජුවන්නා'යී වි.

5. **රැපෑයි**– ඇරැ+පෑ+යී. මේ 'ඇරැ' යනු 'ඉදිරියට පමුණුවා' යන අර්ථ ඇත්තේ යැ.

**9. සමනො ල   මුහුල මහ සමුදුර මෙවුල් බ   ර**
**සු ල ක ල   පුවල ලක'ගන සිරි සොවුන් ව   ර**
**තර ක ල   විසල් වාසල් සතුරු මෙ නුව   ර**
**බැඳෑ හල   රුවන් තන පට කියෙලිසෑ පවු   ර**

මෙ නුවර විසල් වාසල් තර කළ සතුරු පවුර, සමනොළ මුහුළ, මහ සමුදුර මෙවුල් බර, සුලකළ පුවළ ලක් අගන, සිරි සොවුන් වර බැඳෑ හළ, රුවන් තන පට කියෙලි යැ.

**මෙ නුවර**– මේ නගරයෙහි, **විසල්**– විශාල වූ, **වාසල්**– ගොපුරයන්, **තර කළ**– ස්ථිර කළා වූ, **සතුරු**– යන්ත්‍ර ඇති වූ, **පවුර**– ප්‍රාකාර තෙම, **සමනොළ මුහුළ**– සමන්තකූට නමැති කොශකලාපයක් ඇත්තා වූ, **මහ සමුදුර මෙවුල් බර**– මහා සමුද්‍ර නමැති මෙඛලාභාරයක් ඇත්තා වූ, **සුලකළ**– අතිශයින් අලංකෘත වූ, **පුවළ**– පෘථුල වූ, **ලක් අගන**– ලඞ්කාඞ්ගනාව, **සිරි**– ඓශ්වර්‍යයෙන්, **සොවුන් වර**– යෞවනයෙහි, **බැඳෑ හළ**– බන්ධනය කොටැ හරන ලද්දා වූ, **රුවන් තන පට**– රත්නමය පයොධරපට්ටය, **කියෙලි සෑ**- ප්‍රකාශ කෙළේ යි.

නුවර පවුර මෙයින් වර්ණිත යි. මේ නුවර මහත් දොරටු ස්ථිර (නොහැරියැ හැකි) කළා වූ යතුරු ඇති ප්‍රාකාර තෙම සමන්තකූටය නමැති කෙස් වැටිය ඇති, මහා සමුද්‍රය නමැති මෙවුල් බරක් ඇති, ඉතා අලඞ්කෘත වූ, (දුන්) ප්‍රෞඪ වැ හෙවත් (ඓශ්වර්‍යයෙන්) වැඩී සිටින්නා වූ, ලඞ්කා නමැති අඞ්ගනාව විසින් (තමා) ඓශ්වර්‍යයෙන් තරුණ කල්හි, බැඳා, හැර දමන ලද්දා වූ, රත්නමය වූ තන පට දක්වී යැ.

මේ නුවර පවුර කෙබඳු ද? ලඞ්කා නමැති අඞ්ගනාව තමා තරුණ කල්හි බැඳා, වැඩී සිටින්නා වූ මේ කාලයෙහි හැර දමූ රුවන් තන පට වැන්නැ. සොවුන් වර බැඳීමටත් දුන් හැර දැමීමටත් හෙතු කිම? සොවුන් වර බැඳි තන පට, පෘථුල් වූ වර කුඩා වෙයි. සත්‍රියක යොවුන් වර පයොධර මහත් නො වේ,

එ හෙයින්, බැඳෙන තන පට ද මහත් නො වේ. වැඩී සිටින කලැ පයොධර ඉතා මහත් යැ. එ කලට, පෙරැ බැඳි තන පට කෙ සේ නම් සෑහේ ද? ලඞ්කා නමැති අඞ්ගනාව ඓශ්වර්යයෙන් තරුණ වූ කල්හි බැඳි තන පට නම් මේ පවුර යි. දැන් ඒ ප්‍රමාණ නො වේ. කවර හෙයින් ද? දැන් ලඞ්කාඞ්ගනාව ඓශ්වර්යයෙන් ප්‍රෞඪ වැ හෙවත් වැඩී සිටිනා හෙයිනි. එ හෙයින්, පෙරැ බැඳි තන පට මෙ සේ හැරැ දැමිණ. ලඞ්කාඞ්ගනාව හඳුන්වා දෙනු පිණිස සමන්තකූටපර්වත නමැති කෙශකලාපයක් හා මහාසමුද්‍රය නමැති මෙඛලාභාරයක් ඇති බව ද, ඉතා අලඞ්කෘත බව ද, දැන් ප්‍රෞඪ බව ද, කීහ.

පවුර ඉතා විශාල බව ද, ඉතා සුදු බව ද මෙයින් හැඟ විණ. විශාලත්වය හැඟෙනුයේ කෙසේ ද? "ලඞ්කාඞ්ගනාව ඓශ්වර්යයෙන් තරුණ වූ කල්හි බැඳි තන පට වැන්නැ" යි කීමෙනි. දැන් මඳ වුව ත්, තරුණ කල්හි සකල ලඞ්කා නමැති අඞ්ගනාවට තරම් වූ තන පට ඉතා මහත් වියැ යුතු මැ යි. ලඞ්කාඞ්ගනාව ගේ මහත් බව, සමනොළ මුහුළ සේ ද, මහ සමුදුර මෙවුල් බර සේ ද, දක්වීමෙන්, වෙසෙසින් හඟවන ලද. සුදු බව හැඟෙනුයේ කෙසේ ද? "රුවන් තන පට"යි රත්නයෙන් කළ තන පටක් ගැන්මෙනි. මෙහි 'රුවන්' යනුයෙන් ගැනෙනුයේ පළිඟු යි. ඒ ඉතා සුදු යැ. එ හෙයින්, රුවන් තන පට හා සමාන කැරැණු පවුර ද ඉතා සුදු බව හැඟේ.

විසඳුම්:—

1. **සමනොළ**– 'සමන්තකූට' යන්නෙන් ආයේ යැ. ඇතැමෙක් "මෙය 'සුමනාලය' යන්නෙන් ආයේ යැ; එහෙයින් (දන්ත්‍ය) 'ල' කාරයුක්ත වියැ යුතු යැ"යි කියති. මෙ සේ කීමට පෙරැ, 'සුමනාලය' යන්නෙහි වයස ද, පුරාණ ලිපිවලැ 'සමනොළ'යි යෙදීමට හෙතු ද, විමැසියැ යුතු වේ.

2. **මෙවුල් බර**– 'මෙඛලාභාර' නම් මහත් වූ, එ හෙයින් මැ බර වූ මෙඛලාව යි. ස්ත්‍රීන් ගේ ඉඟෙහි බැඳෙන දමය මෙඛලා නම් වේ.

3. **පුවළ, යොවුන්**– සොළොස් විය ඉක්මැවූ ස්ත්‍රිය තිස් හැවිරිදි වන තුරු මැ තරුණ නම් වේ. පස්පණස් හැවිරිදි වූවා ප්‍රෞඪ යි.

4. **වාසල්**– පිටතැ දොරටුව 'වාසල්' නම් වේ. තවත් නමෙක් නම් 'බිස දෙර' යනු යි.

5. **කිසෙලිසැ**– කිසෙලී+ යැ. 'කිසෙලී' යනු 'කියොල' (ප්‍රකාශ කිරීමෙහි) ධාතුයෙන් නිපන් ආඛ්‍යාත පද යි. ඇතැමෙක් මෙය 'කියා ලී යැ' යන්න යැ යි සිතා අරුත් බෙණෙති. 'කියොලන' 'කිසෙලී' යනාදි ජෙකප්‍රයොගයන් ගෙන් ඒ මතය වැරැදි බව ඍජුව වේ.

10.* සිහිල් සපු සුවඳ ගෙනෑ එන උයන් ව ල
සිසිල් නොළෙන් හඬවන මිණි කිකිණි සෑ ල
විපුල් රත් සෙමෙර බඳ රන් දද සස ල
ලකල් මෙ පුර තුළෑ වලහා රිවි කැවු ල

උයන්වලැ සිහිල් සපු සුවඳ ගෙනෑ එන, සිසිල් නොළෙන් මිණි කිකිණි සැළ හඬවන, විපුල් රත් සෙමෙර බඳ, සසල රන් දද, ලකල් මෙ පුර තුළෑ රිවි කැවුල වළහා.

**උයන්වලැ**- උද්‍යානයන්හි, **සිහිල් සපු**- චන්දන (සඳුන්) චම්පක පුෂ්පයන් ගේ, **සුවඳ**- සුගන්ධය, **ගෙනෑ එන**- ඇරැ ගෙනැ එන්නා වූ, **සිසිල්**- ශීතල වූ, **නොළෙන්**- මාරුතයෙන්, **මිණි කිකිණි සැල**- මාණික්‍ය කිඞ්කිණී සමූහය, **හඬවන**- ශබ්ද කරවන්නා වූ, **විපුල්**- විපුල වූ හෙවත් මහත් වූ, **රත් සෙමෙර**- රක්ත චාමරයන්, **බඳ**- බඳනා ලද්දා වූ, **සසල**- චඤ්චල වූ, **රන් දද**- සුවර්ණධ්වජයෝ, **ලකල්**- මනොඥ වූ, **මෙ පුර තුළැ**- මේ පුරයා ගේ අභ්‍යන්තරයෙහි, **රිවි කැවුල**- සූර්‍ය්‍යාතපය, **වළහා**- පහ කෙරෙත්.

උයන්වලැ සඳුන් සපු සුවඳ ගෙනෑ එන්නා වූ ශීතල වූ සුළඟින් මැණික් රහු සමූහය හඬවන්නා වූ, මහත් රත් චාමර බඳනා ලද, චඤ්චල වූ රන් කොඩි, මනොහර වූ මේ නුවර තුළැ සූර්‍ය්‍යාතපය වළක්වයි.

*මෙහි සඳුන් මල් සපු මල් සුවඳින් මිශ්‍ර වූ මාරුතවර්ණනා යෙන් හා රක්ත චාමර රන් පතාකා වර්ණනා කිරීමෙන් ද, වසන්ත කාලයෙහි එ නුවරැ පවත්නා වූ මකරධ්වජපූජෝත්සව

---

* සමහර පිටපතෙකැ දස වැන්න ලෙස පෙනෙන-

දු ව න බඳ කිකිණි හය කුර පහර න ද
ස ව න තළ නිනද ගිජ්දුන් සෙමෙර බ ඳ
ර ව න නොයෙක තුරු ජය සක් හඬ නො ම ඳ
දෙ ව න මුහුද මෙන් ගුම් ගති පුර නිබ ඳ

යන පද්‍යයෙහි පදාර්ථ මෙසේ වේයි:-

බඳ-බඳනා ලද, කිකිණි-කිඞ්කිණි ඇති වැ, දුවන-ධාවනය කරන්නා වූ, හය-අශ්වයන් ගේ, කුර පහර නද- ඛුරප්‍රහාර නාදයෙන් ද; බඳ-බඳනා ලද, සෙමෙර-චාමර ඇත්තා වූ, ගිජ්දුන්-ගජේන්ද්‍රයන් ගේ (ඇතුන් ගේ) සවන තල නිනද- කර්ණතාල ශබ්දයෙන් ද (කන් තල පහරින් හටගන්නා ශබ්දයෙන් ද) රවන-නාද කරවනු ලබන්නා වූ, නොයෙක තුරු-නොයෙක් වූ තූර්‍ය්‍යයෙන් ද, නොමිඳ-අමන්ද වූ, ජය සක් හඬ- ජයශඞ්ඛ නාදයෙන් ද, පුර-(මේ) නගර තෙම, දෙවන මුහුද මෙන්-ද්විතීය සමුද්‍රයක් මෙන්, නිබඳ-නිරන්තරයෙන්, ගුම් ගති-ඝොෂ ග්‍රහණය කෙරේ.

දැක්වූහු" යනු පුරාණ ව්‍යාඛ්‍යානයෙහි ආයේ යැ. මෙ නයින් සල සාන කලැ, මේ වසන්තකාලය බව පෙනේ. පොතැ අනෑ දැක්වුණු-

"පැරකු ම් රජුට පන්තිස් වන නවම් ම ස
ම න ර ම් සැරැ බඳහු මෙ හසුන් නො වි ල ස
අ යෑ දු ම් ලෙසට සිදු කැරැ කිවිඳු අදහ ස
දෙ වි ර ම් මිතුරැ දිනි ගබ බිසොවට සන ස"

යන පද්‍යයෙන් හැඟෙනුයේ, මේ සන්දේශය නවම් මසැ කැරුණු බව යි. නවම් මසැ වසන්ත කාලයෙක් නො ලැබේ.

"නවම් මැදින්දින හා– සිසිල් සිසිර කල් නම්"

යනු රුවන්මලෙහි කිහ, පරාක්‍රමබාහු නරෙන්ද්‍රයෝ. වසන්ත කාලයට ගැනෙනුයේ බක් වෙසක් දෙමස යි. එ ද, රුවන් මලෙහි කියැවිණ-

"බක් වෙසක් වසත්" යි.

මේ සන්දේශය නවම් මසැ කැරුණු බව සත්‍ය වේ නම්, මේ වර්ණනාව මෙ තන්හි නුසුදුසු වෙයි.

සඳුන් සපු මල් ඇති වනුයේ වසන්ත කාලයට යි. වසන්ත කාලයෙහි රාගය බලවත් වෙයි. එ හෙයින් එ කලැ අනඞ්ග පූජෝත්සව පවත්වති. රතු සෙමෙර බැඳි රන්වන් වස්ත්‍රයෙන් කැරුණු දද ගැනෙනුයේ අනඞ්ගපූජෝත්සවයෙහි දී යැ.

"රිවි තැවුල වළහා" යි කීමෙන් නගරශෝභය වසා සිටිනා තරම් මහත් ගණනක් කොඩි බැඳි බව හැඟැවිණ.

**විසඳුම්**:–

1. **ශිහිල්**– සඳුන් සපුරු සපු යනාදීනට මේ නම් වේ. සංස්කෘතයෙහි 'ශිතල' යනු ද ඒ අර්ථ ඇත්තේ යැ. මෙහි සඳුන් ගැනිණ. ලක්දිවැ සඳුන් වැනුම කාව්‍යසමයයට අනුකූල ද යනු විමැසියැ යුත්තෙකි.

2. **නෙලෙන්**– නල + එන්=නලෙන්=නෙලෙන්. ස්වරපරරූප යි.

3. **මිණි කිකිණි**– 'කිංකිණී' (කිඞ්කිණී) යනුයෙන් රනු ගැනේ. මෙහි මැණික් යොදා කරන ලද රනු සලකා 'මිණි කිකිණි'යි කීහ. මෙ කී මිණි කිකිණි සැල ඇතියේ ධ්වජයන්හි යැ.

4. **රත් සෙමෙර**– මේ සෙමෙර ධ්වජයන් ගේ කොන්හි බැඳේ.

5. **ළහල්**– ළයට හල් ළහල්. "හිතට සානන වූ හෙවත් සතුටු උපද වන්නා වූ" යනු අර්ථ යි. ඇතැමෙක් තතු නො දැනැ "අලඞ්කෘත වූ" යන අර්ථයෙහි ද 'ළහල්' යි යොදති, අලඞ්කෘතාර්ථයෙහි යෙදෙනුයේ 'ලකළ' යනු යි. ඒ කිසි කලෙකත් හලනහ වැ නො සිටී. එහි ආදි 'ල'කාරය කිසි සේත් මූර්ධන්‍ය නො වේ.

6. **වලඟා**- 'වලඟ' ධාතුයෙන් වූ කර්තෘකාරක, වර්තමාන, ප්‍රථම පුරුෂ එක වචන, ආඛ්‍යාතපද යි. මෙයින් උක්ත වනුයේ 'දද' යනු යි. ඒ බහු වචන යැ. ඒ හා එක බඳු වූ ආඛ්‍යාතපදය කෙසේ ගැළපේ ද? සිංහලයෙහි නපුංසක ලිඞ්ගයෙහි වූ පදය බහු වචන වුව ද, එකවචනයෙහි වූ ආඛ්‍යාතපද යක් මැ ගනී. මේ රීතිය නො දැන, දත් ඇතැම්හු "ගස් වැටෙති" යනාදීන් අපභ්‍රංශ ලියති.

**11. තර සර හිමි මහල් මෙහි පහ පෙළැ නිතො ර**
**සුර සිදු විදුදරන් සැදි සඳලු මනහ ර**
**කර වන මඟුල් කෙළියෙන් නොමැති අවස ර**
**පුර සිරි බලන ලෙස බට සුර විමන් යු ර**

මෙහි තරසර හිමි මහල් පහ පෙළැ, නිතොර සුර සිදු විදුදරන් සැදි, මන හර සඳලු, කරවන මඟුල් කෙළියෙන් අවසර නො මැ ඇති පුර සිරි බලන ලෙස බට සුර විමන් අයුර.

**මෙහි**- මේ නගරයෙහි, **තරසර**- ස්ථිරසාර වූ, **හිමි**- උස් වූ, **මහල්**- තුන් මහල් පස් මහල් ආදියෙන් යුක්ත වූ, **පහ පෙළැ**- ප්‍රාසාද පඞ්ක්තියෙහි, **නිතොර**- නිරන්තරයෙන්, **සුර සිදු විදු දරන්**- දෙවසිද්ධවිද්‍යාධර (රූප) යන් ගෙන්, **සැදි**- සජ්ජිත වූ, **මන හර**- මනොහර වූ, **සඳලු**- චන්ද්‍රශාලාවෝ, (කෙබඳු ද යත්) **කර වන**- (නාගරිකයන් විසින්) කරවනු ලබන්නා වූ, **මඟුල් කෙළියෙන්**- මඞ්ගලක්‍රීඩායෙන්, **අවසර නො මැ ඇති**- අවකාශයක් නැත්තා වූ, **පුර සිරි**- (මේ) පුරශ්‍රීය, **බලන ලෙස**- නරඹන පරිද්දෙන්, **බට**- (අහසින් බිමට) බැස්සා වූ, **සුර විමන් අයුර**- දෙව විමානයන් හා සමානයහ.

මේ නගරයෙහි ඉතා ශක්තිමත් වූ, උස් වූ මහල් ඇති, ප්‍රාසාදපඞ්ක්තියෙහි, නිරන්තරයෙන් දෙවසිද්ධවිද්‍යාධර (රූප) යන් ගෙන් සැරැසුණා වූ මනොහර වූ චන්ද්‍රශාලාවෝ, කරවනු ලබන්නා වූ මඞ්ගලොත්සවක්‍රීඩායෙන් අවකාශයක් නො මැ ඇත්තා වූ නගරයෙහි ශ්‍රීය හෙවත් ඓශ්වර්‍ය්‍යය බලන පරිද්දෙන් බැස්සා වූ, දිව්‍යවිමාන වැන්නෝ යැ.

මෙයින් ඒ නගරයෙහි ප්‍රාසාද ඉතා උස් බව හා දිව්‍යවිමාන මෙන් විසිතුරු බව ද, ඒ ප්‍රාසාදයන් ගේ චන්ද්‍රශාලාවලැ නිතර දිව්‍යසිද්ධවිද්‍යාධරයන් ගේ රූප ඇති බව ද, නගරය නිරතුරු පැවැත්වෙන මඟුල් කෙළියෙන් යුක්ත බව ද කියහ. පුර සිරි බලන ලෙස බටුවත්, දිව්‍යවිමානයෝ අහස්හි ඉතා ඉහළැ නවතිත්. එබන්දක් හා සමාන චන්ද්‍රශාලා ඇති වීමට නම් මේ නුවර ප්‍රාසාදයෝ ඉතා උස් වියැ යුත්තාහ. සෙස්ස පැහැදිලි යි.

**විවරණ:-**

1. **විදුදර**- 'විද්‍යාධර' යනු දු දෙවයොනි විශෙෂයකට නම වේ.

7. සඳලු- චන්ද්‍රශාලා නම් පහ මුදුන්හි වූවෝ යැ.

8. බටු- 'බස්' (බැස්මෙහි) ධාතුයෙන් සිද්ධ යි. මේ ධාතුව වර නැගෙනුයේ බසී-බසිති-බටි-බටු-ආදී විසිනි.

12. සි සි වන වුවන ඉඟ සුඟ ගත හැකි මිටි න
නි සි පුළුලු'කුල රිය සක යුරු තිසර ත න
දි සි රන ලියෙ'ව රූ සිරි යුත් මෙපුර'ඟ න
ඇසි පිය හෙළන පමණි'න් නො වෙති දෙව'ඟ න

**සිසි වන**- චන්ද්‍රයාට බඳු වූ, **වුවන**- මුහුණු ඇත්තා වූ, **මිටින**- මුෂ්ටියෙන්, **ගත හැකි**- හැර ගත හැක්කා වූ, **ඉඟ සුඟ**- ස්වල්ප වූ හෙවත් කෘශ වූ මධ්‍ය ප්‍රදේශ ඇත්තා වූ, **රිය සක අයුරු**- රථ චක්‍රාකාර වූ, **නිසි**- යොග්‍ය වූ, **පුළුල් උකුල**- පළල් වූ උකුළ ඇත්තා වූ, **රන ලිය එව**- ස්වර්ණ ලතාවක් මෙන්, **රූ සිරි යුත්**- රූපශ්‍රීයෙන් යුක්ත වූ, **මෙ පුර අඟන**- මේ පුරස්ත්‍රීහු, **ඇසිපිය හෙළන පමණින්**- අක්ෂිපක්ෂ්මස්පන්දනමාත්‍රයෙන් හෙවත් ඇසි පිය හෙළන්නා වූ පමණින්, **දෙව් අඟන නො වෙති**- දිව්‍ය ස්ත්‍රීහු නො වෙත්.

“දිව්‍යාඞ්ගනාවෝ ඇසිපිය නො හෙළති; ජයවර්ධන පුරයෙහි ස්ත්‍රී හු ඇසිපිය හෙළති; වෙනස මෙ පමණෙකි. මුහුණ, ඉඟ, උකුල, තන, සාමාන්‍ය රූපය යනාදි අන් සියලු අන්දමින් මේ දෙපක්ෂයෙහි මඳෙකුදු වෙනසෙක් නැත” යනු මෙයින් හැඟැවුනු.

ඒ ස්ත්‍රීන් ගේ මුහුණ සඳ වැන්නැ; ඉතා සිහින් වූ ඉඟ මිටින් ගත හැක; නිසි වූ පුළුල් වූ උකුල රිය සක වැන්නැ; තන හංස යන් වැන්නැ; ස්වර්ණලතා මෙන් පෙනෙන රූපශ්‍රී ඇත. එබඳු වූ ඒ ස්ත්‍රීහු ඇසිපිය හෙළන පමණින් දිව්‍යාඞ්ගනාවෝ නො වෙති.

**විසඳුම්:—**

1. **ඉඟ සුඟ**- මෙහි 'සුඟ' යනු 'ටික' යන අර්ථ ඇත්තේ යැ. 'ඉඟ ටික' යි කී කලැ එයින් හැඟෙනුයේ “ටික වූ හෙවත් සිහින් වූ ඉඟ” යනු යි. වර්තමාන කථාව්‍යවහාරයෙහි නම් 'හුඟ' (සුඟ) යනු යෙදෙනුයේ 'බොහෝ' යන අර්ථයෙහි යැ.

2. **නිසි**- කුමකට නිසි ද? රුචි ඉපැදවීමට නිසි යි,

3. **රන ලිය එව් දිසි**- මෙයින් ඒ ස්ත්‍රීන් ගේ ශරීර රන් වන් බව ද, කොමල බව ද හැඟැවුනු.

4. **ඇසිපිය**- ඇස් + පිය. 'ඉ'කාරාගම යි.

13. සොඳුරැ සිය නදන් අනුතුරැ දෙසැ සිටි න
කිනු රැ නිසසරන් සාදහස වෙනැ නොව න
ඉසු රැ දනද සිය නිකෙලෙස් නැනැ රඳ න
උතු රැ දිගිඳු පුර දිනි මෙ පුර වැජැඹෙ න

සොඳුරැ සිය නදන්, අනුතුරැ දෙසැ සිටිනා, කිනුරැනිසසරන් සාදහස වෙනැ නොවනා, ඉසුරැ දනද සිය, නිකෙලෙස් නැනැ රඳනා, වැජැඹෙනා මෙ පුර, උතුරැ දිගුඳු පුර දිනි.

**සොඳුරැ සිය නදන්**- සුන්දර වූ සිය ගණන් නිධාන ඇත්තා වූ, **අනුතුරැ දෙසැ සිටිනා**- අනුත්තර දිශායෙහි පිහිටියා වූ, **කිනුරැනිසසරන්**- කින්නරයන් හා නිශාචරයන්, **සාදහස**- කිසි කලෙකත්, **වෙනැ නොවනා**- සමීප නොවන්නා වූ, **ඉසුරැ දනද සිය**- ඊශ්වරධනදශතයන් හෙවත් සිය ගණන් ඊශ්වරයන් හා ධන දයන් ඇත්තා වූ, **නිකෙලෙස් නැනැ රඳනා**- කෙලෙස් නැති තන්හි රඳන්නා වූ, **වැජැඹෙනා**- විජෘම්භමාන වූ, **මෙ පුර**- මේ පුරය, **උතුරැදිගුඳු පුර**- උත්තරදිශාධිපතිහු ගේ පුරය, **දිනී**- පැරදූවී යැ.

උතුරු දිශාවට අධිපති වූ වෙසවුණු රජහු ගේ අලකා නම් පුරය හා මේ ජයවර්ධන පුරය අතර ඇති වෙනස දක්වා, සියලු අතින් මේ පුරය මැ දිනන බව මෙයින් කීහ

සුන්දර වූ සිය ගණන් නිධාන ඇති, උතුරු නොවන්නා වූ ඉද්ද හෝ නො හොත් අන් සියලු දෙසට මැ වඩා උතුම් වූ දිශායෙහි පිහිටියා වූ, කින්නරයන් හා නිශාචරයන් ඉද්ද හෝ නො හොත් නින්දිත මනුෂ්‍යයන් හා සොරුන් කිසි කලෙකත් සමීප නොවන්නා වූ, ඊශ්වරයන් හා වෛශ්‍රවණයන් ඉද්ද හෝ නො හොත් අධිපතීන් හා ධනපතීන් සිය ගණන් ඇත්තා වූ, කෙලෙස ඉද්ද හෝ නො හොත් දුක් නැති තන්හි රඳන්නා වූ, (මේ කියැවුණු ලකුණින්) ප්‍රකාශ වූ මේ පුර තෙමේ, උතුරු දික් පතිහු ගේ පුරය දිනී යැ.

"සොඳුරු සිය නදන්" යනාදි සියල්ල මෙ පුර විශේෂණය සොරේ. එ හෙයින් පරදනා වූ උතුරුදිගිඳු පුර කෙබඳු දැ යි මේ පද්‍යයෙන් නො හැගේ. ඒ නගරයේ සවභාවය ලොක ප්‍රසිද්ධ යැ. ප්‍රසිද්ධ වූ ඒ නගරලක්ෂණයන් හා සසඳ බලා, මෙ පුර දිනන පරිදි දත යුතු. ශිෂ්‍යයා ගේ සුඛාවබෝධය පිණිස, උතුරු දිගිඳු පුරවනන ඉස් මූල් තුන් පදය වෙනස් කොටැ, පද්‍යය මෙසේ ගත හැකි එව:-

නිස රැ නව නිදන් යුතු'තුරැ දෙසැ සිරි — න
කිඳුරැ නිසසරන් නිරතුරැ වෙනැ මැ ව — න
ඉසුරැ' දනද එක සකෙලෙස් තැනැ රද — න
උතුරැ දිගිඳු පුර දිනි මෙ පුර වැජැඹෙ — න

මෙයින් නගර දෙකෙහි භේදය පළ වෙයි.

අලකාවෙහි ලෝවැස්සනට නිරර්ථක හෙයින් අසුන්දර වූ හෙවත් මනොහර නොවන්නා වූ නිධාන නවයෙකි. ජයවර්ධන පුරයෙහි වනාහි ලොකයාට අර්ථදායක වූයෙන් සුන්දර වූ නිධාන සිය ගණනෙකි. අලකාව උතුරැ දෙස්හි සිටියේ යැ. උතුර, මඞ්ගලසම්මත වූ දිශාවෙක් නො වේ. ජයවර්ධන පුරය අනුතුරැ හෙවත් තමා හට වැඩියක් නැති දෙස්හි සිටියේ යැ. අලකාව සියලු කල්හි කින්නරනිශාචරයනට වාසස්ථාන වෙයි. කින්නර නිශාචරයෝ ජයවර්ධන පුරයට කිසි කලෙකත් ළං නො වෙත්. අලකාවෙහි සිටිනුයේ එක ඊශ්වරයෙකි. ජයවර්ධන පුරයෙහි සිය ගණන් ඊශ්වරයෝ වෙත්. අලකාවෙහි ඇතියේ එක් ධනදයෙක් හෙවත් ධන දෙන්නෙකි. ජයවර්ධන පුරයෙහි සිය ගණන් ධනදයෝ ඇත්තාහ. අලකාව කෛලාස හෙවත් කෛලාසය ඇති තන්හි වෙයි. ජයවර්ධන පුරය වනුයේ කෙලෙස් හෙවත් දුක් නැති තන්හි යැ. එහෙයින් මේ සියලු අන්දමින් මැ ජයවර්ධන පුරය අලකාව දිනනුයේ මැ යි.

විශෙෂ:—

**1. සිය නිදන්**– පුරාතන ඇතැම් ධනවත්හු තමන්ගේ වස්තුව නිධාන කළහ. එ හෙයින් ධනවතුන් ඇති නගරයෙකැ බොහෝ නිධාන ඇති වීම ආශ්චර්යයෙක් නො වේ. අලකාවෙහි නව නිධානය නම්-

"මහාපද්මශ්ච පද්මශ්ච ශඞ්ඛො මකරකච්ඡපෞ
මුකුන්දනන්දනීලාශ්ච ඛර්වශ්ච නිධයො නව"

යනුයෙන් දක්වුණු (1) මහාපද්ම '(2) පද්ම, (3) ශඞ්ඛ, (4) මකර, (5) කච්ඡප, (6) මුකුන්ද (7) නන්ද. (8) නීල, (9) ඛර්ව යන මේ යැ.

**2. අනුතුරැ දෙසැ**– උතුරැ නොවනුයෙ අනුතුරැ, නොහොත් උතුරක් නොවනුයේ යමකට ද එයේ අනුතුරැ. මෙයි 'අනුතුරැ' යන්නෙන් අර්ථ දෙකක් ගත මනා යැ. අලකාව හා ඇති වෙනස දක්වනු පිණිස "උතුර නොවන" යන අර්ථ ගැනේ. ජයවර්ධනයට ප්‍රශංසා පිණිස "උත්තමනම හෙවත් අන් සියල්ලට මැ වඩා උසස් වූ" යන අර්ථය ගැනේ.

**3. කිඳුරැ නිසසරන්**– කිඳුරැ නම් කින්නරයෝ යැ. 'කින්නර' යනු දෙවතාවිශෙෂයකට නම්. කින්නරයෝ දෙවියනට ගායනය කෙරෙති. ඔවුනතුරෙහි ඇතැමෙක් අශ්වමුඛ හා නරශරීර ඇත්තාහ; ඇතැමෙක් නර මුඛ හා අශ්වශරීර ඇත්තාහ. මෙ සේ මනුෂ්‍ය රූපය මොවුන් කෙරෙහි විකෘත

වැ පිහිටි හෙයින් මොහු 'කිංනර' නම් වූහ. සංස්කෘතයෙහි "කිං නරඃ" යනු "කිම නරයෙක් ද?" යන අර්ථ ඇත්තේ යැ. එයින් හැඟැවෙනුයේ "නින්දිත මනුෂ්‍යයෙකැ" යනු යි. මෙ සේ වචනාර්ථවශයෙන් බලන කලැ මේ 'කිංනර' යනුයෙන් නින්දිත මනුෂ්‍යයෝ ද ගැනෙති. මේ දෙ අරුතින් අලකාපක්ෂයෙහි දී දිව්‍යගායකයෝ ද, ජයවර්ධනපක්ෂයෙහි දී නින්දිත මනුෂ්‍යයෝ ද හැඟැවෙති. මේ දෙපක්ෂයට මැ එක මැ 'කිංනර' නාමය යොදනුයෙන් "අලකායෙහි කිංනරයන් වෙති"යි ද "ජයවර්ධනයට කිංනරයන් ලං නො වෙති" යි ද වචනයෙන් වෙනස දක්විය හැකි වේ.

'නිසසර' යනු 'නිශාචර' යන්නෙහි ආයේ යැ. නිශාචරයෝ නම් රෑ හැසිරෙන්නෝ යැ. එ හෙයින් මේ යක්ෂරාක්ෂසයනට නම්. සොරුනුදු රෑ හැසිරෙන බැවින්, මේ නම ඔවුන් කෙරෙහි දු වැටේ.

අලකායෙහි වනාහි කිංනරනිශාචරයෝ (දෙවගායකයන් හා යක්ෂරාක්ෂසයෝ) නිරතුරු සිටිත්. නමුත් ජයවර්ධනයට කිංනරනිශාචරයෝ (නින්දිත මනුෂ්‍යයන් හා චෞරයෝ) කිසි කලෙකත් ලං නො වෙත්. මෙ තන්හි ද භෙදය හැඟැවෙනුයේ වචනයෙන් පමණෙකි. මෙසේ එක මැ වචනයෙන් දෙපක්ෂය කට ගත හැකි අර්ථ දෙකක් දක්වෙන කලැ, ඊට "ශ්ලෙෂ යැ" යි කියත්. 'අනුතුරු' යනු ද ශ්ලෙෂ යි.

4. **කදහස**– "කිසි කලෙකැ" යන අර්ථයෙහි අව්‍යය පද යි.

5. **ඉසුරු දනද සිය**– 'ඉසුරු' යනු, ඊශ්වර දෙවි, 'අධිපති' යන අර්ථ දෙක්හි මැ වැටේ. ඊශ්වරයෝ කෛලාස නම් පර්වතයෙහි වසන්නෝ යැ. අලකාව ද එහි මැ වෙයි. ඔහු අලකාධිපති වූ (කුවෙර) වෛශ්‍රවණයනට මිත්‍ර වෙයි. ත්‍රිමූර්ති නම් වූ බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර යන මොවුන් අතුරෙහි තෘතීය වූ වෝ මේ ඊශ්වරයෝ යැ. "ජයවර්ධනයෙහි ඉසුරු සිය ඇතැ"යි කී කලැ ගැනෙනුවෝ මේ ඊශ්වරයෝ නොවෙති. 'ඊශ්වර' යනු අධිපතීන් කෙරෙහි දු වැටෙනුයෙන් එතන්හි අධිපති මනුෂ්‍යයෝ ගැනෙත්. මේ මෙසේ නමුත් "අලකායෙහි ඇත්තේ එක ඊශ්වරයෙකැ; ජයවර්ධනයෙහි වනාහි සිය ගණන් ඊශ්වරයෝ ඇත්තාහ"යි කී කලැ දෙ තන්හි මැ යෙදුණේ එක මැ 'ඊශ්වර' ශබ්දය වන බැවින්, දෙ නුවර අතර මහත් වෙනසක් ඇති සේ පෙනේ. මෙ ද ශ්ලෙෂයෙකි.

'දනද' යනු 'ධනද' යන්නෙහි ආයේ යැ. ධන දෙනුයේ ධනද යි. සකල ලොකයෙහි ධනවත්නට අග්‍ර වූ (අලකාධිපති) වෛශ්‍රවණයනට මේ නම්. වචනාර්ථ සැලැකූ කලැ, ධන දෙන කවරක්හු හට වුව ද මේ නම ගත හැකි වේ. අලකායෙහි එක් ධනදයෙකි, (වෛශ්‍රවණයෙකි). ජයවර්ධනයෙහි සිය ගණන් ධනදයෝ (ධනවත්තු) වෙත්. මෙ තන්හි ධනද' යනු ශ්ලෙෂ යි.

6. **නිකෙලෙස් නැනැ**– මෙහි 'කෙලෙස්' යනු 'කෛලාස පර්වත' 'දුක්' යන දෙ අරුත්හි යෙදිණ. අලකාව 'සකෙලෙස්' හෙවත් කෛලාසය ඇති තන්හි වෙයි; ජයවර්ධනය නිකෙලෙස් හෙවත් දුක් නැති තන්හි වෙයි. මෙහි කෙලෙස් යන්නෙහි ශ්ලෙෂය වී.

කෛලාසය නම් හිමාලයයෙහි උතුරින් පිහිටි පර්වතයෙකි. නිරතුරු තුෂාරයෙන් වැසී සිටි හෙයින්, මේ පුළුන් පොදක් සේ සුදු යැ. එ හෙයින් සුදු දෙයට කවීහු කෛලාසය උපමා කෙරෙති, මේ ඊශ්වරයන් ගේ වාසස්ථානය යි.

7. **උතුරුදිගිඳු පුර**– (උතුරුදිගු + ඉඳු) උතුරු දිගට අධිපති වූ වෛශ්‍රවණයෝ යැ. ඔහු ගේ පුරය අලකාව යි.

8. **වැජඹෙන**– ‘වජඹ’ ධාතුයෙන් වේ. ‘ප්‍රකාශ වන’ යනු මෙතැන්හි අර්ථ යි.

## (4) නිෂ්ක්‍රාන්තිය.

14. උදේ සැපත සුර ගුරු අලු කැරැ අවට
සදේ මුඳුන් පත අස්විද නැකැතැ සිට
නදේ සිතින් තම කුල දෙවිය සිහි කොට
යෙදේ ගමන් සහැව මෙ පුරෙන් තොපට

සුරගුරු අවට අලු කැරැ උදේ සැපත, අස්විද නැකැතැ සිටැ සදේ මුඳුන් පත, නදේ සිතින් තම කුල දෙවිය සිහි කොටැ, සහැව, තොපට මෙ පුරෙන් ගමන් යෙදේ.

**සුරගුරු**– බෘහස්පතිහු, **අවට අලු කැරැ**– හාත්පසින් ආලෝක කොටැ, **උදේ සැපත**– උදා වීමට පැමිණි කල්හි, **අස්විද නැකැතැ සිටැ**– අශ්විනී නම් වූ නක්ෂත්‍රයෙහි සිටැ, **සදේ**– චන්ද්‍රයා, **මුඳුන් පත**– (අහසැ) මධ්‍යයට පැමිණි කල්හි, **නදේ සිතින්**– සන්තොෂ චිත්තයෙන්, **තම කුල දෙවිය**– ස්වකීය කුල දෙවතාව, **සිහි කොටැ**– ස්මරණය කොටැ, **සහැව**– මිත්‍රය, **තොපට**– යුෂ්මතුන් හට, **මෙ පුරෙන්**– මේ පුරයෙන්, **ගමන් යෙදේ**–ගමන යහපති.

බෘහස්පතිහු හාත්පස ආලෝක කොටැ උදයට පැමිණි කල්හි, අස්විද නැකැතෙහි සිටැ සඳ (අහස්) මුඳුනට පැමිණි කල්හි, සතුටු සිතින් තමා ගේ කුල දෙවිය සිහි කොටැ, මිත්‍රය, තොපට මේ පුරයෙන් ගමන යහපති.

ගමනාරම්භයට ශුභමුහූර්තය මෙයින් දක්වූහ.

මේ සඳහා පුරාණ ව්‍යාඛ්‍යානයෙහි මෙසේ කියැවිණ:– “මේ කාව්‍යයෙහි අස්විද නැකැත මුඳුන් වූ කල්හි කර්කටක ලග්නය සම්භව වීම ද, ඒ ලග්නයෙහි සිටි බෘහස්පතිහු උච්චක්ෂෙත්‍රගත වැ රශ්මිසහිත වැ බලවත් බව දක්වීමෙන් “ලග්නස්ථඃ සර්වදොෂඝ්නඃ” යන නිර්දෝෂභාවයෙන් යෙදීම ද,–

‘සන්ධ්‍යාකාලමතික්‍රම්‍ය කිඤ්චිදුදෘශ්‍යන්ති තාරකාඃ
යොගො'යං විජයො නාම සර්වකාමිෂු පූජිතඃ’ *

යන විජයයොගයෙන් යෙදීම ද, ‘අශ්විනී ගමනෙ ශ්‍රෙෂ්ඨා’ යන නක්ෂත්‍රයොගය ද දක්වූහු.”

* සන්ධ්‍යාකාලය ඉක්මවා මඳක් තරු දකින් ද, මේ විජය නම් යොගය යැ; සියලු ක්‍රියාවන්හි පූජිත යැ.

මනුෂ්‍යයාට කෙසේ වුව ද, සැල ළිහිණියාට නම් මේ යෝගය යහපත් බව නො පෙනේ. සැල ළිහිණියා දිවාචරයෙකි. (දවල් හැසිරෙන්නෙකි.) එ හෙයින් ඒ කෙසේ නම් රාත්‍රිචර්‍යාවට සුදුසු වේ ද ?

ටිප්පණි:—

1. **උදේ සැපත–** උදය=උද්+අය = උද්+ඒ = උදේ. නපුංසකලිංග යෙහි වූ පදයන් ගේ 'අ'කාරයෙන් පර වූ 'ය'කාරයට පර වැ ද 'අ'කාරයෙක් වී නම්, ඒ දෙ පසැ 'අ' කාර සහිත වූ 'ය' කාරයට 'ඒ' කාරයෙක් ආදෙශ වෙයි. බලය=බලේ, ගුණය=ගුණේ, යනාදිය ද නිදසුන යි.

2. **සුරගුරු–** වෘහස්පති නාම් ග්‍රහයා.

3. **සඳේ–** මේ 'සඳ' යි සිටියැ යුතු තැනි. 'දේ' යන්නෙන් වූ එළි වැටෙහි යෙදෙන පිණිස 'සඳ' යන්නෙහි අගැ 'අ'කාරය 'ඒ' කාර බවට පැමිණිවිණ.

4. **අස්විද නැකැත–** අශ්විනී නක්ෂත්‍රය නම් සත් විසි නැකැතින් පළමු වැන්න යි. නක්ෂත්‍ර යනු චන්ද්‍රකක්ෂයෙහි පිහිටි තාරකාසමූහයන්ට නම්. එබඳු තාරකාසමූහයෝ සත්විස්සෙකි. එක් එක් සමූහයට චන්ද්‍රයා පැමිණි විටැ ඒ තාරකා සමූහයට නම් වූ නැකැතට සඳු පැමිණියේ යැ යෙති. අශ්විනී නක්ෂත්‍රයෙහි තාරකාවෝ තුන් දෙනෙකි.

5. **කුල දෙවිය–** යම් කිසිවකු ගෙන් සිරිත් වශයෙන් ගරු බුහුමන් ලබන දෙවි, ඔහු ගේ කුල දෙවි නම් වේ. සැල ළිහිණියා ගේ කුල දෙවි ස්ත්‍රියක බව 'කුල දෙවිය' යන යෙදුමෙන් පැනේ. පුරුෂ වී නම් 'කුල දෙවි' යි හෝ 'කුල දෙවියා' යි හෝ යෙදියැ යුතු වේ. ගිරාසන්දේශයෙහි–

"එතරම් පසිඳු සරසව් දෙවිය අනැවැසි"

යනු තන්හි 'දෙවිය' යනු ද, කාව්‍යශේඛරයෙහි–

"මේ කීමෙකැ යි කී යා
බලමින් නො දුකැ දෙවි යා"

යන තන්හි 'දෙවියා' යනු ද, පිළිවෙළින් ස්ත්‍රී අර්ථයෙහි ද පුරුෂාර්ථයෙහි ද යෙදුණු 'දෙවි' ශබ්දය දක්වයි.

15. නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙ ඩි
පුල හෙළ කුසුම ලිය පියතෙපල රන් කෙ ඬි
සල සුදු සෙමෙර සෙස සක් ගිජිඳුනො'ද වැ ඩි
බල සුබ නිමිති පෙර මඟැ නැකැතමත් වැ ඬි

සුවඳ මුදු නල, පිරි කුඹු, මියුරු අඹ ගෙඩි, පුල හෙළ කුසුම්, පියතෙපල ලිය, රන් කෙඩි, සල සුදු සෙමර, සෙස් සක්, ඔද වැඩි ගිජිඳුන්, නැකැත වත් වැඩි සුබ නිමිති, පෙර මඟැ බල.

**සුවඳ**- සුගන්ධයෙන් යුක්ත වූ, **මුදු**- මෘදු වූ, **නල**- මාරුතය ද, **පිරි කුඹු**- පූර්ණකුම්භයන් හෙවත් පිරුණා වූ කළ ද, **මියුරු**- මධුර වූ, **අඹ ගෙඩි**- ආම්‍රඵල ද, **පුල**- පිපුණා වූ, **හෙළ කුසුම**-සුදු මල් ද, **පියතෙපල**-ප්‍රිය වචන ඇත්තා වූ, **ලිය**-ස්ත්‍රීන් ද, **රන් කෙඬි**- ස්වර්ණ භෘඞ්ගාර ද, **සල**- සැලෙන්නා වූ, **සුදු සෙමර**- ශ්වෙත චාමර ද, **සේ සත්**- ශ්වෙතච්ඡත්‍ර ද, **ඔද වැඩි**- ඕජෝගුණ, යෙන් අධික වූ, **ගිජිඳුන්**- ගජේන්ද්‍රයන් හෙවත් ඇතුන් ද (යන), **නැකැතටත් වැඩි**- නක්ෂත්‍ර යොගයටත් වඩා විශිෂ්ට වූ, **සුබ නිමිති**- ශුභ නිමිත්තයන්, **පෙර මඟැ**- ඉදිරි මාර්ගයෙහි, **බල**- අවලොකනය කරව.

සැල ළිහිණියා යන ගමන සඵල වන බවට පෙර නිමිති ඉදිරියෙහි දක්නට ලැබෙන බව මෙයින් කීහ. මෙහි කියැවුණු එක් එක් නිමිත්ත මඞ්ගලසම්මත යෑ.

**විසඳුම්-**

**1. ලිය පියතෙපල**– 'තේපල' යන්නෙහි ප්‍රකෘතිය 'තෙපුල්' යනු යි. 'අ' විභක්තිය ගත් කලැ මේ 'තෙපුල' යී සිටී. ඉක්බිති 'පු' යන්නෙහි වූ 'උ'කාරය ලොප් වැ, 'තෙප්ල' යනු ද, 'උ'කාරය පරරූපයට පැමිණීමෙන් 'තෙපල' යනු ද ලැබේ. 'වැඹුම්' යනුයෙන් 'වැඹම' යනු ද 'සඳුන්' යනුයෙන් 'සඳන' යනු ද මේ නයින් සිද්ධ යෑ.

2. **ඔද වැඩි**– 'ප්‍රීතියෙන් මත් වූ' යනු මෙ තන්හි අර්ථ යි.

3. **නැකැතටත් වැඩි**– මෙහි පිටත් වූ නැකැත නම් ඉතා යහපත් යෑ. දක්නට ලැබෙන සුබ නිමිති නැකැතටත් වඩා යහපත් බව මෙයින් කියැවේ. එ හෙයින් කීහ, පුරාතන ව්‍යාඛ්‍යානයෙහි- " 'බල සුබ නිමිති පෙර මඟැ නැකැතටත් වැඩි' යනුයෙන් 'නක්ඛත්තාවජ්ඣතං වරම්'* යන ඍෂිවාක්‍යය දැක්වුණු" යනු.

**16.** **ලොවැ විහි දු සුදු පැහැ සඳ රැසේ'ව සැ දි**
**දෙ න නොම ඳ සිරි සඟැ මොක් සැප නිසැ දි**
**ල ද මු නි ඳු දම් සඳ පහස මනැ බැ දි**
**ව ඳු ද ල දු හිමි නෙමහල් පහසැ රැ දි**

සඳ රැස් එව් සැදි සුදු පැහැ ලොවැ විහිදු, නොමඳ සඟැ සිරි මොක් සැප දෙන, මුනිඳු මනැ බැඳි දම්-සඳ පහස ලද, නෙමහල් පහසැ රැඳි දල ද හිමි වඳු.

**සඳ රැස් එව්**- චන්ද්‍රරශ්මියක් මෙන්, **සැදි**- සජ්ජිත වූ, **සුදු පැහැ**- අවදාතරශ්මීන් හෙවත් සුදු (බුදු) රැස්, **ලොවැ**-ලොකයෙහි, **විහිදු**-ව්‍යාප්ත කොට, **නිසැදි**- නිරන්තරයෙන්, **නොමඳ**- අනල්ප වූ, **සඟැ සිරි**- ස්වර්ගෛශ්වර්යය ද, **මොක් සැප**- මොක්ෂ සෞඛ්‍යය ද, **දෙන**- දානය කරන්නා වූ, **මුනිඳු**- මුනීන්ද්‍රයා ගේ,

* නැකැතට වඩා නිමිත්ත උතුම්.

**මනැ බැඳි**- සිත්හි බැඳුණා වූ, **දම් සඳ**, (සුවාසූදහසක් පමණ වූ) ධර්මස්කන්ධයා ගේ, **පහස**- ස්පර්ශය, **ලද**- ලැබුවා වූ, **තෙමහල් පහයැ**- තුන්මහල් ප්‍රාසාදයෙහි, **රැඳි**- රැඳුණා වූ හෙවත් වැඩැ සිටියා වූ, **දළ දා හිමි**-දන්තධාතු ස්වාමිහුට-**වඳු**- නමස්කාර කරව.

"තුන්මහල් පායෙහි වැඩැ සිටියා වූ දළදා හිමිහු වඳුව" යි මෙයින් කීහ. කෙබඳු දළදා හිමිහු ද? සඳ රැස් මෙන් අලඞ්කාර වූ සුදු පැහැය ලොකයෙහි විහිදුවා නිරතුරු මඳ නො වූ ස්වර්ග සම්පත්ති මොක්ෂසම්පත්ති දෙන්නා වූ, බුදුන් ගේ සිත්හි බැඳුණා වූ ධර්මස්කන්ධයා ගේ ස්පර්ශය ලැබුවා වූ, (තෙමහල් පහයැ රැඳි දළ දා හිමි වඳු.)

**විපසණ්:—**

1. **සුදු පැහැ විහිදු සඟැ සිරි මොක් සැප** කොසේ දෙයි ද? දළ දා හිමින් ගෙන් විහිදෙන සුදු බුදු රැස් දුටු සත්ත්වයෝ බුදුන් කෙරෙහි පැහැද, එ පුණෙකින් ස්වර්ගසම්පත්ති ලබති. පසුත් සිතින් දන් දී සිල් රැකැ භාවනායෙහි යෙදීමෙන් නිවනුදු සාධා ගනිත්.

2. **ලද මුනිඳු දම් සඳ පහස මනැ බැඳි**- බුදුන් දෙසූ ධර්මය පලමු කොටැ වූයේ උන් වහන්සේ ගේ සිත්හි යැ. දහම් දෙසන කලැ නිකුත් වන ශබ්දයා ගේ ස්පර්ශය දන්තයෝ ලබත් මැ යි.

**17.** ග න ර න් කොතින් දිලිහෙන මිණි රැස් විහි දු
ප ව නි න් ලෙලෙන පල අගැ මුතු ලැල් සිනි ඳු
ස ඳ කැ න් මිණින් බඳ යුතු බිතු පෙළින් රැ දු
එ තැ නි න් ගොසින් සැණෙකින් රජ විමන් ව දු

මිණි රැස් විහිදු ගන රන් කොතින් දිලිහෙන, පල අගැ සිනිඳු මුතු ලැල් පවනින් ලෙලෙන සඳකැන් මිණින් බඳ රුදු බිතු පෙළින් යුතු, රජ විමන් , එ තැනින් ගොසින්, සැණෙකින් වදු.

**මිණි රැස්**-මාණික්‍ය රශ්මීන්, **විහිදු**-විස්තීර්ණ කළා වූ, **ගන රන් කොතින්**- ඝනකනකශෘඞ්ගයෙන්, **දිලිහෙන**- බබළන්නා වූ, **පල අගැ**- ඡදනාග්‍රයෙහි හෙවත් පියසි කෙළවර, **සිනිඳු**- සනිග්ධ වූ, **මුතු ලැල්**-මුක්තාලතිකාවන්, **පවනින්**-මාරුතයෙන්, **ලෙලෙන**- චඤ්චල වන්නා වූ, **සඳ කැන් මිණින්**- චන්ද්‍රකාන්ත මණියෙන්, **බඳ**- බඳනා ලද්දා වූ, **රුදු**- මහත් වූ, **බිතු පෙළින්**- භිත්ති පඞ්ක්තියෙන්, **යුතු**- යුක්ත වූ, **රජ විමන්**- රාජ විමානයට, **එ තැනින් ගොසින්**-ඒ ස්ථානයෙන් (එනම්, දළ දා මන්දිරයෙන්) ගමන කොටැ, **සැණෙකින්**- ක්ෂණයෙකින්, **වදු**- ප්‍රවිෂ්ට වව හෙවත් ඇතුළු වව.

“දළ ද මැදුරින් ගොස් වහා රජ විමනට වදුව” සි මෙයින් කීහ. ඒ රජ විමන කෙබඳු ද? එහි මිණි රැස් විහිදුවන්නා වූ සත රතින් කළ කොත් වෙයි; පියසි අගැ සුළඟින් ලෙළෙ දෙන්නා වූ සිනිඳු මුතු ලැල් වෙයි; චන්ද්‍රකාන්තමණි (දියතරිප්පු) නම් වූ ගලින් බඳනා ලද මහත් භිත්තිපඞ්ක්ති වෙයි.

**විසඳුම්:—**

1. **මිණි රැස් විහිදු**– මෙයින්, කොත් මිණි ඔබ්බා කරනා ලද බව හැඟැවුණු.

2. **සඳකැන් මිණින්**– ‘චන්ද්‍රකාන්ත’ යනු කවිසමයයෙහි අතිප්‍රසිද්ධ වූ පාෂාණවර්ගයෙකි. කවීහු “සඳ රැස් වැටුණු කලැ ඒ පාෂාණයෙන් දිය වැහෙති”යි යෙති,

**18.** **රි වි බි ම් බා යුරැ රිවි කුල කමල‘කා ර**
**පි යු ම ‘ම් බා නිතොර වැ රැඳි උර මැඳු ර**
**මෙ න ර ම් බා කිමි රූ සිරිනි මනහ ර**
**පැ රැ කු ම් බා නරනිඳු සඳ දකු මිතු ර**

රිවි කුල කමල් අකර රිවි බිම්බා අයුරැ, උර මැඳුරැ පියුම් අම්බා නිතොර වැ රැඳි, රම්බා කිමි මෙන රූ සිරිනි මනහර, පැරැකුම්බා නරනිඳු සඳ, මිතුර, දකු.

**රිවි කුල**– සූර්‍ය්‍යවංශ නමැති, **කමල් අකර**– පද්මාකරයට, **රිවි බිම්බා අයුරැ**– සූර්‍ය්‍යමණ්ඩලය හා සමාන වූ, **උර මැඳුර**– වක්ෂස්ථල නමැති මන්දිරයෙහි, **පියුම් අම්බා**–පද්මාම්බිකාව හෙවත් සිරිකත **නිතොර වැ**– නිරන්තර වැ, **රැඳි**– රැඳුණා වූ, **රම්බා කිමි මෙන**– රම්භා නම් දෙවඟන ගේ ස්වාමියා මෙන්, **රූ සිරිනි**– රූපශ්‍රීන්, **මනහර**– මනෝහර වූ, **පැරැකුම්බා නරනිඳු සඳ**– පරාක්‍රමබාහු නරේන්ද්‍රචන්ද්‍රයා, **මිතුර**– මිත්‍රය, **දකු**– දර්ශනය කරව.

පරාක්‍රමබාහු රාජෝත්තමයා දකුව. ඒ රජ කෙබඳු ද? හේ සූර්‍ය්‍යවංශ නමැති පියුම් විලට සූර්‍ය්‍යබිම්බය වැන්නැ. ලක්ෂ්මී තොර නො වැ රැඳුණා වූ වක්ෂස් (උර) නමැති මන්දිරය ඇත්තේ යැ. රම්භාස්වාමිහු හෙවත් නලකූබරයා මෙන්, රූපසම්පත්තියෙන් සිත් ඇදැ ගන්නේ යැ.

කවිසමයයෙහි “සූර්‍ය්‍යයා පියුම් පුබුදුවති”යි යෙති. එ හෙයින් පියුම් විල බබළනුයේ සූර්‍ය්‍යයා නිසා යැ. “මෙ රජ රිවි කුල කමලකර රිවි බිම්බා”යි කීමෙන්, “යම් සේ කමලාකරය සූර්‍ය්‍යයා නිසා බැබැළේ ද, එමෙන් මැ සූර්‍ය්‍යවංශය මේ රජහු නිසා බැබැළේ” යනු හැඟැවුනු. “සූර්‍ය්‍යවංශයෙහි වූ රජුන් අතුරින් මේ රජ අතිශ්‍රේෂ්ඨ යැ” යනු පිණ්ඩාර්ථ යි.

ලක්ෂ්මී (පියුම් අම්බා) නම් ශ්‍රී සම්පත්තියට අධිපති වූ දෙවතා යි. යම් කිසිවකු ශ්‍රීමත් බව හැඟැවුව මනා තන්හි කිවීහු "ලක්ෂ්මී ඔහු සෙවුනී යැ" යෙත්. ලක්ෂ්මිය සිටිනුයේ විෂ්ණුදෙවයා ගේ උරෙහි යැ. එ හෙයින් "සිරි උරෙහි සිටියි"යි කීම කවිසමයානුකූල වේ. දේවියක සිටිනුයේ මැදුරෙක යැ. උරෙහි සිටිනා කලැ, එය ඇයට මැදුරක් වැනි වෙයි. එ හෙයින් "සිරි උර මැදුරැ සිටියි"යි කියනු වී.

"පියුමම්බා තිතොර වැ රැඳි උර මැදුර"

යි කීමෙන් මේ රජ තොර නොවන්නා වූ ශ්‍රී සම්පත්තීන් යුක්ත බව හැඟැවූහු.

විසඳුම්:—

1. රිවි කුල– ලොකයෙහි ප්‍රථම රජ වූ වෛවස්වත මනු තෙමේ සූර්යයා ගේ පුත්‍ර වී යැ. එ හෙයින් ඔහු ගේ වංශය රිවි කුල නම් වි

2. කමල'කර- අකර (ආකර) නම් උත්පත්ති ස්ථානය යි. පද්මයන් ගේ උත්පත්ති ස්ථානය විල යි. එ හෙයින් ඒ 'කමලාකර' 'පද්මාකර' යනාදි නාමයන් ගෙන් ප්‍රසිද්ධ යි.

3. පියුම'ම්බා– ලක්ෂ්මී තොමෝ පියුමෙක වසන්නී යැ. එ හෙයින් ඕ 'පද්මා' 'පද්මාලයා' යනාදී නාමයෙනුදු ගැනේ. 'අම්බා' යනු සාන්තාර්ථයෙහි වැටේ. මේ 'අම්බා' යන පාලි වචනය සිංහලයෙන් ලිවූ පරිදි යි.

3. රම්බා හිමි– කුවේරයා ගේ පුත්‍ර වූ නලකූබර තෙමේ අතිමනොහර රූපලාවණ්‍යයෙන් යුක්ත යැ. හේ 'රම්භා' නම් අප්සරාව පාවා ගත. එ හෙයින් රම්භාපති වී.

19. උ නු  නො වැ බරණ සිවුසැට වොටුනුත් පැලැ  දැ
වෙනු  මෙන් පසක් උන් සඳැ සිහසුන් මැ  දැ
ම නු  රජ කුලෙන් පැවැතෙන පිළිවෙළ නො සි  දැ
ග නු  අවසර එ නිරිඳු සිරි පතුල් වැ  දැ

සිවුසැට බරණ වොටුනුත් උනු නො වැ පැලැඳැ, පසක් වෙනු මෙන් සිහසුන් මැදු උන් සඳැ, මනු රජ කුලෙන් පිළිවෙළ නො සිදැ පැවැතෙන, එ නිරිඳු සිරි පතුල් වැඳැ, අවසර ගනු.

සිවුසැට බරණ–. චතුඃෂෂ්ටි (හැටහතර) ආභරණයන් හා, වොටුනුත්– කිරීටයත්, උනු නො වැ– නොඅඩු ව, පැලැඳැ– බහා ගෙන, පසක් වෙනු මෙන්– ප්‍රත්‍යක්ෂ විෂ්ණුහු පරිද්දෙන්, සි හසුන් මැදු– සිංහාසන මධ්‍යයෙහි, උන් සඳැ– හුන්නා වූ කාලයෙහි, මනු රජ කුලෙන්– (මහාසම්මත නම් වූ) මනුරජ කුල

යෙන්, පිළිවෙළ නො සිඳැ පැව තෙන- පරිපාටිය ඡින්න නො කොටැ පැවැතැ එන්නා වූ, එ නිරිඳු- ඒ පරාක්‍රමබාහු නරේන්ද්‍රයා ගේ, සිරි පතුල්- ශ්‍රීපාදයට, වැඳැ- නමස්කාර කොටැ, අව සර ගනු- (තොප යන ගමනට) අනුඥව (අනුදැන්ම) ලබව.

සැට සතර ආභරණ හා වොටුනුත් අඩු නො වැ පැලැඳැ, ඇස් ඉදිරියෙහි පෙනී ගිය විෂ්ණුහු මෙන් සිංහාසනමධ්‍යයෙහි උන් කල්හි, ඒ පරාක්‍රමබාහු රාජයා ගේ සිරි පතුල් වැඳැ, අවසර ගනුව. කෙබඳු පරාක්‍රමබාහු රාජයා ගේ ද? මහාසම්මත රාජ පරම්පරායෙන් පිළිවෙළ නො කඩා පැවැතැ එන්නා වූ පරාක්‍රම බාහු රාජයා ගේ.

ටිප්පණි:—

1. **බරණ සිවු සැට වොටුනුත්**- වොටුන්න සූසැට ආභරණයනට අයත් නොවන බව මෙයින් පෙනේ. නමුත් ගණනාමවිස්තරයන් දක්වන් නෝ එ ද ඇතුළත් කෙරෙති.

2. **වෙනු මෙන්**- තමන් ගේ තේජෝමහිමයෙන් සියල්ලන් අවනත කොටැ පැරැකුම්බා නිරිඳුන් සිංහාසනාරූඪ වැ උන් බව මෙයින් කීහ.

3. **සඳැ**- 'සඳ' යනු කාලාර්ථ නිපාතයෙකැ යි බොහෝ අය වරදවා සිතත්. ඒ කාලාර්ථ වාචී නාම පදයෙකි. අන් නපුංසක ලිඞ්ගශබ්දයන් මෙන් එ ද වර නැගේ. 'ඇ' විභක්ති ගෙනැ 'සඳැ' යි සිටී.

4. **මනුරජ කුල**- මෙ නම් මහාසම්මත රාජවංශය යි. වෛවස්වත මනු රජ මහාජනයා ගේ සම්මතයෙන් රජ වූයෙන් මහාසම්මත නම් වී.

**20.** පෙ ර ව සඳ කිරණ පිපි කුමුදු මල් ව පි න්
ප ර ව නඹර පෙති ගිලි දිය තලා පි පි න්
ත ර ව සිහි ඇති වැ පර තෙරට යන අ පි න්
ක ර ව පියාසර සකි කොන්ත ගම් තො පි න්

සඳ කිරණ පෙරෙවැ, වපින් කුමුදු මල් පිපි, පර වැ නඹර පෙති ගිලි, දිය තලා පිවින්, පර තෙරට යන අපින් තර වැ සිහි ඇති වැ, සකි, කොන්ත ගම් තොපින් පියාසර කරව.

**සඳ කිරණ**- චන්ද්‍රරශ්මිය, **පෙරෙවැ**- ප්‍රාවරණය කොටැ (පෙරෙවැ ගෙනැ), **වපින්**- හාත්පසින්, **කුමුදු මල්**- කුමුද පුෂ්පයන්, **පිපි**- පිපුණා වූ, **නඹර පෙති**- පද්මපත්‍රයන්, **පර වැ**- මැලැවී, **ගිලි**- ගිලිහුණා වූ, **දිය තලා පිවින්**- ජලතලා මතුයෙන්, **පර තෙරට යන අපින්**- පරතීරයට (එ තෙරට) යනු කැමැත්තෙන්, **තර වැ**- ස්ථිර වැ, **සිහි ඇති වැ**- සිහියෙන් යුක්ත වැ, **සකි**- මිත්‍රය, **කොන්ත ගම් තොපින්**- කොන්ත ගම් නම් තීර්ථයෙන් (තොටු පළින්), **පියාසර කරව**- පක්ෂප්‍රසාරණය කරව (පියා හඹව).

“කොත්ත ගම් තොටින් පියාසර කොටැ එ තෙර යව”යි කී සැටි යි. දිය තලා පිටින් එතෙර වැ යා යුතු හෙයින් “පරතෙරට යන අටින් තර වැ සිහි ඇති වැ”යි කීහු. දිය තලා වර්ණනය කරන්නාහු, හාත්පසින් කුමුදු මල් පිපී ඇති බව ද, තෙළඹ පෙති පර වී ගිලිහී ඇති බව ද, කීහ. කුමුදු පිපීමට හා තඹර පෙති පර වීමට හෙතු දක්වන්නාහු “සඳ කිරණ පෙරෙවැ”යි කීහු.

විපසර්:—

1. **පෙරෙවැ සඳ කිරණ**–“සඳ රැස් වැදූ”යනු මේ කවි භාෂායෙන් කී සැටි යි. සඳ රැස් වැටුණු කලැ, ඒ මල් වහා පෙරෙවි සුදු වතක් මෙන් වන හෙයින්, මේ යෙදුම. “සඳ රැසින් කුමුදු පිපෙයි; තෙළඹ මැලැවෙයි”යනු කවිසමයය යි.

**පෙරෙවැ**– ‘පොරෝ’ (පෙරවුම්හි) ධාතුයෙන් සිද්ධ පෙරකිරිය පද යි. ‘පෙරෙවැ’ යන්නෙහි අගැ ‘ඇ’ එළි වැට රූපොත පිණිස ‘අ’ වෙයි; ඉක්බිති, ඒ පිණිස මැ, ‘රෙ’ යන්නෙහි වූ ‘එ’, පරරූපයට පැමිණෙයි.

2. **පිපි–ගිලි**–මේ කෘදන්ත පද දෙක මැ ‘දිය තලා’යන්හට විශෙෂණ වෙයි. කෙ බඳු දිය තලා ද?' කුමුදු පිපි දිය තලා; තඹර පෙති ගිලි දිය තලා

**21.** කළු වැල් කපුරු දුමැ'තුළැ ලෙළෙන දද පෙළ
සුවිසල් මිහිගු සක් සන් මිණි හඬ වන ළ
කැරැ ලොල් සතන් පවසන තිසු ගී දෙම ළ
මන කල් ඉසුරු කෝවිලැ ලගිනේ ලක ළ

කළු වැල් කපුරු දුම් ඇතුළැ දද පෙළ ලෙළෙන, සුවිසල් මිහිගු සක් සන් මිණි හඬ වනළ, ලොල් කැරැ සතන් දෙමළ තිසු ගී පවසන, මන කල් ලකළ ඉසුරු කෝවිලැ ලගිනෙන්.

**කළු වැල් කපුරු දුම්**– කාලාගුරුකර්පූරධූමයා ගේ, **ඇතුළැ**– අභ්‍යන්තරයෙහි, **දද පෙළ**– ධ්වජපඞ්ක්ති, **ලෙළෙන**– ලෙළ දෙන්නා වූ හෙවත් චඤ්චල වන්නා වූ, **සුවිසල්**– අතිශයින් මහත් වූ, **මිහිගු සක් සන්**– මෘදඞ්ගශඞ්ඛස්වනය ( නාදය ) ද, **මිණි හඬ**– ඝණ්ඨා නාදය ද, **වනළ**– පැතුරුණා වූ, **ලොල් කැරැ**–ලොභ කොටැ, **සතන්**–සත්ත්වයන් විසින් (දෙමළ මිනිසුන් විසින්), **දෙමළ තිසු ගී**– ද්‍රවිඩස්තුතිගීතිකාවන්, **පවසන**– ප්‍රකාශ කරන්නා වූ, **මනකල්**– සිත්කලු වූ, **ලකළ**– අලඞ්කෘත වූ, **ඉසුරු කෝවිලැ**– ඊශ්වරදෙවාලයයෙහි, **ලගිනේ**– ලැගුම් ගන්නේ යැ.

“ඊශ්වරදෙවාලයයෙහි ලගිනේ මැනැවැ”යි මෙයින් කීහ. කෙබඳු වූ ඊශ්වරදෙවාලයයෙහි ද? කළු අගිල් හා කපුරු (දැවීමෙන් නැගි) දුම ඇතුළෙහි ධ්වජපඞ්ක්ති ලෙළ දෙන්නා වූ ද,

ඉතා විශාල මිහිඟු බෙර හඬ සක් හඬ හා මිණි (ඝණ්ටා) හඬ පැතුරුණා වූ ද, මහත් ආශාවෙන් සත්ත්වයන් දෙමළ ස්තුති ගීතිකා කියන්නා වූ ද, මනොහර වූ ද, අලඞ්කෘත වූ ද, ඊශ්වර දෙවාලයයෙහි (ලගිනේ මැනැවි.)

දද පෙළ වනුයේ ගෘහම්ස්තකයෙහි යැ. "ඒ දද පෙළ කළු වැල් කපුරු දුම් ඇතුළු ලෙළෙති"යි කීමෙන්, දෙවොල වසා ගෙනැ දුම අහසට නැගෙන බව ද, එ හෙයින් මැ එහි පවත්නා පූජා ඉතා මහත් බව ද හැඟැවූහ.

ටිප්පණි:—

1. **ලෙළෙන- වනල- පවසන-** මේ 'ඉසුරු කෝවිල' යන්නට විශෙෂණ වූ කෘදන්තපද යි.

2. **මිහිඟු-** බෙර වෙසෙසෙකි. "දුන් දෙමළ බෙර යැ" යෙත්. මේ ඊශ්වරපූජායෙහි ලා ගැයෙත්.

3 .**සක්-** ශඞ්ඛය යි. 'හක් ගෙඩිය' යනු සාමාන්‍යව්‍යවහාර යි. මෙ ද ඊශ්වර පූජායෙහි ලා ගැහෙන්නෙකි.

4. **මිණි-** 'මිණි ගෙඩිය' යනු සාමාන්‍ය ව්‍යවහාරයෙහි වැටෙන නමි. මෙ ද ගැසෙත් ඉසුරු පුදෙහි.

5 **දෙමළ තිසු ගී-** මෙහි තිසු ගී නම් ඊශ්වරස්තොත්‍ර යි. මේ ඊශ්වර පූජාව සිංහලයන් විසින් නො වැ, ද්‍රවිඩයන් විසින් සැරෙන බව හැඟැවීමට කීහ, "දෙමළ තිසු ගී"යි.

6. **කෝවිලැ-** 'කෝවිල්' යනු දෙමළෙන් ආයේ යැ.

7. **ලගිනේ-** මේ අපෙයෙන් විධානයෙකි. විධික්‍රියා පදයෙක් නාම නො වේ. මෙයින් හැඟෙනුයේ 'ලැගිම' යන ක්‍රියාභාවය යි. ඒ එ හෙයින් 'මැනැවි' යනු වැන්නක් හා යෙදී "ලගිනේ මැනැවි" යනාදින් වාක්‍ය වෙයි. නතු මෙසේ වන හෙයින්, මුළායෙන් මේ විධික්‍රියා පදයෙකැ යි ගෙනැ, "තෝ ලගිනේ" යි වාක්‍ය ගත හොත් මහාදෝෂ යැ. මෙ මැ නය යි "මෙකරු මේ පියන්නේ" යනාදි තන්හි දු.

**22. වෙ ස ඟන තුඟු තන යුගැ රොන් කොකුම් ඟ ර**
**පි ස එන මඳ පවන් ඇඳැ විල් ළිහිණි ස ර**
**ගො ස අලු යම් පසතුරු සවනතෙහි කැ ර**
**ඇ ස නිදි ගැට හැරැ නැඟැ සිටු උදුහි ර**

වෙසඟන තුඟු තන යුගැ කොකුම් අඟර රොන් පිසැ, විල් ළිහිණි සර ඇඳූ, මඳ පවන් එන, අලු යම් පසතුරු ගොස සවනතෙහි කැරැ, උදුහිරැ, ඇසැ නිදි ගැට හැරැ, නැඟැ සිටු.

**වෙසඟන-** වෙශ්‍යාවන් ගේ, **තුඟු-** උස් වූ, **තන යුගැ-** පයොධර යුගමෙයෙහි වූ, **කොකුම් අඟර රොන්-** කුඞ්කුමාඞ්ගරාග රේණූන්, **පිසැ-**හැමැදැ ගෙනැ, **විල් ළිහිණි සර-**සාරස පක්ෂීන්

ගේ නාදය, **ඇද**– ආකර්ෂණය කොටැ ගෙනැ, **මඳ පවන්**– මන්ද මාරුතය, **එන**– එන් මැ, **අලු යම්**– උදය කාලයෙහි පවත්නා වූ, **පසතුරු**– පඤ්චතූර්යයන් ගේ, **ඝොස**– ඝෝෂය, **සවනතෙකි හැර**– ශ්‍රවණයෙහි නොවැ හෙවත් අසා, **උදුහිර**– සූර්යෝදය කාලයෙහි, **ඇසැ**– අක්ෂිහි, **නිඳි ගැට හැර**– නිද්‍රාග්‍රන්ථි (නිඳි බැඳුම්) පහ කොටැ, **නැගැ සිටු**– නැගී සිටුව.

“අලු යමැ පසතුරු ඝොස අසා නැගී සිටුව” යි කී තැනි. වෙශ්‍යාවන් ගේ උස් වූ පයෝධර යුගමයෙහි කුඞ්කුම ආලෙපයෙහි රොන් (සුනු) පිසැ ගෙනැ, විල් ළිහිණින් ගේ නාදය ඇද ගෙනැ, මඳ සුළඟ එන කල්හි, අලු යම් පසතුරු ඝොස අසා, ඇසෙහි නිඳි බැඳුම් මුදා, සූර්යෝදයයෙහි නැගී සිටුව.

මෙහි පූර්වාර්ධයෙන් උදයමාරුතය සෞරභ්‍ය (සුවඳ) ශෛත්‍ය (ශීතල බව) මාන්ද්‍ය (මඳ බව) යන ගුණත්‍රයයෙන් යුක්ත බව හැඟැවුනු. වෙසඟනන් ගේ තන යුගැ කොකුමඟරා රොන් පිසිනා කලැ මාරුතය සුවඳවත් වෙයි; විල් ළිහිණි සර අඳනා කලැ තඩාගාශ්‍රය යෙන් සිහිල් වෙයි. ‘මඳ’ යනුයෙන් පවනයා ගේ මාන්ද්‍යය ඉඳුරා දක්විණ. මෙයින් මැ, රාත්‍රිය ක්‍රීඩායෙන් ගත කළ වෙසඟනන් ශ්‍රාන්තිනිවාරණය පිණිස අලු යමැ බැහැර සිටිනා බව ද, විල් ළිහිණින් නාද කරන බවද හැඟැවිණ.

**විපසණි:-**

1. **කොකුම් අඟර රොන්**– අඟර (අඞ්ගරාග) නම් ශරීරාලෙප යි, කොකුමින් කැරුණේ කුඞ්කුමාඞ්ගරාග යි. ඒ අඞ්ගරාගයෙහි සුනු මෙහි ‘රොන්’ යනුයෙන් ගැනිණ. කුඞ්කුමචන්දනාදි අඞ්ගරාගයන් ශරීරයෙහි ගැල්වීම් පුරාතන සිරිති. කොකුම් උෂ්ණය ද, සඳුන් ශීතලය ද, දේ.

2. **අලු යම් පසතුරු**– අලු යමැ පැවැත්වෙන පසතුරු අලු යම් පස තුරු යි. මෙහි ‘පසතුරු’ නම්–

“ආතතං චෙව විතතමාතතවිතතං ඝනං
සුසිරං චෙති තූරියං පඤ්චඞ්ගිකමුදීරිතං ”

යනුයෙන් දක්වුණු (1) ආතත (2) විතත (3) ආතතවිතත (4) ඝන (5) ශුෂිර යන පස් යැ. “මෙහි ආතත නම් එකතල තූර්‍ය යැ; විතත නම් උභයතල තූර්‍ය යැ; ආතතවිතත නම් සර්වප්‍රකාරාවනද්ධ තූර්‍ය යැ; ශුෂිර නම් වංශශඞ්ඛසාහලාදි යැ; ඝන නම් ලොහමය තාලාදි යැ” යනු ගුරුළු ගෝමින් ගේ වචන යි. (සර්වප්‍රකාර අවනද්ධ=සියලු අත්දමින් වසා බැඳි; වංශ=වස් දඬු.)

3. **ඇසැ නිඳි ගැට හැර**– නින්දෙන් ඇස පියැවුණු කලැ ඒ නිඳි ගැටයෙන් හෙවත් නිද්‍රාබන්ධනයෙන් බැඳුණාක් වැනි වේ. මේ බන්ධනය මුදා හැරීම හෙවත් ඇස හැරීම, නිඳි ගැට හැරීම යි.

4 **උදුහිර**– හිරු උද වනුයේ යම් කාලෙක්හි ද ඒ උදුහිර. එහි උදුහිරු. අගැ ‘ඈ’ යන්න එළි පිණිස ‘අ’ කාර බවට පැමිණියේ යැ,

23. උ ද ගිරි කසුන් රිවිවැටැ හිසැ බැබැ ළි
එ ද සහසකර පහනෝ'ව කරන හෙ ළි
යොද ' නුවන් ඉසුරුම කරන පුද කෙ ළි
වි ද පියා නිල'ඹර යන් නො වී මැ ළි

උදගිරි කසුන් රිවිවැට හිසැ බැබැළී, පහන් එව්, සහසකර එද හෙළි කරත, ඉසුරුම කරන පුද කෙළි නුවන් යොද, මැළි නො වී, පියා විද, නිල් අඹර යන්.

**උදගිරි**- උදයපර්වත නමැති, **කසුන් රිවිවැටැ හිසැ**- කාඤ්චනප්‍රදීපයෂ්ටිශීර්ෂයෙහි හෙවත් රන්පහන් කණුව මුදුනෙහි, **බැබැළී**- භ්‍රාජමාන වැ, **සහසකර**- සහස්‍රකිරණයා, **පහන් එව**- ප්‍රදීපයක් මෙන්, **එද**- ඒ දිනයෙහි, **හෙළි කරත**- ආලෝක කරත් මැ, **ඉසුරුම**- ඊශ්වරයා භව, **කරන**- කරනු ලබන්නා වූ, **පුද කෙළි**- පූජෝත්සවයන්, **නුවන් යොද**- නෙත්‍රයෙහි යොජිත කොටැ හෙවත් බලා, **මැළි නො වී**- අලස නො වී, **පියා විද**- පියා පත් දිග හැරැ, **නිල් අඹර**- නීලවර්ණ වූ ආකාශයට, **යන්**- ගමනය කරත්.

"උදයපර්වත නමැති සුවර්ණමය පහන් කණුව මුදුනෙහි බබලමින්, පහනක් මෙන්, සූර්යයා එද ආලෝක කරන කල්හි, ඊශ්වරයාට කරන පූජෝත්සවයන් බලා, අලස නො වී, පියා පත් විහිද, නිල් අහසට යන්."

"සූර්යයා ගෙන් සකල දිශාව එකාලෝක වූ කල්හි ඊශ්වරපූජා බලා අහසට නැඟෙන්නැ"යි කී සැටි යැ මේ.

**ටිප්පණී**:—

1. **උදගිරි**- නැගෙනහිර දිගැ උදය නම් පර්වතයෙක් ද, බස්නාහිර දිගැ අපර නම් පර්වතයෙක් ද ඇත යනු කවිසමයයයි. "සූර්යයා උදයපර්වතයෙන් නැගෙති"යි ද "අපරපර්වතයෙන් බසිති"යි ද යෙති.

2. **රිවිවැට.** 'රිවි' යනු යෂ්ටියට නම් වේ. 'වැට' නම් ප්‍රදීප යි. වැට සඳහා පිහිටුවන ලද රිට රිවිවැට යී. 'වැටරිවි' යි කියැ යුතු තන්හි 'රිවිවැට' යනු වී.

3. **සහසකර.** කර (රශ්මි) සහසක් ඇතියේ යමක්හු හව ද හේ සහ 'සකර. සූර්‍ය යි. මේ අර්ථයෙහි 'සියසාර' යනු ද යෙදේ. මෙබඳු තන්හි 'සහස' සිය' යනාදියෙන් හැඟැවෙනුයේ බහුලත්වය යි; නියම සංඛ්‍යාවෙක් නො වේ.

24. සූ ර ර ද සමන් සමගින් සුර'හන එ ව ර
පැහැකද මඳුරු පරසතු මල් පත ර
කැරැ පුද වඳන රැඳි මුනි සිරි පා තඹ ර
ස කි ස ද පෙනේ සමනොළ ගල නැගෙනකි ර

සකිසඳ, එ වරැ, සමන් සුර රද සුරඟන සමගින් පැහැනද මඳරා පරසතු මල් පතර පුද කැරැ වදනා මුනි සිරි පා තඹර රැඳි, සමනොළ ගල නැගෙනහිරැ පෙනේ.

**සකි සඳ**- මිත්‍ර චන්ද්‍රය, **එ වරැ**- ඒ (තොප ආකාශයට නැංගා වූ) කාලයෙහි, **සමන් සුර රද**- සුමන දිව්‍යරාජයා, **සුරඟන සමගින්**- සුරාඞ්ගනාවන් හා එක් ව, **පැහැනද**- (පැහැ + අද) ප්‍රභාද්‍රී වූ හෙවත් කාන්තියෙන් තෙමී ගියා වූ, **මඳුරා පරසතු මල් පතර**- මන්දාරපාරිජාතපුෂ්පසමූහය, **පුද කැරැ**- පූජා කොට, **වදනා**- වඳිනු ලබන්නා වූ, **මුනි සිරි පා තඹර**- සර්වඥ ශ්‍රීපාද තාමරසය, **රැඳි**- පිහිටියා වූ, **සමනොළ ගල**- සමන්තකූට පර්වතය, **නැගෙනහිරැ**- පූර්වදිශායෙහි, **පෙනේ**- දෘශ්‍යමාන වේ.

“ඒ (තොප ආකාශයට ගිය) කාලයෙහි සමනොළ ගල නැගෙනහිරැ පෙනෙති”යි මෙයින් කිහ. කෙබඳු සමනොළ ගල ද? සර්වඥයා ගේ ශ්‍රීපාද නමැති පද්මය රැඳුණා වූ සමනොළ ගල යි. කෙබඳු ශ්‍රීපාද නමැති පද්මය ද? සුමන දිව්‍යරාජයා දිව්‍යාඞ්ගනාවන් හා සමඟ, සියලු තන්හි පතළා වූ කාන්ති ඇති මන්දාරපාරිජාත කුසුම සමූහයන් පූජා කොට වඳින්නා වූ ශ්‍රීපාද නමැති පද්මය යි.

**විපසණ:-**

1. **සමන් සුර රද**- මේ සමනොළෙහි වසනා දිව්‍යරාජයා යි. සිරි ලකට අරක් ගත් සිවු දෙවියන් ගෙන් මේ එක් කෙනෙකි. සෙසු තුන් දෙන නම් උත්පලවර්ණ, ස්කන්ධකුමාර, විභීෂණ යන මොහු යි.

2. **මඳුරා පරසතු**- දෙව් ලොවැ ඇතැයි යන වෘක්ෂ පසින් දෙකෙකි. ඉතිරි තුන නම් සන්තාන, කල්පවෘක්ෂ, හරිචන්දන යන මේ ය.

**25. ග නේ මිණි බැබැළි කිරණෙ'වි සත පා ශ**
**ර නේ සව'ගැ සැවුලිඳු දද ගල පා ශ**
**අ නේ ලකර කළ පුරැ අප නර පා ශ**
**පෙනේ දකුණැ මහසෙන් දෙව් රද පා ශ**

සතපා(ශ) කිරණ එවි ගනේ මිණි බැබළු රනේ සවි අගැ සැවුල් ඉඳු දද ගල පා (ශ) අනේ ලකර කළ, මහසෙන් දෙව් රද පාශ, අප නරපා(ශ) පුරැ දකුණැ පෙනේ.

**සතපාශ**- ශතරශ්මිහු ගේ හෙවත් සූර්යයා ගේ, **කිරණ එවි**- රශ්මීන් වැනි වූ, **ගනේ**- ඝන වූ, **මිණි**- මාණික්‍යයන් ගෙන්, **බැබැළි**- භ්‍රාජිත වූ හෙවත් බැබැළුණා වූ, **රනේ සවි අගැ**- ස්වර්ණයෂ්ට්‍යග්‍රයන්හි, **සැවුල් ඉඳු දද**- කුක්කුටේන්ද්‍රධ්වජයන් (කුකුළු රූපයන් ගෙන් යුත් කොඩි), **ගලපාශ**- සටනා කොට,

**අනේ ලකර කළ**- අනෙකාලඞ්කාරයෙන් අලඞ්කෘත කරන ලද, **මහසෙන් දෙව් රද පාය**- මහාසෙනදිව්‍යරාජප්‍රාසාදය (කතරගම දෙවාලයය), **අප නරපාය පුර**- අප ගේ නරපාලයා ගේ පුරයෙහි, **දකුණැ**- දක්ෂිණදිශායෙහි, **පෙනේ**- දෘශ්‍යමාන වේ.

ජයවඩන පුර දකුණු දෙසෙහි සකන්ධකුමාරදෙවාලයය පෙනෙන බව මේ කී පරිදි යි.

සූර්යයා ගේ රශ්මීන් මෙන් ඝන වැ මැණික් බැබළුණා වූ රන් දඹු අඟැ කුකුළු රුවින් යුතු කොඩි බැඳැ අනෙකාලඞ්කාර කළා වූ මහාසෙන දිව්‍යරාජයා ගේ ප්‍රාසාදය, අප ගේ රජහු ගේ නගරයෙහි දකුණු දිගැ පෙනේ.

කෙබඳු මහසෙන් දෙව් රද පාය ද? අනේ ලකර කළ මහසෙන් දෙව් රද පාය යි. කෙසේ අනේ ලකර කළ පාය ද? රන් යටි අඟැ සැවුලිඳු දද ගළපා ලකර කළ පාය. කෙබඳු රන් යටි අඟැ ද? සතපා කිරණ එව් ගනේ මිණි බැබැළු රන් යටි අඟැ.

**විසඳුම්:-**

1. **බැබැළු**–'බබල' ධාතුව පරස්මෛපදයෙහි බබළා-බබළති-බැබැළි-බැබැළූ-ඈ විසින් ද, ආත්මනෙපදයෙහි බැබැළේ- බැබැළෙති- බැබැළිණි- බැබැළුණු- ඈ විසින් ද වරනැගේ. (පරස්මෛපද ආත්මනෙපද භේදය හැඳිනැ ගැන්මට සුභාෂිත විවරණය බැලියැ යුතු.) පරස්මෛපද අතීත කෘදන්ත පදය 'බැබැළු' යනු යි. මෙහි මැ (55) "විමල් සක් ගිජිඳු කුඹු සිරිවස බැබැළු" යන තැන්හි ද, (86) "බැබැළු සිළිල් ඉසිනා විලස ඔසි දුරැ" යන තැන්හි ද ඒ නිරවුල් වැ පෙනේ.

2. **සතපාය**–'පා' (පාද) යනු රශ්මියට ද නම්. 'සත' නම් සියය යි. එ හෙයින් 'සතපා' (ශතපාද) නම් ශතරශ්මි හෙවත් සූර්යයා යැ.

"දස සතපා අළු සතපා තෙද දිමුත"

යනු කවීශ්වරයන් ගේ ප්‍රයොග යි. 'සතපාය' යන තන්හි ද, 'ගළපාය' 'නරපාය' යන දෙතන්හි ද, 'ය'යනු ඡන්දස රක්ෂා පිණිස යෙදිණ.

"යස ඈ වතන් මුහ්- තුබු පද නො ලා සඳවස්
නො මැ ලැඟැ පෙර කිජ සමා-සව් බැඳැ යස බඳ දෙවා"

යනුයෙන් සිදත්සඟරායෙහි ඡන්දොරක්ෂණය පිණිස 'ය'කාර 'හ'කාරාදීන් යෙදියැ හැකි බව දක්විණ. ඇතැම් අව්‍යක්ත කෙනෙක්, තමූ ඉඳුරා නො දැනැ, මෙහි ද 'ය' 'ව' 'හ' 'න්' යන සතරක්ෂර ගැනිණැ යි සිතා "මේ 'ය හ ඈ වණත්' යි නො වැ 'ය ව ඈ වණත්' යි වියැ යුතු යැ" යි බොළඳ බස් බෙණෙති.

3. **සැවුලිඳු දද**–සකන්ධකුමාරයා ගේ ධ්වජය කුකුළු රූපයෙන් ප්‍රකට යැ. එ හෙයින් සකන්ධකුමාරපූජායෙහි ලා කුක්කුටාඞ්කධ්වජයෝ ගැනෙති. 'සැවුල්' යනු දෙමළ 'සාවල' යන්නෙන් ආයේ යැ. 'ඉඳු' යනු ගෞරවාර්ථ යි.

4. **නරපා**–නරන් රක්නා හෙයින් රජ 'නෘප' නම් වේ. 'නරපා' යනු ද සමානාර්ථ යි.

5. **මහසෙන් දෙව් රද**–ස්කන්ධකුමාර දිව්‍යරාජයා යි. මහත් වූ සෙන් (සේනාව) ඇත්තහුට එව් හු යි 'මහසෙන්' නම් වී. පෙර තාරක නම් මහාබල අසුරයෙක් වී. හේ බ්‍රහ්මයා ගෙන් වර ලැබ, තුන් ලොව දිනී යැ; දෙවියන්හුදු පෙළී යැ. වැසතට පත් ශක්‍රාදි දෙවියෝ බඹහු දැක, තමන් දුකින් මුදනා ලෙස යැදියහ. “මහේශ්වරයා හට පුතකු වුව හොත්, හේ උපන් සත් දිනෙන් මෙපිට, තාරකයා නසන්නේ යැ” යි බ්‍රහ්ම කී. දෙවියෝ හිමාලයපුත්‍රී වූ උමාව මහේශ්වරයා හේ ප්‍රියාව වන සේ කළහ. ඉක්බිති ඈයගෙන් උපන් ස්කන්ධ කුමාරයා ලැබ, දෙව්සේනාවට අධිපති කළහ. ස්කන්ධකුමාර මහා සේනාව ගෙන ගොස්, තාරකයා මැර, දෙවියනට සෙත් කෙළේ.

**26. ව ළ දන අඳහසින් මෙන් සුර ගඟ අඟ න**
**න ළ බල සසල දළ රළ පෙළ නුබ නැගෙ න**
**වෙළ ළ'සැ ගැවැසි මුතු සක් පබළු බබළ න**
**බ ළ මහ මුහුද එ මැ සඳැ උතුරින් පෙනෙ න**

සුර ගඟ අඟන වළදන අඳහසින් මෙන් නළ බල සසල දළ රළ පෙළ නුබ නැගෙන, වෙළළ අසැ ගැවැසි මුතු සක් පබළු බබළන, එ මැ සඳැ උතුරින් පෙනෙන මහ මුහුද බල.

**සුර ගඟ**– ආකාශගඞ්ගා නමැති, **අඟන**– ස්ත්‍රිය, **වළදන අඳහසින් මෙන්**– වැළැඳැ ගන්නා රිසියෙන් මෙන්, **නළ බල**– වාතශක්තියෙන්, **සසල**– චඤ්චල වූ, **දළ**– මහත් වූ, **රළ පෙළ**– තරඞ්ගපඞ්ක්තිය, **නුබ**– ආකාශයට, **නැගෙන**– නැගෙන්නා වූ, **වෙළළ අසැ**– වෙරළ සමීපයෙහි, **ගැවැසි**– ගැවැසුණා වූ, **මුතු සක් පබළු**– මුක්තාශඞ්ඛප්‍රවාලයන්, **බබළන**– බබළන්නා වූ, **එ මැ සඳැ**– ඒ කාලයෙහි, **උතුරින්**– උත්තර දිශායෙන්, **පෙනෙන**– දෘශ්‍යමාන වන්නා වූ, **මහ මුහුද**– මහාසමුද්‍රය, **බල**– දකුව.

(තොප අහසට නැංගා වූ,) ඒ කාලයෙහි උතුරින් පෙනෙන්නා වූ මහ මුහුද බලව. කෙබඳු මහ මුහුද ද? මහත් රළ පෙළ අහසට නැගෙන්නා වූ මහ මුහුද යි. යළි කෙබඳු මහ මුහුද ද? මුතු හා සක් හා පබළු බබළන්නා වූ මහ මුහුද යි. කෙබඳු මහත් රළ පෙළ ද? මාරුතබලයෙන් චඤ්චල වූ මහත් රළ පෙළ යි. රළ පෙළ කවර අඳහසින් මෙන් අහසට නැගෙන්නා වූ මහ මුහු ද ද? ආකාශගඞ්ගා නමැති අඞ්ගනාව වැළැඳැ ගන්නා අඳහසින් මෙන් මහත් රළ පෙළ අහසට නැගෙන්නා වූ මහ මුහුද යි. කෙබඳු මුතු සක් පබළු බබළන්නා වූ මහ මුහුද ද? වෙරළ සමීප යෙහි ගැවැසුණා වූ මුතු සක් පබළු බබළන්නා වූ මහ මුහුද යි.

මෙහි “උතුරින් පෙනෙන”යි කියැවුණ ද, ජයවර්ධනපුරාකාශයට නැඟුණු කල්හි සාගරය පෙනෙනුයේ උතුරින් නො වේ. එය ඉතා ලං වැ පෙනෙනුයේ බටහිරිනි. නමුත් මේ දූතයාට බව

හිර බැලීමට අවසර නැති. කවර හෙයිනැ යත්:- මොහු යනුයේ නැගෙනහිර බලා යැ. බටහිර බැලීමට නම් පස්සට හැරුණ මනා යැ. එසේ කිරීම අමඞ්ගලසම්මත හෙයින් නො කැරෙයි. එ හෙයින් මැ, මෙහි බටහිර, නමින් වත්, නො ගැනිණ. ඒ එසේ වුව ද, සාගරය මේ කවීනට අවශ්‍යයෙන් වර්ණනීය සේ පෙනුණු හෙයින් ද, උතුරෙහි වැනුමට සමනොළ ගල හා මහසෙන් දෙවි රද පාය වැනි වස්තුවක් නොලැබුණු හෙයින් ද, වයඹ දෙසට බර කොටැ බැලූ කලැ දුරින් පෙනෙන මහ මුහුද උතුරට අයත් වන හෙයින්, "උතුරින් පෙනෙන"යි කියැවිණ.

ටීප්පණි:—

1 **වලඳන අඳහසින් මෙන් සුර ගඟ අඟන**- කවිසමයයෙහි ගඞ්ගාවෝ සාගරයා ගේ ප්‍රියාවෝ යැ. ඔවුනතුරින් ආකාශගඞ්ගා තොමෝ සෙස්සනට ප්‍රධාන වෙයි. "මාරුතවේගයෙන් මුහුදෙහි රළ පෙළ අහසට නැඟීම ආකාශ ගඞ්ගා නමැති අඞ්ගනාව වැලැඳැ ගන්නා අදහසින් මෙනැ"යි මෙහි ලා උත්ප්‍රේක්ෂිත යි. 'සුර ගඟ' යනු සඳහා මූවදෙව්දා විවරණයෙහි 36 සං. 3. බලත්තේ යැ.

2. **නැගෙන-බබලන**- මේ කෘදන්ත පද දෙක 'මුහුද' යන්නට විශෙෂණ වේ.

මෙසේ අහසට නැඟුණු කලැ ඉදිරියෙහි ද, දකුණත් පසැ ද, වමත් පසැ ද, පෙනෙන දෑ කියා, ඉක්බිති මඟ දූනැ යන සේ කියත්.

**27. ස න් න න් සිහින් ගෙදි සෙවණලු වැලි තෙලෙ න**
**තැන් තැන් වලැ මැ සැතැපී සියුමැලි බැවි න**
**ර න් ව න් කරල් ගෙනැ එන ගිරවුන් අති න**
**ය න් ම න් තොසින් මඟැ තොරතුරැ නියම දූ න**

නන් සිහින් ගෙදි සෙවණලු වැලි තෙලෙන සන් තැන් තැන් වලැ මැ, සියුමැලි බැවින සැතැපී, රන් වන් කරල් ගෙනැ එන ගිරවුන් අතින මඟ තොර තුරැ නියම දූනැ, මන් තොසින් යන්.

**නන් සිහින් ගෙදි**- නොයෙක් හීන් ගෙන්ද වෘක්ෂයන් ගේ, **සෙවණලු**- සෙවණැලි වලින් යුක්ත වූ, **වැලි තෙලෙන**- වැලි තලාවන් ගෙන්, **සන්**- සඤ්ජාත වූ හෙවත් ගැවැසී ගත්, **තැන් තැන් වලැ මැ**- ඒ ඒ ස්ථානයන්හි මැ, **සියුමැලි බැවින**- සුකුමාරභාවයෙන් යුක්ත වූ හෙයින්, **සැතැපී**-සන්තර්පිත වැ හෙවත් විශ්‍රාම ගෙනැ (ගිමන් හැර), **රන් වන් කරල් ගෙනැ එන**- ස්වර්ණ වර්ණ වූ ශස්‍යමඤ්ජරීන් (වී කරල්) ගෙනැ එන්නා වූ, **ගිරවුන් අතින**- කීර පක්ෂීන් කෙරෙන්, **මඟැ**- මාර්ගයා ගේ, **තොරතුරැ නියම**- විශෙෂ විභාග පිළිබඳ නිශ්චයය, **දූනැ**- අසා ගෙනැ, **මන් තොසින්**- චිත්තසන්තොෂයෙන්, **යන්**- ගමනය කරන්නා.

නොයෙක් සිහින් ගෙන්ද වෘක්ෂයන් ගේ සෙවණැල්ලෙන් යුත් වැලි තලායෙන් ගැවැසී ගත්තා වූ ස්ථානයන්හි මැ, (නොප) සියුමැලි බැවින් තවා තන් ගෙනැ, රත් වන් (වී) කරල් ගෙනැ එන්නා වූ ගිරවුන් අතින් මඟැ තොරතුරැ පිළිබඳ නියමය දැනැ ගෙනැ, සිත් තොසින් යන්නැ.

**විපසණ:—**

1. **ගිරවුන් අතින**— මෙහි 'අතින' යනු 'සොරෙස්' යන අර්ථ ඇත්තේ යැ. ගිරවා සොරිකාව හේ වලලන සේ නම්සමයෙහි සැලැකෙයි. එ හෙයින් අන් තෙනෙකත් නො අසා, ගිරවුන් අතින් මඟැ තොරතුරැ අසනු සේ කීහු.

**28.** **නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව සිරි** **න**
**දුල සැරැ සේ සක් මිණි බරණ කිරණි** **න**
**බල පිරි සෙන් සහ යාපා පවුන් ගෙ** **න**
**බල සේනානායක සපු කුමරැ එ** **න**

රිවි දෙව් සිරිනා නිල තුරඟුට නැඟෙමින්; මිණි බරණ කිරණිනා සේ සක් දුල සැරැ, යාපා පවුන් ගෙනැ, බල පිරි සෙන් සහ එන, සේනානායක සපු කුමරැ බල.

**රිවි දෙව සිරින**– සූර්යදෙවයා ගේ ආකාරයෙන්, **නිල**– නිල වර්ණ වූ, **තුරඟුට**– අශ්වයා පිටට, **නැඟෙමින්**– ආරූඪ වැ, **මිණි බරණ කිරණින**– මණ්‍යාභරණකාන්තියෙන්, **සේ සක්**– ශ්වෙත වජ්‍රය, **දුල සැරැ**– ජ්වලිත කොටැ (බබළවා), **යාපා පවුන් ගෙනැ**– යාපාපට්ටනය දිනා, **බල පිරි සෙන් සහ**– බලවත් සම්පූර්ණ වූ සෙනාව හා එක් වැ, **එන**– එමින් සිටියා වූ, **සේනානායක**– සේනාධිපති වූ, **සපු කුමරැ**– චම්පක කුමාරයා, **බල**– දකුව.

“ආර්යචක්‍රවර්තීහු පලවා හැරැ, යාපා පටුන තමා අයත් කොටැ ගෙනැ, පිය රජහු දන්නා පිණිස බලවත් වූ සම්පූර්ණ වූ සේනාව හා එන සේනානායක සපුමල් කුමරු දකුව”යි මෙයින් කීහ.

කෙසේ එන සපුමල් කුමරු ද? රිවි දෙවියා මෙන් නිල් අසකු පිටට නැඟී, සේ සක රත්නාභරණ කාන්තියෙන් බබළවා, එන සපුමල් කුමරු. කුමක් කොටැ එන කුමරු ද? යාපා පටුන ගෙනැ එන කුමරු. කාවුරුන් හා එන කුමරු ද? බලවත් වූ සම්පූර්ණ වූ සේනාව හා එන කුමරු.

**විපසණ:—**

1. **නිල තුරඟුට**– කවිසමයෙහි නීල කාල වර්ණද්වයය නොවෙනස් සේ ගැනේ. එ හෙයින් මෙ සුදු අසු නිල් කොටැ ගත් තැනි. සූර්යයා ගේ අශ්වයෝ සත් දෙන ද හරිද්වර්ණයෝ යැ (පලාවන්නු යැ). එ හෙයින් “රිවි දෙව් සිරිනා නිල තුරඟුට නැඟෙමිනැ” යි කීහු.

2. **නැගෙමින්**– පූර්වක්‍රියාවෙහි මිශ්‍රක්‍රියා නිපාත යි.

3. **සේසත්**–කුමරු අනු පිටින් එන කලැ ආතපාදිනිවාරණය පිණිස යෙදූ සුදු කුඩය යි.

4. **සිව් සෙන්**– ඇත් අස් රිය පාබල යන චතුරඞ්ගයෙන් යුක්ත වූයේ සම්පූර්ණසේනාව යි.

5 **සපු කුමරු**– සවන පරාක්‍රමබාහු රජු ගේ පුත් තනතුරෙහි වැඩුණු මේ තෙම 'සෙම්බහප් පෙරුමාල්' යන නාමයෙනුදු ප්‍රසිද්ධ යැ. මෑත භාගයෙහි සවන භුවනෛකබාහු නාමයෙන් රජයට පැමිණියේ මේ යැ.

29. අග පිපි මල් මලිගිය ලිය කැ — ලේ යා
වග බැඳෑ හෙන රජ හස පුල් වි — ලේ යා
ළග තුරු මල් ගිලිහුණු රොන'වු — ලේ යා
මග බැසෑ යව පළ හෙළ වැලි තෙ — ලේ යා

මලිගිය ලිය කැලේ(යා) අගැ මල් පිපි, රජ හස වග බැඳෑ පුල් විලේ (යා) හෙන, ළගැ තුරු මල් ගිලිහුණු රොන් අවුලේ(යා) පළ හෙළ වැලි තෙලේ(යා), මග බැසෑ, යව.

**මලි ගිය ලිය කැලේයා**– මාලතීලතාවනයෙහි (ඉද්ද වැල් කැලයෙහි), **අගැ**– අග්‍රයෙහි, **මල්**– පුෂ්පයන්, **පිපි**– ප්‍රබුද්ධ වූ, **රජ හස**– රාජහංසයන්, **වග බැඳෑ**– වර්ගබන්ධනය කොටැ හෙවත් පඞ්ක්ති සැදී, **පුල් විලේයා**–ඵුල්ල (පිපි මලින් ගැවැසි) තඩාගයෙහි, **හෙන**– බස්නා වූ, **ළගැ**– (මාර්ග) සමීපයෙහි වූ, **තුරු**– වෘක්ෂයන් ගේ, **මල්**– කුසුමයෙන්, **ගිලිහුණු**– ගලිත වූ හෙවත් වැටුණා වූ, **රොන්**– රේණුයෙන්, **අවුලේයා**– ආකූල වූ, **පළ**– ප්‍රකට වැ පෙනෙන්නා වූ, **හෙළ වැලි තෙලේයා**– සුදු වැලි තලායෙහි, **මග**– මාර්ගයට, **බැසෑ**– අවතීර්ණ වැ, **යව**– ගමනය කරව.

මගට බැසැ යව. කොබඳු මගට ද? මාලතීලතාසමූහයා ගේ මුදුනෙහි මල් පිපුණා වූ, රාජහංසයන් පඞ්ක්ති බැඳී (මල්) පිපුණු විල්හි බස්නා වූ, සමීපයෙහි වූ ගස්වලැ මලින් ගිලිහුණා වූ රේණු යෙන් ආකූල වූ ප්‍රකට වූ සුදු වැලි තලායෙහි මගට (බැසැ යව).

**ටිප්පණි**:—

1 **කැලේයා–විලේයා–අවුලේයා–තෙලේයා**–මේ සිවු තන්හි මැ 'යා' යනු ඡන්දස රැකෙනු පිණිස යෙදුණු අධික අකුරෙකි. 'ය' 'හ' ආදි අකුරු මෙසේ යොදනු කවිසම්ප්‍රදාය යි. 'ය' යනු කොබඳු පදයක් සමග වුව ද යෙදිය හැකි වේ. නමුත් 'හ' යනු එසේ යෙදිය හැක්කේ නො වේ. එය බෙහෙවින් යෙදෙනුයේ ප්‍රථමා බහුවචනාන්ත වූ නාමයක් සමග යැ; නැත හොත් බහුවචනාන්ත ආඛ්‍යාතයක් සමග යැ. 'අවුලේ' යන තන්හි වූ 'ඒ' යනු ද ඡන්දෝහේතුයෙන් මැ වූයේ යැ. අර්ථය ලැබීමට නම් 'අවුල්' යි සිටීම මැ ප්‍රමාණ වේ. 'තලේ' යන තන්හි 'ත' යන්නෙහි සවරය පරරූපයට යැමෙන් 'තෙලේ' යනු වී යැ.

2. වග බැඳෑ– 'සමූහ වෑ' යනු අර්ථ යි.

3. මේ පද්‍යයෙහි සමුද්‍රඝොෂ වෘත්තයට හී ලක්ෂණ නො පිරෙයි. සතර පාදයෙහි ම ලැබෙනුයේ මාත්‍රා සතළොස බැගිනි. පාදාන්තයෙහි ගුරක් වුයෙත් අධික මාත්‍රාවක් ද නො ගිණිය හැකි යැ. 74 වැනි පද්‍යයෙහි ද මේ [illegible] පැනේ.

### (5) මාර්ගවර්ණනා.

80. අ සි රවණ වුවත් නවතන රිසින් එ නා
අ සි ර දහස් දිලි දුනු කොත් සිපත් ගෙ නා
කා සි කාවලෙහි දකා සෙබළුන් රැකා සිටි නා
ව සි යා කරත් මල් තුරු ගන වන හිසි නා

එන අසිරවණ වුවත් නවතන රිසින්, අසිර දහස් දිලි දුනු කොත් සිපත් ගෙනෑ, කාසිකාවලෙහි රැකෑ සිටිනා සෙබළුන් දකෑ, මල් තුරු ගන වන හිසින, වසි යා කරත්.

එන– එන්නා වූ, අසිරාවණ වුවත්– ඓරාවණයා වූ නමුදු, නවතන රිසින්– නවත්වන්නා වූ අභිප්‍රායයෙන්, අසිර දහස්– දහසින් අධික වූ, දිලි– දිලිසෙන්නා වූ, දුනු කොත් සිපත්– ධනු කුන්ත අසිපත්‍රයන් (දුනු ද කුන්තයන් ද කඩු ද), ගෙනෑ– ග්‍රහණය කොට, කාසිකාවලෙහි– කාසිකාවල නම් ස්ථානයෙහි, රැකෑ සිටින– මුර කරමින් සිටින්නා වූ, සෙබළුන්– සේවක භටයන්, දකෑ– දර්ශනය කොට, මල් තුරු– පුෂ්පවෘක්ෂයෙන්, ගන– සාන්ද්‍ර වූ, වන හිසින– වනශීර්ෂයෙන් හෙවත් කැලෑ මුදුනින්, වසී– වහා, යා කරත්– යාත්‍රා කරත්නෑ හෙවත් (පියාඹා) යත්නෑ.

සේවක භටයන් දකෑ, මල් ගසින් ඝන වූ වන මුදුනින් වහා ගමන් කරත්. කවර සේවක භටයන් ද? කාසිකාවලෙහි රැකෑ සිටින්නා වූ සේවක භටයන්. කෙසේ රැකෑ සිටින්නා වූ සේවක භටයන් ද? එන්නා වූ ඓරාවණයා වුවත් නවත්වන කැමැත්තෙන් දහසකට ද අධික වූ දිලිසෙන්නා වූ දුනු ද කුන්ත ද කඩු පත් ද ගෙනෑ කාසිකාවලෙහි රැකෑ සිටින්නා වූ සේවක භටයන් (දකෑ, මල් ගසින් ඝන වූ වන මුදුනින් වහා ගමන් කරත්).

"අසිරාවණ වුවත් නවතන රිසින් එන"

යනුයෙන් මේ භටයන් ගේ ශූරවීරත්වය හැඟැවූහ. ඓරාවණයා ද නැවැත්වීමෙහි නොපසුබට වත් හොත්, ඔහු කවුරුන් දකෑ පසු බසිත් ද?

ටිප්පණී:—

1. අසිරවණ– මේ 'ඓරාවණ' යන සංස්කෘත වචනය, සිංහල පද්‍ය භාෂාවට ගැළපෙන සේ ලියූ සැටි යි. 'එරවණ' යනු සිංහල වචනය යි. මේ ශක්‍රයා ගේ හස්තියා යි. සිය ගවුවක් දිගැයි ද තුන්සිය සැට ගවුවක් උසැති ද යෙති.

2. **අසිරු**– අසිකාපීඨයෙහි යෙදේ.

3. **ඝොන්**– 'ඝුණා' නම් අනිනා ආයුධ විශෙෂයෙකි.

4. **සිපත්**– 'අසි පත්' යනයත්හි 'අ'කාර ලොපයෙන් වූයේ යැ. 'අසි' යනු මාගධ සංස්කෘත භාෂාද්වයෙහි ද කඩුවට නමි.

5. **සෙබළුන්**– (සේ+බළ) 'බළ' යනු 'භට' (යොධ) යන අර්ථයෙහි යෙදේ. 'සෙනා' යන්නෙහි 'සේ' යනු ආයේ යැ. එ හෙයින් 'සෙබළ' නම් සේනාවෙහි නියුක්ත භටයා යි. 'සේ' යනු 'ජේක'(දක්ෂ) යන අර්ථය ද ගෙනැ දෙයි'

5. **කසිකාවල**– එ කලැ මුර පලෙකි.

6. **වයි**– මේ සංස්කෘත 'වෛ' යනු යි. ශීඝ්‍රාර්ථයෙහි වැටේ.

**31. නි ම ල් සඳ පහන් වැනි වැලි පිටැ උදු ළ**
**සු පු ල් මල් යහන් ලිය මඬු ලිය ගෙ පෙ ළ**
**එ ක ල් කෙළන වන දෙව් ලිය දකැ කොම ළ**
**ළ ස ල් රුකෙකැ සැතැපෙව ළ පලු සිහිල' ළ**

නිමල් සඳ පහන් වැනි උදුළු වැලි පිටැ, සුපුල් මල් යහන් ලිය මඬු ලිය ගෙ පෙළැ, කෙළනා කොමළ වන දෙව් ලිය දකැ, එ කල් ළ පලු සිහිල් අළු, ළ සල් රුකෙකැ සැතැපෙව.

**නිමල්**– නිර්මල වූ, **සඳ පහන් වැනි**– චන්ද්‍රකාන්තිය හා සමාන වූ, **උදුළ**– දිලියෙන්නා වූ, **වැලි පිටැ**– වාලුකා ස්ථලයෙහි හෙවත් වැලි තලායෙහි, **සුපුල්**– මනා සේ පිපුණා වූ, **මල් යහන්**– කුසුම්ශයනයෙහි ද, **ලිය මඬු**– ලතාමණ්ඩපයෙහි ද, **ලිය ගෙ පෙළැ**– ලතාගෘහ පඞ්ක්තියෙහි ද, **කෙළන**– ක්‍රීඩා කරන්නා වූ, **කොමළ**– කොමල වූ, **වන දෙව් ලිය**– වනදිව්‍යස්ත්‍රීන්, **දකැ**– දර්ශනය කොටැ, **එ කල්**– ඒ කාලයෙහි **ළ පලු**– තරුණ පල්ලවයෙහි හෙවත් ළා දළුයෙහි, **සිහිල්**– ශීතල භාවය, **අළු**– එළුවූ, **ළ සල් රුකෙකැ**– තරුණ ශාලවෘක්ෂයෙක්හි, **සැතැපෙව**– විශ්‍රාමය කරව.

ක්‍රීඩා කරන්නා වූ කොමල වූ වනදිව්‍යස්ත්‍රීන් දකැ, ඒ කාලයෙහි, ළා දළුයෙහි ශීතලභාවය එළුවූ තරුණ සල් ගසෙකැ, නවාතැන් ගනු. කොහි ක්‍රීඩා කරන්නා වූ වන දෙව් ලිය ද? මනා සේ පිපුණා වූ මල් යහනෙහි ද, ලතාමණ්ඩපයෙහි ද, ලතාගෘහ පඞ්ක්තියෙහි ද, ක්‍රීඩා කරන්නා වූ වන දෙව් ලිය. කොහි වූ මල් යහන් ආදියෙහි ද? පිරිසුදු වූ සඳ පාන වැනි දිලියෙන්නා වූ වැලි තලා මතුයෙහි වූ (මනා සේ පිපුණු මල් යහනෙහි ද, ලතා මණ්ඩපයෙහි ද, ලතාගෘහපඞ්ක්තියෙහි ද, ක්‍රීඩා කරන්නා වූ කොමල වූ වනදිව්‍යස්ත්‍රීන් දකැ, ඒ කාලයෙහි, ළා දළුයෙහි ශීතල භාවය එළුවූ තරුණ සල් ගසෙකැ, නවාතැන් ගනු).

"සඳ පහන් වැනි" යි කීමෙන් වැලි ඉතා සුදු බව හැඟැවූහ.

**විසඳුම්:—**

1. **මල් සහන්**– මලින් කළ සහනි.

2. **ලිය මඬු**– වැල් විසිදූ එතීමෙන් මඬුවක් මෙන් වූ තැන 'ලිය මඬු' නම්.

3. **ලිය ගෙ**– වැලින් ගෙයක් මෙන් වූ තැනි.

4. **කොමල**– මෙයින් සුකුමාර ශරීර ඇති බව හැඟැවෙයි.

5. **සැනැපෙව**– 'සනප' ධාතුයෙන් වූ කර්මකාරක විධි ක්‍රියාපද යි. කර්මකාරක ප්‍රත්‍යයය නිරුත්‍යාභාවියෙහි දු යෙදේ. මේ එ සේ වූ තැනි.

6. **ල පදු සිහිල් අල**– "ලා දළුයෙහි සිහිල් බව එළැවූ" යනුයෙන් "ලා දළු කරණ කොටැ ගෙනැ සිහිල් බව ඇති වූ" යනු හැඟෙයි. 'අළ' යනු 'අර' (ඇරුම්හි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත පද යි. මෙහි ඇරීම නම් පැමිණි විම හෙවත් ඉදිරිපත් කිරීම යි.

32. ම   ල්   ද   ම්   සුවඳ දුම් දුන් සොඳ වරල    සි නි
     ක   ල්   ගි   ම්   නිවා සැනැහෙන සිසිලස ර    සි නි
     කොල්   ල   ම්   ගසින් නිල් ඉවුරැ'ති පොකුණ'    සි නි
     ව   ල්   අ   ම්   බලම දක්‍ෂැ යා ගන් සහ තො    සි නි

මල් දම් සුවඳ දුම් දුන් වරලසිනි සොඳ කල්, සිසිලස රසිනි ගිම් නිවා සැනැහෙන, කොල්ලම් ගසින් නිල් ඉවුරු ඇති, පොකුණ අසිනි, වල් අම්බලම දක්‍ෂැ, සහ තොසිනි යා ගන්.

**මල් දම්**– කුසුමදාමයන් ද, **සුවඳ දුම්**– සුගන්ධවත් වූ ධූම යන් ද, **දුන්**– දෙන ලද, **වරලසිනි**– කේශකලාපයෙන්, **සොඳ**– සුන්දර වූ, **කල්**– කාන්තාවන්, **සිසිලස රසිනි**– ශිතල ජලයෙන්, **ගිම් නිවා**– ග්‍රීෂ්මනිර්වාපණය කොටැ හෙවත් ශරීර දාහය පහ කොටැ, **සැනැහෙන**– ස්නානය කරන්නා වූ, **කොල්ලම් ගසින්**– කොල්ලම් ගස් කරණ කොටැ ගෙනැ, **නිල්**– නීලවර්ණ වූ, **ඉවුරු ඇති**– කූලයන් ඇත්තා වූ, **පොකුණ අසිනි**– පුෂ්කරිණීපාර්ශ්ව යෙන් (පොකුණු අසලින්), **වල් අම්බලම**– එ නම් විශ්‍රාම ශාලාව, **දක්‍ෂැ**– දර්ශනය කොටැ, **සහ තොසිනි**– සන්තොෂ සහිත වැ, **යා ගන්**– ගමන් ගන්නැ.

වල් අම්බලම දක්‍ෂැ, සන්තොෂසහිත වැ යා ගන්නැ. කොයින් (කොහි සිටැ) වල් අම්බලම දක්‍ෂැ ද? පොකුණු අසලින් (පොකුණු අසලැ සිටැ) වල් අම්බලම දක්‍ෂැ (යා ගන්). කෙබඳු පොකුණු අසලින් ද? මල් මාලා හා සුවඳ දුම් දුන්නා වූ කෙස් වැටියෙන් සුන්දර වූ කාන්තාවන් ශිතල ජලයෙන් ග්‍රීෂ්මය නිවා ස්නානය කරන්නා වූ ද, කොල්ලම් ගසින් නිල් වූ ඉවුරු ඇත්තා වූ ද, පොකුණු අසලින් (වල් අම්බලම දක්‍ෂැ සන්තොෂසහිත වැ ගමන් කරන්නැ).

**විසඳුම්:—**

1. **මල් දම් සුවඳ දුම් දුන්**– මල් මාලා බහා සුවඳ දුම් දී සොස් වැටිය බැඳීම පුරාතන ජාත්‍යන් ගේ සිරිති.

2. **කල්**– මේ ශබ්දප්‍රකෘතියාමැ බහුවචනාර්ථය ගෙනැ දීමට යෙදුණු තැනි. විභක්තිමත් කොටැ ගත් කල් හි මේ 'කලුන්' යි සිටියැ යුතු. පද්‍යයෙහි වූ බැවින් නිදොසි. ගැහැනු, ලිය, ගොන්, දන (ජන) යනාදි ශබ්දයෝ ද ප්‍රකෘතියෙන් සිටැ බහුවචනාර්ථය ද ගෙනැ දෙති. 'කල්' යනු මෙහි ස්ත්‍රී අර්ථයෙහි යෙදුණ ද, පුරුෂාර්ථයෙහි දු නොයෙදෙන්නේ නො වේ.

> "වැලැඳෑ ද කළුන් සා ර
> දුකට පැමිණෙත් ලියෝ සමහ ර"

යනු කාව්‍යශේඛරයෙහි එසේ යෙදුණු තැනෙකි. •

3. **රසිනි**– මෙහි 'රස' යනු ජලාර්ථයෙහි වේ.

4. **පොකුණසිනි**– (පොකුණු + අස + ඉනි) (පොකුණු අසැ) 'ළඟැ' යන අර්ථය මේ තෘතීයා (ඉනි) විභක්තියෙන් දක්වූ තැනි. "ගඟ මුදුනින් මුහුද බලව" යනාදීන් මේ සාමාන්‍ය ව්‍යවහාරයෙහි දු පෙනේ. පුරාණ සන්නයෙහි "පුෂ්කරිණී පාර්ශ්වයෙන් යුක්ත වූ" යි 'යුක්ත' යන්නක් අතින් දමා අරුත් බැණුණ ද, ඒ අයුක්ත යැ, 'ඉනි' විභක්ත්‍යන්තපදයක් මෙසේ විශේෂණ වැ නොසිටුනා හෙයිනි. මෙහි 'අස' යනු 'සිහිලස' යන තන්හි මෙන් නිරර්ථක නො වේ; සමීපාර්ථයෙහි වැටේ.

**33.** **කස්තුරු තිලක සැදි නලලතැ සුම** වා න
**පුල් රත්'පුල් මල් දම් හිසැ දව** වා න
**සලෙළුන් යනෙන නිති කැරැ කෙළි කව** වා න
**ඊවිමුඳුනතැ වන මැද වදු සුමු** වා න

සුම්වාන නලලතැ කස්තුරු තිලක සැදි සලෙළුන්, පුල් රත් උපුල් මල් දම් හිසැ දවවාන, කෙළි කවවාන කැරැ නිති යන එන, සුමුවාන වන මැද, ඊව් මුඳුනතැ වදු.

, **සුමවාන**– (සුමෘෂ්ට) අතිශයින් මටසිලුටු වූ, **නලලතැ**– ලලාට තලයෙහි, **කස්තුරු තිලක**– කස්තූරිතිලකයෙන්, **සැදි**– අලඞ්කෘත වූ, **සලෙළුන්**– තරුණයන්, **පුල්**– ඵුල්ල වූ (පිපුණා වූ), **රත් උපුල් මල් දම්**– රක්තොත්පලකුසුමදාමයන්, **හිසැ**– ශිර්ෂයෙහි, **දවවාන**– වෙළා ගෙනැ, **කෙළි කවවාන කැරැ**– කෙළි කවට කම් කොටැ, **නිති**– අනවරතයෙන්, **යන එන**– ගමනාගමනය කරන්නා වූ, **සුමුවාන වන මැද**– සුමුවාන නම් වන මධ්‍යයට, **ඊවිමුඳුනතැ**– මධ්‍යාහ්නකාලයෙහි (ඉර මුදුන් වේලෙහි), **වදු**– ප්‍රවිෂ්ට වව.

හිර මුදුන් වූ වේලෙහි, සුමුවාන නම් වන මැදට වදුව. කෙබඳු සුමුවාන වන මැදට ද? සලෙළුන් නිරන්තරයෙන් යන එන සුමුවාන වන මැදට. සලෙළුන් කුමක් කොටැ නිතර යන එන සුමුවාන වන මැදට ද? සලෙළුන්, පිපුණා වූ රත් මහනෙල්

මල් වැල් හිසෙහි දවටා ගෙනැ කෙළි කවට කම් කෙරෙමින් නිතර යන එන සුමුවාන වන මැදට. කෙබඳු සලෙළුන් ද? ඉතා මටසිළුටු වූ තලල් තලයෙහි කස්තුරි තිලකයෙන් අලඞ්කෘත වූ සලෙළුන් (පිපුණු රත් මානෙල් මල් වැල් හිසෙහි දවටා ගෙනැ, කෙළි කවට කම් කෙරෙමින් නිතර යන එන සුමුවාන වන මැදට හිර මුදුන් වූ වේලෙහි වදුව).

**විසඳුම්:—**

1. **තිලක–** තලල් මැද කස්තුරු කොකුම් සඳුන් ආදි යම් කිසිවෙකින් කැරෙන ලකුණෙකි. සිඞ්හදෙශවාසීහු ද, ලක් දිවැ ද්‍රවිඩයෝ ද එය දක්නුදු කෙරෙතු.

2. **සුමවාන...දවටාන... කවටාන–** මේ තුන් තන්හි මැ 'න'කාරය එළි වැට රුකැ ගන්නා පිණිස නිරර්ථක ලෙස යෙදුණෙකි. 'සුමවා' 'කවටා' යන දෙ තන්හි අත්‍යක්ෂරය දීඝ කැරුණෙයින් එළි වැට රැකෙන පිණිස යි. 'සුමට' 'දවටා' 'කවට' යි යෙදිණි නම් අර්ථට ප්‍රමාණ වේ. 'සුමුවාන' යනු හා එළිසම වැ සිටියැ යුතු වූ හෙයින් මෙ තුන් තැන ද වෙනස් කළ යුතු වී යැ. " 'කවටාන' යනු ද්විතීයා (කර්ම) විභක්ති බහුවචනාන්ත යැ"යි ගත හොත් 'ආන' යනු විභක්තිය වෙයි.

3. **සලෙළුන්–** 'සලෙළු' යනු තරුණාර්ථයෙහි යෙදෙන සිංහල වචනයෙකි. ප්‍රකෘතිය 'සලළු'යි ද සිටී.

4. **රිවිමුදුනතැ–** 'සනගස' යනාදි තන්හි 'අස' යනු මෙන් මෙහි 'අත්' යනු ද නිරර්ථක යැ. 'රිවිමුදුනතැ'යි කිව ද 'රිවිමුදුනැ' යි කිව ද ලැබෙනුයේ එක මැ අර්ථ යි. 'කනත' නම් කන යි. 'ගහනත' නම් ගහන (නැහැය) යි. 'නුවනත' නම් නුවන (ඇස) යි. ඒ ඒ දෙසෙහි කෙළවර මැ විශෙෂයෙන් හැඟෙන තන්හි 'අත්' යනු සාර්ථ වෙයි. 'පොකුණසිනි' යන තන්හි 'අස' යනු මෙහි. රිවි මුදුනත්හි වූයේ යම් කාලෙක්හි ද, ඒ රිවිමුදුනත්. එහි රිවිමුදුනතෙහි.

5. **සුමුවාන–** දැන් 'හිඹුටාන' යන නාමයෙන් ප්‍රසිද්ධ යැ.

34\. **මඟැ නි ලමින් සිපි නා දෙඹ නී පිය ල**
**පිය ස ලමින් මල'ගෙහි කොළැ රෙනින'ව ල**
**න තුඩ ලමින් බිඳු විලිකුන් මියුරු ප ල**
**ඉ සු ඹු ලමින් යෙහි සැල දඹ පඳුරැව ල**

මඟැ නිලමින් සිපි නා දෙඹ නී පියල රෙනින් අවල මල් අංගයි පිය සලමින් කොළැ, න තුඩ ලමින් විලිකුන් මියුරු පල බිඳැ, දඹ පඳුරැවලැ ඉසුඹු ලමින්, සැල, යෙහි.

**මඟැ–** මාර්ගයෙහි, **නිලමින් සිපි–** නීලවර්ණ වැ සිපියා වූ, **නා–** නාග යැ, **දෙඹ–** පුන්නාග යැ, **නී–** නීප (බක්මී) යැ, **පියල–** ප්‍රියාල (මොර) යැ, (යන මේ වෘක්ෂයන් ගේ) **රෙනින් අවල–** රේණුයෙන් ආකුල වූ, **මල් අගෙහි–** කුසුමාග්‍රයෙහි, **පිය සල**

මින්- පක්‍ෂවාලනය කෙරෙමින් (පියාපත් සොලවමින්), කෙලෑ- ක්‍රීඩා කොටැ, තා තුඩ- තා ගේ තුණ්ඩය, ලමින්-ප්‍රක්‍ෂෙප කෙරෙමින් හෙවත් බහා, පිළිකුන්- මනා වැ පැසුණා වූ, මිහුරු පල- මධුර වූ ඵලයන්, බිඳු- අනුභව කොටැ, දඹ පඳුරුවලැ- ජම්බු ස්තම්බයන්හි, ඉසුඹු ලමින්- විශ්‍රාමය කෙරෙමින්, සැල- ශාරිකා පක්‍ෂිය, යෙහි- ගමනය කර.

සැල ලිහිණිය, දඹ පදුරු වලැ විඩා හරිමින් යව. කුමක් කොටැ විඩා හරිමින් ද? තා ගේ තුඩ ලමින්, ඉදුණු මධුර ඵල අනුභව කොටැ. අන් කුමක් කොටැ ද? මාර්ගයෙහි නිල් වැ සිටියා වූ නා යැ, දෙඹ යැ, බක්මී යැ, මොර යැ යන ගස් වලැ රේණුයෙන් ගැවැසී ගත් මල් අගැ පියාපත් සලමින් ක්‍රීඩා කොටැ, (තා ගේ තුඩ ලමින් ඉදුණු මධුර ඵල අනුභව කොටැ, දඹ පඳුරුවලැ විඩා හැර, සැල ලිහිණිය, යව).

විපසන්:—

1. **නිලමින්**- 'නිල්' යන නාමය ධාතුව වැ 'නිල'යි සිටි කලැ, එයින් නිපන් මිශ්‍රක්‍රියා නිපාත පද යි.

2. **බිඳු**- 'බුදු' (බිඳීමෙහි-කෑමෙහි) ධාතු යි. මේ ධාතුව බුදී - බුදිති- බිදි- ඈ වියිය වරනැගේ. 'බිදැ' යනු අපපාඨ යි.

3. **ඉසුඹු**- මේ 'විශ්‍රාම' යන්නෙන් ආයේ යැ. "ශ්‍රම හෙවත් විඩාව දුරු කිරිම යැ" යනු අර්ථ යි.

4. **ලමින්**- 'තා තුඩ ලමින්' ඉසුඹු ලමින්' යන දෙ තන්හි මැ වූ 'ලමින්' යනු පූර්වක්‍රියාර්ථයෙහි වූ මිශ්‍රක්‍රියා නිපාත යි.

5. **යෙහි**- වර්තමාන මධ්‍යම පුරුෂ ඒකවචන ආඛ්‍යාතපද යි. මේ විධි ක්‍රියාර්ථයෙහි යෙදුණු තැනි.

**35.** රිවි තැවුලේ පිපි සමලේ විල් ගැවැ සි
මන සෝ වුලේ තුරු වදලේ හඩනා නි සි
වන සැවුලේ මගැ අසලේ පොර සැලැ සි
ගුරු බැවුලේ යව අවුලේ නො වී කි සි

රිවි තැවුලේ පිපි සමලේ විල් ගැවැසි, නිසි තුරු වදලේ මන සොවුලේ හඩන, මගැ අසලේ වන සැවුලේ පොර සැලැසි, ගුරුබැවුලේ කිසි අවුලේ නො වී, යව.

**රිවි තැවුලේ**- සූර්යතාපය කාරණ කොටැ ගෙනැ, **පිපි**- පිපුණා වූ, **සමලේ**- පද්මයන් ඇති, **විල් ගැවැසි**- තඩාගයන් ගැවැසී ගත්තා වූ, **නිසි**- යොග්‍ය වූ, **තුරු වදලේ**- වෘක්‍ෂයන් ගේ මූවායෙහි, **මන සොවුලේ**- මත්තකොකිලයන්, **හඩන**- නාද පවත්වන්නා වූ, **මගැ අසලේ**- මාර්ගාසන්නයෙහි, **වන සැවුලේ**- විල්කුකුළන්, **පොර සැලැසි**- යුද්ධයෙහි යෙදුණා වූ, **ගුරු බැවුලේ**- ගුරුබැවුල නම් ප්‍රදෙශයෙහි, **කිසි අවුලේ නො වි**- ස්වල්ප වූ ද ආකූලයක් නැති වැ, **යව**- ගමන් කරව.

ගුරුබැවුලේ කිසි අවුලක් නො වී යව. කෙබඳු ගුරුබැවුලේ ද? හිර අවුවෙන් පිපුණා වූ පියුම් විල් ගැවැසුණා වූ ද, (නැසිරී මට) යොග්‍ය වූ ගස් වදුලෙහි මත් වූ කොවුලන් හඬන්නා වූ ද, මාර්ගය අසලැ විලිකුළන් පොරෙහි යෙදුණා වූ ද, ගුරුබැවුලේ (කිසි අවුලක් නො වී ගමන් කරව).

ටිප්පණි:—

1. **රිවි තැවුලේ**– 'තැවුලේ' යනු කරණාර්ථයෙහි පස් වන (ආධාර) විබත ගත් තැනි.

2. **කමලේ...කොවුලේ...සැවුලේ...අවුලේ**– 'කමල්' 'කොවුල්' 'සැවල්' 'අවුල්' යි සිටියැ යුතු තැන් එළි වැට රැකෙනු පිණිස 'ඒ'කාරයෙකින් යුක්ත කරන ලද. 'කොවුලන්' 'සැවුලන්' යි ඒකනාමයේ වැ සිටියැ යුතු වුව ද; පද්‍යයෙහි වන බැවින් ඒ දෙ තැන ප්‍රකෘතිරූපයෙන් සිටි සේ ගත හැකි වේ.

3. **ගැවැසි ..හඬන ..සැලැසි**– මේ කෘදන්ත පද තුන මැ 'ගුරුබැවුලේ' යන්නට විශේෂණ වේ. මෙබඳු විශේෂණ කෘදන්ත පද කවර කාරක යක් වුව ද උක්ත කෙරෙයි. සුභාෂිත විවරණය බලන්නේ යැ.

4. **මත කොවුලේ**– ප්‍රීතියෙනුදු, පුෂ්පමධු ආදියෙනුදු, මදයෙනුදු මත් වියැ හැකි යැ. මේ වසන්තකාලය වන බැවින් කොවුලා ඍතුගුණයෙන් මැ මත් වෙයි.

5. **තුරු වදලේ**– 'වදුලු' නම් කොළ ආදිය ඝනව වැ මුවා වූ තැනි.

6. **තිසි**– තුම්සට තිසි ද? නැසිරීමට තිසි.

7. **නො වී**– මෙහි 'වී' යනු හේත්වර්ථයෙහි වූ භින්නකර්තෘක පූර්වක්‍රියා නිපාත යි. 'නොවීමෙන්' යනු අර්ථ යි. යම් පූර්වක්‍රියාවක් කරන්නහු ඒ පූර්වක්‍රියාව හා බැඳෙන ක්‍රියාව කරන්නහු ගෙන් අන්‍ය වේ ද, ඒ භින්නකර්තෘක පූර්වක්‍රියා නම්. මෙහි 'වී' යන්නෙහි කර්තෘ පදය 'අවුල්' යනු යි. 'වී' යනු හා 'බැඳෙනා' 'යව' යන්නෙහි කර්තෘපදය 'තෝ' යනු යි.

8. **ගුරු බැවුලේ**– මෙයට දූත් 'මානගුරුගොඩැල්ල යැ' යි කියත්. 'බැවුල්' යනු 'උස් වූ ප්‍රදේශය' යන අර්ථ ඇත්තේ යැ.

36. **වන සිරි පියුම්රා බඳ රන'බරණ යු රැ**
**වටැ පිරි සුපුල් දුනුකේ මල් මුරැන'තු රැ**
**බිඟු පිරි වැරැ ඔලු'පුලැ'ඹුල'වල තඹු රැ**
**හිම සරි සිසිල් දිය ගෙබ දූකැ යන් මිතු රැ**

වන සිරි පියුම්රා බඳ රන් අබරණ අයුරු මල් මුරුත අතුරු සුපුල් දුනුකේ වටැ පිරි, බිඟු පිරිවැරැ ඔලු උපුල් ඇඹුල තඹුරු අවල, හිම සරි සිසිල් දිය ගෙබ දකැ, මිතුරු, යන්.

**වන සිරි**– වනලක්ෂ්මිය ගේ, **පියුම්රා**– පද්මරාග මාණික්‍ය යෙන්, **බඳ**– බඳනා ලද්ද වූ, **රන් අබරණ අයුරු**– ස්වර්ණාභරණ යක් හා සමාන වූ, **මල් මුරුත අතුරු**– මල් සහිත මුරුත ගස්

අතරෙහි, සුපුල්- සුඵුල්ල වූ හෙවත් මනා සේ පිපුණා වූ, දුනුකේ- රාජකේතකී (දුනුකේ) වෘක්ෂයන්, වටැ පිරි- හාත්පසැ පිරැණා වූ. බිඟු- භෘඞ්ගයන් විසින්, පිරිවැරූ- පරිවෘත වූ, **ඔලු උපුල් ඇඹුල නඹුරැ**- ඔලු යැ මානෙල් යැ එළ මානෙල් යැ නෙළුම් යැ යන මෙයින්, අවුල- ආකුල වූ, හිම සරි- හිම හා සමාන වූ, සිහිල්- ශීතල වූ, දිය- ජලයෙන් යුක්ත වූ, හෙබ- ශ්වභ්‍රය (ගැඹුරු ජලාශය), දුසැ- දර්ශනය කොට, මිතුරූ- මිත්‍රය, යන්- ගමනය කරන්.

හෙබ දුසැ, මිත්‍රය, යන්නැ. කෙ බඳු හෙබ ද? වනශ්‍රිය ගේ හෙවත් වන ශොභාව නමැති සිරි කත ගේ, රතු මැණික් බැඳි ස්වර්ණාභරණයක් වැනි, මල් සහිත මූරුත ගස් අතරෙහි මනා වැ පිපුණු දුනුකේ ගස් හාත්පස්හි පිරුණා වූ ද, භෘඞ්ගයන් පිරිවැරුවා වූ ඔලු යැ, මානෙල් යැ, එළ මානෙල් යැ, නෙළුම් යැ යන මෙයින් ආකුල වූ ද, හිම මෙන් සිහිල් වූ දිය ඇත්තා වූ ද, හෙබ (දුසැ, මිත්‍රය, යන්නැ).

මෙහි පියුම්රා බඳ රන් අබරණ අයුරු වූයේ කිමෙක් ද? මල් මූරුත අතුරෙහි සුපුල් වූ දුනුකේ යැ. මූරුත මල් රත් පැහැ ඇත්තේ යැ; දුනුකේ මල් රන් වන් වේ. එ හෙයින් මූරුත මල් අතරෙහි වූ දුනුකේ මල්, පියුම්රා (රතු කැට) බැඳි රන බරණක් වැන්නේ යැ.

විශේෂ:—

1. **වන සිරි**- 'වන සිරි' නම් වනයා ගේ ශොභාසම්පත්තිය යි. නමුත් 'සිරි' යනු (විෂ්ණුභාර්‍යා වූ ද ශ්‍රී සම්පත්තියට අධිපති වූ ද) ශ්‍රී දෙවියට ද නම් වේ. එ හෙයින් මෙහි 'වන සිරි' නම්, වන ශොභා නමැති ශ්‍රී දෙවිය යි.

**37.** ස ලා දු ලා පියොවුරැ තඹර රෙණ් ර න
පු ලා නි ලා උපුලන් ලා ගෙනැ කණ න
ක ලා පි ලා නො වැ ඇල්ගෙවි කෙළන ඉ න
බ ලා ප ලා සව අස්වන් ගුරුළු කෙ න

දුලා පියොවුරැ රන තඹර රෙණ් සලා, පුලා නිලා උපුලන් කණනැ ලා ගෙනැ, කලා පිලා නො වැ ඉන ඇල්ගෙවි කෙළන, අස්වන් ගුරුළු කෙත බලා, පලා යව.

දුලා- දිලිසෙන්නා වූ, පියොවුරැ- පයොධරයෙහි, රන තඹර රෙණ්- රක්ත වූ තාමරස රේණුන් හෙවත් රත් නෙළුම් රේණු, සලා- විසුරුවා ගෙනැ, පුලා- ඵුල්ල වූ හෙවත් පිපුණා වූ, නිලා උපුලන්- නීලොත්පලයන්, කණනැ- කර්ණාන්තයෙහි, ලා ගෙනැ- බහා ගෙනැ, කලා පිලා නො වැ- කලහ පීඩාවක්

නැති වැ, ඉත- අත්‍යන්‍යමිත්‍ර වූ, ඇල්ගෙවි- ශාලිගොපිකාවන් හෙවත් ඇල් කෙත් රක්නා සත්‍රීන්, කෙළන- ක්‍රීඩා කරන්නා වූ, අස්වන්- ශශ්‍යසමෘද්ධියෙන් යුක්ත වූ (අස්වැද්දුණා වූ), ගුරුළු කෙත- ගුරුළු කෙත නම් කුඹුර, බලා- නරඹා, පලා යව- ගමන් කරව.

දිලිසෙන්නා වූ පයොධරයෙහි රත් වූ නෙළුම් රේණු සලා ගෙන, පිපුණා වූ තිල් මානෙල් කන් අගැ ලා ගෙන, කලහ පීඩාවක් නො වී, (ඔවුනොවුන් හට) හිත වූ ශාලිගොපිකාවන් ක්‍රීඩා කරන්නා වූ ද, අස් වැද්දුණා වූ ද, ගුරුළු කෙත බලා, පිටත් වැ යව.

**විසඳුම්:—**

1. **දුලා... පුලා... නිලා**– 'දුල්' 'පුල්' 'නිල්' යි සිටියැ යුතු තැන් එළි වැට රැකෙන පිණිස, 'ආ'කාරයෙකින් යුක්ත කරන ලද.

2. **කලා**– කලහ = කල + අ = කලා. හකාරලොප කා 'අ + අ' දෙදෙනාම 'ආ'.

3. **පිලා**– 'පීලා' යන්නෙන් ආයේ යැ. 'පීඩා' යනු අර්ථ යි.

4. **ඉත**– 'හිත' යන්නෙහි 'හ'කාරය ලොපයට පැමිණීමෙන් නිපන. 'හිතවත්' හෙවත් 'මිත්‍ර' යනු අර්ථ යි.

5. **පලා**– 'පලා' (යැමෙහි) ධාතුයෙන් නිපන් පූර්වක්‍රියා නිපාත යි.

6. **අස්වන්** – 'අස්' ශබ්ද හා යෙදුණු 'වද' (වැදුම්හි) ධාතුයෙන් සිද්ධ වූ අතීත කෘදන්තපද යි. 'අස්' යනු ද, පාළි 'සස්ස' (සංස්කෘත 'ශස්‍ය') යන්නෙන් ආ, 'හස්' යන්නෙහි 'හ'කාරලොපයෙන් වූයේ යැ. '(අස්)වද' යනු (අස්)වදී- (අස්)වදිති (අස්)වනි- (අස්)වනු- ආ විසින් වරනැගේ. 'අස්වැදීම' නම් ශශ්‍යසමෘද්ධිය ඇති වීම යි.

7. **ගුරුළු කෙත**– දැන් "ගුරුල්ල කෙත යැ" කියත්.

38. බ න් නේ මර මිණි දුල පබළු මුතු ප ට
වැ න් නේ ගම්'ඹු ගෙලෙ පල මල් කුමුකු ව ට
ග න් නේ න සිත එ බැවින් නො වැද කෙළිය ට
ය න් නේ වෙලඳගොඩ දැකැ මඳ කලක් සි ට

පල මල් කුමුකු වට ගම් අඹු ගෙලෙ බන්නේ මර මිණි දුල පබළු මුතු පට වැන්නේ, නසිත ගන්නේ. එ බැවින් කෙළියට නො වැද, වෙලඳගොඩ දැකැ මඳ කලක් සිටැ, යන්නේ.

පල මල්- ඵලයෙන් හා පුෂ්පයෙන් යුක්ත වූ, කුමුකු වට- පූගවෘක්ෂවෘතිය (පුවක් ගස් වැට), ගම් අඹු ගෙලෙ- ග්‍රාමස්වාමිනිය ගේ ග්‍රීවායෙහි, (ගම නමැති ස්ත්‍රිය ගේ ගෙලෙහි),

බන්- බඳනා ලද, නේ මරා මිණි දුල- නොයෙක් මරකත මණි යෙන් දිලියෙන්නා වූ, පබළු මුතු පට වැන්නේ- ප්‍රවාල (මිශ්‍ර) මුක්තාහාරයක් වැනි වූයේ, න සිත- තා ගේ චිත්තය, ගන්නේ- ග්‍රහණය කරන්නේ යැ හෙවත් අලවන්නේ යැ. එ බැවින්- ඒ භාවයෙන්, කෙළියට නො වැදූ- ක්‍රීඩාවට ප්‍රවිෂ්ට නො වැ, වෙළඳගොඩ- වෙළඳගොඩ නම් ග්‍රාමය, දැකැ- දර්ශනය කොටැ, මඳ කලක් සිටැ- ස්වල්ප කාලයක් නැවැති, යන්නේ- ප්‍රයාණය කරන්නේ යැ.

(නිල් රතු) ගෙඩි හා (සුදු) මල් ඇති පුවක් වැට, ගම නමැති ස්ත්‍රිය ගේ ගෙළෙහි බඳනා ලද නොයෙක් මරා මිණියෙන් බබළන්නා වූ පබළුයෙන් යුත් මුතු පටක් වැනි වූයේ, තා ගේ සිත ගන්නේ යැ. එ හෙයින් ක්‍රීඩාවට නො වැදී, වෙළඳගොඩ නම් ගම දැකැ, ස්වල්ප වේලාවක් සිටැ ගමන් කරන්නේ යැ.

පුවක් වැට ගම වටා සිටි බැවින්, ගම නමැති ස්ත්‍රිය ගේ ගෙලෙහි බැඳි පබළු මුතු පටක් වැන්නැ යි කීහ. නිල් ගෙඩි මරා මිණි (පච්ච) වැන්නැ; රතු ගෙඩි පබළු වැන්නැ; මිණිමුතු නුවූ සුදු මල් මුතු වැනි වේ. මෙ සමාන කිරීම වර්ණය නිසා වෙයි.

ටිප්පණී:-

1. **වැන්නේ**- (වැනි වූයේ) වැනි වූ හෙයින් යන අර්ථය මෙයින් ලැබේ. "ගේ පොහොසත් වූයේ දූන් අප නො බලයි" යන තන්හි 'වූයේ' යනුයෙන් 'වූ හෙයින්' යන අර්ථය ලැබෙන්නාක් මෙනි.

2. **ගන්නේ**- මෙ ආඛ්‍යාතයෙක් නො වේ. කෘදන්ත නාමයෙකි. "කුමුතු වට න සිත ගන්නේ වේ" යී 'වේ' යන ආඛ්‍යාතය අධ්‍යාහාර්‍ය යි. මේ බව නොදන්නාහු, "සිංහලයෙහි අනාගතාර්ථය වෙසෙසා හඟවන ආඛ්‍යාතයක් ඇති" යි යෙති.

3. **යන්නේ**- මෙ විධික්‍රියාපදයෙක් නො වේ. භාවකෘදන්ත නාමයෙකි. 'යෑම' යනු අර්ථ යි. "යන්නේ මැනැවි" යි වාක්‍යය සම්පූර්ණ කැරැ ගත යුතු. 'යන්නේ' යනු විධික්‍රියාවෙක් වී නම් "තෝ යන්නෙ" යි වාක්‍ය වෙයි. නමුත් එ බන්දෙක් කිසි කලෙකත් නො යෙදේ. මේ බව නොසැලැකූ පතිරජ පිරුවන් හිමියෝ එහි යෙහි 'අන්නේ' ප්‍රත්‍යයයක් දක්වා, ආධුනිකයන් නොමඟ යැවූහ.

39. අවට සුපිපි සපු දුනුකේ සල ලා න
හඬන තැනින් තැනැ විලිකුළු කිර ලා න
පැසි නැමි කරල රත් හැල් සහ ලා න
වඩන මැනැවි මහ වෙල මැදූ වෙර ලා න

අවට සුපිපි සපු දුනුකේ සලලාන තැනින් තැනැ විලිකුළු කිරලාන හඬනා, රත් හැල් කරල් පැසී නැමී, වෙරළාන මහ වෙල මැදූ, සහලාන, වඩනා මැනැවි.

**අවම**- හාත්පසින්, **සුපිපි**- සුපුෂ්පිත වූ, **සපු දුනුකේ සල ලාන**- චම්පක රාජකෙතකී සරල (සොර) වෘක්ෂයන් ගෙන් යුක්ත වූ වනයෙහි, **තැනින් තැනැ**- තන්හි තන්හි හෙවත් ඒ ඒ තැනැ, **විලිකුළු කිරලාන**- විලිකුළුන් හා කිරළුන්, **හඬන**- නාද පවත්වන්නා වූ, **රත් හැල් කරල්**- රක්තශාලිශස්‍යමඤ්ජරීන්, **පැසි**- පරිණත වැ, **නැමි**- නැමුණා වූ, **වෙරලාන මහ වෙල මැද**- වෙරලාන නම් වූ මහාක්ෂෙත්‍ර මධ්‍යයෙහි, **සහලාන**- මිත්‍රය, **මඩන මැනැවි**- ගමන් කරනු යහපති.

යහළුව, වෙරලාන නම් මහ කුඹුර මැද යනු යහපති. කෙබඳු වූ වෙරලාන නම් මහ කුඹුර මැද ද? හාත්පසැ (කුඹුර වටා) මනා වැ පිපුණා වූ සපු දුනුකේ හොර ගසින් යුත් වනයෙහි තැනින් තැනැ විලිකුළුන් හා කිරළුන් හඬන්නා වූ ද, රත් හැල් නම් වී කරල් පැසී නැමුණා වූ ද, (වෙරලාන නම් මහ කුඹුර මැද, යහළුව, යනු යහපති).

**විසඳුම්**:-

1. **සපු දුනුකේ සලලාන**- මේ 'සපු දුනුකේ සලල වන' යන්නට සමාන ය. කෙවල වැ යෙදීම කෙසේ වුව ද, අන්‍ය ශබ්දයක්හු ගේ සම්බන්ධයෙන් යෙදෙන කල්හි 'ආන' යනු වනාර්ථය ගෙනැ දෙයි. 'මූකලාන' නම්, මූකල වනය යි.

2. **සහලාන**- මෙහි 'න'කාරය එළි වැට රුකැ ගන්නා පිණිස යෙදුණෙකි. 'සහලා' යනු මිත්‍රාර්ථයෙහි වැටේ. සසදයෙහි-

"නැමී වසත් රජ-කල් **සහලා** දකුණු මරු"

යන තන්හි 'කල් සහලා' යනු 'ප්‍රියමිත්‍ර' යන අර්ථයෙහි යෙදිණ. මේ රහල් හිමියෝ මැ-

" තම ගනනත පු බා
පැරැයූ වටොර මහ බා
**සහලා** වන ර බා
ගජහු වෙරිතෙ'ව බිදිති නො න බා "

යන තන්හි 'සහළා' යනු සුහෘදර්ථයෙහි යෙදූහ. ගුත්තිලයෙහි-

"පියුම් පිටැ සිටැ සරණ **සහලා**"

යන තන්හි 'සහළා' යනුයෙන් ලැබෙනුයේත් සුහෘදර්ථය යි. සදෘශාර්ථයක් ලැබෙතුදු එසේ වනුයේ සුහෘදර්ථය මුල් කොටැ ගෙනැ ය.

පුරාණ සන්නයෙහි "රත් හැල් සහලාන" යි ගෙනැ, "රක්තශාලින් යුක්ත වූ"යි අරුත් බැණුණු සේ අයුක්ත යැ. 'සහලාන' යි (දන්ත්‍ය) 'ල'කාර යුක්ත කොටැ ගත ද, එයින් 'යුක්ත වූ' යන අර්ථය කෙසේ නම් ලැබේ ද? ලැබෙතුදු, මෙහි (දන්ත්‍ය) 'ල'කාර වුව හොත්, එළිවැට බිඳෙයි. 'කිරළ' යනු (මූර්ධන්‍ය) 'ළ'කාරවත් බව රහල් හිමියෝ මැ-

" මහවෙල් දිය කිර ළි
සරහ දියකා කොක වැ ලි
සිසිල් දිය සොරව ලි
සදිසි සුදු වැලි රිදී පව්තු ලි "

යන තන්හි දක්වූහ.

3. වෙරලාන- දැන් 'වැරැල්ලාන' නමින් හැඳින්වෙන ප්‍රදේශය යි.

40. පත් ගන පුල්මල් දෙඹ තුරෙකැ පියකා රැ
සිත් පිනවා ඉඳැ සැල ළිහිණින් අතු රැ
ගත් සරතස හැරැ විඳැ සුවඳ මඳ ම රැ
කිත් සිරිමෙ වෙහෙරට වදුව පස්ව රැ

පත් ගන පුල් මල් පියකරු දෙඹ රුකෙකැ, සැල ළිහිණින් අතුරු ඉඳැ, සිත් පිනවා, සුවඳ මඳ මරු විඳැ, ගත් සරතස හැරැ, පස් වරු කිත්සිරිමෙ වෙහෙරට වදුව.

**පත්**- පත්‍රයන් ගෙන්, **ගන**- ඝන වූ, **පුල්මල්**- පිපුණා වූ මල් ඇති, **පියකරු**- ප්‍රියඞ්කර වූ, **දෙඹ රුකෙකැ**- පුන්නාග වෘක්ෂයෙකැ, **සැල ළිහිණින් අතුරු**- ශාරිකා පක්ෂීන් ගේ මධ්‍යයෙහි, **ඉඳැ**- නිෂද්නය කොට, **සිත් පිනවා**- චිත්තය ප්‍රීතියට පමුණුවා, **සුවඳ**- සුගන්ධවත් වූ, **මඳ මරු**- මන්දමාරුතය, **විඳැ**- විඳිනය කොට, **ගත්**- ශරීරයෙහි, **සරතස**- ශ්‍රාන්තිය (විඩාව), **හැරැ**- පහ කොට, **පස්වරු**- අපරාහණ කාලයෙහි, **කිත්සිරිමෙ වෙහෙරට**- කීර්තිශ්‍රීමෙඝ විහාරයට, **වදුව**- ප්‍රවිෂ්ට වව.

පත්‍ර ඝන වැ ඇති පිපුණු මල් ඇති ප්‍රියකර වූ දෙඹ ගසෙකැ සැල ළිහිණින් හා සමග ඉඳැ, සිත සතුටු කොට, සුවඳින් යුත් මඳ සුළඟ විඳැ ශරීරයෙහි විඩාව දුරු කොට, ඉර හැරුණු වේලෙහි කිත්සිරිමේ විහාරයට ඇතුළු වව.

නෑයන් සමග සිත් සේ මුවා වැ සෙවණෙහි හිඳීමට පිළිවන් වන පරිදි පත් ගන වූ ද, චිත්තප්‍රීතිය ඇති කිරීමට වහල් වන පරිදි පුල් මල් ඇති වූ ද, දෙඹ තුරෙකැ හිඳිනට කිහ. ගමනින් ද නෑයන් සමග ක්‍රීඩායෙන් ද වූ ශ්‍රාන්තිය සුවඳින් යුත් මඳ සුළඟ විඳීමෙන් හරනට කීහ.

**විසඳුම්:—**

1. **කිත්සිරිමේ වෙහෙර**- "කිත්සිරිමෙවන් කැළණි වෙහෙර"යි දැන් කියති. 'කිත්සිරිමෙවන්' නම් රජකු විසින් කැරැවුණෙන් එනම් වී,

41. සොඳ මුනි රද පිඩු කල යස මෙරද ස ම
පු ද කල බහු නෙත් නිල් කැලුමෙ'ව බැර ම
ස ද යුරු සඳ වෙලෙන් රැඳි රුසිරු මනර ම
ව ද නෙති තෝ දා ගප් මහ බෝ පිළි ම

සොඳ මුනි රද පිඩු කල යස මෙරද සම, ඔහු පුද කල නෙත් බැරම නිල් කැලුම එව්, සඳ වෙලෙන් රැඳි සඳ අයුරු රුසිරු මනරම, දා ගප් මහ බෝ පිළිම, තෝ වදනෙහි.

**සොඳ**– යහපත් වූ, **මුනි රද**– සර්වඥයා ගේ, **පිඩු කල**– කැටි කරන ලද්දා වූ, **යස මෙරද සම**– යශොමරීචි (යසස් නමැති රශ්මි) හා සමාන වූ ද, **ඔහු**– ඒ සර්වඥරාජයා විසින්, **පුද කල**– පූජා කරන ලද්දා වූ, **නෙත්**– නෙත්‍රයන් ගේ, **බැරම**– බොහෝ වූ, **නිල් කැලුම් එව**– නීලකාන්ති හා සමාන වූ ද, **සඳ වෙලෙන්**– සන්ධ්‍යා වලාහකයෙන්, **රැඳි**– රඤ්ජිත වූ, **සඳ අයුරු**– චන්ද්‍රයාට බඳු වූ, **රුසිරු**– රූපශ්‍රීන්, **මනර**–ම මනොරම්‍ය වූ ද, **දා ගප්**– ධාතු ගර්භයට ද, **මහ බෝ**– මහාබොධියට ද, **පිළිම**– ප්‍රතිමාවට ද, **තෝ වදනෙහි**– තෝ නමස්කාර කරන්නෙහි.

යහපත් වූ බුදු රජහු ගේ කැටි කරන ලද කීර්තිරශ්මිය හා සමාන වූ දා ගබ ද, ඒ බුදු රජහු විසින් පූජා කරන ලද නෙත්‍රයන් ගේ බොහෝ වූ නීලකාන්තිය වැනි වූ මහාබොධිය ද, සැන්දෑ වලා කුළින් රැඳුණු චන්ද්‍රයා වැනි රූපශ්‍රීන් මනොහර වූ ප්‍රතිමාව ද, තෝ වඳනෙහි යැ.

**විසඳුම්:—**

1. **පිඩු කල යස මෙරද සම**– යශස් හෙවත් කීර්ති නම් රූවෙහි පැතුරුණු ගුණ කථාව යි. කවිසමයයෙහි කීර්තිය සුදු සේ ගැනේ. බුදුන් ගේ කීර්තිය වනාහි ලොව පුරා සිටියේ යැ. එය යම් කිසි ලෙසෙකින් පිඩු (කැටි) කළ හැකි වී නම්, අතිශයින් ශුභ්‍රවර්ණ වූ ඉතා මහත් පිඩෙක් වෙයි. එයට සමාන කැරුණෙන්, කිත්සිරිමේ වෙහෙර දා ගබ ඉතා සුදු බව ද, ඉතා මහත් බව ද, හැඟැවිණ.

2. **පුද කල බහු නෙත් නිල් කැලුමෙ'ව බැරම**– සර්වඥත්‍වය ලැබූ දෙවන සතිය මුළුල්ලෙහි, බුදුහු කොළෙහි ගුණ සලකා ඇසි පිය නො හෙළා බලා හිඳීමෙන් මහාබොධියට නෙත්‍රපූජාව කළහ. මේ "අනිමිෂලොචන පූජා" යැ සෙත්. සතියක් මුළුල්ලෙහි නෙත්‍රයුගමයෙන් නික්මුන් වූ නීලකාන්තිය ඉතා බොහෝ වෙයි. නීලවර්ණපත්‍රයෙන් ගහන වූ මහාබොධිය එ සේ බොහෝ වූ නීලනෙත්‍රකාන්තියට සමාන යැ.

3. **සඳ යුරු සඳ වෙලෙන් රැඳි රුසිරු මනරම**– සන්ධ්‍යා කාල යෙහි වලා අතිරක්තවර්ණ යැ. එ බඳු වලායෙන් රැඳුණු සඳෙක් වී නම්, එයට (බුද්ධ) ප්‍රතිමාව සමාන වේ. ප්‍රතිමායෙහි මුහුණ චන්ද්‍රයා වැන්න, සිවුරු සන්ධ්‍යා වලා වැනි වේ.

4. **වඳනෙහි**– සිදත්සඟරාව සිංහල ව්‍යාකරණය කොටැ ගත්තාහු, මේ ආඛ්‍යාතයෙකැයි කියත්. තමුත් මේ මධ්‍යම පුරුෂයෙහි වන 'හි' ප්‍රත්‍යය යෙන් යුක්ත වූ' කෘදන්ත නාමයෙකි.

5. **දා ගප් මහ බෝ පිළිම**— මෙයින් මේ චෛත්‍යයත් වැඳියැ යුතු පිළිවෙළ ද දක්වූහ. ශාරීරික පාරිභෝගික උද්දේශක චෛත්‍යයෝ ඒ පිළිවෙළින් වැඳියැ යුතු වෙත්.

## (6) කල්‍යාණ නදී වර්ණනා.

42. **ස ල් සපු කිණ දෙඹ රැරඟ නා මිදෙ ලි**
**පු ල් එරහැඳි හෝපලු මීඅඹ පලො ලි**
**පොල් පුවකු'ගු රඹ මල බුලත සලිම ලි**
**නි ල් ගන සා සෙවණලු දෙ තෙර මනක ලි**

සල් සපු කිණ දෙඹ රැරඟ නා මිදෙලි පුල් එරහැඳි හෝපලු මීඅඹ පලොලි පොල් පුවක් උගු රඹ මල බුලත සලිමලි නිල් ගන සා සෙවණලු මනකලි දෙ තෙර-(මතු සම්බන්ධ යි.)

**සල්**– ශාල යැ, **සපු**– චම්පක යැ, **කිණ**– තමෙරු යැ, **දෙඹ**– පුන්නාග යැ, **රැරඟ**– ඖෂධී යැ, **නා**– නාග යැ, **මිදෙලි**– නිචුල (මිදෙල්) යැ, **පුල්**– ඵුල්ල (පිපුණා) වූ, **එරහැඳි**– කෘතමාල (ඇසළ) යැ, **හෝ**– අශෝක යැ, **පලු**– පීලු(මොර) යැ, **මීඅඹ**– සහකාර යැ, **පලොලි**– පාටලී යැ, **පොල්**– නාරිකෙල යැ, **පුවක්**– පූග යැ, **උගු**– ඉක්ෂු (උක්) යැ, **රඹ**– රම්භා (කෙසෙල්) යැ, **මල බුලත**– මලයතාම්බූලලතාලිඞ්ගිත වූ (මල බුලත් වැලැඳි), **සලිමලි**– ශාල්මලී (ඉඹුල්) යැ, (යන මොවුන් ගේ) **නිල්**– නීලවර්ණ වූ, **ගන**– ඝන වූ, **සා**– ශාඛාවන් ගේ, **සෙවණලු**– ඡායාමණ්ඩලයෙන් (සෙවණැල්ලෙන්) **මනකලි**- මනොඥ වූ, **දෙ තෙර**– උභය තීරයෙහි, (මතුසම්බන්ධ යි.)

43. **ග ව සා සුපුල් කඩුපුල් මල් නිල් වර ල**
**ස ල සා උකුළු වටැ රසු'දුල මිණි මෙවු ල**
**ස ක සා දෙ තන හර සඳනෙන් කැරැ සිසි ල**
**දෙ ප සා ඉසින නිල් පැහැ නෙතැ දිගු පුළු ල**

නිල් වරලැ සුපුල් කඩුපුල් මල් ගවසා, උකුළු වටැ රස් උදුල මිණි මෙවුල සලසා, දෙ තන හර සඳනෙන් සකසා සිසිල කැරැ, දිගු පුළුල නෙතැ නිල් පැහැ දෙ පසා ඉසින-(මතුසම්බන්ධ යි.)

**නිල් වරලැ**– නීලවර්ණ වූ කෙශකලාපයෙහි, **සුපුල් කඩුපුල් මල්**– සුඵුල්ල වූ කාණ්ඩොත්පල කුසුමයන්, **ගවසා**– පුරා පැලැඳැ ගෙන, **උකුළු වටැ**– ජඝනවෘත්තයෙහි, **රස් උදුල**– රශ්මියෙන් උජ්වලිත වූ, **මිණි මෙවුල**– මණි මෙඛලාදාමය, **සලසා**– යොදා,

**දෙ සන**- පයොධරයුගමය, **හර සඳනෙන්**- මුක්තාහාරයෙන් හා චන්දනයෙන්, **සසා**- යහපත් ලෙස, **සිසිල කැරු**- ශීතල භාවයට පමුණුවා, **දිගු පුළුල නෙතැ**- දික් වූ ද පළල් වූ ද නෙත්‍රයෙහි, **නිල් පැහැ**- නීල ප්‍රභාවන්, **දෙ පසා**- උභය පාර්ශ්වයෙහි, **ඉසිනා**- ඉසින්නා වූ, -(මතු සම්බන්ධ සි.)

44. ම න හර නා මෙණෙවියනි'දැ ළ වැලි පි ට
ගෙ න මිණි වෙණ තත් නිය'ගින් මැදූ රුව ට
සන එවැ කියන බුදු ගුණ ගී මියුරු කො ට
සැ . න හෙව කැලණි ගඟ බඩැ මඳ කලක් සි ට

මනහර නා මෙණෙවියන් ළ වැලි පිටැ ඉඳැ, මිණි වෙණ ගෙනැ තත් නිය අගින් රුවට මැදැ, මියුරු කොටැ කියන බුදු ගුණ ගී සනැ එවැ, කැලණි ගඟ බඩැ මඳ කලක් සිටැ, සැනැහෙව.

**මනහර**- මනොහර වූ, **නා මෙණෙවියන්**- නාග මාණවිකාවන්, **ළ වැලි පිටැ**- තරුණ වූ පුලින තලයෙහි, **ඉඳැ**- නිෂදනය කොටැ, **මිණි වෙණ**- මණිමය වීණාවන්, **ගෙනැ**- ග්‍රහණය කොටැ, **තත්**- තන්ත්‍රීන්, **නිය අගින්**- නඛාග්‍රයෙන්, **රුවට**- මනා සේ, **මැදූ**- මාර්ජනය කොටැ හෙවත් පිරිමැදූ, **මියුරු කොටැ කියන**- මධුරස්වරයෙන් කියනු ලබන්නා වූ, **බුදු ගුණ ගී**- බුද්ධ ගුණ ගීතිකාවන්, **සනැ එවැ**- කර්ණයෙහි බහා හෙවත් අසා, **කැලණි ගඟ බඩැ**- කල්‍යාණි නදී සමීපයෙහි, **මඳ කලක්**- ස්වල්ප කාලයක්, **සිටැ**- නැවැතී, **සැනැහෙව**- සන්තර්පිත වව.

මේ සිවුපද තුන මැ එක් වාක්‍යයෙකි. එ හෙයින් විස්තරාර්ථ වාක්‍යාවසානය වූ තන්හි මැ දක්වේ. මෙසේ පද්‍යත්‍රයයෙකින් කෙළවර වන්නා වූ වාක්‍යය 'විශෙෂක' නම් වේ. වාක්‍යාවසානය වනුයේ එක මැ පද්‍යයෙන් නම් 'මුක්තක' යැ යි ද, දෙකින් නම් 'යුගමක' යැ යි ද, සතරෙකින් නම් 'කලාප' යැ යි ද එයට වැඩි ගණනෙකින් නම් 'කුලක' යැ යි ද කියත්.

“(ගඞ්ගා) උභයතීරයෙහි (ගඟ දෙපසැ) නාග මාණවිකාවන් කියන බුදු ගුණ ගී අසා කැලණි ගඟ බඩැ ස්වල්ප කාලයක් සිටැ සැනැහෙව ( විඩා හරුව )” යි මෙයින් දූතයාට සාමාන්‍යයෙන් කියැවිණ.

“කෙබඳු (ගඟ) දෙතෙර ද” යනු 42 වන පද්‍යයෙන් ද, “කෙ බඳු නා මෙණවියන් ද” යනු 43 වන පද්‍යයෙන් ද, “කෙසේ කියන බුදු ගුණ ගී ද” යනු 44 වන පද්‍යයෙන් ද, දක්වන ලදී.

(42) සල්, සපු, කිණි, දෙඹ, රුරග, නා මිදෙල්, පිපුණු ඇසල, අශෝක, මොර, මීඅඹ, පළොල්, පොල්, පුවක්, උක්, කෙසෙල්, මල බුලත් වැලින් වෙළඳනා ලද ඉඹුල්, යන මේ වෘක්ෂයන් ගේ නිල් වූ ඝන වූ අතුවලැ සෙවණැල්ලෙන් සිතට ප්‍රියකර වූ ගං ඉවුරැ දෙකෙහි- (43) නිල් කෙස් වැටියෙහි, මනා සේ පිපුණු කඩුපුල් මල් පුරා ගෙනැ, උකුළ වටා රශ්මියෙන් දිලියෙන්නා වූ මණි මෙබලා දමය යොදා ගෙනැ; පයොධර යුගමය මුතු හරින් හා සඳ නෙන් මොනවට සිසිල් කොටැ ගෙනැ, දික් වූ ද පුළුල් වූ ද ඇසෙහි නිල් පැහැය දෙ පැත්තෙහි ඉසින්නා වූ, (44) සිත් ඇදැ ගන්නා වූ නාග මාණවිකාවන් (තරුණියන්) අළුත් වැලි පිටැ ඉඳැ, මැණික් ඔබ්බා කැරුණු වීණාවන් ගෙනැ, තත් තිය අගින් යහපත් ලෙස මැදැ, මිහිරි කොටැ කියන්නා වූ බුද්ධ ගුණ ගීතිකාවන් කනෙහි යොදා (අසා), කැලණි ගඟ සමීපයෙහි සවල්ප වේලාවක් සිටැ විඩා හරැව.

**ටිප්පණි:-(42)**

1. **රුරග**– 'රාත්‍රි කාලයෙහි ආලෝකයක් දෙන වෘක්ෂ විශේෂයෙකැ'' යෙත්.

2. **මිදෙලි...පළොලි...මනකලි**– 'මිදෙල්' 'පළොල්' 'මනකල්' යන ශබ්ද මෙහි 'ඉ'කාර යුක්ත කැරුණේ 'සලිමලි' යත්නෙහි අන්ත්‍යාක්ෂරය හා යෙදුණු එළි වැට රැකෙන පිණිස යැ.

3. **මල බුලත**– මහා වෘක්ෂයන්හි විහිදූ යන බුලත් වැල් වෙසෙසෙකි.

4. **දෙ තෙරැ**– මේ, 44 වන පද්‍යයෙහි වූ "ළ වැලි පිටැ" යනු හා සම්බන්ධ යැ. "නාග මාණවිකාවන් ගඟ දෙ තෙරැ ළ වැලි පිටැ ඉඳැ කියන බුදු ගුණ ගී"යි සම්බන්ධය සලකන්නේ යැ.

**ටිප්පණි:-(43)**

1 **කඩුපුල් මල්**– නාගලෝකයෙහි ඇතැයි යන පුෂ්පවිශේෂයෙකි.

2. **මෙවුල**– ස්ත්‍රීන් ගේ උකුළ වටා බැඳෙන ද්‍රව්‍යය 'මෙවුල්' (මෙබලා) නම් වේ.

3. **හර සඳුනෙන් කැරැ සිසිල**– මුතු ද සඳුන් ද ශීතල ගුණය ඇති සොරේ.

4. **දෙ පසා ඉසින නිල් පැහැ නෙතැ දිගු පුළුල**– මෙයින් හැඟැවෙනුයේ දෙ පස බලනා බව යි. දිගු පුළුල් නෙත් අයා බලන කලැ, නෙතෙහි නිල් පැහැය එ දෙසට ඉසින්නාක් වැනි වේ.

**ටිප්පණි:—(44)**

1. **නා මෙණවියන්**– දිව්‍යනාග තරුණියන්. දිව්‍ය නාගයෝ රිසි විටෙකැ මනුෂ්‍යරූපයට බඳු රූපය ඇති කැරැ ගැන්මෙහි පොහොසත්හු යැ. එ අස් කැරැ ගත් විටැ ඔහු විශිෂ්ට වූ රූපලාවණ්‍යයෙන් යුක්තාංග යි යෙත්.

'මණවු' යනු තරුණාර්ථයෙහි වේ. ස්ත්‍රී අර්ථය පහළ කරනු පිණිස මෙහි ස්වරයක් අනාභ්‍යාභේදයකට පැමිණි කලැ වියැ යුත්තේ 'මැණැවි' යනු යි. නමුත් වනුයේ 'මෙණෙවි' යන්න යි, මෙහි 'අ'කාරය 'එ'කාර බවට පැමිණියේ යැ. 'මහණ' යන්නෙන් 'මෙහෙණ' යනු ද 'යහළු' යන්නෙන් 'යෙහෙළි' යනු ද, මේ විශෙෂ ක්‍රමයෙන් සිදු වේ.

2. **ළ වැලි පිටැ**– මෙහි ළා හෙවත් තරුණ වැලි නම් කිම? ගංවතුරින් අළුතැ රැස් කැරුණු වැලි යි. මෙයින් වැල්ලෙහි පිරිසුදු බව හැඟැවෙයි.

3. **තත් නිය'ගින් මැදූ**– මෙහි 'තත්' නම් වීණා තන්ත්‍රී යැ. දූත් 'ලනු' යැ කියත්. වීණාව වාදනය කැරෙනුයේ නියගින් මැදීමෙහි.

4. **රුවට**– 'මනා සේ' යනු අර්ථ යි. 'සොඳ සේ' යන අර්ථය ගෙනැ දෙනු පිණිස යෙදෙන 'සොඳට' යනු ද මේ හා සමාන යැ.

5. **කනැ එවැ**– මෙහි 'එවැ' යනු 'ඕ' (එවුම්හි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාතයි. 'ඕ' ධාතුව වරනැගෙනුයේ ඔවී-ඔව්හි-ඔති-ඔනු- ඈ විසිනි. "දිය ඔවී" යනාදි තන්හි මෙන් 'වත් කිරීම' යන අර්ථයෙහි වැටේ. "ගීතය කනෙහි එවැ" යි කී කලැ ලැබෙනුයේ "ගීතය අසා" යන අර්ථය යි.

"කනැ හෙවැ" යනු අපපාඨ යි. 'හෙවැ' යන්නෙන් ලැබෙනුයේ "ශයනය කොටැ" යන අර්ථය යි. කාව්‍යශෙඛරයෙහි–

"හෙවැ පසු කොටැ ඇම ට
අලුයමැ පලමු නැගැ සි ට"

යන්නෙන් ඒ ස්ඵුට වෙයි. 'හෙවැ' යනු 'හෝ' (හෙවුම්හි-ශයනයෙහි) ධාතුයෙන් සිදු වූ පූර්වක්‍රියා නිපාත පද යි.

6. **සැනැහෙව**– මේ 'සනස(හ)' ධාතුයෙන් වන කර්මකාරක විධි ක්‍රියා රූපය යි. මෙ තන්හි නිරුත්සාහාර්ථයෙහි වූයේ යැ. 'සැනැහෙව' යන තන්හි 'නැ'යන්නෙහි වූ 'ඇ'කාරය, එළි වැට රැකෙන පිණිස 'අ'කාර බවට පෙරළිණ. දෙවන තුන් වන පාදයන්හි 'ගෙනැ' 'කනැ' යන දෙතන්හි ද මේ පෙරළිය පෙනේ.

"'ගෙනැ' 'කනැ' 'සැනැහෙව' යන තුන් තන්හි මැ යෙදුණේ 'ඇ' කාරය නම්, ඒ තුන් තන්හි මැ පෙරළියක් නො කොටැ 'මන' යන එක මැ තන්හි වූ 'අ'කාරය 'ඇ'කාර බවට පෙරළීම යුක්තියුක්ත නො වේ ද?" යන ප්‍රශ්නය උපදී. එළි සමය පිණිස 'ඇ'කාරය 'අ'කාර බවට පෙරළනු විනා 'අ'කාරය 'ඇ'කාරය බවට පෙරළීම කවිසම්ප්‍රදායයට විරුද්ධ වේ. මේ හෙතුයෙන් මැ, මෙහි මැ, ප්‍රථම තෘතීය චතුර්ථ පාදාන්තයෙහි වූ 'පිටැ' 'කොටැ' 'සිටැ' යන තුන් තන්හි වූ 'ඇ'කාරය 'රුවට' යන එක මැ තන්හි වූ 'අ'කාරය බලා, 'අ'කාර බවට පෙරළිණ.

## (7) සන්ධ්‍යා වර්ණනා.

45. සපු මල් සොහොඹු ළා බැඳැ වරල මන ර ග
පැහැ දුල් දෙඹ කැකුළු හර කැරැ ළා තන' ග
රෙන'වුල් නා කුසුම් කනැ ළා කොඬොල් ර ග
ද ව හල් උයන් කෙළි කෙළැ සලෙළුන් සම ග

සපු මල් සොහොඹු ලා වරල මන රඟ බැඳැ, පැහැ දුල් දෙඹ කැකුළු හර කැරැ තන අගැ ලා, රෙන් අවුල් නා කුසුම් කොඬොල් රඟ කනැ ලා, සලෙළුන් සමඟ, දවහල් උයන් කෙළි කෙළැ-(මතුසම්බන්ධ යි.)

**සපු මල්**- චම්පක පුෂ්පයන් ද, **සොහොඹු**- මාධවී පුෂ්පයන් ද, **ලා**- බහා, **වරල**- කේශ කලාපය, **මන රඟ**- සිත් වූ පරිද්දෙන්, **බැඳැ**- බන්ධනය කොට, **පැහැ දුල්**- ප්‍රභායෙන් දිලියෙන්නා වූ, **දෙඹ සැකුළු**- පුන්නාග කුඩමලයන්, **හර සැරැ**- මුක්තාහාර(මෙන්) කොට, **තන අඟැ**- පයෝධරාග්‍රයෙහි, **ලා**- පැලැඳැ ගෙනැ, **රෙණු අවුල්**- රේණුයෙන් ගැවැසී ගත්තා වූ, **නා කුසුම්**- නාගකුසුමයන් (නා මල්), **කොඬොල් රඟ**- කුණ්ඩලාභරණ විලාසයෙන්, **කනැ**- කර්ණයෙහි, **ලා**- බහා, **සකලඑන් සමඟ**- තරුණයන් හා එක් වැ, **දවහල්**- දිවාභාගයෙහි, **උයන් කෙළි කෙළැ**- උද්‍යානක්‍රීඩා කොට, (මතු සම්බන්ධ යි.)

46. **නු ව නි න් නිල් උපුල් මඳ හසිනි හෙළැ'ඹු ල**
**වු ව නි න් කමල් පෑ ලවනතිනි රතු'පු ල**
**ප ව නි න් අඹල රන ලිය වන් ලියන් කැ ල**
**රු ව නි න් ලකළ ගඟ දියැ කෙළැ නිමුණු ක ල**

නුවනින් නිල් උපුල්, මඳ හසිනි හෙළ ඇඹුල, වුවනින් කමල්, ලවනතිනි රත් උපුල පෑ, පවනින් අඹල රන ලිය වන් ලියන් කැල, රුවනින් ලකළ ගඟ දියැ කෙළැ නිමුණු කලැ-(මතු සම්බන්ධ යි.)

**නුවනින්**- නේත්‍රයෙන්, **නිල් උපුල්**- නීලෝත්පලයන් ද, **මඳ හසිනි**- මන්දහාස්‍යයෙන් හෙවත් මඳ සිනායෙන්, **හෙළ ඇඹුල**- සේවතෝත්පලයන් හෙවත් සුදු මානෙල් ද, **වුවනින්**- වක්ත්‍රයෙන්, **කමල්**- පද්මයන් ද, **ලවනතිනි**- අධරයෙන් හෙවත් තොලින්, **රත් උපුල**- රක්තෝත්පලයන් හෙවත් රතු මානෙල් ද, **පෑ**- ප්‍රකාශ කොට, **පවනින්**- මාරුතයෙන්, **අඹල**- ආවෘතත වූ හෙවත් ඇඹැරී ගියා වූ, **රන ලිය වන්**- සුවර්ණලතා වන්හා සමාන වූ, **ලියන් කැල**- කාන්තා සමූහයා, **රුවනින්**- රත්නයෙන්, **ලකළ**- අලංකෘත වූ, **ගඟ දියැ**- ගඞ්ගාජලයෙහි, **කෙළැ**- ක්‍රීඩා කොට, **නිමුණු කලැ**- අවසාන වූ කාලයෙහි, (මතු සම්බන්ධ යි.)

47. **ව දි මි න් සවස තල හැසිරෙන දිඟ'තුව ල**
**සොබමන් සුනිල් මිණි නිල් නුබ තුරු විපු ල**
**ප ත' සන් අවර ගිරි නැවිගෙන් වැටෙන ක ල**
**විලි කු න් සුරත් පල වැනි වේ රිවි මඬ ල**

රිවි මඬල, සොබමන් සුනිල් මිණි නිල් විපුල නුබ තුරු, දිගු අතුවලැ හැසිරෙන සවස තල වදිමින්, අවර ගිරි නැවියෙන් වැටෙන කල අසන් පත්, විලි කුන් සුරත් පල වැනි වේ.

**රිවි මඬල**- සූර්යමණ්ඩලය, (කෙ බඳු ද යත් හොත්:-) **සොබමන්**- ශෝභමාන වූ, **සුනිල් මිණි නිල්**- ඉන්ද්‍රනීල මණි මෙන් නීලවර්ණ වූ, **විපුල**- මහත් වූ, **නුබ තුරු**- ආකාශ නමැති වෘක්ෂ

යෙහි, දිගු අතුවලැ- දිශා නමැති ශාඛාවන්හි, හැසිරෙන- සඤ්චාරණය කරන්නා වූ, සවස නල- සායාහ්නමාරුතය හෙවත් සවස් සුළං, වදිමින්- වැදීම හේතු කොට ගෙනැ, අවර ගිරි නැවිගෙන්- අපර පර්වත නමැති වෘක්ෂයෙන්, වැටෙන කල- පතනය වන කාලය, අසන් පත්- ආසන්නප්‍රාප්ත වූ (ළං වූ), විලිකුණ්- පක්ව භාවයට පැමිණියා වූ හෙවත් ඉදුණා වූ, සුරත්- අතිශයින් රක්ත වර්ණ වූ, පල වැනි වේ- ඵලයක් හා සමාන වන්නේ යැ.

45 වන 46 වන 47 වන පද්‍යයන් ගෙනුදු විශේෂතෙයක් වේ.

සළෙළුන් සමඟ දවහල් උයන් කෙළි කෙළැ, ළියන් කැල, රුවතින් ලකළ ගඟ දියැ කෙළැ තිමුණු කලැ, රිවි මඬල විලිකුත් සුරත් පල වැනි වේ.

“කුමක් කුමක් කොටැ, සළෙළුන් සමඟ දවහල් උයන් කෙළි කෙළැ ද” යනු 45 වන පද්‍යයෙන් ද, “කුමක් කොටැ කෙ බඳු ළියන් කැල රුවතින් ලකළ ගඟ දියැ කෙළැ තිමුණු කලැ ද” යනු 46 වන පද්‍යයෙන් ද, “රිවි මඬල කෙ බඳු සුරත් පල වැනි වේ ද” යනු 47 වන පද්‍යයෙන් ද කීහ.

(45) සපු මල් ද යෝඹු මල් ද බහා කෙස් වැටිය සිය් වූ පරිද්දෙන් බැඳැ, (සුදු) පැහැයෙන් දිලියෙන්නා වූ දෙඹ මල් තැකුළු මුතු හරක් මෙන් කොටැ තන අගැ පැලැඳ, රේණුයෙන් ගැවැසුණු තා මල් කුණ්ඩලාභරණ මෙන් කනෙහි ලා ගෙනැ, තරුණයන් හා සමඟ දිවා කාලයෙහි උද්‍යාන ක්‍රීඩා කොටැ,- (46) ඇසින් නිල් මානෙල් ද, මඳ සිනායෙන් ඵල මානෙල් (කුමුදු) ද, මුහුණින් නෙළුම් ද, තොලින් රත් මානෙල් ද, (ගඟෙහි) දක්වා, සුළඟින් ඇඹැරී ගියා වූ රන් වැල් වැනි ස්ත්‍රී සමූහයා, රත්නයෙන් ශොභමාන වූ ගඟ දියෙහි ක්‍රීඩා කොටැ අවසාන වූ කල්හි,- (47) සූර්‍ය්‍යමණ්ඩලය, (කෙ බඳු ද යත හොත්:-) ශොභමාන වූ ඉන්ද්‍රනීල මාණික්‍ය මෙන් නිල් වූ මහත් වූ ආකාශය නමැති ගසෙහි දිශා නමැති අතුවලැ හැසිරෙන්නා වූ සවස් සුළඟ වැදීම හෙතු කොටැ ගෙනැ, අවරපර්වත නමැති නැවියෙන් (ගැලැවී) වැටෙන කාලය ළං වූ, ඉදුණා වූ ඉතා රතු වූ ඵලයක් හා සමාන වේ.

සූර්‍ය්‍යා අස්තඞ්ගත වීමට ඉතා ආසන්න වැ, අධිකරක්ත වර්ණයෙන් යුක්ත වැ අවරාකාශයෙහි ඉතා පහතැ සිටි බව මෙයින් කියැවිණ. එ සේ සිටියේ කවර කාලයෙකැ ද? 46 වන පද්‍යයෙන් වර්ණිත වූ ස්ත්‍රීන්, දවහල් සළෙළුන් සමඟ උයන් කෙළි කෙළැ, ඉක්බිති ගඟ දියෙහි ක්‍රීඩා කොටැ කෙළවර වූ කලැ යැ. මෙයින්, ඉර බස්නා වේලාව ඉතා ළං වන තුරැ මැ හෙවත් දිවාභාගය

මූළුල්ලෙහි මැ ස්ත්‍රීන් ක්‍රීඩායෙහි නියුක්ත වූ බව ද, එ හෙයින් මැ රට යුද්ධකෝලාහලාදියෙන් වියුක්ත වැ ඉතා සමෘද්ධ වැ පැවැති බව ද, හැඟැවිණ.

සූර්‍යමණ්ඩලය කෙසේ නම් පක්වාතිරක්තඵලයක් වැනි වේ ද? මේ ආකාශය මහත් රුකෙකි. පූර්වදක්ෂිණාදි දිශා ඒ රුකෙහි අතු යැ. අවර දිශා නමැති අත්තෙහි අවර පර්වත නමැති නැටියෙක් වේ. දිශා නමැති අතු අතරෙහි හැසිරෙන්නා වූ සවස් සුළඟ ඇති වේ. මේ සුළඟ වැදීම කරණ කොටැ ගෙනැ, අවර පර්වත නමැති නැටියෙන් ගැලැවී වැටෙන කාලය ඉතා ළං වූ, ඉදුණා වූ, එ හෙයින් මැ ඉතා රතු වූ, ඵලයෙක් වේ. එනම් සූර්‍යමණ්ඩලය යි.

ටිප්පණි:—(45)

1. **දවහල්**– දව+කල්. 'ක'කාරයට 'හ'කාරාදේශ වැ, 'දවහල්' යනු ලැබේ. 'ව'කාර 'හ'කාරයන් ගේ විපර්‍යයෙන් 'දහවල්' යනු ද වෙයි.

ටිප්පණි:—(46)

1. ස්ත්‍රීහු ජලක්‍රීඩා කරන කලැ, තමන් ගේ ඇසින් මහනෙල් ද, මද සිනායෙන් කුමුදු ද, මුහුණින් නෙළුම් ද, තොලින් රතුපුල් ද දක්වති. කවර හෙයින් ද, ඇස් නිලුපුල් හා ද, මද සිනා කුමුදු හා ද, මුහුණු නෙළුම් හා ද, තොල් රතුපුල් හා ද, අතිශයින් සමාන වන හෙයිනි. කීයේ මැ නො-

"වන නෙත කමලු'පුල සරි වී කිවි වද න
බොරු යැ යි කියති මෙ උවම් නො දැකැ එක තැ න
දිය කෙළනවුන් දැකැ පොකුණේ පුල් මලි න
කිවි බස සැබැවැ නුඹට මැ වැටැහෙයි එ තැ න"

යි කවීශ්වරයන් විසිනුදු?

2. **පවනින් අඹල රන ලිය වන්**– සුවර්ණමය වුව ද ලතාවෝ නම ස්ථාවරයෝ යැ. එ හෙයින් සුවර්ණලතාවෝ ද මේ ස්ත්‍රීන් හා සමාන නො වෙති. සුළඟින් ඇඹැරුණාහු නම් මදක් සමාන වියැ හැකි යැ. කවර හෙයින් ද? සුවර්ණලතාවන් පවනින් වැනුවල වන කලැ, ස්ත්‍රීන් ක්‍රීඩා කරන්නාක් මෙන් පෙනෙන හෙයිනි.

'අඹල' යනු 'අඹර' (ඇඹැරැම්හි) ධාතුයෙන් වූයේ යැ.

ටිප්පණි:— (47)

1. **සුනිල් මිණි නිල්**– 'ඉතා නිල් වූ මිණි නම් ඉන්ද්‍රනීල යි. එ මෙන් නිල් වූ' යනු මෙයින් හැඟැවේ.

48. මහතු න් හසළ නම හට යස පිහිට ලෙ ස
නියති න් නොහළ යුතු බව පැමිණෙන වෙසෙ ස
සුද න න් පැවැති සිරිනැසි දන්වන විල ස
නුබ මි න් සමඟ ගෙවෙනු යැ දවහල් දව ස

තම හට යස පිහිට ලෙස හසල මහතුන්, වෙහෙස පැමිණෙන නියතින් නොහල යුතු බව, සුදනන් පැවැති සිරිතැයි දන්වන විලස, නුබමිත් සමග දවහල් දවස ගෙවෙනු යැ.

**තම හට**- තමා හට, **යස පිහිට ලෙස**- යහපත් ප්‍රතිෂ්ඨා විලාසයෙකින්, **හසල**- සඤ්චරිත වූ (ඇසුරු කළා වූ), **මහතුන්**- මහාත්මයන්, **වෙහෙස**- විහිංසාවක්, **පැමිණෙන**- පැමුණුණු කල්හි, **නියතින්**- නිශ්චයයෙන්, **නොහල යුතු බව**- අත් නො හැරියැ යුතු බව, **සුදනන්**- සත්පුරුෂයන් විසින්, **පැවැති**- ප්‍රවෘත්ත වූ හෙවත් පවත්වන ලද, **සිරිතැයි**- චරිත්‍රය යැ යි, **දන්වන විලස**- දන්වන්නාක් මෙන්, **නුබමින් සමග**- සූර්‍ය්‍යා හා එක් වැ, **දවහල් දවස**- දිවා භාගය හෙවත් දවල් කාලය, **ගෙවෙනු යැ**- ක්‍ෂය වන්නේ යැ.

සූර්‍ය්‍යා හා සමග දවල් දවස ගෙවෙන්නේ යැ. කුමක් මෙන් ද? තමා හට යහපත් පිහිට සේ හැසුරුණා වූ මහාත්මයනට, පීඩාවක් පැමිණි කල්හි, නිශ්චයයෙන් අත් නොහැරියැ යුතු බව සත්පුරුෂයන් අතරැ පැවැත්තා වූ සිරිත යැ යි දන්වන්නාක් මෙන් (සූර්‍ය්‍යා හා සමග දවල් දවස ගෙවෙන්නේ යැ).

දවල් දවස නම් සූර්‍ය්‍යා උදා වූ තැන් පටන් බැසැ යන තැන් දක්වා ඇති කාලය යි. එ හෙයින් සූර්‍ය්‍යා බසිනු හා සමඟ මැ දවල් දවස කෙළවර වීම ස්වභාවධර්ම යි. මෙසේ සූර්‍ය්‍යා හා සමග දවල් දවස ද යැම, "තමාට පිහිට වැ හැසුරුණු උත්තමයනට, විපත්තියක් පැමිණි කල්හි, අත් නොහැරැ සිටීම සත්පුරුෂයන් ගේ සිරිත යැ" යනු දන්වන්නාක් වැන්නැ යි කියහ. මෙහි සූර්‍ය්‍යා නම් දවල් දවසට පිහිට වැ හැසුරුණු මහාත්මයා යැ. ඔහු අස්තඞ්ගත වීම විපතට පැමිණීම යි. ඔහු ගේ අස්තඞ්ගත වීම හා සමඟ මැ දවල් දවස ද කෙළවර වීම, විපතෙහි නො හැරැ සිටීම නම් වේ.

**ටිප්පණි:—**

1. **සිරිතැයි**- සිරිත් + යැ යි=සිරිත් + ඇ යි=සිරිතැයි. මෙහි අවාච ශාතයෙහි නිපාතය වූ 'යැ' යන්නෙහි ව්‍යඤ්ජනය ලොප් වේ.

2. **නුබමින්**- නුබට මිත් (මණි) නුබමිත්. අහසට රත්න යැ, මැණික යැ යනු අර්ථ යි. 'මිත්' යනු 'මණි' යන්නෙන් ආයේ යැ. එසින් මැ ආ 'මිණ' 'මැණ'යි තවත් ශබ්ද දෙකෙක් ඇති.

49. සැ ඳු ලෙන් වරැණ දෙව් රද මුහුදු වි ෂු
ස ඳු සහස්කර එන මහ වනැ සැලැ ෂු
වි දැ උපුල් පිල මෙන් රන් පවින් වැ ෂු
සැඳැ වලා පෙළ පැල දිගැ පෙනුණු ප ෂී

මුහුදු විසූ වරුණ දෙව් රද, සැදූ ලෙන්, සඳ සහසකර එන මහ වත සැලැසූ, රත් පටින් වැසූ, විදැ උපුල් පිල මෙන්, සැදෑ වලා පෙළ පැල දිගෑ පෙනුණු පසු-(මතු සම්බන්ධ යි.)

**මුහුදු**- සමුද්‍රයෙහි, **විසූ**- වාසය කළා වූ, **වරුණ දෙව් රද**- වරුණදිව්‍යරාජයා විසින්, **සැදූ ලෙන්**- ශ්‍රද්ධාවිතානයෙන්, **සඳ**- (තමා හා) සමාන ජාති ඇති, **සහසකර**- සහස්‍රකිරණයා හෙවත් සූර්යයා, **එන**- එන්නා වූ, **මහ වතැ**- මහාමාර්ගයෙහි, **සැලැසූ**- යොජනය කරන ලද්දා වූ, **රත් පටින්**- රක්ත පට්ටයෙන් (රතු වස්ත්‍රයෙන්), **වැසූ**- ඡාදනය කරන ලද්දා වූ, **විදැ උපුල් පිල මෙන්**- කුරුවින්ද හෙවත් පද්මරාග පාෂාණයෙන් කළ වෙදිකාවක් සේ, **සැඳෑ වලා පෙළ**- සන්ධ්‍යාවලාහකපඞ්ක්තිය, **පැල දිගෑ**- පශ්චිම දිශායෙහි, **පෙනුණු පසු**- දෘශ්‍යමාන වූ ඉක්බිති, (මතු සම්බන්ධ යි.)

50. උදුල සොමි කැලුම් නිසයුරු හිමි පුව ල
පහල වන බැවින් තම වෙත නිස'ඹු දෙ ල
ලකල ගුවන් තල සිරි යහනැ නිකස ල
අතුල කුසුම් විලසින් සැදෙන තුරු වැ ල

උදුල සොමි කැලුම් පුවල නිසයුරු හිමි තම වෙත පහළ වන බැවින්, දෙල නිස අඹු, නිකසල ලකල ගුවන් තල සිරි යහනැ අතුල කුසුම් විලසින්, තුරු වැල සැදෙන.- (මතු සම්බන්ධ යි.)

**උදුල**- උජ්වලිත වූ, **සොමි කැලුම්**- සෞම්‍යකාන්ති ඇති, **පුවල**- පෞඪ වූ, **නිසයුරු හිමි**- නිශාකර නමැති ස්වාමියා, **තම වෙත**- තමා ගේ සමීපයට, **පහල වන බැවින්**- ප්‍රකාශ වන බව හෙතු කොටැ ගෙනැ, **දෙල**- අභිලාෂවත් වූ, **නිස අඹු**- රාත්‍රි නමැති භාර්යාව විසින්, **නිකසල**- කසළ නැත්තා වූ හෙවත් පිරිසුදු වූ, **ලකල**- අලංකෘත වූ, **ගුවන් තල සිරි යහනැ**- ගගන තල නමැති ශ්‍රීශයනයෙහි, **අතුල**- ආස්තරණය කරන ලද (අතුරණ ලද), **කුසුම් විලසින්**- පුෂ්පවිලාසයෙන් (මල් මෙන්), **තුරු වැල**- තාරකාවලින්, **සැදෙන**- සජ්ජිත වන් මැ- (මතු සම්බන්ධ යි.)

51. දන කැ ත් ගෙනැ දමන ගොදුරට නො හැකි ලි ය
ප නි මි න් දියෙන් ඔවුනො'වුනැ'ගෙහි පෙරැ ලි ය
ලෙහෙලුන් කෙළන කැරැ පෙණ පිඬු රළ රැ ලි ය
එ තැනින් පියා සර කැරැ දකු මස් කෙ ළි ය

එ තැනින් පියා සර කැරැ, දන කැත් ගෙනැ දමන ගොදුරට නො හැකි ලිය දියෙන් පනිමින් ඔවුනොවුන් ඇඟෙහි පෙරැළිය, පෙණ පිඬු රළ රැළිය කැරැ, ලෙහෙලුන් කෙළන, මස්කෙළිය දකු.

එ තැනින්- ඒ ස්ථානයෙන් (කැලණි ගඟ බඩින්), පියා සර කැරැ- පක්ෂප්‍රසාරණය කොට (පියාඹා ගොස්), දන ඇස්- ජන සමූහයා විසින්, ගෙනැ- ග්‍රහණය කොට, දමන- ප්‍රක්ෂේප කරනු ලබන්නා වූ, ගොදුරම- ආහාරයට, නො හැකිළිය- සඞ්කුචිත නො වී (නො හැකිළී), දියෙන්- ජලයෙන්, පනිමින්- උල්ලඞ්ඝනය කෙරෙමින්, ඔවුනොවුන් ඇඟෙහි- අන්‍යෝන්‍යයන් ගේ ශරීරයෙහි, පෙරළිය- පරාවෘත්ත වැ (පෙරළී), පෙණ පිඬු- ඵේණපිණ්ඩයන් ද, රළ රැළිය- තරඞ්ගභඞ්ගයන් ද, කැරැ- කොට, ලෙහෙළුන්- රෝහිත මත්ස්‍යයන්, කෙළනා- ක්‍රීඩා කරන්නා වූ, මස්කෙළිය- මස්කෙළිය නම් වූ නදී තීර්ථය, දකු- දර්ශනය කරව.

49 වන 50 වන 51 වන පද්‍යත්‍රයයෙන් ද විශේෂකයෙක් වේ. සැඳෑ වලා පෙළ පැළ දිගැ පෙනුණු පසු, තුරු වැල සැදෙන, එ තැනින් පියාසර කැරැ, මස් කෙළිය දකු.

“කුමක් මෙන් සැඳෑ වලා පෙළ පැළ දිගැ පෙනුණු පසු ද” යනු 49 වන පද්‍යයෙන් ද, “කුමක් මෙන් තුරු වැල සැදෙන කල් හි ද” යනු 50 වන පද්‍යයෙන් ද, “එ තැනින් පියා සර කැරැ කෙ බඳු මස් කෙළිය දකු ද” යනු 51 වන පද්‍යයෙන් ද, කීහ.

(49) සමුද්‍රයෙහි වාසය කළා වූ, වරුණ දිව්‍යරාජයා විසින්, ශ්‍රද්ධායෙන් යුත් සිතින්, (තමා හා) සමාන ජාති ඇති සූර්යයා (තමා ගේ වාසස්ථානයට) එන්නා වූ මහා මාර්ගයෙහි යොදන ලද්දා වූ රක්ත වස්ත්‍රයෙන් වසන ලද්දා වූ පද්මරාගමාණික්‍යයෙන් බඳනා ලද පිළක් මෙන් සන්ධ්‍යාවලාහක පඞ්ක්තිය බටහිරි දිග්හි පෙනුණාට පසු වැ-(50) බැබැළුණා වූ සෞම්‍ය කාන්ති ඇති, ඉතා වැඩුණු චන්ද්‍රයා නමැති ස්වාමියා, තමා සමීපයට පැමිණෙන බැවින්, කැමැති වූ රාත්‍රි නමැති ස්ත්‍රිය විසින්, පිරිසුදු වූ අලඞ්කෘත වූ ආකාශතල නමැති සිරි යහනෙහි අතුරන ලද්දා වූ මල් මෙන්, තාරකා සමූහය සැරැසෙන කල්හි-(51) ඒ කැලණි ගඟ බඩින් පියාසර කොට, (මස්කෙළිය දකු. කෙබඳු මස් කෙළිය ද?) ජන සමූහයා විසින් ගෙනැ දමනු ලබන ආහාරයට නො හැකිළී (බියෙන් පසු නො බැස) දියෙන් පනිමින්, ඔවුනොවුන් ගේ ඇඟෙහි පෙරළී, පෙණ කැටිත් රළෙහි රැළිත් ඇති කොට, රෝහිත නම් මත්ස්‍යයන් ක්‍රීඩා කරන, මස්කෙළිය දකුව.

බටහිරි දිගැ සැඳෑ වලා පෙනුණු පසු අහස පුරා තාරකා පඞ්ක්තිය සැදෙයි. සැඳෑ වලා කෙ බඳු ද යත් හොත්:-සූර්යයා එන මඟැ වරුණ දිව්‍යරාජයා විසින් රතු ඇතිරිල්ලෙන් වසා පිළියෙල

කරන ලද රතු මැණික් ගලින් බැඳි පිළක් වැන්නා. සැඳෑ වලා කුළෙහි අධික රක්තභාවය මෙයින් හැඟැවිණ. පද්මරාග මාණික්‍යය රතු යැ. එයින් කළ පිළක් රතු පිළියෙන් වැසූ කලැ එය තවත් රතු වේ.

තාරකා සමූහය කෙ බඳු ද යත් හොත්:- චන්ද්‍ර නමැති ස්වාමියා තමා ළඟට එන බැවින් රාත්‍රි නමැති ස්ත්‍රිය අහස නමැති යහනෙහි අතුළ මල් වැන්නැ. මේ පුෂ්පොපමානය-

“කුඹුයොන් සයුරැ බොත එහි මිණි සේ අන     න
නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් ව     න
සැඳෑ සඳුව සඳමින් මඟ තිසා ක     න
ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමූ     න”

යි කවීශ්වරයෝ ද කිහ.

ටිප්පණි:— (49)

1. **සැඳූ ලෙන්**- 'ල' යනු හෘදයාර්ථයෙහි වැටෙනුයේ 'සිත' යන අර්ථය ද දෙයි. මෙහි 'සැඳූ' නම් හසාතිමද්භාවය යි.

2. **වරුණ දෙව රද මුහුදු විසූ**- 'වරුණ' නම් පශ්චිමදිශාධිපති වූ දෙවයා යි. මේ සාගරයට ද අධිපති වේ. එ හෙයින් මුහුදු වෙසෙසි. මොහු ගේ පියෝ කාශ්‍යප ඍෂිහු යැ; මවු 'අදිති' නම් වූවෝ යැ. වරුණ සූර්‍ය්‍යයා ගේ මාගිය සාදත්තෙකි.

“මුහුදු විසූ” යන තන්හි 'විසූ' යනු අතීතාර්ථය ගෙනැ දෙන හෙයින් විමැසියැ යුත්තෙකි. සමුද්‍රය ..මි වරුණයා පෙරැ විසූ තැනෙක් නො වේ. දැනුදු වසන තැන යි.

3. **සඳු සහසකර**- සූර්‍ය්‍යයා ද අදිතිපුත්‍රයෙකි. එ හෙයින් වරුණයා හා අතිශයින් සමාන වූ ජාති ඇත්තෝ යැ.

4. **විදැ උපුල් පිළ මෙන්**- මෙහි 'විදැ' යනු 'කුරුවින්ද' හෙවත් 'පද්මරාග' යන අර්ථයෙහි යෙදිණ. 'උපුල්' යනු 'උපල' ශබ්දයෙන් ආයේ යැ. 'ගල්' යනු අර්ථ යි. 'පිළ' හෙවත් 'වෙදිකාව' නම් ගෘහාදියෙහි ද මාර්ගයෙහි ද සෙසු තැනට වඩා උස් කොටැ සැලැසුණු භාගය යි. දූත් කොළඹ නගරයෙහි මහාවීථි උභය පාර්ශ්වයෙහි පාදචාරීන් ගේ (පයින් යන්නන් ගේ) ගමනය පිණිස කැරුණු වෙදිකාවෝ වෙති.

ටිප්පණි:— (50)

1. **පුවල**- ප්‍රෞඪ හෙවත් වැඩුණු. දූත් පුර පසැ අටවක ද පසු කොටැ සිටි හෙයින් චන්ද්‍රයා වැඩුණේ නම් වේ.

2. **සිරි සහනා**- මෙහි 'සිරි' යනු උත්තමාර්ථයෙහි වේ.

ටිප්පණි:— (51)

1. **නො හැකිළිය...පෙරැළිය...රළ රැළිය...**- මේ තුන් තන් හි මැ 'ය'කාරය එළි වැට රැකෙන පිණිස යෙදුණෙකි. 'හැකිළි' 'පෙරැළි' යන පද තන්හි අන්ත්‍යස්වරය හ්‍රස්ව කැරුණේත් ඒ පිණිස මැ යැ.

2. රල රැළිය- මුහුන් පහිත කලැ රළු බිඳී රැළි ඇති වන හෙයින් මෙ සේ කියා.

3. මජ්ඣසාළිය — මේ කැලණිය අසලැ පිහිටි පුරාණ නදී තීර්ථයක් බව හැඟේ. දැන් මෙහි මෙ නමින් ස්ථානයක් නැත ද, පුරාතනයෙහි මෙය අති ප්‍රසිද්ධ වැ පැවැති බව සන්දේශකාව්‍යයන් ගෙන් පැහැදිලි වේ.

52. පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට
බඳ කිකිණිය දද ගිහිණිය විමන් වට
නො වැ පැරැණිය වන රමණිය විවිත් විට
සැල ලිහිණිය වදු කැලණිය පුර වරට

මිණි පැහැ සරණිය කොත් අගට පැමිණිය, විමන් වටැ කිකිණිය බඳ දද ගිහිණිය, පැරැණිය නො වැ විවිත් විටැ රමණිය වන, කැලණිය පුර වරට සැල ලිහිණිය වදු.

**මිණි**- මාණික්‍යයන් ගේ, **පැහැ සරණිය**- ප්‍රභාශ්‍රේණිය, **කොත් අගට**- ශෘඞ්ගාග්‍රයට හෙවත් කොත් මුදුනට, **පැමිණිය**- ප්‍රාප්ත වූ, **විමන්**- විමානයන් ගේ, **වටැ**- හාත්පස්හි, **කිකිණිය**- කිඞ්කිණිකයන්, **බඳ**- බඳනා ලද, **දද ගිහිණිය**- ධ්වජ ගහන වූ, **පැරැණිය නො වැ**- පුරාණ භාවයකට නො පැමිණ, **විවිත් විටැ**- ක්‍ෂණක්‍ෂණයෙහි, **රමණිය වන**- රමණීය (මනොඥ) වන්නා වූ, **කැලණිය පුර වරට**- කල්‍යාණී පුර වරයට, **සැල ලිහිණිය**- ශාරිකා පක්‍ෂිය, **වදු**- ප්‍රවිෂ්ට වව.

මාණික්‍යයන් ගේ කාන්ති සමූහය කොත් අගට පැමිණියා වූ ප්‍රාසාදයන් ගේ හාත්පස්හි ධ්වජ ගහන වූ, පැරැණි නො වී වාර යෙන් වාරයෙහි මනොහර වන්නා වූ කැලණි නම් උතුම් පුර යට, සැල ලිහිණිය, වදුව.

මාණික්‍ය කාන්ති සමූහය කොත් අගට පැමිණියැ යි කිමෙන්, ඒ කැලණි පුරයෙහි ප්‍රාසාදයන් ගේ කොත් මැණික් ඔබ්බා කැරැණු බව හැඟැවෙයි. එබඳු වූ ප්‍රාසාදයන් ගේ හාත් පස්හි රහු බැඳි ධ්වජ ගහන යැ. එ පමණෙක් මැ නො වේ. ඒ නගරය පැරැණි නො වී, වාරයෙන් වාරයෙහි රමණීය වෙයි. රාජරාජමහාමාත්‍යාදීන් විසින් වරින් වර ප්‍රතිසංස්කෘත වැ, අමුතු වැ කැරැවෙන විහාරාරාම ප්‍රාසාදදීන් ගෙන් අලඞ්කෘත වන බව මෙයින් සූචිත සි.

විපසණි:—

1. **පැහැ සරණිය**- 'සරණි' යනු 'ශ්‍රේණී' යන්නෙන් ආයේ යැ, සමූහාර්ථ සි.

2. **පැමිණිය, කිකිණිය, ගිහිණිය, පැරැණිය, රමණිය, කැලණිය**- මේ ස තැනැ අගැ 'ය'කාරය එළිවැට රැකෙනා පිණිස යෙදුණෙකි.

3. වට, විට– මේ 'වටැ' 'විටැ' යන පද තත්හි 'ඇ'කාරය එළි පිණිස 'අ'කාර කළ තැනි.

58. දිය කඳ ගැඹර පිරි පුවතර මහ සයු ර
මුවරඳ ලෙසින් වන අගතිසි කර තඹ ර
මන නඳ කරන මිණි ගණ මෙන් දිසි එ ව ර
පැහැ නඳ පහන් එහි මහ වෙසැ බල මිතු ර

ගැඹර දිය කඳ පිරි පුවතර මහ සයුර අගතිසි කර තඹරැ මුවරඳ ලෙසින් වන දිසි, මන නඳ කරන මිණි ගණ මෙන්, එ වරැ, එහි මහ වෙයෑ, පැහැ නඳ පහන්, මිතුර, බල.

ගැඹර– ගම්භීර වූ, දිය කඳ– ජලස්කන්ධයෙන්, පිරි– පූර්ණ වූ, පුවතර– ප්‍රසිද්ධ වූ, මහ සයුර– මහාසාගරය, අගතිසි– අගස්ති ඍෂිහු ගේ, කර තඹරැ– හස්ත තල නමැති තාමරසයෙහි, මුව රඳ ලෙසින්– මකරන්දයක් මෙන්, වන– වන කල්හි, දිසි– දෘශ්‍ය මාන වූ, මන නඳ කරන– මනොනන්දනය කරන්නා වූ, මිණි ගණ මෙන්– මණි සමූහය පරිද්දෙන්, එ වරැ– ඒ කාලයෙහි, එහි– ඒ කල්‍යාණී පුර වරයෙහි, මහ වෙසැ– මහා වීථියෙහි, පැහැ නඳ– ප්‍රභායෙන් නද්ධ වූ (වැසුණා වූ ), පහන්– ප්‍රදීපයන්, මිතුර– මිත්‍රය, බල– අවලොකනය කරව.

ඒ කාලයෙහි ඒ කල්‍යාණීපුරයා ගේ මහා වීථියෙහි ප්‍රභායෙන් යුක්ත වූ ප්‍රදීපයන්, මිත්‍රය, බලව. කුමක් මෙන් ප්‍රභායෙන් යුක්ත වූ පහන් ද? ගැඹුරැ වූ, ජල රාශියෙන් පිරුණා වූ ලොක ප්‍රසිද්ධ මහාසාගරය, අගස්ති ඍෂිහු ගේ අත්ල නමැති නෙළුම් මලෙහි මල් පැණි මෙන් වන කල්හි පෙනී ගියා වූ සිත සතුටු කරන මැණික් රාශිය මෙන්, (ඒ කාලයෙහි ඒ නගරයා ගේ මහා වීථියෙහි ප්‍රභායෙන් යුක්ත වූ ප්‍රදීපයන්, මිත්‍රය, බලව).

සකල සාගර ජලය අගස්ති ඍෂිහු අත්ලට ගත් කල්හි, සාගරයෙහි ඇති නාක් මැණික් ප්‍රභාසහිත වැ පෙනේ මැ යි. එ සේ පෙනෙන මැණික් ද; කල්‍යාණී නගර මහාවීථියෙහි පහන් ද, සඞ්ඛ්‍යාමහත්ත්වයෙන් ද ප්‍රභායෙන් ද සමාන බව මෙයින් හැඟැවූහු. මණි සමූහය මෙන් ඒ කාලයෙහි ප්‍රභායුක්ත වූ බව කීමෙන්, එ කලැ පහන් දල්වුණු බව දක්වූහ.

තිසර සන්දේශයෙහි මෙබඳු වූ සාගරය රුවන් සල්පිලකට උපමාන කැරිණ–

"පැ හැ ස ර විදු විදුම රන් මිණි මුතු නිතො ර
ම න හ ර එහි මහ වෙයැ සල් පිල් පත ර
නො මැ හැර ඇති සිලිල් කුඹුයොන් රැගත් ව ර
පු ව ත ර මිණි අකරැ සිර කියෙල්යැ මිතු ර"

යනුයෙන්. මෙ සේ පෙනෙන මණි සමූහය කවීශ්වරයෝ–

"කුඹුයොන් සයුරු බොත එහි මිණි සේ අත ත
නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් ව ත"

යනුයෙන් තාරකාවනට සමාන කළහ.

විපාණ:-

1. දිය සඳ ගැඹර පිරී පුවතර මහ සයු ර
මුවර ද ලෙසින් වන අගතිසි කර තම ර

සකල සාගර ජලය අගස්ති ඍෂීන්ද්‍ර ගේ අත්ලට ගත් කල්හි, අත්ල නෙළුම් මලක් වැනි නම්, සාගර ජලය ඒ නෙළුම් මලෙහි වූ (මල්) පැණිය වැන්නැ. මෙයින්, සියලු සයුරු දිය නිරයාසයෙන් අත්ලට ගත් බව හැඟැවිණ.

2. අගතිසි- අගස්+ඉසි 'අගස්' යනු 'අගස්ති' යන්නහු හෝ 'අගස්ත්‍ය' යන්නහු හෝ ආදේශ යැ. 'අග' යනු 'පර්වත' 'කුම්භ' (කළය) යන අර්ථ ඇත්තේ යැ. වින්ධ්‍යපර්වතය දමූ හෙයින් හෝ, කළයෙහි උපන් හෙයින් හෝ, මේ අගස්ති, අගස්ත්‍ය, කුම්භයොනි, යනාදි නාමයෙන් ප්‍රසිද්ධ යැ. මේ තෙම වෛදයෙහි අතිප්‍රසිද්ධ ඍෂිවරයෙකි. දක්ෂිණ ජම්බුද්වීපයට අවුත් ඒ ප්‍රදෙශයෙහි ශාස්ත්‍රය පැතිරැවී යැ. වරක් සාගරය තමා කුපිත කළ හෙයින් පළිගන්නා පිණිස ද, තුන් ලොව පෙළුවාවූ ද, ඉන්ද්‍රයාට සතුරු වූ ද රකුසන් සාගරයෙහි සැඟැවී උන්නන්, දක්වනු සඳහා ද, මහා සාගරයෙහි ජලය එක් වර මූ අත්ලට ගෙනැ, පානය කෙළේ යැ.

54. උදයග පියුම්රා පැහැ වැදූ මෙන් රැඳු ණු
පෙර දිග පෙනෙන සඳ සඳ කැල්මෙන් දිලු ණු
මන රග එ පුරැ සඳ කත ගෙහ'ඹින් වැඩු ණු
සුර ගඟ පතිනි දම් රැකු'මෙහි වැනි දුපු ණු

උදයගැ පියුම්රා පැහැ වැදූ රැඳුණු මෙන් සඳ කැල්මෙන් දිලුණු සඳ පෙර දිගැ පෙනෙන, මන රග එ පුරැ සඳකත ගෙහි අඹින් වැඩුණු සුර ගඟ, පතිනි දම් රැකුමෙහි දුපුණු වැනි.

උදයගැ- උදයපර්වතාග්‍රයෙහි, පියුම්රා පැහැ- පද්මරාග (මණි) ප්‍රභාව, වැදූ- සපර්ශ වැ, රැඳුණු මෙන්- රඤ්ජිත වූවාක් මෙන්, සඳ කැල්මෙන්- සන්ධ්‍යාකාන්තියෙන්, දිලුණු- බැබැළුණා වූ, සඳ- චන්ද්‍රයා, පෙර දිගැ- පූර්වදිශායෙහි, පෙනෙන- දෘශ්‍යමාන වන කල්හි, මන රග- මනොඥ වූ, එ පුරැ- ඒ කල්‍යාණී පුරයෙහි, සඳකත- චන්ද්‍රකාන්ත පාෂාණමය වූ, ගෙහි- ගෘහයෙහි, අඹින්- ජලයෙන්, වැඩුණු- වර්ධිත වූ, සුර ගඟ- ආකාශ ගඞ්ගාව, පතිනි දම්- පතිව්‍රතා ධර්මය, රැකුමෙහි- රක්ෂා කරණයෙහි, දුපුණු වැනි- දර්පිත වූවාක් (තත්පර වූවාක්) වැන්නැ.

උදය පර්වතාග්‍රයෙහි පද්මරාග කාන්තිය වැදී රැඳුණාක් මෙන් සන්ධ්‍යාකාන්තියෙන් බැබැළුණා වූ චන්ද්‍රයා පූර්වදිශායෙහි පෙනෙන් නට වූ කල්හි, මනොහර වූ ඒ නගරයෙහි චන්ද්‍රකාන්ත පාෂාණයෙන් කැරුණු ප්‍රාසාදයෙහි ජලයෙන් වැඩුණා වූ අහස් ගඟ පතිව්‍රතාධර්මය රැකීමෙහි දර්පිත වූවාක් වැන්නැ.

සඳ උදා වන කල්හි චන්ද්‍රකාන්ත පාෂාණයෙන් දිය වැහෙයි. ඒ කැලණි පුරයෙහි චන්ද්‍රකාන්තමය ප්‍රාසාදයෙන් එසේ වැහෙන දිය අහස් ගඟට වැටීමෙන් ඒ ගඟෙහි ජලය වැඩේ.

කවිසමයයෙහි සියලු නදීහු, සාගර නමැති වල්ලභයා ගේ ප්‍රියාවෝ යැ. චන්ද්‍රොදයයෙහි සාගර ජලය වැඩේ. මෙහි දුක් වුණු පරිදි අහස් ගඟෙහි ජලය ද වැඩේ. ස්වාමියා ගේ දුකෙහි දී දුක් වීම ද ප්‍රීතියෙහි දී ප්‍රීත වීම ද, පතිව්‍රතා ලක්‍ෂණ යි. මෙහි සාගරයා ගේ ජලය වැඩීම නම් වූ ප්‍රීතිය ඇති වූ කල්හි, ආකාශ ගඞ්ගායෙහි ද එසේ මැ ජලය වැඩීම නම් වූ ප්‍රීතිය ඇති වෙයි. හෙවත් සාගරය නමැති වල්ලභයා ප්‍රීත වූ කල්හි, ආකාශ ගඞ්ගා නමැති ප්‍රියාව ද ප්‍රීත වෙයි. මෙයින් හැඟෙනුයේ ආකාශ ගඞ්ගාව පතිව්‍රතා ධර්මය රැක්මෙහි දපුණු බව යි.

නගරප්‍රාසාදයෙන් ගලන ජලයෙන් අහස් ගඟ වැඩිණැ යි කීමෙන් ප්‍රාසාදයන් අහස් ගඟට ද වඩා උස් වන බව සූචිත යි.

“උදය පර්වතාග්‍රයෙහි පියුම්රා පැහැය වැදී රැඳුණාක් මෙන් සන්ධ්‍යාකාන්තියෙන් බැබැළුණා වූ චන්ද්‍රයා පූර්වදිශායෙහි පෙනෙන කල්හි” යි කීමෙන්, චන්ද්‍රයා උදා වනු හා සමඟ මෙ කී දෑ වන බව හැඟැවිණ. සන්ධ්‍යාකාන්තිය ඇති වනුයේ දිවසාන්තයෙහි යැ. ඒ කාන්තිය සඳට වැදියැ හැක්කේ ඒ කාලයෙහි මැ යැ.

• මේ පද්‍යයෙහි අර්ථය ශ්‍රී හර්ෂයන් ගේ-

“යදගාරඝට්ටකුට්ටිම-
ස්‍රවදින්දූපලතුන්දිලාපයා
මුමුචෙ න පතිව්‍රතෞචිතී
ප්‍රතිචන්ද්‍රොදයමභ්‍රගඞ්ගයා”

යන ශ්ලොකයෙන් ගැනිණ.

“යත්- යම් නගරියෙක්හි, අගාරඝට- ගෘහසමූහයන් ගේ, අට්ට- උපරිගෘහයන් සම්බන්ධි වූ, කුට්ටිම- බද්ධභූමියෙහි, ස්‍රවත්- (ජල) ස්‍රාවය කරන්නා වූ, ඉන්දු උපල- චන්ද්‍රකාන්තපාෂාණයෙන්, තුන්දිල- වැඩුණා වූ, ආපයා- ජලය ඇති, අභ්‍රගඞ්ගයා- ආකාශ ගඞ්ගාව විසින්, ප්‍රතිචන්ද්‍රොදයම්- චන්ද්‍රොදයක් චන්ද්‍රොදයක් පාසා, පතිව්‍රතෞචිතී- පාතිව්‍රත්‍යෞචිත්‍යය, න මුමුචෙ- නොහරනා ලද ද” යනු ශ්ලොකාර්ථ යි.

ටිප්පණී:-

1. උදය‘ග පියුම්රා පැහැ- “උදය පර්වත පද්මරාගමාණික්‍යමය යැ” යෙති. ‘උදය අගැ’ යන්නට ‘උදය පර්වතාග්‍රයෙහි’ යි නො කියා, ‘උදය පර්වතයෙහි’ යි ද අරුත් බිණියැ හැකි, ‘අග’ යනු පර්වතාර්ථයෙහි ද වැටෙන හෙයින්.

2. **පෙර දිග**– ''මෙ තොසෙදිණි නම් මිතැවැ''යි හැයේ. ''උදයග පිහුමරා පැහැ වැද රුදුණු මෙන් සඳ කැල්මෙන් දිලුණු සඳ''යි කී පමණින් මැ, පෙර දිගැ වූ සඳ මැ ගත යුතු වන හෙයිනි. 'නුවුවමනා පද යෙදීම' කාව්‍යයා ගේ දොෂ පක්ෂයෙහි ලා ගිණියැ යුත්තේ යැ.

3. **සඳ කැල්මෙන්**– සන්ධ්‍යාකාන්තිය නම් සවසැ වලා කුළුවලැ පෙනෙන රක්තප්‍රභාව යි.

4. **මන රඟ**– 'මන' නම් සිත යි. 'රඟ' යනු 'ආකාර' යන අර්ථ ඇත්තේ යැ. එ හෙයින් 'මන රඟ' යන්නෙහි අර්ථය නම් 'චිත්තානුකූල වූ' යනු යි. යමෙක් චිත්තානුකූල නම්, ඒ සිත් ගන්නේ යැ.

5. **පතිනි දම් රැකුමෙයි වැනි දපුණු**– 'පතිනි දම්' (පත්නී ධර්ම) නම් භාර්‍යාවක ගේ ධර්මය හෙවත් ප්‍රතිව්‍රතා ධර්මය යි. ඒ කෙබඳු ද යනු–

''ආර්තෙ ආර්තා මුදිතෙ හෘෂ්ටා-ප්‍රොෂිතෙ මලිනා කෘශා''

යනාදීන් දක්විණ. ''ආර්තෙ-(සැමියා) පීඩිත වූ කල්හි, ආර්තා- පීඩිත වන්නී යැ; මුදිතෙ- ප්‍රීත වූ කල්හි, හෘෂ්ටා- සතුටු වන්නී යැ; ප්‍රොෂිතෙ- විදෙශ ගත වූ කල්හි, මලිනා කෘශා- මලින ද කෘශ ද වන්නී යැ'' යනු අර්ථ යි.

'දපුණු' යනු 'ආඩම්බර සහිත වූ' යන අර්ථ ඇත්තේ යැ. පතිව්‍රතාවට ඒ ධර්මය මහත් ආඩම්බරයට හෙතුවෙකි. එ හෙයින් මෙ සේ කියත්.

**66. සුනිල් වලා නව සඳ නිලුපුල් පබ ළු**
**විමල් සක් ගිජිඳු කුඹු සිරිවැස බැබැ ළු**
**විපුල් පුලින රඹ සිකි ගල මුතු ළ ද ළු**
**ළ කල් රන ලියන් සරනා බල සබ ළු**

සුනිල් වලා, නව සඳ, නිල් උපුල්, පබළු, විමල් සක්, ගිජිඳු කුඹු, බැබැළු සිරිවැස, විපුල් පුලින, රඹ, සිකි ගල, මුතු, ළ දළු, ළ කල් සරනා රන ලියන්, සබළු, බල.

**සුනිල්**– අති නීලවර්ණ වූ, **වලා**– වලාහක (වලා කුළු) යැ, **නව සඳ**– අභිනව චන්ද්‍ර යැ, **නිල් උපුල්**– නීලොත්පල යැ, **පබළු**– ප්‍රවාල යැ, **විමල්**– නිර්මල වූ, **සක්**– ශඞ්ඛ යැ, **ගිජිඳු කුඹු**– ගජෙන්ද්‍ර කුම්භ යැ, **බැබැළු**– භ්‍රාජිත වූ, **සිරිවැස**– උඩැක්කි යැ, **විපුල්**– මහත් වූ, **පුලින**– වැලි තලා යැ, **රඹ**– රම්භා යැ (කෙසෙල් කඳ යැ), **සිකි ගල**– මයූර ග්‍රීවා යැ, **මුතු**– මුක්තා යැ, **ළ දළු**– තරුණ පල්ලව යැ, (යන මෙයින්) **ළ කල්**– මනොඥ වූ, **සරනා**– සඤ්චරණය කරන්නා වූ, **රන ලියන්**– සුවර්ණලතාවන්, **සබළු**– මිත්‍රය, **බල**– අවලොකනය කරව.

ඉතා නිල් වලා කුළු යැ, අළුත් සඳ යැ, නිල් මානෙල් යැ, පබළු යැ, පරිසුදු වූ හක් යැ, ඇත් කුඹු යැ, බබලන්නා වූ උඩැක්කි යැ, මහත් වැලි තලා යැ, කෙසෙල් කඳ යැ, මොනර කර යැ, මුතු යැ, ළා දළු යැ, යන මෙයින් මනොහර වූ, ඇවිදින්නා වූ සුවර්ණලතාවන් (රන් වැල්), මිත්‍රය, බලව.

"රත් ලියත් බල" යී කී තමුදු මෙසින් වැනුණාහු පුරස්ත්‍රීහු යි. උපමෙය පක්‍ෂය නිරායාසයෙන් අවබොධ කළ හැකි වන බැවින්, උපමාන පක්‍ෂය පමණක් මෙසේ දැක්විණ.

ඒ නගරයෙහි ස්වර්ණලතාවන් වැනි ස්ත්‍රීහු සඤ්චරණය කෙරෙති. ඉතා නිල් වලා කුළු වැනි කෙශකලාපයෙන් ද, අළුත් සඳ වැනි නළලින් ද, නිල් මානෙල් වැනි ඇසින් ද, පබළු වැනි තොලින් ද, පිරිසුදු වූ හක් වැනි ගෙලෙන් ද, ඇත් කුඹු වැනි පියොවුරින් ද, බබළන්නා වූ උඩැක්කිය වැනි සිහිනිඟින් ද, මහත් වැලි තලා වැනි උකුළින් ද, කෙසෙල් කඳ වැනි වටොරින් ද, මොනර කර වැනි ජඞ්ඝායෙන් ද, මුතු වැනි නියෙන් ද, ලා දළු වැනි අතුල් පතුල්වලින් ද, ඒ ස්ත්‍රීහු මනොහරයෝ යැ.

මේ පද්‍යය බලා අලගියවන්න මුකවෙටි තුමෝ ද–

"ගන 'බ නිලුපුල් ස ර
රන'කුසු මුතු පබළ'කු ර
සක් රන දම නිස ර
ළ කල් රන ළිය සරනි එනුව ර"

යි කීහ.

**විපසණි:—**

1. **සුනිල් වලා**– කෙශකලාපය ඉතා නිල් බවද, විශාල බව ද මෙයින් හැඟැවෙයි

2. **නව සඳ**– නළල ඉතා පටු බව මෙ දක්වයි.

3. **පබළු**– තොල් රතු බව මෙයින් සූචිත යි.

4. **සක්**– ග්‍රීවායෙහි පූර්ණත්වය හා තුන් හිරි රැඳි බව මෙයින් දැක්විණ.

5. **ගිජිඳු කුඹු**– මෙයින් හැඟැවෙනුයේ පයොධරයන් ගේ උන්නතුඞ්ගත්ව පූර්ණත්ව ඝනබද්ධත්වාදිය යි.

6. **සිරිවැස**– මේ පිළිබඳ මතභෙදයෙක් වෙයි.

'සිරිවැස' යන්නට පුරාණ සන්නයෙහි "ශ්‍රීවත්ස යැ" යි අරුත් දැක්විණ. සංස්කෘතයෙහි 'ශ්‍රීවත්ස' යනු විෂ්ණුහු ගේ වක්‍ෂස්හි වූ ලාඤ්ඡනයට නම් වේ. ඉතින් මේ ලාඤ්ඡනයට සමාන කළ හැකි අන් කිසිවක් ස්ත්‍රී ශරීරයෙහි නො දක්නහෝ 'වසා රෙද' නම් වූ රොමරාජිය ගනිති. "වසා රෙද ශ්‍රීවත්ස ලාඤ්ඡනයට සමාන වනුයේ කවර ආකාරයෙන් ද?" යනු පැහැදිලි නො කෙරෙති.

"රත් සිරිවැස නිහාය සිහිනිඟාය"

යන ගුත්තිල පාඨය මතක් නුවූ බව ද, ප්‍රකාශ කෙරෙත්.

තවත් පක්‍ෂයෙකැ වූවෝ, මෙහි ශරීරාවයවයන් ගැනුණු පිළිවෙළ සලකන්නාහු, ගුත්තිල පාඨය ද මෙනෙහි කරන්නාහු, "ශ්‍රීවත්ස යැ" යි මෙබෙණින් මැ "එ නම් උඩැක්කිය යැ"යි ද, "එයින් වැනුණෙ ස්ත්‍රීන් ගේ ශරීරමධ්‍යය යැ" යි ද දක්වති.

තෘතීය පක්‍ෂය ගත්තෝ උඩැක්කියට 'ශ්‍රීවාස' යන නාමයක් සංස්කෘතයෙහි නම් නැති බව සලකන්නාහු–

“රත් සිරිවැස නිඟාය සිහිනිඟාය”

යන ගුත්තිලපාඨයෙහි ‘සිරිවැස’ යන්නට “ශ්‍රීවත්ස යැ”යි අරුත් බැණැ’ උඩැක්කියක් ගෙනැ කෙලින් සිටුවන ලද්දේ නම්, එහි රූපාකාරය ‘ශ්‍රීවත්ස’ නම් ලාඤ්ඡනයෙහි රූපාකාරය මැ වන බව ද, දෙකෙහි මැ මධ්‍යය එක සේ සිහින් වන බැවින්, සිහිනිඟට සමාන බව ද, කියත්. මෙ සේ උඩැක්කිය සඳහන් කරතුදු, ඔවුන්ගේ මතයෙනුත් ‘රත් සිරිවැස’ නම් ශ්‍රීවත්ස ලාඤ්ඡනය මැ යි; සිහිනිඟ සවර්ණයට ද වඩා මනෝහර වර්ණයෙන් යුත් වන බැවින් ද, විෂ්ණුහුගේ ලාඤ්ඡනය ශුභ්‍රවර්ණ වන බැවින් ද, සවර්ණමය වූ ශ්‍රීවත්සයෙක් සම්භාව්‍ය වේ.

කෙ සේ කිව ද ශ්‍රීවත්සලාඤ්ඡනය උඩැක්කියෙහි රූපාකාරය පහළ කරන්නේ නො වේ. “සවර්ණ ශ්‍රීවත්සයෙක් සම්භාව්‍ය යැ” යනු බළලකු මරා කනු කැමැති වැ, “එම් සාවෙක් මැ යැ; හුදෙක් පූර්වකුශලයෙන් මුහුනේ වලඟ දික් වී යැ” යි එකකු කී බස පරදව යි.

‘සිරිවැස’ යනුයෙන් සිහිනිඟ ගත යුතු බව, ගුත්තිල පාඨයෙන් සුව්‍යක්ත වෙයි. එ හෙයින් වෙසා රොද ගැන්ම අනනුකූල යැ. ‘සිරිවස්’ ලකුණ, සිටුවන ලද උඩැක්කියක් හා සමාන නොවන බැවින්, උඩැක්කි නාමය මනාලයක් කොටැ ගෙනැ, “සිහිනිඟ සිරිවස් ලකුණ වැන්නැ”යි කීම ද අයුක්ත යැ. රූපාකාරයෙන් උඩැක්කිය සිහිනිඟට අතිශයින් සමාන වන හෙයින් ද, මඟුල් ලකුණෙහි ‘සිරිවැස දෙක යැ’ යන තන්හි ‘සිරිවැස’ යනු ‘උඩැක්කිය යැ’ යන අර්ථයෙහි මැ යෙදුණු හෙයින් ද, මේ අර්ථයෙහි ‘සිරිවැස’ සඳහන් නිපදවා ලීමෙහි පොහොසත් වූ ‘සිරිවච්ඡ’ යන්නක් පාලියෙහි ලැබෙන හෙයින් ද, “මෙහි‘සිරිවැස’යනු‘උඩැක්කිය යැ’ යන අර්ථයෙහි යෙදිණැ”යි ද, “උපමෙයත්වයෙන් සිහිනිඟ ගැනිණැ”යි ද, යන මතය අතිශයින් යුක්තියුක්ත ද ශාස්ත්‍රීය ද වෙයි. හුදෙක් ‘සිරිවැස’ යන්නට ‘ශ්‍රීවත්ස යැ’ යි අර්ථ කීව නම් නො මැනැවි, උඩැක්කිය හඟවන ශ්‍රීවත්ස ශබ්දයක් සංස්කෘතයෙහි නැති හෙයින්.

7. **විපුල් පුලින**- මෙයින් උකුළ ඉතා පළල් වන බව හැඟැවෙයි.

8. **මුතු**- නිය ද මුතුමෙන් සුදු පැහැ ඇත්තේ යැ. දක්වුණු පිළිවෙළින් නිය ගත යුතු වන නමුත්, දත් ද මුතු හා සමාන වේ මැ යි.

9. **ලදළු**- අතුල් පතුල්, ලා දළු මෙන් රක්තවර්ණ වේ. ‘පබළු’ යන්නෙන් මෙහි තොල් හැඟැවුණු හෙයින් හා පිළිවෙළ සිඳෙන හෙයින් නො ගැනෙතුදු, එ ද ලදළු හා සමාන නොවන්නේ නො වේ. කීයේ මැ නො, රහල් හිමියන් විසින් මැ-

“තොලතුල් පතුල් ප ලූ
සසමල් කැනින් සිත්ක ලූ
පියොවුරු පල ඉසි ලූ
ලියෝ ලිය වැනි පුර සරනා සු ලූ”-යි?

10. **ලකල්**- ලයට (සිතට) කල්. ඇතැමෙක් මෙයට “අලඞ්කෘත වූ” යි අරුත් බෙණෙති. නමුත් ඒ අර්ථයෙහි යෙදෙනුයේ ‘ලකළ’ හෝ ‘ලකුළු’ යනු යි. කිසි කලෙකත් ඒ ශලතා නො වේ.

56. ඔ ද වැඩී කෙළි මඟුල් ලැබෑ තුටු නිසා ක ල
ස ද සක් මඬෙසිනැ'දූ දෙන දුණු කැන් දුහු ල
සොද පුර අඟන පහ සුමුගින් පැහැ උදු ල
සෙ ද දුනු අඹර මතු ඇය රැස් මිණි මෙවු ල

ඔද වැඩී කෙළි මහුල් ලැබෑ තුටු නිසා කල සඳ සක් මඬෙසින් ඇදූ දුණු කැන් දුහුල දෙන, සොද පුර අඟන පැහැ උදුල පහ සුමුගින්, රැස් මිණි මෙවුල, ඇය අඹර මතු, සෙද දුනු.

ඔද වැඩී- ඕජෝගිත වූ (අධික දීප්ති ඇති), කෙළි මහුල්- ක්‍රීඩාමඞ්ගලයන්, ලැබෑ- ලබා, තුටු- සන්තුෂ්ට වූ, නිසා කල- රාත්‍රි නමැති කාන්තාව විසින්, සඳ සක් මඬෙසින්- චන්ද්‍ර නමැති ශඞ්ඛ මඤ්ජුෂායෙන් (සඳ නමැති සක් පෙට්ටියෙන්), ඇදූ-ගසා ගෙන, දුණු කැන් දුහුල- ජ්‍යොත්ස්නා සමූහ නමැති දුකූලය හෙවත් චන්ද්‍රකාන්ති සමූහ නමැති සිනිඳු පට සළුව, දෙන- දානය කරන කල්හි, සොද- සුන්දර වූ, පුර අඟන- පුර නමැති අඞ්ගනා තොමෝ, පැහැ උදුල- ප්‍රභායෙන් උජ්ජ්වලිත වූ, පහ සුමුගින්- ප්‍රාසාද නමැති සමුද්ගයෙන් හෙවත් කරඬුයෙන්, රැස්- රශ්මි නමැති, මිණි මෙවුල- මණිමෙඛලාව, ඇය- ඒ නිශාකාන්තාව ගේ, අඹර මතු- ආකාශමස්තකයෙහි දෙහෝ නො හොත් වස්ත්‍රමස්තකයෙහි, සෙද- ශීඝ්‍ර ව, දුනු- දානය කළා යැ.

(ඒ නගර නමැති ස්ත්‍රිය විසින් පවත්වන ලද්දා වූ) දීප්තියෙන් අධික වූ ක්‍රීඩා උත්සවයන්. ලබා සතුටු වූ රාත්‍රි නමැති කාන්තාව, සඳ මඬල නමැති සක් පෙට්ටියෙන් ඇද, සඳ රැස් සමූහ නමැති සිනිඳු පට සළුව දෙන කල්හි, යහපත් වූ (ඒ) නගර නමැති අඞ්ගනාව, ප්‍රභායෙන් බබලන්නා වූ ප්‍රාසාද නමැති කරඬුයෙන් රශ්මි නමැති රත්නමෙඛලාව, ඒ රාත්‍රි නමැති ස්ත්‍රිය ගේ ආකාශ නමැති වස්ත්‍රය මතුයෙහි, වහා දුන්නා යැ.

කල්‍යාණී පුර නමැති ස්ත්‍රිය අධික දීප්ති ඇති ක්‍රීඩා උත්සව පවත්වයි. ඒ දැක සතුටු වූ රාත්‍රි නමැති ස්ත්‍රිය තමා ගේ සඳ නමැති සක් පෙට්ටියෙන් ගෙන සඳ රැස් සමූහ නමැති සිනිඳු පට සළුව තෑගි පිණිස දෙයි. පුර නමැති ස්ත්‍රිය ද, තමා තෑගි ලබා කර බා සිටිනු අයුතු වන බැවින්, වහා තමා ගේ ප්‍රාසාද නමැති කරඬුයෙන් ගෙන (මාණික්‍යාදීන් ගේ) රශ්මි නමැති රුවන් මෙවුල, ඒ රාත්‍රි නමැති ස්ත්‍රිය ගේ අවකාශ නමැති වස්ත්‍රය මතුයෙහි පලඳව යි.

නුවරට සඳ රැස් වැටුණු කලැ නුවර ප්‍රාසාදයන් ගෙන් මිණි රැස් අහසට වැදුණු බව මෙහි දණ්ටාර්ථය යි. අහසට මිණි රැස් වැදීමට නම් ප්‍රාසාද අතිශයින් උස් විය යුතු බව සලකා ගත

පුර[illegible]ත්‍රියෙහි මහත් ක්‍රීඩා උත්සවයන් පවත්වනුයෙන් ඒ සංසරමාසින් [illegible]ඩාදියෙන් දුරු වැ මහත් වූ ශ්‍රී සම්පත්තීන් කල් යවන බව ද හැඟේ.

විසඳුම්:—

1. බඳ වැඩි– මෙහි 'බඳ' යනු 'දිපති' 'ප්‍රකාශ' යන අර්ථයන්හි වැටේ. [illegible] පැවැත්වෙන කෙළි මඟුල් මහත් විභූතියෙන් යුක්ත බව මෙයින් සූචිත යි. 'වැඩි' යනු 'වඩ' (වැඩ්ඪති) ධාතුයෙන් වූ අතීත කෘදන්ත පද යි. මේ ධාතුව වඩ්-වඩ්ඪති-වැඩි-ආදි විසින් වරනැගේ.

2. කෙළි මඟුල්– මේ කෙළි මඟුල් නම් රාත්‍රිකාලයට සුදුසු වූ මධු පානාදිය යි. ස්ත්‍රීපුරුෂයෝ රුස් වැ මිරස බී මෙදෙන් උදම් වැ වර්ණනාපථාතික්‍රාන්ත වූ ක්‍රීඩෝත්සවයෙන් අභිරමණය කෙරෙත්.

3. තුටු- 'තුස්' (සතොස්ති) ධාතුයෙන් වූ අතීතකෘදන්ත පද යි. 'තුස්' ධාතුව වරනැඟෙනුයේ තුසී-තුසිති-තිට්-තුටු-ආදි විසිනි.

4. සඳ සක් මඳුසින්– 'මඤ්ජූෂා' (පාළි- මඤ්ජූසා) නම් පෙට්ටිය යි. මේ සිංහලයෙහි 'මඳෙස්'යි සිටී. 'සක් මඳුස' නම් සකින් කළ මඳෙස යි. සඳ සුදු වන හෙයින් "සක් මඳෙසැ"යි කීහ.

5. දුණු කැන් දුහුල– මෙහි 'දුණු' නම් චන්ද්‍රරශ්මිය යි. ඒ සංස්කෘතයෙහි 'ජ්‍යොත්ස්නා' යි ද පාළියෙහි 'ජුණ්හා' යි ද දක්නා ලැබේ. 'කැන්' යනු සමූහාර්ථයෙහි වේ. 'දුහුල්' යනු සිහිඳු පට පිළියට නම් වේ. චන්ද්‍රරශ්මිසමූහයට සිහිඳු පට පිළිය උපමිත යි.

6. පහ සුමුහින්– 'සුමුහු' (සංස්කෘත-සමුද්ගක, පාළි- සමුග්ග) යනු ප්‍රකෘති යි. 'පහ සුමුහින්' යනු මෙහි අවධි යි. "එයින් ගෙනැ රුස් මිණි මෙවුල දුන්නැ"යි අරුත් ගත යුතු.

7 දුනු– 'පුර අඟනා' යනු එකවචන වුව ද එය උක්ත කරනා මේ ආඛ්‍යාතපදය බහු බසැ සිටියේ යැ. කවර හෙයින් ද? 'අඟනා' යනු ස්ත්‍රීලිංග වන හෙයිනි. "උක්තය ස්ත්‍රීලිංග නම් ඒ එකවචන වුව ද, අතීත ආඛ්‍යාතය බහු බසින් ම යෙදිය යුතු යැ" යනු සිංහල ව්‍යාකරණ රීති යි. සතු මඟද විවරණ මැ පෙළ විවරණ කොටැ ගත්තෝ මේ බව නො දනිති.

8 අඹර මතු– මෙහි 'අඹර' යනු අර්ථ දෙකක් දෙයි. එ හෙයින් "ආකාශ නමැති වස්ත්‍රයැ"යි අර්ථ ගත්තෝ යැ. සතු මඟද දෙක්හි දු 'අම්බර' යනු 'ආකාශ' 'වස්ත්‍ර' යන අර්ථද්වයයෙහි මැ වැටේ.

9. ඈය රුස් මිණි මෙවුල– ඈය ගේ හෙවත් නගර නමැති ස්ත්‍රිය ගේ 'රුස්' නම් ප්‍රාසාදශෘඞ්ගයෙහි ද තොරණාදියෙහි ද වූ මාණික්‍යයන් ගේ රශ්මිය යි.

57. ත වර කැරු කොකුම් සඳෙනෙන් තුනු සිය ල
පවර සුවඳ මල් දම් පැලැඳැ මනත ල
බැහැර සිතු නොලූ ගිම්නඹුවො කෙළිලො ල
එ පුර ඉඳිති සඳ පානෙන් සඳලුව ල

කොකුම් සඳනෙන් සියල තුනු තවර සැරැ, මනකල පවර සුවඳ මල් දම් පැලැඳැ, සිතු බැහැර නොලූ, කෙළිලොල හිමිනඹුවො (හිමි + අඹුවො), එ පුරැ සඳලුවලැ සඳ පානේ ඉඳිති.

**කොකුම් සඳනෙන්**- කුඞ්කුමයෙන් යුක්ත කැරුණු චන්දනයෙන්, **සියල තුනු**- සකල ශරීරය, **තවර සැරැ**- චර්චිත කොට හෙවත් ගල්වා, **මනකල**- මනඃකල්‍ය වූ හෙවත් මනොඥ වූ, **පවර**- උතුම් වූ, **සුවඳ මල් දම්**- සුගන්ධ මාලාදාමයන්, **පැලැඳැ**- ප්‍රසාධනය කොට, **සිතු**- චිත්තයන්, **බැහැර නොලූ**- පිටතට නොපැමිණිවූ, **කෙළිලොල** - ක්‍රීඩාලොල වූ, **හිමිඅඹුවො**- දම්පතීහු, **එ පුරැ**- ඒ පුරයෙහි, **සඳලුවලැ** - චන්ද්‍රශාලාවන්හි, **සඳ පානේ**- චන්ද්‍රාලොකයෙහි, **ඉඳිති**- නිෂදනය කෙරෙති.

කොකුම් හා මිශ්‍ර කොටැ කැරුණු සඳුන් විලවුනින් සියලු ශරීරය තවරා, සිතට ප්‍රියකර වූ උතුම් වූ සුවඳින් යුත් මල් දම් පැලැඳැ ගෙනැ, සිත (ඔවුනොවුන් කෙරෙන්) (පිටතට නොහැරියා වූ, ක්‍රීඩායෙහි ලොල් වූ, අඹුසැමියෝ ඒ නගරයෙහි චන්ද්‍රශාලාවන්හි සඳ පානේ ඉඳිත්.

අඹුසැමියන් වැනුණු හෙයින්, ස්ත්‍රී පක්ෂයට හෝ පුරුෂ පක්ෂයට විශෙෂයෙන් අයත් වූ වස්ත්‍රාභරණාදියක් නො කියා, උභයපක්ෂයට මැ සාධාරණ වූ කුඞ්කුමචන්දනවිලෙපනය හා කුසුමදාමයන් ගත්හ.

මේ ශිශිරකාලය වන බැවින් කුඞ්කුමාඞ්ගරාගය යෙදෙයි. සිසිල් වන හෙයින් චන්දනය නම් නො යෙදෙයි. ශිශිර ඍතුයෙහි සඳ පානේ සදලුවලැ හිඳුම ද, කවීන් විසින් අවර්ණිත යැ.

**සසඳයෙයි–**

"වලඳ හුණු බොජුන් - ගල්වා බොල් කසා වෙරැ
හැඳැ රතු වතුනුරැ ලා - අඹුන් තිළී හිමින් මන"

යනුයෙන් ශිශිරකාලයෙහි පැවැතුම් වැනිණ.

**විපසණි:—**

1. **හිමිනඹුවො**- 'හිමි + අඹුවො'- 'න'කාරාගමයෙන් මේ සිද්ධ යැ. මෙ බඳු තන්හි 'න'කාරාගමය ඉතා විරල වේ.

2. **සඳලුවලැ**- 'සඳලු' (චන්ද්‍රශාලා) යනු ප්‍රාසාදමස්තකයෙහි වූ ශාලාවනට නම් වේ.

58. **මුව ලඹ රඹ වලු බර රන් තැඹිලි තු රැ**
**සැදි ගෙ උසන් ගෙවමින් වේ මඟැ අ තු රැ**
**කරකැවෙමින් දකුණට අවුදින් මි තු රැ**
**වදු වෙහෙරම සිහි කැරැ නව ගුණ ම තු රැ**

අතුරු වෙ මගැ, මුව ලඹ රඹ වලු බර රන් තැඹිලි තුරු සැදි ගෙ උයන්
ගෙවමින්, දකුණට කරකැවෙමින් අවුදින්, නව ගුණ මතුරු සිහි කැරැ,
මිතුරු, වෙහෙරට වදු.

**අතුරු වෙ මගැ-** අතර වීථිමාර්ගයෙහි, **මුව ලඹ-** මුවාව ලම්බක ඇති (මුව එල්ලෙන්නා වූ), **රඹ-** කෙසෙල් ගස් ද, **වලු බර-** ඵලභරිත වූ, **රන් තැඹිලි තුරු-** රන් තැඹිලි ගස් ද, **සැදි-** සජ්ජිත වූ හෝ හොත් අලඞ්කෘත වූ, **ගෙ උයන්-** ගෘහෝද්‍යානයන්, **ගෙවමින්-** පසු කොට, **දකුණට කරකැවෙමින්-** දක්ෂිණාවෘත්ත වැ, **අවුදින්-** ආගමන කොට, **නව ගුණ මතුරු-** නවගුණ මන්ත්‍රය, **සිහි කැරැ-** සමරණය කොට, **මිතුරු-** මිත්‍රය, **වෙහෙරට-** විහාරයට, **වදු-** ප්‍රවිෂ්ට වව.

අතරෙහි වූ වීථිමාර්ගයෙහි, මුව එල්ලෙන කෙසෙල් ද, ගෙඩි වලු බර රන් තැඹිලි ද යන ගස් සැදුණා වූ ගෙ වතු පසු කොට, දකුණට කරකැවී අවුත්, නව (අරහාදි බුද්ධ) ගුණ මන්ත්‍රය සිහි කොට, මිත්‍රය, වෙහෙරට ඇතුළු වව.

**විසඳුම්:—**

1. **ගෙ උයන්-** ගෙය වටා සිටි උයන ගෙ උයන යි.

2. **අතුරු වෙ මගැ-** කැලණි පුරයෙහි සැළලිහිණියා තුන් තැනැ සිටැ වෙහෙරට හැරෙන ස්ථානය දක්වා අතරෙහි වූ වීථිමාර්ගය මෙයින් ගැනිණ,

3. **අවුදින්-** 'අවුදු' යන පූර්වක්‍රියා නිපාතය 'ඉන්' විබත් ගෙනැ සිටි තැනි. මෙසේ 'ඉන්' විභක්තිය ගත්තාහු ධාතුප්‍රත්‍යයන් දක්වීමෙන් පූර්වක්‍රියා පද ලෙස සිද්ධ කළ නොහැකි නිපාතයෝ යැ. 'කොටින්', 'ලදින්' යනු ද නිදර්ශන යි.

4. **නව ගුණ මතුරු-** "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා" යන මේ නව ගුණ මන්ත්‍රය යි. මේ බුදුන් ගේ ගුණ නවය ප්‍රකාශ කරනුයෙන් 'නව ගුණ' නම් වෙයි; බෞද්ධයන් විසින් මන්ත්‍රයක් මෙන් නිතර කියැවෙන සිහි කැරෙන හෙයින් මන්ත්‍ර නමුදු වෙයි. "මෙසේ ද ඒ භාග්‍යවත් බුදුන් වහන්සේ (1) භගවත් ද, (2) අර්හත් ද, (3) සම්‍යක් සම්බුද්ධ ද, (4) විද්‍යාචරණසම්පන්න ද, (5) සුගත ද, (6) ලොකවිදූ ද, (7) අනුත්තර ද, (8) පුරුෂදම්‍යසාරථි ද (9) දෙවිමිනිස්නට ශාස්තෘ ද වන සේක" යනු නව ගුණ පාඨයෙහි අර්ථ යි.

69. දි ග නෙ ක් පැතිරැ සිටි බුදු ගුණ කියා හැ ම
ස ග මො ක් ලබනු වස් පිය සුග ඔබා බි ම
සි ය ස ක් සුරු දුමු සෙමෙන් නුමු වැ මුනි තු ම
ව දු ල ක් තිලක සෙණ වැඩැ ලක් මහ පිළි ම

හැම දිය තෙක් පැතිරැ සිටි බුදු ගුණ කියා, සග මොක් ලබනු වස් පිය සුග බිමැ ඔබා, මුනි තුම සිය සක් පුරා දුටු මෙන් අවු වැ, ලක්තිලක ගෙහි වැඩැ උන් මහ පිළිම වඳු.

හැම දිය තෙක්- සකල ලෝකය ඇති තාක්, පැතිරැ සිටි- ව්‍යාප්ත වැ සිටියා වූ, බුදු ගුණ- බුද්ධගුණයන්, කියා- කථනය කොට, සග මොක් ලබනු වස්- ස්වර්ගමෝක්ෂ ලාභය පිණිස, පිය සුග- පක්ෂයුගමය, බිමැ- භූමියෙහි, ඔබා- පිහිටුවා, මුනි තුම- මුනීන්ද්‍රයන් වහන්සේ, සිය සක් පුරා- ස්වකීය නෙත්‍රයන් පරිපූර්ණ කොට, දුටු මෙන්- දර්ශනය කළාක් මෙන්, තුටු වැ- සන්තුෂ්ට වැ, ලක්තිලක ගෙහි- ලඞ්කාතිලක නම් වූ (ප්‍රතිමා) ගෘහයෙහි, වැඩැ උන්- නිෂණ්ණ වැ සිටියා වූ, මහ පිළිම- මහාප්‍රතිමා වහන්සේට, වඳු- නමස්කාර කරව.

සියලු ලෝකය තාක් පැතිරැ සිටියා වූ බුදු ගුණ කියා, දෙව් සැප නිවන් සැප ලබනු පිණිස, පියා පත් දෙක බිමැ පිහිටුවා, බුදුන් වහන්සේ තමා ගේ ඇස් පුරා දුටුවාක් මෙන් සතුටු වැ, ලඞ්කාතිලක නම් පිළිම ගෙහි වැඩැ හුන් මහා ප්‍රතිමාව නමදුව.

**විසඳුම්:—**

1. **දිය තෙක්** පැතිරැ සිටි **බුදු ගුණ** කියා **හැම**- මෙහි 'හැම' යනු 'දිය' යන්නට විශේෂණ කොට ගෙනැ අරුත් පැවැසිණ. පස් පදයෙකින් ඈත් වැ, විශේෂ්‍යය කොට ගත හැකි අන්‍ය පදයෙකිනුදු පර වැ, සිටි හෙයින් මේ යැත්ම රමණීය හෝ ශාස්ත්‍රානුකූල හෝ නො වේ. "අන් බුදු කෙනකුට පවා කල්පයෙකිනුදු හැම බුදු ගුණ නොකියැ හැක්කැ"යි සම්මත හෙයින්, 'හැම' යනු 'බුදු ගුණ' යන්නට විශේෂණ කොටැ ගත් කල්හි අර්ථයෙහි විරෝධත්වයෙක් පැනේ.

'බුදු ගුණ' යනුයෙන් සාමාන්‍යයෙන් ගැනෙනුයේ "ඉතිපි සො භගවා" යනාදීන් දක්වුණ නවය යි. එ පමණෙක් මැ නම්, "හැම බුදුගුණ"යි කිව ද වරදෙක් නො වේ. එසේ ගත හොත් "දිය තෙක් පැතිරැ සිටි" යනුයෙන් හැඟෙනුයේ ඒ ගුණ කථාව සියලු ලෝකය පුරා පැතිරැ සිටි බව යි.

2. **සිය සක් පුරා දුටු මෙන්**- "රිසි සේ දුටු මෙන්" යනු පිණිසැ ඊ යි.

3. **තුටු වැ**- සිත පහදවා. බුදුන් දැකැ සිත පැහැදවීම ද මහත් පිනෙකි.

4. **මුනි තුම**- ජීවමාන බුදුන් වහන්සේ.

5. **වැඩැ උන්**- සිටි පිළිම, හුන් පිළිම, හොත් පිළිම යැ යි බෙදෙන හෙයින් පිළිමය බැඳී අයුරැ දක්වන්නට මෙසේ කීහ.

60 පෙරළ ද ල   නිඳු දිය සඳ රම තිමි ගල   ත
සුර කු ල   හිමි රකිනුව ලකැ මැවූ ස   ත
මහ ක ල   ඒ සමුදුරැ පැහැයෙන් දිමු   පා
වඳු ස ල   පිළිම හිමි සිරි සරණ සිසප   ත

පෙරැ, දලනිදු දිය කඳ රට බිම් ගලන, ලකැ සත රකිනුව සුර කුල හිමි මැවූ, මනකල ඒ සමුදුරැ පැහැයෙන් දිමුත, සල පිළිම හිමි සිරි සරණ සිය පත වඳු.

**පෙරැ**- පූර්වයෙහි, **දලනිදු**- ජලනිධිහු ගේ (මහා සමුද්‍රයා ගේ), **දිය කඳ**- ජලස්කන්ධය, **රට බිම් ගලන**- ජනපදභූමීන් නිමග්න කරන කල්හි, **ලකැ සත**- ලංකාද්වීපයෙහි සත්ත්වයන්, **රකිනුව**- රක්ෂා කරනු පිණිස, **සුර කුල හිමි**- දෙව කුල ස්වාමීහු (ශක්‍රයා) විසින්, **මැවූ**-නිර්මිත වූ, **මනකල**-මනඃකල්‍ය වූ, **ඒ සමුදුරැ පැහැයෙන්**- ඒ සමුද්‍රයා ගේ ප්‍රභායෙන්, **දිමුත**- දීප්තිමත් වූ, **සල පිළිම හිමි**- ශිලාප්‍රතිමා ස්වාමීන් ගේ, **සිරි සරණ**- ශ්‍රී චරණ නමැති, **සියපත**- ශතපත්‍රයට ( පිළිමයට ), **වඳු**- නමස්කාර කරව.

**පූර්වයෙහි (කැලණිතිස් රජු ගේ කාලයෙහි) සාගරයෙහි ජලස්කන්ධය රට බිම් යට කරන කල්හි, ලංකාද්වීපයෙහි සත්ත්වයන් රකිනු පිණිස ශක්‍රයා විසින් මවන ලද්දා වූ ද, මනොහර වූ ඒ සාගරයෙහි පැහැයෙන් දිලියෙන්නා වූ ද, ගල් පිළිම වහන්සේ ගේ ශ්‍රීපාද නමැති පද්මය නමදුව.**

**ටිප්පණි:—**

1. **පෙරැ**- කැලණිතිස්ස රජු ගේ කාලයෙහි. එ කලැ කැලණිතිස් රජ නිවැරැදි රහත් තෙරුන් හුණු තෙල් සැළෑ ලැවූයෙන්, මුහුද ගලා, රට විනාශ වූ පරිදි මහාවංශය බලා දත්තේ යැ. මේ මුහුද ගැල්ම නවත්වනු පිණිස ශක්‍රයා විසින් නීලවර්ණ වූ ගල් පිළිමයක් මවන ලද බව මේ පද්‍යයෙන් පැනේ.

2. **දලනිදු**- 'ජලනිධි' යන්නෙහි මේ ආයේ යැ. ජලයට නිධි (නිධාන) වූයෙන් සාගරය මේ නම් වෙයි.

3. **රට බිම්**- මෙහි 'රට' යනුයෙන් රට වැස්සෝ ගැනෙති. සාගරය රට වැස්සන් නසා නැවැත්තේ නො වේ. භූමිය ද තමා අයත් කෙළේ යැ.

4. **සුර කුල හිමි**- මෙහි 'කුල' යනු වර්ගය යි. සුර කුලයාට හෙවත් දිව්‍ය වර්ගයාට ස්වාමි වූයේ ශක්‍රයා යි. එ හෙයින් ඔහුට 'දෙවෙන්ද්‍ර' යනු ද නම් වේ.

5. **සමුදුරැ පැහැයෙන්**- සමුද්‍රය නීලවර්ණ යැ. එ හෙයින් "සමුදුරැ පැහැයෙන් දිමුතැ"යි නීලවර්ණත්වය හැඟැවීමට යෙදිණ.

6. **සල පිළිම හිමි**- 'සල' යනු පාෂාණයට නම්, පාලි 'සිලා' (සංස්කෘත 'ශිලා') යන්නෙහි ආයේ යැ.

7. **සියපත**- පත් සියයක් ඇතියේ යමෙකැ ද ඒ සියපත්. නෙළුම් මල යි. මේ නම යෙදෙනුයේ එහි පත්‍ර බොහෝ වන හෙයිනි; සියයක් මැ ඇති හෙයින් නො වේ. 'සහස්පත්' යනු ද මේ අර්ථයෙහි මැ යෙදේ.

61. ගි ලි ය නො දී සැට මහණුන් බව මහ' ණ
ම ලි ය දෙව් තෙරිඳු වැඩැ හිඳැ දෙසූ බ ණ
දි ලි ය පස් මහල් පායෙහි මිණි කිර ණ
බැ ලි ය හැකි වී නම් දකැ වැඳැ යා කල ණ

සැට මහණුන් බව මහ අණැ ගිලියැ නො දී, මලියදෙව් තෙරිඳු වැඩැ හිඳැ බණ දෙසූ, පස් මහල් පායෙහි දිලිය මිණි කිරණ බැලියැ හැකි වී නම්, දකැ වැඳැ; කලණ, යා.

**සැට මහණුන්**- සැටක් පමණ වූ ශ්‍රමණයන්, **බව මහ අණැ**- භව නැමැති මහාර්ණවයෙහි හෙවත් සංසාර නමැති මහා සාගරයෙහි, **ගිලියැ නො දී**- නිමග්න වන්නට නො හැර, **මලිය දෙව් තෙරිඳු**- මලියදෙව ස්ථවිරයන් වහන්සේ, **වැඩැ හිඳැ**- නිෂණ්ණ වැ, **බණ දෙසූ**- ධර්ම දේශනා කළා වූ, **පස් මහල් පායෙහි**- පඤ්චභූමක ප්‍රාසාදයෙහි, **දිලිය**- දිලියෙන්නා වූ, **මිණි කිරණ**- මණිරශ්මීන්, **බැලියැ හැකි වී නම්**- නිරීක්ෂණය කළ හැකි නම්, **දකැ**- (එය) දර්ශනය කොට, **වැඳැ**- (ඊට) නමස්කාර කොට, **කලණ**- කල්‍යාණය හෙවත් මිත්‍රය, **යා**- ගමන් කරව.

ශ්‍රමණයන් සැට දෙනා සංසාර නමැති මහා සාගරයෙහි ගිලෙන්නට නො දී, මලියදෙව ස්ථවිරයන් වහන්සේ වැඩැ හිඳැ ධර්මය දේශනා කළා වූ, පස් මහලින් යුත් ප්‍රාසාදයෙහි දිලියෙන්නා වූ මණිරශ්මීන් බැලියැ හැකි වී නම්, දකැ, නමස්කාර කොටැ, මිත්‍රය, යව.

**විසඳුම්:—**

1. ගිලිය නො දී සැට මහණුන් බව මහ ණ
මලිය දෙව් තෙරිඳු වැඩැ හිඳැ දෙසූ බ ණ

'භව' නම් සංසාරය යි. 'අණ' නම් සාගරය යි. මහත් වනුයෙන් 'මහ අණ' නම් වේ. සාකරාවයෙහි 'අණ' 'අණව' යන නම් දෙක මැ යෙදේ. ඒ පාලි 'අණ්ණව' (සංස්කෘත 'අර්ණව') යන්නෙන් ආයේ යැ.

සංසාරසාගරයෙහි ගිලියැ නොදීම නම්, රහත් බවට පැමිණවීම යි. මලිය දෙව ස්ථවිරයන් වහන්සේ මේ වර්ණිත වූ ප්‍රාසාදයෙහි හිඳැ, 'ඡඡක්ක' නම් වූ සූත්‍රයෙන් බණ වදළ කලැ මහණුන් සැට නමක් රහත් වූ බව කියත්.

2. **මිණි කිරණ**- මෙහි මිණි කිරණ ගැනුමෙන් ප්‍රාසාදයා ගේ විභූතිය දක්වන පිණිස යැ.

62. පෙර ළ වි ඳ ගෙනැ ගිරි ඳ සිඳු සල ත
නැඟි පැහැද පෙණ ස මු ද සැවි තුමූ ත
මෙන ළ ලි ඳ පැහැ වි ඹි ද නෙ දිගු බි ත
සැ දි ව ට ද ගෙඩි ව ඳු ද ගබ දිමු ත

පෙරැ උවිඳු ගිරිඳු ගෙනැ සිඳු සලන, පැහැදු නැගි පෙණ සමුදු සැපි නුමුන,
උළිඳු මෙන පැහැ නෙ දිගු බිනැ විහිදු සැදි, වට දු ගෙහි දිමුත දු ගබ වඳු.

පෙරැ- පූර්වකාලයෙහි, උවිඳු- උපෙන්ද්‍රයා (විෂ්ණුහු), ගිරිඳු- (මන්දර) පර්වතරාජයා, ගෙනැ- ග්‍රහණය කොට, සිඳු- (ක්ෂීර) සාගරය, සලන- අලලන කල්හි, පැහැදු- ප්‍රසන්න වැ, නැගි- උද්ගත වූ, පෙණ සමුදු- ඵේණ සමුදයෙහි (පෙණ රැසෙහි) සැපි- විලාසය, නුමුන- නොහැරියා වූ, උළිඳු මෙන- චන්ද්‍රයා මෙන්, පැහැ- ප්‍රභාව, නෙ දිගු බිනැ- අනෙක දිශා භිත්තියෙහි, විහිදු- විස්තීර්ණ කොට, සැදි- සජ්ජිත වූ, වට දු ගෙහි- වෘත්ත ධාතු ගෘහයෙහි, දිමුත- දීප්තිමත් වූ, දු ගබ- ධාතුගර්භය, වඳු- නමස්කාර කරව.

පූර්වයෙහි විෂ්ණුහු (මන්දර) මහාපර්වතය ගෙනැ, (කිරි) මුහුද කලඹන කල්හි, පැහැදී නැගුණා වූ පෙණ රැසෙහි ආකාරය නොහැරියා වූ, චන්ද්‍රයා මෙන් ප්‍රභාව නොයෙක් දිශා ප්‍රදෙශයෙහි පතුරුවා අලඞ්කෘත වී සිටි, වට දා ගෙහි බබලන්නා වූ දා ගබ වඳුව.

කිරි මුහුද සුදු යැ; එය කලඹන කලැ නැගි පෙණ සමූහය වඩාත් සුදු වෙයි. “ඒ පෙණ සමූහය වැන්නැ”යි ද, “චන්ද්‍රයා මෙන් ප්‍රභාව විහිද සැදිණැ”යි ද කීමෙන්, දා ගබ අතිශයින් සුදු බව හැඟැවිණ.

විසඳුම්:—

1. පෙරැ උවිඳු ගෙනැ ගිරිඳු සිඳු සලන- පූර්වයෙහි දුර්වාසස් නම් සෘෂි තෙමේ ශක්‍රයාට මල් දමක් දින. ශක්‍ර එයින් ඓරාවණයා ගේ කුම්භය සැරැසී යැ. ඇත් එය සොඬින් ගෙනැ බිමැ හෙළී යැ. මෙයින් කුපිත වූ සෘෂිහු විසින් ශාප කරන ලද ශක්‍රයා ගේ තෙද පිරිහිණ. මේ කාරණ කොටැ ගෙනැ අසුරයන් හා සටනට නොහිකි වූ දෙවියෝ විෂ්ණුහු දුකැ තමනට පිළිසරණ වන ලෙස යැදියහ. විෂ්ණු තෙමේ ‘තෙපි අසුරයන් හා එක් වැ කිරි මුහුද අලලා අමෘතය ගෙනැ බී වීඩ වඩා ගෙනැ අමර වවු යැ” යි කී යැ. දිව්‍යයෝ ද අසුරයන් හා මිත්‍ර වැ, මන්දර පර්වතය මන්ථය කොටැ ගෙනැ, වාසුකී නම් නාගයා රැහැන කොටැ පර්වතය වෙළා, අසුරයනට නාගයා ගේ හිස දී, තමන් වලග ගෙනැ, කිරි මුහුද ඇලෑවූහ. මේ ඇලෑලීමෙන්-

“ලක්ෂ්මීඃ කෞස්තුභපාරිජාතකසුරා ධන්වන්තරිශ්චන්ද්‍රමාඃ
ගාවඃ කාමදුඝාඃ සුරෙශ්වරගජො රම්භාදිදෙවාඞ්ගනාඃ
අශ්වඃ සප්තමුඛො විෂං හරිධනුඃ ශඞ්ඛො’මෘතං චාම්බුධෙඃ
රත්නානීහ චතුර්දශ ප්‍රතිදිනං කුර්‍ය්‍යාත් සදා මඞ්ගලම්”-යි

දක්වුණු, (1) ලක්ෂ්මී, (2) කෞස්තුභ මාණික්‍යය, (3) පාරිජාත වෘක්ෂය, (4) සුරා දෙවී, (5) ධන්වන්තරී, (6) චන්ද්‍ර, (7) කාමදුඝා ගවයෝ, (8) ඓරාවණ, (9) රම්භාදි දෙවාඞ්ගනාවෝ, (10) සප්තමුඛ අශ්වයා, (11) කාලකූට විෂය,

(12) විෂ්ණුහු ගේ දූත්ත, (13) ශඞ්ඛය, (14) අමෘතය යන මේ චතුර්දශ-රත්නයෝ පහළ වූ හ. සුරයෝ අමෘතය බී විජි ලැබූ අසුරයන් පැරද්දූ හු.

එක් ජන්මයෙක්හි ඉන්ද්‍රයාට මල් බෑ වෑ උපන් හෙයින් විෂ්ණු 'උපෙන්ද්‍ර' නම් වී. 'උපෙන්ද්‍ර' යනුයෙන් සිංහලයට එනුයේ **උවිඳු** යනු යි.

මෙහි ගැනුණු **ගිරිඳු** නම් මන්දර පර්වතය යි. බොහෝ සිංහල කවීහු මන්දර යනු දු මේරු යනු දු එක මැ යැ යි සිතූ හ.

"රුපු සයුර **මෙර** මත්තෝ"
"**සුමෙනර** මතින් අළලන වර කිරි සයුර"
"නම වදන් හරි **මෙර** - මතින'ළලා සබ සයුරු"

යනාදීන් ඒ සදුට වෙයි. පුරාණ ඥානයෙහි කොත්‍ර පැමිණි රහල් හිමියෝ වනාහි පර්වතයන් දෙදෙනා ගේ භෙදය දත්තාහු.

"උගු සැවු ගුරු සයුරු අළලන **මඳර** ගිරේ"
යි කී හු.

2. **උළිඳු**- (උළු+ඉඳු) 'උළු' යනු භාරකාවනට නම්. ඔවුනට නායක වන බැවින් චන්ද්‍ර 'උළිඳු' නම් වේ. 'උළු' යනු ද සතු ඔහද 'උඩු' යන්නෙන් ආයේ යැ.

3. **දිගු බිනෑ**- මෙහි 'බිනු' ශබ්දය ප්‍රදෙශාර්ථයෙහි වැටේ. සංස්කෘත යෙහි 'භිත්ති' ශබ්දය ඒ අර්ථය ද දෙන්නේ වේ.

"භිත්තිඃ ප්‍රදෙශෙ කුඩ්‍යෙ'පි" යනු කොෂවචන යි.

**63. දිගු නෙ ත් නිලු'පුලෙ'ව රත'දර පබළ ර ඟ**
**සි රි ම ත් සුපුන් සඳ වැනි වුවන මන ර ඟ**
**පැහැ ප ත් ලකල රන්වන් විලසින් ලොව ග**
**වැඳු හො ත් පිළිම හිමි වඳු පාසෑ පැල දි ග**

දිගු නෙත් නිල් උපුල් එව්, රතු අදර පබළු රඟ, මනරඟ වුවන සිරිමත් සුපුන් සඳ වැනි, පැහැ පත් ලකල රන්වන් විලසින් ලොවඟ, පැළ දිගැ පාසෑ වැඳූ හොත් පිළිම හිමි වඳු.

**දිගු නෙත්**- දීර්ඝ වූ නෙත්‍රයන්, **නිල් උපුල් එව්**- නීලොත්පල බඳු වූ, **රතු අදර**- රක්තාධරයන්, **පබළ රඟ**- ප්‍රවාලාකාර වූ, **මනරඟ වුවන**- මනොඥ වූ වක්ත්‍රය, **සිරිමත්**- ශ්‍රීමත් වූ, **සුපුන් සඳ වැනි**- සම්පූර්ණ චන්ද්‍රයා බඳු වූ, **පැහැ පත්** - ප්‍රභාප්‍රාප්ත වූ, **ලකල**- අලඞ්කෘත වූ, **රන්වන් විලසින්**- සුවර්ණවර්ණවිලාසයෙන්, **ලොවඟ** - ලොකාග්‍ර වූ, **පැළ දිගෑ** - පශ්චිම දිග්භාගයෙහි වූ, **පාසෑ**- ප්‍රාසාදයෙහි, **වැඳූ හොත්**- ශයනප්‍රාප්ත වූ, **පිළිම හිමි**- ප්‍රතිමාස්වාමීන් වහන්සේට, **වඳු**- නමස්කාර කර.

දිගු වූ ඇස් නිල් මහනෙල් වැනි වූ, රතු වූ තොල් පබළු වැනි වූ, සිත් ගන්නා මුහුණ ශ්‍රීමත් සම්පූර්ණ චන්ද්‍රයා වැනි වූ,

කාන්තිමත් අලඞ්කෘත සුවර්ණවර්ණ විලාසයෙන් ලොකාග්‍ර වූ, බස්නාහිරි දිගැ ප්‍රාසාදයෙහි වැඩ හොත්තා වූ, ප්‍රතිමා ස්වාමීන් වඳුව.

ඒ පිළිමයෙහි ඇස් නිල් යැ, තොල් රතු යැ, මුහුණ සඳ වැනි නැ. කාන්තියෙන් යුක්ත වූ අලඞ්කෘත වූ සුවර්ණවර්ණවිලාස යෙන් ඒ පිළිමය ලොකයෙහි සියලු පිළිම අතුරෙහි අග්‍ර යැ. ඒ පිළිමය බස්නාහිරි දිගැ ප්‍රාසාදයෙහි වූයේ යැ.

**විසඳුම්.—**

1. **වැඩ හොත්**– මෙහි 'වැඩ' යන පූර්වක්‍රියා නිපාතය පාදපූරණයෙහි වෙයි. 'හොත්' යී කී පමණින් අර්ථය ලැබෙයි. 'වැඩ' යනු 'වඩ' (පිවිසුම්හි) දහින් නිපන.

64. අ හ සින් අවුත් මිණිඅක් නයිඳු යැදුම ට
ර හ තන් මැදෙහි මුනි හිඳැ මිණි පලඟ පි ට
ද හ මුන් දෙසූ තැනැ කළ සැට රියන් කො ට
ම හ දගප් හිමින් වඳු සොළොස තන් සි ට

මිණිඅක් නයිඳු යැදුමට මුනි අහසින් අවුත් රහතන් මැදෙහි මිණි පලඟ පිටැ හිඳැ දහමුන් දෙසූ තැනැ සැටරියන් කොටැ කළ, මහ දගප් හිමින් සොළොස තන් සිටැ වඳු.

**මිණිඅක් නයිඳු**– මණ්‍යක්ෂික නාගරාජයා ගේ, **යැදුමට**– යාච්ඤාවට, **මුනි**– සර්වඥයන් වහන්සේ, **අහසින් අවුත්**– ආකාශයෙන් ආගමනය කොටැ, **රහතන් මැදෙහි**– අර්හතුන් මධ්‍යයෙහි, **මිණි පලඟ පිටැ** – රත්න පර්‍යඞ්කය මස්තකයෙහි, **හිඳැ**– නිෂණ්ණ වැ, **දහමුන් දෙසූ තැනැ**– ධර්ම දෙශනාය කළා වූ ද ස්ථානයෙහි, **සැටරියන් කොටැ** – ෂෂ්ට්‍යරත්නිප්‍රමාණ කොටැ, **කළ**– කරන ලද, **මහ දගප් හිමින්**– මහාධාතුගර්භ ස්වාමීන් වහන්සේට, **සොළොස තන්**–ශොඩශ ස්ථානයෙහි, **සිටැ**– ස්ථිතිය කොටැ, **වඳු**– ප්‍රණාමය කර.

මණ්‍යක්ෂික නාගරාජයා ගේ යැදීම පරිදි බුදුන් අහසින් අවුත් රහතන් මැද්දෙහි රුවන් පුටුව පිටැ හිඳැ ධර්මය දෙශනාය කළා වූ ද ස්ථානයෙහි සැටරියන් කොටැ කරන ලද්දා වූ මහාධාතු ගර්භස්වාමීන් වහන්සේ, සොළොස් තැනෙකැ සිටැ වඳුව.

**විසඳුම්:-**

1. **මිණිඅක් නයිඳු**–කැලණියේ නා රජ යි. සමුද්‍රනාග භවනයෙහි රජ වූ මහොදරයා ගේ මයිල් යැ. ජුද්ධයෙහි දී බැන ඥාතීනට සහාය වනු පිණිස ආ හෙතෙම කැලණියට ද වඩින ලෙස බුදුන් යැදි යැ.

2. **මිණි පලඟ**– චූළොදර යැ ඔහු මයිල් මහොදර යැ යන දෙ නා රජුන් ගේ යුද්ධයට හෙතු වූයේ මිණි පුටුව යි. බුදුන් අවුත් යුද සමත් කළ කලැ දෙ නා රජහු එක් වැ මිණි පුටුව බුදුනට පිදූ හ.

3. **මිණි පලඟ පිටැ හිඳැ දහමුත් දෙසූ තැනැ-** 'දහමුත්' යනු 'දහම්+දු' යන තන්හි ස්වරාගම-අන්ත්‍යස්වරලෝප-අඝෝෂාදේශයන් ගෙන් සිද්ධ යැ. මෙහි 'දු' යනු සමුච්චයාර්ථයෙහි නිපාත යි. ඒ කුමක් කුමක් සමුච්චය කෙරේ ද? ඒ ස්ථානය වන්‍දනාහි විෂය කරැණු දෙකෙක් හේතු විය. එකෙක් නම් බුදුන් එහි හුන් බව යි. අනෙක නම් එ තන්හි හිඳැ දහම් දෙසූ බව යි. හිඳීම, දෙසීම යන ක්‍රියා දෙකෙහි සමුච්චය 'දු' නිපාතයෙන් කැරිණ. ක්‍රියාව හා සම්බන්ධ සමුච්චයාර්ථයෙහි නිපාතය යෙදීම සිංහලයෙහි විරල යැ. අවශ්‍ය තන්හි එබඳු නිපාතය යෙදෙනුයේ ක්‍රියාවට අනන්තර වූ නාමය සමග යැ. "මෙහ් බණත් ඇසී යැ, දනුත් දිනි" යන තන්හි නිපාතය යෙදුණේ 'බණ' 'දන්' යන නාමයන් සමඟ මැ නමුත් සමුච්චය කැරුණේ 'ඇසී' 'දිනි' යන ක්‍රියා දෙක යැ. එ හෙයින් මෙබඳු තන්හි "බණත් ඇසී" යනු ද "දනුත් දිනි" යනු ද බලා "අන් කුමක් ඇසී ද? අන් කුමක් දිනි දැ?" යි අසනු නො යෙදෙයි. එමෙන් මැ "දහමුත් දෙසූ" යනු බලා "අන් කුමක් දෙසි දැ?" යි අසනු ද යෙදෙත්තේ නො වේ.

4. **රියන්-** මේ පාළි 'රතන' (සංස්කෘත 'අරත්නි') යන්නෙහි අංගේ යැ.

5. **දගජ්-** 'දගබ' යනු ප්‍රකෘතිය යි. අන්ත්‍යස්වරලෝපයෙන් 'දගබ්' යනු වෙයි. යුගල වූ තැනෙකැ මුත් අන් තන්හි ග, ද බ, යන ඝෝෂයන් හල් වැ නොසිටිනු සිංහල රීති යි. හල් වුව ඔවුනට ක, ත, ප, යන අඝෝෂයෝ ආදේශ වෙති. මේ අඝෝෂාදේශ යි. දිගු= දික්, සඳ= සත්, ගබ= ගප්, යනු පිළිවෙළින් උදාහරණ යි.

6 **සොළොස තන් සිට-** වන්‍දනාර්ථයක්හු ප්‍රදක්ෂිණා කොටැ වඳනා කලැ සිවු තැනෙකැ හෝ අට තැනෙකැ හෝ සොළොස් තැනෙකැ හෝ සිටැ නොහොත් හිඳැ නොහොත් බැසැ හෙවැ වඳිනු සිරිති. මෙහි සොළොස් තැනෙකැ සිටැ වඳිත්නාට කී සේ යි.

7. **පිට, කොට, සිට-** පිටැ, කොටැ, සිටැ, යන තන්හි 'ඇ' කාරය එළිසමය පිණිස 'අ' කාර බවට පැමිණිවුණු සේ යි.

65. ස ව න සතියැ වැසි වසි නා දස දි ගෙ හි
පෙ ණී න සෙවෙනි මුදලිඳු නා දරණ ගෙ හි
ස ව න හිඳිනු දනන්'ද නා නෙතු සු ගෙ හි
ව ද න මැනැවි පිළිමය නා පිළිම ගෙ හි

දස දිගෙහි වැසි වසිනා සවන සතියැ, මුදලිඳු නා පෙණීන සෙවෙනි දරණ ගෙහි සවන හිඳිනු, දනන් නෙතු සුගෙහි අඳනා, නා පිළිම ගෙහි පිළිමය වඳන මැනැවි.

**දස දිගෙහි** - දශ දිශායෙහි, **වැසි වසිනා** - වර්ෂණය කරන්නා වූ, **සවන සතියැ**- ෂෂ්ඨ සප්තාහයෙහි, **මුදලිඳු නා**- මුචලින්ද නාගයා ගේ, **පෙණීන**- ඵණය කරණ කොටැ ගෙනැ, **සෙවෙණි**- ඡදනවත් වූ, **දරණ ගෙහි**- භෝගාවලී ගෘහයෙහි, **සවන**- සර්වඥයන් වහන්සේ, **හිඳිනු**- නිෂදනය කිරීම, **දනන්**- ජනයන් ගේ,

**නෙතු යුගෙහි** - නෙත්‍ර යුගමයෙහි, **අඳනා**- අඤ්ජනය කරන් නා වූ, **නා පිළිම ගෙහි**- නාගප්‍රතිමාගෘහයෙහි, **පිළිමය**- ප්‍රතිමා වට, **වඳනා මැනැවි**- නමස්කාර කරනු යහපති.

දශදිශායෙහි වැසි වසින්නා වූ සවැනි සතියෙහි, මුචලින්ද නාගයා ගේ පෙණයෙන් සෙවෙති වූ දරණ වැල නමැති ගෘහ යෙහි සඹුදුන් හිඳින සැටි, ජනයන් ගේ දෙ ඇස්හි අඳින්නා වූ, නා පිළිම ගෙහි පිළිමය වඳිනු මැනැවි.

මුචලින්ද නාගයා දරණ ලා මතුයෙහි පෙණය කොටැ සිටි කලැ, ගෙයක් වැනි වෙයි. ඔහුගේ දරණ වැල ගෙහි බිත යි; පෙණය පියස්ස යි. ධාරානිපාතයෙන් වස්නා සවන සතියෙහි බුදුහු ඒ නාගයා ගේ දරණ ගෙහි හුන් හ. ඒ හුන් ආකාරය දක්වා කැරැණෙකි මේ පිළිමය. එ හෙයින් මේ පිළිමය බුදුන් මුචලින්ද නාගයා ගේ දරණ ගෙහි හුන් ආකාරය මිනිසුන් ගේ ඇස්හි අඳින්නේ නම් වෙයි.

**විසඳුම්:-**

1. **සවන සතියැ**- අභිසම්බෝධියට අනතුරු වැ බුදුහු සත් සතියක් ධ්‍යානසුඛයෙන් ගත කළ හ. ඉන් සත් වන සතිය ගෙවුණේ මෙහි ලා කියැවුණු පරිදි සි.

2. **සවන හිඳිනු දනන‘දනා නෙතු යුගෙහි**- ‘සවන හිඳිනු දක්වන’ යනු මේ කවි භාෂායෙන් කී පරිදි සි. ‘නා පිළිම ගෙහි පිළිමය’ සවන සති යැ මුදලිඳු හා දරණ ගෙහි සවන හිඳිනු දනන් නෙතු යුගෙහි, අඳී. මේ පිළිමය දුටු කලැ, ‘සවන සතියැ සවන මුදලිඳු හා දරණ ගෙහි හිඳිනු’ දුටුවා මෙන් වෙයි.

3. **නා පිළිම ගෙහි**- නා පිළිමය වූ ගෙය ද ‘නා පිළිම ගේ’ නම් වී ය.

66. සසරින් මුදා ලෙව් සදහම් අමා දී
එකගින් මුනිඳු හුන් වැනි නිපරමාදී
ලකුණෙන් සපිරි පිළිමය දකැ සමාදී
වැඳැ ගන් මිතුර තුන් සිත කැරැ සමාදී

සදහම් අමා දී ලෙව් සසරින් මුදා මුනිඳු එකඟින් හුන් වැනි නිපරමාදි ලකුණෙන් සපිරි සමාදි පිළිමය දකා, තුන් සිත සමාදි කැරැ, මිතුර, වැඳ ගන්.

**සදහම් අමා**- සද්ධර්ම නමැති අමෘතය, **දී**- දී කොටැ, **ලෙව්**- ලොක සත්ත්වයා, **සසරින්**- සංසාරයෙන්, **මුදා**- මුක්ත කොටැ, **මුනිඳු**- මුනීන්ද්‍රයන් වහන්සේ, **එකගින්**- එකාග්‍රතායෙන්, **හුන් වැනි**- හුන්නාක් වැනි වූ, **නිපරමාදී ලකුණෙන්**- නිෂ්ප්‍රමාද

ලක්ෂණයෙන්, **සපිරි**- සම්පූර්ණ වූ, **සමාදි පිළිමය**- සමාධි නම් වූ ප්‍රතිමාව, **දැක**- දර්ශනය කොටැ, **තුන් සිත**- ත්‍රිවිධ චිත්තය, **සමාදි කැර**- සමාධි කොටැ, **මිතුර**- මිත්‍රය, **වැඳැ ගන්**- (එයට) නමස්කාර කරන්නේ යැ.

සද්ධර්මය නමැති අමෘතය දී ලෝකයා සංසාරයෙන් මුදා, මුනීන්ද්‍ර යන් (සිත්) එකඟින් යුක්ත වැ වැඩැ හුන්නාක් වැනි වූ නිෂ්ප්‍රමාද ලක්ෂණයෙන් සම්පූර්ණ වූ සමාධි පිළිමය දැකැ, මිත්‍රය, ත්‍රිවිධ චිත්තය එක සේ ප්‍රසන්න කොටැ ගෙනැ, වැඳැ ගනුව.

**ටිප්පණි:-**

1. **සසරින් මුදා**- ස්කන්ධයන් ගේ ද ධාතු ආයතනයන් ගේ ද නො සිඳී පැවැත්ම සංසාර යි. ඉන් මිදීම නම් නිවනට පැමිණීම යි

2. **එකඟින්**- චිත්තෛකාග්‍රතාව මෙහි ලා ගැනේ. 'අග්‍ර' යනු යෙන් 'අග' යි ලැබෙතු දු ඒ 'අග්‍ර' යනු මැ 'එක' ශබ්දය හා එක් වැ නිපන් 'එකග්‍ර' යනුයෙන් ලැබෙනුයේ 'එකඟ' යනු යැ.

3. **මුනිඳු හුන් වැනි**- මෙහි 'හුන්' යනුයෙන් මේ පිළිමය සිටි පිළිමයක් හෝ හොත් පිළිමයක් නොවන බව හැඟැවෙයි.

4. **නිපරමාදී ලකුණින් සපිරි**- 'ප්‍රමාදය' නම් සිතෙහි එකඟ බව සිඳීම යි. නොසිඳුණු චිත්තෛකාග්‍රතාව (සිත එකඟ බව) ඇත්තේ 'නිෂ්ප්‍රමාද' නම්. ඒ නිෂ්ප්‍රමාදයා ගේ ලක්ෂණ නිෂ්ප්‍රමාද ලක්ෂණ යි. මෙයින් ගැනෙනුයේ, සිත නොපිරිහුණු එකඟ බැවින් යුත් බව හැඟෙන ලකුණු යි. පිළිමය එබඳු ලකුණින් සම්පූර්ණ බව මෙසේ කී හ.

යම් සමාධි ප්‍රතිමාව කොතරම් දක්ෂලෙස කැරුණේ ද යත හොත්, නිෂ්ප්‍රමාදයකු ගේ හෙවත් ප්‍රමාදරහිත වූවකු ගේ ඇති විය යුතු සියලු ලකුණු, මෙහි සම්පූර්ණ වැ පෙනේ. නිෂ්ප්‍රමාද වූවකු ගේ ඇස් යම් බඳු ද, මේ ප්‍රතිමායෙහි ඇස් ද එබඳු මැ යැ; ඇසි බැම මුව යනාදිය යම් බඳු ද, මෙහි දු ඒ ඒ දෑය එසේ එසේ මැ වෙයි. එ හෙයින් මේ පිළිමය නිෂ්ප්‍රමාද ලක්ෂණයෙන් සම්පූර්ණ යැ.

'නිෂ්ප්‍රමාද' යනු 'නිපරමාද' යි බිඳැ ගන්නා ලද. 'නිෂ්ප්‍රමාද' යන්නෙහි අර්ථය නම් 'ප්‍රමාදය නැති' යනු යි. නමුත් 'නිපරමාද' යනු අප්‍රමාදාර්ථයෙහි ගැනුණු බව පෙනේ. නිපරමාදය ඇත්තේ 'නිපරමාදි' යි තද්ධිත පදයෙක් නිපැදවිණි. 'නිපරමාදී' යි දීර්ඝස්වරාන්ත කැරුණේ එළි වැට රැකෙනු පිණිස යැ.

5 **සමාදී පිළිමය**- 'සමාධි' යනු චිත්තෛකාග්‍රතාවට නම් වේ. පිළිමයට මේ නම යෙදුණේ, සිත එකඟ බව හඟවන ලකුණෙන් සම්පූර්ණ වූ හෙයිනි. 'සමාදි' යි සිටියැ යුතු තන්හි අන්ත්‍යස්වරය දික් කැරුණේ එළි වැට රැකෙනු පිණිස යැ.

6 **තුන් සිත සමාදි කැර**- ආදිචේතනා, මධ්‍යචේතනා, පශ්චාච්චේතනා යන මේ යැ තුන් සිත නම්. එයි ආදි චේතනා නම් යම් කිසි

සිත් කරන්නට පළමු කොට මැ ඇති වන සිත යි. මධ්‍යචෙතනා නම් ඒ දු කරන කල්හි ඇති වන සිත යි. පශ්චාත්තා චෙතනා නම් කොට නිමැවූ පසු ඇති වන සිත යි. කුශලකරණයෙහි දී මේ තුන් සිත එක සේ පහදවා ගත යුත්තේ යැ.

'සමාදි' (සමාධි) යනුයෙන් මේ තන්හි දු එකග බව ගැනේ. මේ වැදී මෙහි දී ද සිත එක්වද කැර ගත යුත්තේ යැ. මෙහි වුවමනා සිත පැහැදීම යි. එ හෙයින් මේ තන්හි එකග කිරීම නම්, තුන් සිත එක සේ පහදවා ගැනීම යි.

මෙහි දු 'සමාදි' යි සිව්යැ යුතු තැනැ අනන්‍යසවරය ඡන්ද හෙතුයෙන් දීන් කාරණ.

67\. අ ප මු නි ඳු බුදු වන දිනැ මුරුන් පි ඳු
පැ හැ වි හි ඳු දිලි කලදෙ යටින් යෙ දූ
සැ දි සි නි ඳු ඉඳු නිල් මිණි සතෙ'ක බ ඳු
වැ දැ දු මි ඳු වන පින් පල න අන් බ ඳු

අප මුනිඳු බුදු වන දිනැ මුරුන් පිදූ, පැහැ විහිඳූ දිලි කලදෙ යටින් යෙදූ, සැදි, සිනිඳු, ඉඳුනිල් මිණි සත් එක බඳු, දුමිඳු වැදැ, වන පින් පල න අන් බඳු.

**අප මුනිඳු**- අප ගේ මුනීන්ද්‍රයා, **බුදු වන දිනැ**- බුද්ධත්වයට පැමිණෙන දිනයෙහි, **මුරුන්**- දෙවියන් විසින්, **පිඳු**- පුදන ලද්දා වූ, **පැහැ**- ප්‍රභාව, **විහිඳූ**- විස්තෘත කළා වූ, **දිලි**- බබළන්නා වූ, **කලදෙ යටින්**- කලධෞත යෂ්ටියෙන් (රිදී මිටින්), **යෙදූ**- යොජිත වූ, **සැදි**- අලඞ්කෘත වූ, **සිනිඳු**- සන්ධි වූ, **ඉඳුනිල් මිණි සත්**- ඉන්ද්‍රනීලමණිච්ඡත්‍රයක් හා, **එකබඳු**- එකාකාර වූ, **දුමිඳු**- (බොධි) ද්‍රැමෙන්ද්‍රයාට, **වැදැ**- නමස්කාර කොටැ, **වන**- සිද්ධ වන්නා වූ, **පින් පල**- පුණ්‍ය ඵලය, **න**- යුෂ්මත්හු ගේ, **අන් බඳු**- හස්තප්‍රාප්ත කර.

ඉඳුනිල් මිණි කුඩයක් හා එකාකාර වූ වෘක්ෂරාජයා වැඳැ ඉන් සිදු වන පුණ්‍යඵලය තා අයත් කරව. කෙබඳු ඉඳුනිල් මිණි කුඩයක් හා එකාකාර වූ ද? අප බුදුන් බුදු වන දිනයෙහි දෙවි යන් පිදූ, ප්‍රභාව පැතිරි වූ දිලියෙන රිදී මිටෙකින් යෙදුවා වූ, අලඞ්කෘත වූ, සිනිඳු වූ, ඉඳුනිල් මිණි සතක් හා එකාකාර වූ (වෘක්ෂරාජයා වැඳැ ඉන් සිදු වන පුණ්‍යඵලය තා අයත් කරව )

**විසඳුම්:-**

1\. **මුරුන්**- 'මුරු' යනු දෙවියනට නමි. පාලි 'මරූ' යනු ද සංස්කෘත 'මරුත්' යනු ද මේ අර්ථය මැ දෙයි.

2\. **ඉඳුනිල් මිණි**- ඉතා උතුම් නිලමණි වර්ගය යි. ලක් දිවැ ලද දී ල, කිරෙහි දූ කලැ කිරි ද නිල් වේ ල.

3. **දුමිඳු**- බොධිය යි. දුම් + ඉඳු. ද්‍රුමෙන්ද්‍ර යනු අර්ථ යි. පාලියෙහි 'දුම' යනු ද සංස්කෘතයෙහි 'ද්‍රුම' යනු ද සමානාර්ථ යි. මෙහි දන්තා ස්වරය ඡන්දස රැකෙන පිණිස දික් කැරිණ. 'මුනිඳු' 'සිහිඳු' 'ඔඳු' යන තන්හි ද මෙසේ මැ යැ.

68. වි ට ං ක පැකිළි'ඳු දකුණ'සැ දෙරටුමෙහ න
නි ස ං ක යෙන් පුද නත් තුරු ගොස'සමි න
ක ල ං ක නො වැ කළ සුබ ලකුණු බබල න
ති ව ං ක නම් දෙ පිළිම නැමැදැ බැසැ ගෙ න

ඉඳු විටංක පැකිළි දකුණු අසැ දෙරටුමෙහ නත් තුරු ගොස් පුද නිසංකයෙන් අසමින, කලංක නො වැ කළ සුබ ලකුණු බබලන තිවංක නම් දෙ පිළිම නැමැදැ, බැසැ ගෙනැ-

**ඉඳු**- චන්ද්‍රයා, **විටංක**- කොබෝ ගෙඩි වළල්ලෙහි, **පැකිළි**- ප්‍රජ්වලිත වූ (හැපුණා වූ), **දකුණු අසැ දෙරටුමෙහ**- දක්ෂිණ පාර්ශ්වයෙහි වූ ද්වාරයෙන්, **නත් තුරු ගොස් පුද**- අනෙක තූර්ය ඝොෂ පූජාවන්, **නිසංකයෙන්**- නිශශඞ්ක වැ (සැක නැති වැ), **අසමින**- ශ්‍රවණය කෙරෙමින්, **කලංක නො වැ**- අකලංක වැ හෙවත් දෙෂයක් නැති වැ, **කළ**- කරන ලද්ද වූ, **සුබ ලකුණු**- ශුභ ලක්ෂණයෙන්, **බබලන**- භ්‍රාජමාන වූ, **තිවංක නම්**- ත්‍රිවඞ්ක නම් වූ, **දෙ පිළිම**- ප්‍රතිමා දෙදෙනා වහන්සේට, **නැ මැ දැ**- නමස්කාර කොට, **බැසැ ගෙන**- අවතීර්ණ වැ— (මතු සම්බන්ධ යි.)

69. ස ම නො ල ගිරි ගිජිඳු දිගු කළ සොඬ'කසැ වි
සි සි ල'ල ගඟැ සිලිල් සනහා මුණි නොගැ වි
පැ හැ දු ල තුන් සිවුරු ඇඳැ පෙරෙ වැ වැඩැ සි ටි
තැනැ කළ සිවුරු දගබ වඳු නො පැ පි වි

සමනොළ ගිරි ගිජිඳු දිගු කළ සොඬ එක සැවි, සිසිල් අළු ගඟැ, නො ගැවී මුනි සිලිල් සනහා, පැහැ උදුළ තුන් සිවුරු ඇඳැ පෙරෙවැ වැඩැ සිටි තැනැ කළ සිවුරු ද ගබ, පිවි නො පැ වඳු.

**සමනොළ ගිරි ගිජිඳු**- සමනනකූට පර්වත නමැති ගජේන්ද්‍රයා විසින්, **දිගු කළ**- ප්‍රසාරණය කරන ලද, **සොඬ එක සැවි**- ශුණ්ඩාව (හොඬ වැල) හා එකාකාර වූ, **සිසිල් අළු**- ශීතලභාවය එළැවූ, **ගඟැ**- ගඞ්ගායෙහි, **නොගැවි**- වීතරාග වූ, **මුනි**- සර්වඥයන් වහන්සේ, **සිලිල් සනහා**- ජල ස්නානය කොට, **පැහැ උදුල**- ප්‍රභායෙන් උජ්ජ්වලිත වූ, **තුන් සිවුරු**- ත්‍රිචීවරය, **ඇඳැ පෙරෙ වැ**- නිවාසන ප්‍රාවරණය කොට (ඇඳැ පොරෝවා ගෙනැ,) **වැඩැ සිටි**- ස්ථිත වූ, **තැනැ**- ස්ථානයෙහි, **කළ**- කරන ලද,

සිවුරු දගබ- චිවරධාතුගර්භයට, පිටි නො පෑ- පර ඔමුව නො වී, වඳු- නමස්කාර කරව.

68 වන 69 වන පද්‍යයන් ගෙන් යුගමයෙක් වේ.

ත්‍රිවඞ්ක නම් වූ ප්‍රතිමා දෙක වැඳැ බැසැ ගෙනැ, සිවුරු දා ගබ පිටු නො පා වඳුව.

"කුමක් කෙරෙමින්, කොබඳු වූ ත්‍රිවඞ්ක නම් ප්‍රතිමා දෙක වැඳැ ගෙනැ ද?" යනු 68 වන පද්‍යයෙන් ද, "කොතැන්හි කළ සිවුරු දා ගබ ද?" යනු 69 වන පද්‍යයෙන් ද, කී හ.

(68) වඳුයා සොබෝ ගෙඩි වළල්ලෙහි හැපුණා වූ දකුණු පැත්තෙහි දෙරටුයෙන් නොයෙක් තූර්යඝෝෂ පූජාවන් සැක නැති වැ අසමින්, නිදෝෂ ලෙස කරන ලද්දා වූ, ශුභ වූ ලක්ෂණ යෙන් බබලන්නා වූ ත්‍රිවඞ්ක නම් වූ ප්‍රතිමා දෙක වැඳැ, (එ තැ නින) බැසැ ගෙනැ- (69) සමන්තකූට පර්වතය නමැති හස්තිරාජයා දික් කළා වූ සොඬ හා එකාකාර වූ, ශීතලභාවය එළැවූ (කල්‍යාණි) නදියෙහි, වීතරාග වූ සර්වඥයන් වහන්සේ ජලස්නානය කොටැ, ප්‍රභාවයෙන් දිළියෙන්නා වූ සිවුරු තුන ඇඳැ පොරෙවා වැඩැ සිටියා වූ ස්ථානයෙහි කරන ලද්දා වූ සිවුරු දා ගබ, පිටු නො පා, වඳුව.

විසඳුම්:- (68)

1 විටංක පැකිලි'දු දකුණ'ණැ දෙරටුයෙන- ප්‍රාසාදාදි ස්ථානයෙහි දඬුයෙන් නිර්මිත වූ කපෝතවාසය හෙවත් (පරෙවි කූඩුව) 'විටඞ්ක' නමි. කපෝතයන් පල්නා හෙයින් 'කපෝතපාලිකා' යනු ද නම් වේ. මෙහි වනාහි, කපෝතපාලිකාව, දක්ෂිණපාර්ශ්වයෙහි වූ දෙරටු මුදුනෙහි වූ බව පෙනේ. "දුදු හෙවත් වඳුයා විටඞ්කයෙහි පැකිලි යැ" යි කීමෙන් ඒ විටඞ්කය ඇති දෙරටුව, වඳුයා යන මාර්ගයට ද වඩා උස බව හැඟැවිණ.

'දෙරටුයෙන' යන තන්හි දෙරටුව නම් ගොපුරද්වාරයෙකි. (ප්‍රාකාර යෙනැ වූ මහ දොරෙකි.) මේ 'දෙරටුයෙන්' යනු අන්විත වනුයේ 'අසමින' යන මිශ්‍ර ක්‍රියා නිපාතයට යි. ඒ දෙරටුයෙන් තූර්යඝෝෂය පැමිණෙන හෙයින් "දෙරටුයෙන් තුරු ගොස් පුද අසමිනැ" යි කී හ.

දෙරටු + එහි = දෙරටුයෙහි = දෙරටුයෙන් = දෙරටුයෙන. 'එහි' විබත්හි අන්ත්‍ය ස්වර ලෝපය ද, ස්වර ලෝපය වූ තන්හි 'අ' කාරයක් වීම ද සිංහල භාෂා රීති යි. එ හෙයින් දෙරටුයෙහි-දෙරටුයෙන-දෙරටුයෙන්-යි රූප තුනෙක් වේ. මේ බව නො විමසා, සිදත්සඟරායෙහි, 'එන්' යනු 'ඉ' යුතු කොටැ ද ගන්නට 'ඉන්' 'අ' යුතු කොටැ ද ගන්නට නොකී සේ අයුතු යැ.

'දෙරටුවෙන්' යනු වර්තමාන ව්‍යවහාරයෙහි බෙහෙවින් ලැබෙන පරිදි යි. නමුත් පුරාතනයනට 'එන්' 'එහි' විභක්ති පර කල්හි, 'උ' කාරයෙන් පර වැ ද, 'ය' කාරාගමය මැ අභිමත වී යැ.

2. **නිසංසාවෙන්**–මහත් තූර්යඝෝෂය ඇසෙන කල්හි සැළලිහිණියාට භය ඉපැදියැ හැකි බැවි "උපද්‍රව ඇතැ" යි සිතා. භය ඉපැදීමට හේතු නැති බව හඟවනු පිණිස 'නිසංසාවෙන් අසමිහැ' යි කී හ.

සංස්කෘතයෙහි 'නිශ්ශඞ්ක' යනු ද පාලියෙහි 'නිස්සඞ්ක' යනු ද, 'ශඞ්කාවෙන් දුරු වූ' යන අර්ථයෙහි යෙදේ. මෙයින් ලැබුණු 'නිසංසා' යනු මෙහි යෙදුණේ 'සැක නැති බව' යන අර්ථයෙහි යැ.

3. **නන් තුරු ගොස සද**– බුද්ධාලයෙහි දේවාලයෙහි අනේකවිධ තූර්යඝෝෂයෙන් පූජා පැවැත්වීම සිරිති. වාදනය පිණිස ගැනෙන්නා වූ උපකරණයෝ 'තූර්' නම් වෙත්.

"ආතතං චෙව විතතං ආතතවිතතං ඝනං
සුසිරං චෙති තූරියං පඤ්චඞ්ගසමුද්දිතං"

යනුයෙන් පාලි පොත්හි (1) ආතත (එක්තල බෙර) යැ, (2) විතත (දෙතල බෙර) යැ, (3) ආතතවිතත (සියලු අඟින් වසා බැඳි බෙර) යැ, (4) ඝන (තාලම්) යැ, (5) සුසිර (නළා) යැ යි, තූර්ය විශේෂ පසෙක් දක්විණ. අති ශ්‍රේෂ්ඨ වූ වීණාදි තන්ත්‍රී වාද්‍ය විශේෂය ගරු කොට සැලැකුණු බවෙක් නො පෙනේ.

"ඝනං ච විතතං වාද්‍යං තතං සුසිරමේව ච"

යනුයෙන්, සංස්කෘත සංගීත ග්‍රන්ථයන්හි, (1) ඝන යැ (2) විතත යැ (3) තත යැ (4) සුසිර යැ යි වාද්‍ය විශේෂ සතරෙක් ගැනිණ. එහි 'ඝන' නම් එක් කොටැ හැසීමෙන් වාදනය කැරෙන කංසතාලම් ආදිය යි. 'විතත' නම් මෘදඞ්ග පුෂ්කරාදි වූ බෙර යි. 'තත' නම් තන්ත්‍රීයුක්ත වූ වීණාදිය යි. 'සුසිර' නම් නළා වැනි යි. මේ බෙදුම් සම්පූර්ණ ද ශාස්ත්‍රානුකූල ද වෙයි.

4. **අසම්නා**–මිශ්‍රක්‍රියා නිපාත නිපැදවීමෙහි දී යෙදෙනුයේ 'මිනි' ප්‍රත්‍යය පමණෙකි. මේ 'මිනි' ප්‍රත්‍යයෙහි අන්ත්‍ය ස්වර ලෝපයෙන් 'මින්' යනු ද, ස්වරලෝපය වූ තන්හි 'අ'කාරය වීමෙන් 'මින' යනු ද, 'මි' යන්නෙහි වූ ස්වරය ලොප් වීමෙන් 'ම්නි' යනුද වේ. මෙසේ අසමිනි-අසමින්-අසමින-අසම්නි-යි රූප සතරෙක් නිපදී. සිදත්සඟරායෙහි ව්‍යාපති මේ සියල්ලට මුල් වූ 'මිනි' ප්‍රත්‍යය නො දක්වා, "මුසු බැවැ මින් මින මිනි ද" යි කී හ.

5. **කලංකා නො වැ කල**–'කලංක' නම් කැළැල් හෙවත් දෝෂ යි. "කිසි දෝෂයක් නො කියැ හැකි සේ කැරුණු" යනු මෙහි අර්ථ යි.

මෙ තන්හි 'වැ' යන පූර්වක්‍රියා නිපාත පදය විශේෂයෙන් සැලැකියැ යුත්තේ යැ.

පූර්ව ක්‍රියාවෙකින් ලැබෙන අර්ථ තුනෙකි. එනම් (1) පූර්ව කාලාර්ථ යැ (2) මිශ්‍ර ක්‍රියාර්ථ යැ (3) හේත්වර්ථ යැ යන මේ යැ.

(1) 'බිළිඳු කිරි බී නිඳයි" යන මෙහි 'බී' යනුයෙන් නිදන්නහු විසින් නිදීමට පෙරැ මැ කැරුණු ක්‍රියාවෙක් හැඟෙයි. මේ බඳු තන්හි ක්‍රියා දෙක මැ එක කර්තෘහු ගේ වියැ යුතු යි.

(2) "පියා මා සොයා එයි" යන තන්හි 'සොයා' යනු 'සොයමින්' යන තාට සමාන යැ. මිශ්‍රක්‍රියා රූපයෙන් නො සිටැ, පූර්වක්‍රියා රූපයෙන් සිටියෙන් මේ පූර්වක්‍රියාවෙකි, නමුත් අර්ථයෙන් මිශ්‍රක්‍රියාවෙකි.

(3) "සෙබලා සුදු කොටැ මැරෙයි" යන තන්හි 'කොටැ' යන්නෙන් මැරීමට හෙතු දක්විණ. "පහන නිවී අඳුරු වී යැ" යන තන්හි 'නිවී' යන්න, යෙන් අඳුරු වීමට හෙතු දක්විණ. ප්‍රථමොදාහරණයෙහි සුදු කරන්නේ ද මැරෙන්නේ ද, සෙබලා මැ යි. ක්‍රියා දෙක මැ එකකර්තෘක යැ. ද්විතීයොදාහරණයෙහි, නිවෙන්නේ පහන යි; වන්නේ අඳුරු යි. එ හෙයින් 'නිවී' යන්න හෙත්වර්ථයෙහි වූ භින්නකර්තෘක පූර්වක්‍රියා යි. හෙවත් එලඹ්‍යාන ක්‍රියාව කරන්නහු විසින් මැ නො වැ අන්‍යයකු විසින් කැරුණු පූර්වක්‍රියා යි.

"කලංක නො වැ කල" යන තන්හි 'වැ' යන්න මෙයින් කවර පක්ෂය කට ඇතුලත් වේ ද? 'කල' යන්නෙන් හැඟෙන ක්‍රියාව කල තැනැත්තහු විසින් නොකැරුණු හෙයින් ද, පිළිමය කරන්නාට පෙරැ මැ කැරුණු ක්‍රියාවක් නොහඟවන හෙයින් ද ඒ පූර්වකාලාර්ථයක් නො දෙයි. මිශ්‍රක්‍රියාර්ථය නම් නො දේ මැ යැ. පිළිමය කිරීමට හෙතුවක් නොහඟවන හෙයින් හෙත්වර්ථයකුදු පහළ නො කෙරෙයි. එසේ නම් මෙයින් ලැබෙන අර්ථය කිම?

'වැ' යන පූර්වක්‍රියා නිපාත පදය වෙනස් කොටැ, "කලංක නොවන සේ" යි මේ වාක්‍ය ඛණ්ඩය සෙදුණ හොත්, මෙ තන්හි ලැබියැ යුතු ප්‍රකාරාර්ථය බව පැහැදිලි වේ. කෙසේ කල දෙ පිළිම ද? 'කලංක නො වැ හෙවත් කලංක නොවන සේ' කල දෙ පිළිම යි. මෙසේ පූර්වක්‍රියාව 'ප්‍රකාරාර්ථ' නම් වූ සතර වන අර්ථයෙහැ ද යෙදෙනා බව පෙනේ. "ගොඩාභය රජ ආදාහන පුජව විශෙෂවිසිත වැ කැරුවු" යන තන්හි දු, 'වැ' යන්න මෙ අර්ථයෙහි යෙදිණ.

6. **සුබ ලකුණු බබලන**– ශුභ ලක්ෂණ නම් දුටුවන් හෙත් සිත් පහදවන්නා වූ ශොභන ලක්ෂණ යි. "ශුභ ලක්ෂණයෙන් භ්‍රාජමාන වූ" යි අරුත් බැණුණ ද, "ලකුණු" යන්න 'බබලන' යන්නෙහි කර්තෘවාචි පද යි.

7. **තිවංක නම් දෙපිළිම**– "කවර හෙයින් මේ පිළිම 'ත්‍රිවංක' නම් වී ද?" යනු විචාර්‍ය යි.

**විපසුණ**:- (69)

1. **සිහිල'ළ ගඟැ**– මෙහි 'අල' යනු 'එලැවූ- ඉදිරිපත් කළා වූ-දුන් නා වූ' යන අර්ථ ඇත්තේ යැ. 'සීතලභාවයෙන් යුත් ගඟෙහි' යනු පිණ්ඩාර්ථ යි.

2. **නොගැටි මුනි** – 'ගැට' හෙවත් කෙලෙස් බැඳුම් ඇතියේ 'ගැටි' යි. 'ගැටි නොවන්නේ නොගැටි' යි. 'කෙලෙස් නැති' හෙවත් 'කෙලෙසුන් නැසූ' යනු අර්ථ යි.

3 **තුන් සිවුරැ ඇඳැ පෙරෙවැ**– අඳනා සිවුර යැ, තනිපට පොරෝනා සිවුර යැ, දෙපට පොරෝනා සිවුර යැ, යන මේ තුන් සිවුරැ යි. "අඳනය ඇඳැ, ඉතිරි දෙක පෙරෙවැ" යැ යු සේ යි.

4. **වැඩැ සිටි**– මෙහි 'වැඩැ' යනු හුදු ගෞරවාර්ථයෙහි යෙදිණ. අර්ථයට 'සිටි' යනු මැ ප්‍රමාණ යි. 'වැඩැ' යන පූර්වක්‍රියාව කෙවල වැ යෙදුණෙහි, 'ගමන් කොටැ'- 'වසිත වැ'- 'අභිගමනය කොටැ' යනාදි යම් කිසි අර්ථයකැ යෙදෙයි. 'වැඩැ සිටි' 'වැඩැ හුන්' 'වැඩැ වසනා' යනාදි තන්හි 'සිටි' 'හුන්' 'වසනා' යනාදි පදයනට ඔවුන් ගෙන් නො ලැබියැ හැකි ගෞරවාර්ථයක් මැ එක් කෙරෙයි.

5. **නො පෑ පිටි-** පිටු පෑම අගෞරවයක් සේ ගැනෙන හෙයින් පිටු නො පා වඳුව" යි කී ය.

'පෑ' යනු 'පා' ධාතුයෙන් නිපන් පූර්වක්‍රියා නිපාත යි. 'පා' යි ද සිටී.

'පිටි' යනු ද 'පිටු' යනු ද එක මැ යැ. 'පිටු' යන තන්හි අන්ත්‍යස්වරය පූර්ව රූපයට පැමිණැ 'පිටි' යනු වී යැ.

**70. නි රි ඳු න් කැලණි තිස් නිවැරැදි රහත් නැ න**
**සැ ක යෙ න් ලැවු හුණු තෙල් සැල තුබූ නැ න**
**බැ ති යෙ න් පිනැතියන් කල විසිතුරු විම න**
**වැ ඩැ හු න් පිළිම හිමි නමඳින් සහද න**

කැලණිතිස් නිරිඳුන් නිවැරැදි රහත් නැන සැකයෙන් ලැවු හුණු තෙල් සැල තුබූ නැනැ, පිනැතියන් බැතියෙන් කල විසිතුරු විමනැ වැඩැ හුන් පිළිම හිමි, සහදසන, නමඳින්.

**කැලණිතිස් නිරිඳුන්-** කල්‍යාණීතිස්ස නරේන්‍ද්‍රයන් විසින්, **නිවැරැදි-** නිර්දෝෂ වූ, **රහත් නැන-** රහතන් වහන්සේ, **සැක යෙන්-** ශඞ්කායෙන්, **ලැවු-** ප්‍රක්ෂේප කැරැවූ (දැමූ,) **හුණු තෙල් සැල-** උෂ්ණ වූ තෛලස්ථාලිය, **තුබූ-** ස්ථාපිත වූ, **නැනැ-** ස්ථානයෙහි, **පිනැතියන්-** පුණ්‍යවතුන් විසින්, **බැතියෙන්-** භක්තියෙන්, **කල-** කරන ලද්දා වූ, **විසිතුරු විමනැ-** විචිත්‍ර විමානයෙහි, **වැඩැ හුන්-** උපවිෂ්ට වූ, **පිළිම හිමි-** ප්‍රතිමා ස්වාමීන් වහන්සේට, **සහ දසන-** ප්‍රියදර්ශනය (මිත්‍රය), **නමඳින්-** නමස්කාර කරන්නැ.

කැලණිතිස් රජුන් නිර්දෝෂ වූ රහතන් වහන්සේ ශඞ්කායෙන් දැමූ උණු තෙල් කටාහය තබන ලද ස්ථානයෙහි, පින් ඇති අය විසින් භක්තියෙන් කරන ලද්දා වූ විසිතුරු වූ ගෙහි වැඩැ හුන්නා වූ ප්‍රතිමා ස්වාමීන් වහන්සේට, මිත්‍රය, නමස්කාර කරන්නැ.

**විසඳුම්:-**

1 නි රි ඳු න් කැලණි තිස් නිවැරැදි රහත් නැ න
සැ ක යෙ න් ලැවු හුණු තෙල් සැල තුබූ නැ න.

මේ සම්බන්ධ ප්‍රවෘත්තිය ඉතිහාසයෙහි විස්තර වශයෙන් ආයේ යැ.

"හුණු තෙල් සැළෙහි සිදැ මේ රහතන් වහන්සේ විසින් කියන ලදැ" යි ප්‍රසිද්ධ පාලි ගාථා පඞ්ක්තියක්, තෙලකටාහ ගාථා නමින්, දනුදු ඇති.

2 **පිනැතියන්-** "පුණ්‍යාර්ථින් විසිනැ" යි පුරාණ සන්නයෙහි අරුත් පැවැසිණ. 'පුණ්‍යාර්ථි' නම් පින් කැමැත්තෝ යැ.

3. **වැඩැ හුන් පිළිම හිමි-** මෙහි ද 'වැඩැ' යනු ගෞරවාර්ථයෙහි වේ.

4. යසඳසනා – යස වූ දසුන් ඇතියේ යමක්හු සවද ගේ යසඳ සුන්. 'යසදසන' යනු 'යසදසන්' සඳ 'අ' විබත් නොහැ සිටි තැනි. විබත් ගන්නා කලැ 'දසුන්' යන්නෙහි මැදු වූ 'උ'කාරය 'අ'කාරබවට පැමිණියේ යැ. තෙපුල්- සඳුන්- යනාදි තන්හි දු මෙසේ වෙයි.

71. පි රි සි ද නො දන හැකි මෙ වැඳුම් පින් පඬු රැ
මි නැ බැ ද ඇරැගෙනැ දෙන ලෙස දුනැ එ සුර වි රැ
සු ර ර ද පාය වන් විජයොත් නම් මහ රැ
එ මැ ස ද වඩන රජ ගෙට මිතුර වැඩසා රැ

පිරිසිදැ නො දන හැකි මෙ වැඳුම් පින් පඬුරැ, එ සුරවිරැ දුනැ දෙන ලෙස, මිනැ බැඳැ ඇරැ ගෙනැ, සුර රද මහරැ විජයොත් නම් පාය වන් රජ ගෙට, වැඩසරැ මිතුර, එ මැ සඳැ වඩන.

**පිරිසිදැ**- පරිච්ඡේද කොටැ, **නො දන හැකි**- දැනැ ගත නො හැක්කා වූ, **මෙ වැඳුම් පින්**- මේ නමස්කාරමය පුණ්‍ය නමැති, **පඬුරැ**- ප්‍රාභෘතයන්, **එ සුරවිරැ**- ඒ (විභීෂණ නම්) සුරවීරයා, **දුනැ**- දර්ශනය කොටැ, **දෙන ලෙස**- දානය කරන පරිද්දෙන්, **මිනැ**- චිත්තයෙහි, **බැඳැ**- බන්ධනය කොටැ, **ඇරැ ගෙනැ**- ග්‍රහණය කොටැ, **සුර රද**- සුරරාජයා ගේ, **මහරැ**- මහාර්ඝ වූ, **විජයොත් නම් පාය වන්**- වෛජයන්ත නම් ප්‍රාසාදය වැනි වූ, **රජ ගෙට**- රාජගෘහයට, **වැඩසරැ මිතුර**- අභිවෘද්ධිකර වූ මිත්‍රය, **එ මැ සැදැ**- එ විටැ මැ, **වඩන**- ගමන් කරන්නේ යැ

කෙළවර කොටැ දැනැ ගත නොහැක්කා වූ මේ වැඳීම් පින් නමැති තෑගි, ඒ දිව්‍යරාජයා දකා දෙන පරිද්දෙන් සිතෙහි බැඳැ තබා ගෙනැ, (ශක්‍ර) දිව්‍යරාජයා ගේ මාඇඟි වෛජයන්ත නම් ප්‍රාසාදය වැනි වූ (දෙව්) රජ ගෙට නොහොත් දෙවාලයයට, වැඩ සලසන්නා වූ මිත්‍රය, ඒ වේලාවෙහි මැ යන්නැ.

**විසඳුම්:-**

1 **පිරිසිදැ නො දන හැකි**- පිරිසිඳීම නොහොත් පරිච්ඡේද කිරීම නම්. "මේ මේ පමණ ය; මේ මෙ පමණ යැ" යනාදීන් සීමා කිරීම යි. එසේ සීමා කොටැ ගත නොහැකි නොහොත් අප්‍රමාණ වූ යනු මෙහි අභිමත අර්ථය යි.

2. **මිනැ බැඳැ**- සිත්හි රඳවා ගෙනැ.

3. **එ සුරවිරැ**- ඒ විභීෂණ නම් දෙවෝත්තමයා. මෙහි 'විරැ' (වීර) ශබ්දය උත්තමාර්ථ යි.

4 **සුර රද** පාය වන් **විජයොත්** නම් මහරැ- මෙ තන්හි 'සුර රද' නම් ශක්‍රයා යි සුරනට රජ නොහොත් අධිපති වන හෙයින් ඔහු ගේ එනම් වෙයි. ඔහු ගේ ප්‍රාසාදය වෛජයන්ත නම්.

5. **එ මැ සඳැ**- වැඳුම් කෙළවර වූ කෙණෙහි මැ.

6. **වඩන** - මේ විහිතක්‍රියා පදයෙක් නොවේ. 'වඩනේ' යනු මෙන් මෙද භාවකෘදන්ත නාමයෙකි. "වඩන මැනැවි" යි සම්පූර්ණ කොට ගත යුතු.

7 **රජ ගෙට** - මේ නම් දෙවාලය බව ප්‍රව්‍යක්ත යි. දෙවි රජකු ගේ ගෙය වූ බැවින් ඒ 'රජගේ' නම් වී ඇ යි හැගේ.

72. **පු ලා සුවඳ මල'වුල් කැරැ වරල් බැ ඳ**
**දු ලා රන් පතින් සරසා සවන් සො ඳ**
**නි ලා දිගු නුවන් රස'ඳුන් තනා ඇ ඳ**
**බ ලා සිටු රගන රග මඩලැ කල්බ ඳ**

පුලා සුවඳ මල් අවුල් කැරැ වරල් බැඳැ, දුලා රන් පතින් සොඳ සවන් සරසා, නිලා දිගු නුවන් රස අඳුන් තනා ඇඳැ, රග මඩලැ රගන කල්බද බලා සිටු.

**පුලා** - ඵුල්ල වූ හෙවත් පිපුණා වූ, **සුවඳ** - සුගන්ධවත් වූ, **මල්** - පුෂ්පයන්, **අවුල් කැරැ** - ආකුල කොටැ, **වරල්** - කෙශකලාපයන්, **බැඳැ** - බන්ධනය කොටැ, **දුලා** - දිළියෙන්නා වූ, **රන් පතින්** - සවර්ණ පත්‍රයෙන්, **සොඳ** - සුන්දර වූ, **සවන්** - කර්ණයන්, **සරසා** - අලඞ්කෘත කොටැ, **නිලා** - නිලවර්ණ වූ, **දිගු** - දීර්ඝ වූ, **නුවන්** - නෙත්‍රයන්හි, **රස අඳුන්** - රසාඤ්ජනයන්, **තනා** - අලඞ්කෘත කොටැ, **ඇඳැ** - අඤ්ජනය කොටැ, **රග මඩලැ** - රඞ්ග මණ්ඩල යෙහි, **රගන** - නෘත්‍ය කරන්නා වූ, **කල්බඳ** - සත්‍රීන්, **බලා සිටු** - අවලොකනය කෙරෙමින් සිටුව.

පිපුණු සුවඳ මල් අවුල් කොටැ කෙස් වැටි බැඳැ, දිළියෙන් නා වූ සවර්ණපත්‍රයෙන් යහපත් වූ කන් සරසා, නිල් දික් ඇස්හි රසාඤ්ජන මනා කොටැ ඇඳැ, නැටුම් බිම්හි නටන්නා වූ කාන්තා වන් බලමින් සිටුව.

**විපසර්:-**

1 **රන් පතින්** - 'රන් පත්' නම් පත්‍රයක් හෙවත් පෙත්තක් මෙන් සිටින සේ, රනින් කළ කර්ණාභරණය යි.

2 **නුවන්** - ආධාරාර්ථයෙහි දෙවන (කම්) විබත්.

3. **රසඳුන්** - 'රසාඤ්ජන' නම් ඇසෙහි ගානු ලබන අඳුන්.

4. **තනා ඇඳැ** - මෙහි 'තනා' යනුයෙන් ගැනෙන අර්ථ නම් "විචිත්‍ර හෙවත් විසිතුරු කොටැ" යනු යි.

5. **බලා සිටු** - 'බලා' යනු මිශ්‍රක්‍රියාර්ථයෙහි පූර්වක්‍රියා යි.

6. **කල්බඳ** - කල් = කල්‍ය, කාන්ත, ප්‍රියකර. බඳ = දෙහය, ශරීරය. කල් වූ බඳ ඇතියේ යම්ක් හට ද ඕ කල්බඳ. සාමාන්‍යයෙන් 'කල්බඳ' යනු 'කාන්තා' යන අර්ථයෙහි වැටේ.

**78.** **වි දෙ න ලෙලෙන නරැබර පුළුලු'කුලැ රැ - දී**
**හෙ ළ න න ග න අත භුවන'ග බැලුම දි දී**
**රැ වි න දි ලෙ න අබරණ කැලුම ගතැ සෙ දී**
**සැලෙන ප හ න සිළු වැනි රඟන ලිය සැ දී**

විදෙන ලෙලෙන නරැබර පුළුල් උකුලැ රැඳි, භුවන් අඟ බැලුම් දිදී අත හෙළන නගන, අබරණ කැලුම ගතැ සෙදී රූවින දිලෙන, සැදී රඟන ලිය සැලෙන පහන සිළු වැනි.

**විදෙන-** විහිදී යන්නා වූ ද, **ලෙලෙන-** ලීලෝපෙත වන්නා වූ ද, **නරැබර-** බර වූ නරැ පට, **පුළුල් උකුලැ-** පෘථුල වූ ජඝන යෙහි, **රැඳි-** රඤ්ජිත වූ, **භුවන් අඟ බැලුම්-** නයන ප්‍රාන්තදර්ශන යන්, **දිදී-** දෘනය කොටැ කොටැ, **අත** - හස්තය, **හෙළන-** අවක්ෂේ පණය කරන්නා වූ, **නගන** - උත්ක්ෂේපණය කරන්නා වූ, **අබරණ කැලුම-** ආභරණකාන්තිය, **ගතැ-** ශරීරයෙහි, **සෙදී-** යුක්ත වැ, **රූවින-** රූපයෙන්, **දිලෙන-** බබලන්නා වූ, **සැදී-** අලඞ්කෘත වැ, **රඟන-** නෘත්‍ය කරන්නා වූ, **ලිය** -කාන්තාවෝ, **සැලෙන-** චඤ්චල වන්නා වූ, **පහන සිළු වැනි-** ප්‍රදීපශිඛාවන් වැන්නෝ යැ.

අලඞ්කෘත වී නටන්නා වූ ස්ත්‍රීහු, චඤ්චල වන්නා වූ පහන් සිළු වැන්නෝ යැ කෙබඳු ස්ත්‍රීහු ද? විහිදී යන්නා වූ ද ලෙළ දෙන් නාවූ ද බර වූ නරැ පට, පළල් වූ උකුළෙහි රැඳුණා වූ ස්ත්‍රීහු. යළිත් කෙබඳු ස්ත්‍රීහු ද? ඇස් කොනින් බැලුම් දෙමින් හෙවත් බලමින්, අත පහත් කරන්නා වූ ද උස් කරන්නා වූ ද ස්ත්‍රීහු. යළිත් කෙබඳු ස්ත්‍රීහු ද? ආභරණකාන්තිය ශරීරයෙහි පැතිර, රූපයෙන් බබළන්නා වූ ස්ත්‍රීහු.

සියලු විශෙෂණයන් එක් කොටැ ගත් කලැ, භාවය මෙසේ වෙයි:-

විහිදෙන්නා වූ ද ලෙළදෙන්නා වූ ද බර නරැ පට උකුළෙහි රැඳුණා වූ, ඇස් කොනින් බලමින් අත පහළට දමන්නා වූ ඉහළට නගන්නා වූ, ආභරණ කාන්තිය ශරීරයෙහි පැතිරී රූපයෙන් බබළන්නා වූ, සැරැසී නටන්නා වූ ස්ත්‍රීහු චඤ්චල වන්නා වූ පහන් සිළු වැන්නෝ යැ.

**විසඳුම්:-**

1. **විදෙන-** කරකැවෙමින් නටන කලැ, ඉණ වටා වැටී සිටි නරැව විහිදී පැතිරී යන හෙයින් මෙසේ කී හ.

2. **නරැ බර-** දඹදිව වැසි ස්ත්‍රීහු නරැවක් නො දනිති. එ හෙයින් සංස්කෘතයෙහි එයට නමෙක් නැත පුරාණ සන්නකාරයෝ 'නරැබර' යන්නට 'නීවිභාර'යැ යි අරුත් බෙණෙති. නමුත් නීවිය නම් නරැව නො වේ. ඉණ වටා ඇඳි සළුයෙහි දෙකොන එක් කොටැ ඉදිරියෙහි කළ බන්ධනයෙකි. මෙ

බව පෙනී, මෑතෙක දී මේ සඳහා යෙදුණු 'අඤ්චලහාර' යනුයෙන් ද, අභිමතාර්ථය නො ලැබේ. 'අඤ්චල' නම් වස්ත්‍රයෙහි දශාව (වාටිය) යි.

3. **රැඳී-** මෙහි අන්ත්‍ය ස්වරය එළි වැට රැඳෙන පිණිස දීක් කැරිණ. 'රැඳි' යන කෘදන්තය 'ළිය' යන්නට විශේෂණ වේ.

4. **හෙළන නගන අත නුවන'ග බැළුම් දිදී-** පුරඟනන් ගේ නෘත්‍යයෙහි මේ ප්‍රධාන ලක්ෂණයෙකි.

'දිදී' යනු 'දී' යන පූර්වක්‍රියා නිපාතපදය ද්විත්වයට පැමිණි තැ.හි, මෙසේ වූ කල්හි පූර්වපදාන්ත වූ දීර්ඝ ස්වරය නිත්‍යයෙන් හ්‍රස්ව වෙයි. එ හෙයින් 'දිදී' යනු 'දිදී' යි වී 'බලබලා' යනු ද නිදර්ශන යි ද්විත්වයට පැමිණි පූර්වක්‍රියාව මිශ්‍ර ක්‍රියාර්ථය දෙන්නේ යැ.

5. **රුවින දිලෙන අබරණ කැලුම ගනෑ සෙදී-** ඒ ස්ත්‍රීහු රූමත්හු යැ. ආභරණ කාන්තිය ශරීරයෙහි යුක්ත වූ කල්හි තවත් පැතිරී ගිය කල්හි, රූපය විශේෂයෙන් දිලියෙයි.

"කැලුම ගනෑ සෙදී" යන්නෙහි වචනාර්ථ නම් "කාන්තිය ශරීරයෙහි යුක්ත වැ" යනු යි. කාන්තිය ශරීරයෙහි යුක්ත වීම නම්, ශරීරය පුරා පැතිරී යෑම යි

6. **සැලෙන පහන සිළු වැනි රඟන ළිය-** නටන්නා වූ ස්ත්‍රීහු ස්වර්ණවර්ණ වූ කෘශ වූ ශරීර ඇත්තාහු, සැලෙන්නා වූ ප්‍රභාසම්පන්න වූ සිඟිත් වූ ප්‍රදීප ශිඛා වැන්නෝ යැ

7. **සෑදී-** නාටිකාවනට හොබනා වූ වේශයෙන් සැරැසී.

**74. ලකල පුළුලු'කුළු බඳ මිණි මෙවු — ල්ලා**
**සමඟ රන් සලඹ රැවු දී වෙවු — ල්ලා**
**වයන පදට තබමින් පද කම — ල්ලා**
**රඟන ළඳුන් බල රූසිරි සිය — ල්ලා**

ලකල පුළුල් උකුළු බඳ මිණි මෙවුල්ලා සමඟ රන් සලඹ වෙවුල්ලා රැවු දී, වයන පදට පද කමල්ලා තබමින් රඟන ළඳුන්, සියල්ලා රූසිරි බල.

**ලකල-** අලංකෘත වූ, **පුළුල් උකුළු-** පෘථුල වූ ජඝන ප්‍රදේශයෙහි, **බඳ-** බඳනා ලද, **මිණි මෙවුල්ලා සමඟ-** මණිමෙඛලා දමය හා, **රන් සලඹ-** ස්වර්ණනූපුරය, **වෙවුල්ලා-** කම්පිත කරවා, **රැවු දී-** ශබ්ද පවත්වා, **වයන-** වාදනය කරනු ලබන්නා වූ, **පදට-** පදයට, **පද කමල්ලා-** පාදපද්මයන්, **තබමින්-** ස්ථාපනය කෙරෙමින්, **රඟන-** නෘත්‍ය කරන්නා වූ, **ළඳුන්-** ස්ත්‍රීන් ගේ, **සියල්ලා රූසිරි-** සකල රූපශ්‍රීය, **බල**- නරඹව.

අලංකෘත වූ පළල් වූ උකුළෙහි බඳනා ලද මැණික් මෙඛලා දමය සමඟ රන් සලඹ වෙවුල්වා නාද පවත්වා, ගසනු ලබන්නා වූ බෙර පදයට (අනුකූල වන ලෙස) පාද නමැති පද්මයන් තබමින් නටන්නා වූ ස්ත්‍රීන් ගේ සියලු රූප ශෝභාව බලව.

බෙර තාලයට පය තබමින් නැටීමෙහි දී ඉණෙහි බැඳි මෙඛලායෙන් ද පයෙහි ලූ නූපුරයෙන් ද හඬ නැගෙනු වෙයි. මෙයින් ඒ සත්‍රීන් නෘත්‍යයෙහි ඉතා දක්‍ෂ බව හැඟැවූ හ.

විසඳුම්:-

1. ලකල- "නැටුමට සැරසීමෙහි දී ඉණෙහි බැඳෙන දූයින් හෝ සිත් ඇද ගන්නා ස්වාභාවික අලඞ්කාරයෙන් හෝ, අලඞ්කෘත වූ" යනු අර්ථ යි.

2. මෙවුල්ලා, කමල්ලා, සියල්ලා- මෙහි ඇති 'මෙවල්' 'කමල්' සියල්' යනු ප්‍රකෘති ලෙස ගත හොත්, 'ල්'කාරය ද්විත්වයට පැමිණීම ව්‍යාකරණානුකූල නො වේ. ද්විත්වයට පැමිණෙනුයේ 'ඉ'කාරයෙකින් හෝ 'උ'කාරයෙකින් යුක්ත වූ ව්‍යඤ්ජනයෙකි ස්වරයක් පර වූ කල්හි 'ඉ'කාරය හෝ 'උ'කාරය පලමු කොට ලා ලොප් වේ. 'මෙවුල්' 'සියල්' යන දෙක 'මෙවුලු' 'සියලු' යි 'උ'කාරාන්ත ව ද සිටී. නමුත් 'කමල්' යනු 'කමලු' යි සිටින බවක් නො පෙනේ. එහි වැට රැකෙනු පිණිස වැඩි 'ල'කාරයෙක් යෙදිණැයි සිතිය හැකි.

3. සලඹ- (දෙමළ-'සිලම්බු') පයැ ලන ආභරණයෙකි. යන කල හඬ නගයි. දෙවාලයවලැ 'සලම්' නමින් දක්නට ලැබෙයි, දෙමළ ගැහැනු දූ කුදු මෙය පලඳිති.

4. වයන- 'වය'(වැයුම්හි) ධාතු යි. තූර්‍ය්‍ය භාණ්ඩයෙකින් නාද ඉපැදවීම 'වැයීම' නම් වේ.

75. වස් දඹු බිඟු කොවුල් වීණා නද මියු රැ
රැස් වූ සෙසින් සත් සර රස ගී සොඳු රැ
අස් වන ලියන් දුකැ ලිය කිඳුර'ගන'සු රැ
තොස් කර න සිත සවනත නුවනත මිතු රැ

වස්දඹු බිඟු කොවුල් වීණා මියුරු නද රැස් වූ සෙයින්, සොඳුරු සත් සර රස ගී අස්වන, ලිය කිඳුරු අඟන අසුරු ලියන් දුකැ, මිතුරු න සිත සවනත නුවනත තොස් කර.

වස්දඹු- වස් කුලල් යැ, බිඟු- භෘඞ්ග යැ, කොවුල්- කොකිල යැ, වීණා- වීණා යැ, යන මොවුන් ගේ, මියුරු නද- මධුර වූ නාදයන්, රැස් වූ සෙයින්- රැශිභූත වූවාක් මෙන්, සොඳුරු- සුන්දර වූ, සත් සර රස- සප්තස්වර රසයෙන් යුක්ත වූ, ගී- ගීතිකාවන්, අස්වන- ශ්‍රවණය කරවන්නා වූ, ලිය කිඳුරු අඟන අසුරු- ලිය කිඳුරු අඞ්ගනාවන් හා සමාන වූ, ලියන්- සත්‍රීන්, දුකැ- දර්‍ශනය කොට, මිතුරු- මිත්‍රය, න- නා ගේ, සිත- චිත්තය ද, සවනත- ශ්‍රවණය ද, නුවනත- නයනය ද, තොස් කර- සන්තොෂ කරව.

වස් දඹු නම් නලා යැ, මී මැසි යැ, කොවුල් යැ, වීණා යැ යන මොවුන් ගේ මධුර නාදය රැස් වුණාක් මෙන් මනහර (සුන්දර) වූ සප්තස්වර රසයෙන් යුත් ගීතිකාවන් අස්වන්නා වූ, ලිය කිඳුරු

අඞ්ගනාවන් වැනි සළුන් දූතා, මිත්‍රය, තා ගේ සිත ද කන ද ඇස ද සතුටු කරව.

ඒ සළුන් අතිමධුර වූ ස්වරයෙන් ගී කියන බව මෙහි පූර්වාර්ධයෙන් හැඟැවූ හ. ඔවුන් ගේ මුඛයෙන් නිකුත් වන ගීතස්වරය, වස් දඬු බිඟු කොවුල් වීණා නද රැස් වූණක් මෙන් මධුර යැ; සප්තස්වර රසයෙන් යුක්ත යැ.

ටිප්පණී:-

1. **වස්දඬු**- (වංශ= බට.) මෙහි වචනාර්ථ නම් 'බට දඬු' යනු යි. මේ නළා වර්ගයකට නමි.

2. **සත් සර**- සඞ්ගීත ශාස්ත්‍රයෙහි-

"ෂඩ්ජර්ෂභගාන්ධාරා මධ්‍යමඃ පඤ්චමස්තථා
ධෛවතශ්ච නිෂාදශ්ච ස්වරාඃ සප්තප්‍රකීර්තිතාඃ"

යනුයෙන් දක්වුණු (1) ෂඩ්ජ (2) ඍෂභ (3) ගාන්ධාර (4) මධ්‍යම (5) පඤ්චම (6) ධෛවත (7) නිෂාද යන ස්වර සත යි. මේ නාමයන් ගේ මුල් අකුරු ගෙනැ "ස- රි- ග- ම- ප- ධ- නි-" යි කියත්. සකල සඞ්ගීතයෙහි පැතිරැ සිටියේ මේ ස්වර යි.

3. **අස්වනා**- අසන්නට සලස්සනා. 'කියනා' යනු අර්ථ යි.

4. **ලිය කිඳුර'ඟන'ඟුරු**- මෙහි 'ලිය කිඳුරු' යනු විමැසියැ යුත් තැනි.

'කින්නර' ශබ්දයෙක් සකු මගද දෙබස්හි ඇති. එයින් සිංහලයට ආ 'කිනුරු' යනු මැතෙකැ දී 'කිඳුරු' යි වි යැ. 'කින්නර' යනු ද 'කිං+නර' යනුයෙන් ආයේ යැ 'කුත්සිත මනුෂ්‍ය' යනු 'කිංනර' යන්නෙහි අර්ථ යි. කින්නරයෝ නම් දිව්‍යගායකයෝ යැ, ඔහු ගායනයෙහි අති දක්‍ෂය හ; අතිශයින් මධුර වූ ස්වර ඇතියෙ හ, අශ්වමුඛ හා මනුෂ්‍යදෙහ හෝ මනුෂ්‍යමුඛ හා අශ්වදෙහ හෝ ඇත්තෝ යැ. මෙසේ කුත්සිත මනුෂ්‍ය ස්වරූප ඇති වන බැවින් 'කින්නර' නම් වෙති. මධුරස්වර ඇති වන බැවින් නාටිකාවනට කින්නරාඞ්ගනාවෝ උපමිතයෝ යැ.

(දු සමන් ආදි) වැල් යැ, කාන්තා යැ, (සංගීතයෙහි) ලය යැ යනාදි අර්ථයන්හි 'ලිය' ශබ්දය වැටේ. 'ලිය කිඳුරු' යන තන්හි 'ලිය' යනු මෙයින් කවර අර්ථයෙකැ වැටේ ද?

කාව්‍යශේඛරයෙහි—

"ලිය ගී දනු මදුරන ලිය කිඳුරන"

යන තන්හි වූ 'ලිය කිඳුරන' යන්නට ව්‍යාඛ්‍යාන කාරයෝ "කින්නරාඞ්ගනාවන්"යි අරුත් බෙණෙති. 'ලිය කිඳුරඟනා' යන තන්හි මෙන් 'අඟනා' ශබ්දය මැත්තක් පර වැ නොයෙදුණත්, එ තන්හි මෙසේ අරුත් බැණැ පිරිමසා ගත හැකි වන නමුත්, මෙ තන්හි නම් එබන්දකට ඉඩ නැති. එ හෙයින් 'ලිය කිඳුරු අඟන අසුරු' යන්නට "ලිය කිඳුරු අඟනන් බඳු" යි අරුත් පවසා එපමණෙකින් සෑහැසෙන්,

නෘත්‍යගීතවාද්‍යයන් ගේ එකතානස්වරූප වූ සම්භාවයට සංස්කෘතයෙහි 'ලය' යනු නමි. මෙ ද සිංහලයෙහි "ලිය ගී" යනා තන්හි මෙන් 'ලිය' යි සිටී. කින්නරයන් එබඳු වූ ලයාන්විත ගායනයෙහි දක්‍ෂ වන බැවින් "ඔවුනට 'ලිය කිඳුරු' යි නමෙක් වී ද?" යනු පිරික් සියැ යුත්තේ යැ. සංස්කෘතයෙහි නම් ලයකින්නර' යන්නෙක් නො ලැබේ.

5 **තොස් කර න සිත සවනත නුවනත**- නෘත්‍ය දර්ශනයෙන් ඇස ද, ගීත ශ්‍රවණයෙන් කන ද පිනා යෙයි. මෙසේ ඉන්ද්‍රියද්වයයක් පිනා යැමෙන් සිත තොස් වේ.

'සවනත' 'නුවනත' යන දෙ තන්හි අගැ 'අත්' යනු විශෙෂාර්ථයක් නො දෙන්නේ යැ.

**76.** **මෙ සේ පැවැති අනතුරැ ගී රැඟුම් පු ද**
**තො සේ සිතින් වැඩැ සිටි සුර විමන් මැ ද**
**ය සේ පතල දිය තුලැ උතුල මන න ඳ**
**ඇ සේ පුරා දකු විබිසණ සුරිඳු ස ඳ**

මෙසේ පැවැති ගී රැඟුම් පුද අනතුරැ, තොසේ සිතින්, සුර විමන් මැදැ වැඩැ සිටි මනනඳ යසේ දිය තුළැ පතළ උතුල විබිසණ සුරිඳු සඳ, ඇසේ පුරා, දකු.

**මෙසේ**- මේ ආකාරයෙන්, **පැවැති**- ප්‍රවෘත්ත වූ, **ගී රැඟුම් පුද අනතුරැ**- ගීතනෘත්‍ය පූජාවට අනතර වැ, **තොසේ සිතින්**- සන්තොෂ චිත්තයෙන් යුක්ත වැ, **සුර විමන් මැදැ**- දෙව විමාන මධ්‍යයෙහි, **වැඩැ සිටි**-වැඩැ සිටියා වූ, **මනනඳ**-මනොනන්දන වූ, **යසේ**- කීර්තිය, **දිය තුළැ**- ජගදභ්‍යන්තරයෙහි, **පතල**- ව්‍යාප්ත වූ හෙවත් පැතිරැ ගියාවූ ද, **උතුල**- ඉතිරී ගියා වූ ද, **විබිසණ සුරිඳු සඳ**- විභීෂණ සුරෙන්ද්‍රචන්ද්‍රයා, **ඇසේ පුරා**- නෙත්‍ර පූරණය කොටැ, **දකු**- දර්ශනය කරව.

මෙසේ පැවැත්තා වූ ගී නැටුම් පූජාවට ඉක්බිති වැ මැ, සතුටු සිතින්, විභීෂණ දිව්‍යරාජෝත්තමයා ඇස් පුරා දකුව. කෙබඳු වූ විභීෂණ දිව්‍ය රාජෝත්තමයා ද? සිත් සතුටු කරන්නා වූ කීර්තිය ලොකය ඇතුළෙහි පැතුරුණා වූ ද, එසේ පැතිරැ ලොකයෙහි ඉඩ නැති වූ හෙයින් පිටතට [ඉතිරී ගියා වූ ද, විභීෂණ දිව්‍ය රාජෝත්තමයා. යළිත් කෙබඳු විභීෂණ දිව්‍ය රාජෝත්තමයා ද? දිව්‍ය විමාන මධ්‍යයෙහි (දෙවොල මැදැ) වැඩැ සිටියා වූ, විභීෂණ දිව්‍ය රාජෝත්තමයා.

මෙසේ පැවැත්තා වූ ගී නැටුම් පූජාවට ඉක්බිති වැ මැ, සතුටු සිතින්, දෙවාලය මැද්දෙහි වැඩැ සිටියා වූ, සිත් සතුටු කරන්නා වූ කීර්තිය ලොකය ඇතුළෙහි පැතුරුණා වූ (පිටතට ද) ඉතිරී ගියා වූ, විභීෂණ දිව්‍යරාජෝත්තමයා ඇස් පුරා දකුව.

ටිප්පණි:-

1. **තොපසේ, යසේ, ඇසේ–** 'තොප්' 'යස' 'ඇස්' යනු එළි වැට රැකෙන පිණිස, 'ඒ'කාරයෙන් යුක්ත කළ තැනි.

2. **යසස් පතල දිය තුලැ උතුල මනනඳ–** 'පතල' යනු 'පතුරු' (පතුරුම්හි) ධාතුයෙන් වූ අතීතකෘදන්ත පද යි. 'සුරිඳු සඳ' යන්නට විශෙෂණ යි.

'උතුල' යනු 'උතුරු' (ඉතුරුම්හි) ධාතුයෙන් වූ අතීතකෘදන්ත පද යි' එ ද 'සුරිඳු සඳ' යන්නට විශෙෂණ වේ.

"යස පතල උතුල සුරිඳු සඳ' යන හත්හි පද සිංහල ව්‍යාකරණානුකූල ලෙස මනා පිළිවෙළින් සිටියේ යැ. අප ව්‍යාඛ්‍යාන කාරයෝ වනාහි, මෑත භාෂාරීතිය බලා, "පතල උතුල යස ඇති" යි 'ඇති' යන්නක් අතින් දමා අරුත් බෙණෙති. ව්‍යවහාරයෙහි ද "දත් වැටුණු මිනිසා" යනු වැන්නක් මුත්, "වැටුණු දත් මිනිසා" යනු වැන්නක් නො ලැබෙන හෙයින් එහි ලා සිංහල භාෂාරීතිය මැ මැනැවි.

3. **විබිසණ සුමිඳු සඳ–** සතුරන් විශෙෂයෙන් භය ගන්වනුයෙන් හේ විභීෂණ නම් වී.

පුලස්ත්‍ය නම් ඍෂීහු ගේ විශ්‍රවස් නම් පුත්‍රයෙක් වී ඔහුට කෛකෂා නම් රාක්ෂසිය ගෙන් උපන් රාවණ, කුම්භකර්ණ, විභීෂණ යන පුත්‍රයෝ තිදෙනෙක් ද, ශූර්පනඛා නම් දුවක් ද වූ හ. පියා බමුණකු වුව ද, මව රාක්ෂසියක වූයෙන් මොහු හැම "රාක්ෂසයහ" යි දන්නා ලද හ.

රාවණ රජ, රාම කුමාරයා ගේ භාර්‍යා වූ සීතා කුමරිය පැහැරැ ගෙනැ ගිය කලැ, විභීෂණ නොසතුටු වැ, "කුමරිය යළිත් ඇය ගේ සැමියාට මැ දෙව" යි දෙටු බෑයාට අවවාද කෙළේ යැ. ගර්විත වූ රකුසු රජ එ බස් නෑසී යැ. කිහිප විටක් මැ මෙසේ කිව ද, රාවණ රජ එය නොසැලැකූයෙන්, විභීෂණ සොහොයුරා පියා, රාම කුමරු වෙතැ ගොස්, ඔහු ගේ ඉෂ්ටමිත්‍ර වී යැ. රාවණ සංහාරයෙන් පසු රාම කුමර විභීෂණයාට ලඞ්කාරාජ්‍යය දින. රාක්ෂසයනට විපක්ෂ වැ දෙවියනට පක්ෂ වැ සිටි හෙයින්, එ තැන් පටන් විභීෂණ දෙවි කෙනකු මෙන් සැලැකෙන්නට වන.

විභීෂණ චිරජීව (කෙවත් මරණයට නොපැමිණෙති යියන) සත් දෙනා කෙරෙහි ඇතුලත් වන්නෙකි, ඒ සත් දෙනා නම්—

"අශ්වත්ථාමා බලිර්ව්‍යාසො හනූමාංශ්ච විභීෂණඃ
කෘපඃ පරශුරාමශ්ච සප්තෛතෙ චිරජීවිනඃ"

යනුයෙන් දැක්වුණ හ.

**77. පැ මි ණ සිටි අඳුන් ගිරි කුළු මුදුන වෙ න**
**රෙ හෙ ණ නැකැතැ ගැල සරි විලසින් දිමු න**
**ස ර ණ මුළු ලොවට එ සුරිඳු සිරසැ ප න**
**ඛ ල ණ කිරුළ දිසි මුතු ලැල් රුවන් සු න**

අඳුන් ගිරි කුළු මුඳුන වෙනැ පැමිණැ සිටි රෙහෙණ නැකැතැ ගැල සරි විලසින් දිමුන, මුළු ලොවට සරණ එ සුරිඳු සිරසැ පන, මුතු ලැල් රුවන් සුනා ඛලණ කිරුළ දිසි.

**අඳුන් ගිරි කුළු මුදුන වෙතැ**- අඤ්ජන පර්වත කූට මස්ත සක්හු ගේ සමීපයෙහි, **පැමිණැ සිටි**- ප්‍රාප්ත වැ සිටියා වූ, **රෙහෙණ නැකැතැ**- රෝහිණී නක්ෂත්‍රය සම්බන්ධී වූ, **ගැල සරි**- ශකටය හා සමාන වූ, **විලසින්**- විලාසයෙන්, **දිමුත**- දීප්තිමත් වූ, **මුළු ලොවට**- සමස්ත ලෝකයට, **සරණ**- පිහිට වූ, **එ සුරිඳු**- ඒ සුරේන්ද්‍රයා ගේ, **සිරසැ පත**-ශීර්ෂප්‍රාප්ත වූ, **මුතු ලැල් රුවන් යුත**- මුක්තාලතිකාවෙන් හා රත්නයෙන් යුක්ත වූ, **කලණ කිරුළ**- කල්‍යාණ කිරීට තෙම, **දිසි**- දෘශ්‍ය වෙයි.

සකල ලෝකයට පිහිට වූ ඒ දිව්‍යරාජයා ගේ හිසට පැමිණියා වූ, මුතුවැලින් හා රත්නයන් ගෙන් යුක්ත වූ රන් වොටුන්න පෙනෙන්නේ වෙයි කෙබඳු රන් වොටුන්න ද? අඤ්ජන පර්වත කූට මස්තකයෙකැ සමීපයට පැමිණැ සිටියා වූ රෙහෙණ නැකැතෙහි ගැලට හා සමාන රූපාකාරයෙන් බබලන්නා වූ, (සකල ලෝකයට පිහිට වන ඒ දිව්‍යරාජයා ගේ හිසට පැමිණියා වූ, මුතු වැලින් හා රත්නයන් ගෙන් යුක්ත වූ,) රන් වොටුන්න පෙනෙන්නේ වෙයි.

මුතු වැලින් හා රුවනින් යුත් කිරුළ, රෙහෙණ නැකැතෙහි ගැල හා සමාන යැ. කිරුළ පිහිටියේ කාලවර්ණ වූ මේ සුරේන්ද්‍රයා ගේ හිස මතුයෙහි යැ. එ හෙයින් එය අඤ්ජන පර්වතකූටයෙකැ මුදුනට පැමිණියා වූ රෙහෙණ නැකැතෙහි ගැල වැන්නැ. දෙව් රජ අඤ්ජන පර්වතය බඳු වෙයි. හිස අඤ්ජන පර්වතයා ගේ කූටය වැනි වේ. හිස් මුදුන පර්වත කූටයා ගේ මුදුන හා සමාන යැ. හිස් මුදුනෙහි වූ කිරුළ කූට මස්තකයෙහි වූ රෙහෙණ නැකැතැ ගැල සරි වේ.

දෙව් රජ කෘෂ්ණවර්ණ යැ. අඤ්ජන පර්වතය නීලවර්ණ වේ. කවි සමයයෙහි නීලකෘෂ්ණවර්ණයෝ නොවෙනස් හ.

**ටිප්පණි:-**

1. **රෙහෙණ නැකැතැ ගැල**- සත් විසි නැකැතින් සිවුවැන්න 'රෝහිණී' නම්. මේ, තාරකා පසෙකින් යුක්ත යැ. මේ තරු පස අතරැ ඉරි ඇඳුණ හොත්, ගැලකට සමාන වූ රූපයෙක් වෙයි. ඒ යැ මෙහි ගැනුණේ. ඒ ගැල් රුව වොටුන්නට ද සමාන බව මේ පද්‍යයෙන් පෙනේ.

2. **සිරසැ පත**- සිරසෙහි හෙවත් හිසෙහි පත් වූ (පැමිණියා වූ) "සිසෙහි පැලැඳි" යනු භාව යි.

3. **කලණ කිරුළ** - මෙහි 'කලණ' යනු සවර්ණාර්ථයෙහි වේ. සංස්කෘතයෙහි ද 'කල්‍යාණ' ශබ්දය සවර්ණාර්ථයෙහි යෙදේ.

"කල්‍යාණං හෙම්නි මඞ්ගලෙ"

යනු නිඝණ්ටු වචන යි. "'කල්‍යාණ' ශබ්දය 'සවර්ණ' 'මඞ්ගල' යන අර්ථ දෙක්හි වෙයි" යනු එහි අර්ථ යි.

78\. සු නි ලේ පැහැය හැරැ සුදු වනු යැ ඝන වෙ ලේ
වි දු ලේ එයින් වියොවට පැමිණැ වියවු ලේ
නි ස ලේ එ මෙ සිරි ගත් සුරිඳු හැම ක ලේ
උ දු ලේ දෙහෝ රන් පට මෙන් නලල් තෙ ලේ

ඝන වෙලේ සුනිලේ පැහැය හැරැ සුදු වනු යැ. එයින් විදුලේ වියොවට පැමිණැ වියවුලේ, නිසලේ එ මෙ සිරි ගත් සුරිඳු නලල් තෙලේ රන් පට මෙන් හැම කලේ උදුලේ දෙ හෝ!

**ඝන වෙලේ**- සාන්ද්‍ර වූ හෙවත් ඝන වූ වලාහකය, **සුනිලේ**- අතිනීල වූ, **පැහැය**- ප්‍රභාව, **හැරැ**- පියා (දුරු කොට), **සුදු වනු යැ**- ශුභ්‍රවර්ණවත් වන්නේ යැ **එයින්**- ඒ හෙතුයෙන්, **විදුලේ**- විද්‍යුල්ලේඛාව, **වියොවට පැමිණැ**-වියොගයට ප්‍රාප්ත වැ, **වියවුලේ**- ව්‍යාකුලත්වයෙන්, **නිසලේ**- නිශ්චල වැ, **එ මෙ සිරි ගත්**- ඒ මෙඝයා ගේ ශ්‍රීය ග්‍රහණය කළා වූ **සුරිඳු**-සුරෙන්ද්‍රයා ගේ, **නලල් තෙලේ**- ලලාටස්ථලයෙහි, **රන් පට මෙන්**- ස්වර්ණ පට්ටාකාරයෙන්, **හැම කලේ**- සියලු කල්හි, **උදුලේ දෙහෝ**- උජ්ජ්වලිත වූයේ දෙහෝ!

වැසි වලාව ඉතා නිල් පැහැය හැර සුදු වන්නේ යැ. එයින් විදු ලිය වෙන් වීමට පැමිණැ, ව්‍යාකුලත්වය හෙතු කොටැ ගෙනැ, වෙනස් නොවන්නා වූ ඒ වැසි වලාවෙහි ආකාරය ගත්තා වූ (මේ) දිව්‍ය රාජයා ගේ නලල් තලයෙහි රන් පටෙහි ආකාරයෙන් සියලු කාලයෙහි බැබැළුණේ වත් ද?

විශේෂණ දිව්‍ය රාජයා ඉතා කළු යැ. කවිසමයයෙහි ආ පරිදි නම් ඉතා නිල් යැ. එහෙයින් වැසි වලා කුළක් වැන්නැ. මේ නිල් වූ දිව්‍යරාජයා ගේ නලල් තෙලෙහි බඳනා ලද රන් (නලල්) පට කෙබඳු ද? නොවෙනස් වන වලා කුළෙකැ හැම කල්හි බබළන්නා වූ විදු ලියක් වැනි වේ. කවිහු "මේ විදු ලියක් වැන්නැ"යි නො කියා, "මේ විදු ලිය වත් දෙහෝ"යි සැක කෙරෙති ඒ විදු ලිය මැ නම් වැසි වලා කුළු හැරැ මෙ තැනට පැමිණීමට හෙතු කිම?

වැසි වලා කුළ නම් විදු ලිය නමැති කාන්තාව ගේ වල්ලභයා යැ. විදු ලිය නමැති කාන්තාව ස්වකීය වල්ලභයා හැඳිනැ ගනුයේ නිල් පැහැයෙනි. නමුත් වල්ලභ තෙම නිරතුරු නිල් පැහැ ඇත්තේ නො වේ. සුදු ද වෙයි. සුදු වූ කල්හි වල්ලභ වූ මෙඝය හැඳිනැ ගත නොහැකි වැ, විදු ලිය වියොගයට හෙවත් ස්වාමියාගෙන් වෙන් වීමට පැමිණේ. මෙසේ වෙන් වැ, ඒ දුක් වියවුලෙහි සිටැ වල්ලභයා සොයන්නා වූ විදු ලිය නමැති ලියට, කිසි සේත් වෙනස් නොවන්නා වූ නිල් පැහැ ඇති මේ දිව්‍ය රාජයා පෙනේ. එ කලැ ඕ තොමෝ ඔහු වෙතැ පැමිණැ, ඔහු ගේ ශරීරවර්ණය

වෙනස් නොවීම හේතු කොටැ ගෙනැ අතිශයින් සතුටු වැ, තමා ගේ ක්‍ෂණික සවභාවය (මොහොතක් පෙනී නැති වැ යන සවභාවය) හැර දමා, ඔහු ගේ නලල් පට මෙන් හැම කල්හි බබලන්නී ද? මෙසේ ප්‍රශ්න කිරීමෙන් "බබලන්නී මැ යැ" යි නො කියා, "බබලන්නියක වැන්නැ" යනු හැඟැවූ හු.
මේ පද්‍යය බැඳුමෙහි දී—

"නිල් උපුලේ පැහැ සර හුණු නලල් තෙලේ
රුදි නිමලේ රන් පට නදන ඇම කලේ
උදු සුනිලේ දුල පැහැසෙරෙන'වල වෙලේ
කිව විදුලේ කිම දිලියෙනු ද ඇම කලේ

යන මයුරසන්දේශ පද්‍යය ඉවහල් වූ සේ පෙනේ.

විපසණ්:—

1. **සුනිලේ**– 'සුනිල්' යනු එළි පිණිස 'ඒ'කාර යුක්ත කැරිණ.

2. **ඝන වෙලේ**– 'ඝන' යනු මේ තන්හි මේඝකාලයට නම්. ඝන කල්හි වූ වලා ඝන වලා යි. 'වළා' යනු මැ 'වල' යි හ්‍රස්වාන්ත වූ පසු, 'ඒ' විබත් එක් වැ 'වල+ඒ'යි සිටි තන්හි, පූර්වස්වරලෝපය හා ස්වරපරරූපය වීමෙන් 'වෙලේ' යනු වෙයි.

3. **විදු ලේ**– 'විදු' නම් විද්‍යුත යි (විදු ලිය යි). 'ලේ' යනු 'ලෙඛා' හෙවත් 'රේඛා' යන අර්ථ ඇත්තේ යැ. විදු ලිය ඉරක් හෝ පටියක් මෙන් වැටෙන හෙයින්, 'විද්‍යුල්ලෙඛා' යි කියත්.

4 **වියවුලේ**– වියවුලෙහි. මෙහි 'වියවුල' නම් වලාහ වූ වැසි වලා කුළු සොයා ගන්නට බැරි වීමෙන් ඇති වන ශෝකව්‍යාකුලත්වය යි. "ඒ ව්‍යාකුලත්වයෙහි සිටැ, හෙවත් ඒ ව්‍යාකුලත්වය හේතු කොටැ ගෙනැ" යනු ගත යුතු අර්ථය යි.

5. **නිසලේ**– මෙයින් දිව්‍ය රාජයා නිශ්චල බව හෙවත් චඤ්චලපක්ෂ සඞ්කට නො පැමිණෙන බව හැඟැවෙයි. 'නිසල' යනු එළි පිණිස 'නිසලේ'යි ළිවි

6. **එ මෙ සිරි ගත්**– ඒ මේඝයා ගේ හෙවත් වැසි වලා කුළෙහි ආකාරය ගත්තා වූ; ඒ වැසි වලා කුළ වැනි වූ. "මේ මාගේ වියෝග වූ වලාහ යා යැ" යි විදු ලිය නමැති ලිය සිතූ බව, මෙයින් හැඟැවෙයි.

7. **සුරිඳු හැම කලේ**– 'හැම කලේ' යනුයෙන්, ස්වාභාවික විදු ලිය, මේ දිව්‍යරාජයා වෙතට පැමිණි පසු ඇති වූ වෙනස දක්විණ. ස්වාභාවික විදු ලිය නම් ක්‍ෂණික යැ, හෙවත් ස්ථෙණ්කිත් නැති වැ යන්නේ යැ. නමුත් මේ සුරිඳු වෙතට පැමිණ, ඒ සර්වකාලික වී යැ. එයට හේතුවෙකුදු ඇති. පෙර වලාහයා 'සුනිලේ පැහැය හැර සුදු වනු යැ.' දැන් එසේ නො වේ; නිසල යැ, හෙවත් නිරතුරු නිල් පැහැ ඇත්තේ යැ. එ හෙයින් විදු ලියට ද, තමාගේ ස්වාභාවික චපල ගතිය හැර, නිසල වීම හෙවත් සර්වකාලික වීම යුක්ත මැ නු?

'සුරිඳුහැම කලේ' යි එක් පොතෙක පෙනේ. අන් සියලු තන්හි 'සුරිඳු' යි එක බසැ මැ යෙදුණෙන් ද, 'හැම කලේ' යනු නිරර්ථ වන හෙයින් ද, ඒ සුපාඨය නොවියැ හැකි.

'හැම කලේ' යන්නට 'සදකාලයෙහි' යි පුරාතන ව්‍යාඛ්‍යානයෙහි අරුත් පැවැසිණ. "සර්වස්මින් කාලෙ ඉති සදා" යනුයෙන් "සියලු කල්හි යන අර්ථයෙහි සද යනු වෙතැ" යි කියන ලද හෙයින්, 'සද' යන්නට යළින් 'කාල' යන්නක් එක් කොටැ ගැනීම මහාදෝෂයෙකි.

8. **උදුලේ දෙහෝ**– උදුලේ ද හෝ. 'ද' යන්නෙහි ස්වරය පරරූප සට යැමෙන් 'ද්+හෝ' යනු සන්ධි වැ, 'දෙහෝ' යි වී.

**79.** **රැ වි නේ  උතුම් එ සුරිඳු මිණි ඊලැ මෙ  නේ**
**ස ව නේ  රැඳුණු ර'සුදුල තෝඩු ගන ර  නේ**
**වු ව නේ  වැජැඹි සිරි සරසවිය හැම දි  නේ**
**සොබනේ  කනා කැම පත් සුවල විලසි  නේ**

රුවිනේ උතුම් එ සුරිඳු මිණි ඊලැ මෙනේ සවනේ රැඳුණු රස් උදුල ගන රනේ තෝඩු, වුවනේ හැම දිනේ වැජැඹි සිරි සරසවිය කනා කැට පත් සුවල විලසිනේ සොබනේ,

**රැවිනේ**– රූපයෙන්, **උතුම්**– උත්තම වූ, **එ සුරිඳු**- ඒ සුරෙන්ද්‍රයා ගේ, **සවනේ** කර්ණයෙහි, **මිණි ඊලැ මෙනේ**–මාණික්‍ය හිංදෙලයෙහි මෙන්, **රැඳුණු**- රඤ්ජිත වූ, **රස් උදුල**- රශ්මියෙන් උජ්ජ්වලිත වූ, **ගන රනේ**–ඝනසවර්ණමය වූ, **තෝඩු**–තාඩඞ්කයෝ, **වුවනේ**- මුඛයෙහි, **හැම දිනේ**- සියලු කාලයෙහි, **වැජැඹි**- විජෘම්භිත වූ, **සිරි සරසවිය**- ශ්‍රීසරස්වතිය ගේ, **කනා කැම පත් සුවල**- සවර්ණ දක්ෂිණ යුගම්යෙහි (රන් කැටපත් දෙකෙහි), **විලසිනේ**- විලාසයෙන්, **සොබනේ**- ශොභමාන වන්නේ යැ.

රූපයෙන් උතුම් වූ, ඒ දිව්‍යරාජයා ගේ කනෙහි, මැණික් ඔබිල්ලෙහි මෙන් රැඳුණා වූ, රශ්මියෙන් දිලිසෙන්නා වූ, ඝනරන් තෝඩු (දෙක), මුඛයෙහි සියලු කල්හි වසන්නා වූ, ශ්‍රීසරස්වතිය ගේ රන් කැට පත් දෙකෙහි ආකාරයෙන්, බබළන්නේ යැ.

ඒ දිව්‍ය රාජයා ගේ කන් වැල් දෙක, හිංදෑල (උන්සිල්ලා) දෙකක් වැන්නැ; තෝඩු දෙක, මුඛයෙහි ඉන්නා උතුම් සරස්වතිය ගේ රන් කැට පත් දෙක වැන්නැ.

**විසඳුම්:-**

1 **මිණි ඊලැ මෙනේ**– කළු වූ මේ දිව්‍යරාජයා ගේ කන් වැල් ද කළු වන හෙයින්, මෙහි 'මිණි' යනුයෙන් ගැනෙනුයේ ඉන්ද්‍රනීලමාණික්‍ය යි. පුරාතනයන් ගේ කන් පළා එල්ලෙන සේ කැරෙන බැවින්, හිංදෙල උපමාව ගැළපෙයි.

මේ පාඨය "මිණි ඊල මෙතේ" යි ගෙනැ, පුරාණ සන්නයෙහි "මාණික්‍ය ඇලෑවක් වැනි වූ" යි අරුත් බණන ලද. නමුත් 'ඊල' යනු 'එක බසැ මැ වෙයි. බුහුබසැ 'ඊල්' යි සිටී.

2. **මුවමෙන් වැජැඹි සිරිසරසවිය**- සරසවතී නම් බ්‍රහ්මයා ගේ භාර්යාව යැ. වචනයට ද ශාස්ත්‍රඥානයට ද අධිපති වෙයි. ඕ බ්‍රහ්මයා ගේ මුඛයෙහි වසන්නී යැ. එ හෙයින් කවීන් යමක්හු ගේ වාක්චාතුර්ය්‍ය ද ශාස්ත්‍රඥානය ද වැඩියවි වූ කලැ, "ඔහු ගේ මුඛයෙහි සරසවතිය වෙසෙසි" යි යෙති. 'සිරිසරසවිය' යි 'සිරි' යනු මුලින් යෙදුණේ සරසවතියට ගෞරව පිණිස යැ. මෙසේ ගෞරව පිණිස කවර නාමයකට පූර්ව කොටැ 'ශ්‍රී' යන්න යෙදියැ යුතු ද යනු—

"දෙවං ගුරුං ගුරුස්ථානං ක්ෂේත්‍රං ක්ෂෙත්‍රාධිදෙවතාම්
සිද්ධං සිද්ධාධිකාරාංශ්ච ශ්‍රීපූර්වං සමුදීරයෙත්"

යනුයෙන් දක්විණ. "දෙව යැ, ගුරු යැ, ගුරුස්ථාන යැ, ක්ෂෙත්‍ර යැ, ක්ෂෙත්‍රාධිෂ්ඨිත දෙවතා යැ, සිද්ධ යැ, සිද්ධාධිකාර යැ යන මොවුන් ශ්‍රීපූර්ව කොටැ කියන්නේ යැ" යනු අර්ථ යි.

පුරාණ සන්නයෙහි වනාහි 'සිරිසරසවිය' යන්නට "ශ්‍රී සරසවතී දෙවතා ගේ" යි අරුත් පැවැසිණ. ශ්‍රී හෙවත් ලක්ෂ්මිය වසනුයේ විෂ්ණුහු ගේ වක්ෂස්හි යැ. කැටුහු, යම්කිසිවක්හු ගේ වක්ෂස්හි සිරි වසන බව කීමෙන් ඔහු ගේ ශ්‍රීමද්භාවය හඟවති. මෙහි මැ— "පියුම්ඹා නිතොර වැ රැඳි උර මැඬුර" යනුයෙන් ඒ සදුට වෙයි. එ හෙයින් "සිරි මුවනැ වෙසෙති" යි කිව, ඒ කවි සමයට විරුද්ධ වෙයි.

3. **සොබනෝ**- සිදත් සඟරාහෙහි දක්වුණු අනාගත කාලිකාඛ්‍යාත ප්‍රත්‍යය මෙහි පෙනේ. නමුත්, මේ සුරිඳු ගේ තෝඩු කතා කැට මෙත් සොහමාන වනුයේ සැබැවින් මැ අනාගතයෙහි ද? නැත හොත් 'සොබනෝ' යනු වර්ත්මාන කෘදන්ත පදයෙක් ද?

'දිසි' 'උදුළේ' යි අතීතාර්ථය දෙන පද පසු වූ දෙ තන්හි යෙදිණ. මෙහි වර්ත්මානාර්ථය දෙන පදයෙක් පෙනේ. විමැසියැ යුතු.

**80. නම කල සත හැලේ සි සි ලේ සැප සිලි ලී
බිය සෙණ රුපු කැලේ තු මු ලේ දෙන නොකා ලී
නළලත ගිරි තෙ ලේ සු හි ලේ රුසිනි'පි ලී
සුර රද දෙ බැම ලේ ග න ලේ සිරි කියෙ ලී**

නම කළ සත හැලේ සිසිලේ සැප සිලිලී තුමුලේ රුපු කැලේ නොකලී බිය සෙණ දෙන, නළලත ගිරි තෙලේ සුහිලේ රුසින් දුපිලී ගඟ ලේ සිරි, සුර රද දෙ බැමලේ කියෙලී.

**නම කල**- නමස්කාර කළා වූ, **සත**- සත්ත්ව නමැති, **හැලේ**- ශාලීනට, **සිසිලේ**-සිසිල් වූ, **සැප සිලිලී**-සම්පත්ති නමැති සලිලය ද, **තුමුලේ**- මහත් වූ, **රුපු කැලේ**- ශත්‍රු නමැති වනයට, **නොකලී**- අකාල වූ නො හොත් අමනොඥ වූ, **බිය**- භීතිය නමැති, **සෙණ**- අසනිය ද, **දෙන**- දානය කරන්නා වූ, **නළලත**-

ලලාට නමැති, **කිඳි නෙළල්**- පව්ත තලයෙහි, **සුනිලේ රැසින්**- අති නීල කාන්තියෙන් (යුක්ත වැ), **ඉපිලි**- උද්ගත වූ, **ගනලේ**- අභ්‍රලේඛාවන් ගේ, **සිරි**- ආකාරය, **සුර රද**- සුරරාජයා ගේ. **දෙ බැම ලෙල්**- භ්‍රෑ ලේඛා යුගම තෙමේ. **කිළෙළි**- ප්‍රකාශ කෙළේ යැ

දිව්‍ය රජයා ගේ සිහින් බැම දෙක, සිහින් වැසි වලාවන් ගේ ආකාරය දැක්වී යැ. කෙබඳු වැසි වලාවින් ගේ ආකාරය ද? වැන්ද වූ සත්ත්ව නමැති හැලට හෙවත් ඇල් ගොයමට සිසිල් වූ සම්පත්ති නමැති ජලය ද, මහත් සතුරු නමැති වනයට නොකල් වූ නොහොත් ප්‍රියකර නුවූ භය නමැති හෙණ පහර ද දෙන්නා වූ, වැසි වලාවන් ගේ ආකාරය යළිත් කෙබඳු වූ වැසි වලාවන් ගේ ආකාරය ද? (ඒ දෙව් රජු ගේ) නළල නමැති පව්ත තලයෙහි ඉතා නිල් වූ රශ්මියෙන් යුතු වැ ඉපිලැ හෙවත් උඩට නැගී සිටියා වූ, වැසි වලාවන් ගේ ආකාරය.

මේ දිව්‍ය රාජයා ගේ ඇස් බැම දෙක පක්ෂ වූ අයට සම්පත්තියක් විපක්ෂ වූ අයට විපත්තියක් දෙයි ඇස් බැම් විහිදී ගිය හොත්, දෙව් රජ පැහැදුණු බවට ලකුණෙකි ඒ. ඒ පැහැදීමෙන්, පක්ෂ වූ අයට සිතූ පැතූ දෙය ලැබෙයි ඇස් බැම වකුටු වුව හොත්, කෝපයේ ලකුණකි ඒ. ඒ කොපයෙන්, විපක්ෂ වූ අයට නොකල් හි ද භයංකර විපත්ති පැමිණේ.

**විසඳුම්:-**

1. **හැලේ**- මේ 'හැල්' ශබ්දය පස්වන (ආධාර) විබත් ගත් තැනි. 'සැලේ' යන තන්හි දු මෙ මැ නය යි.

2 **සිසිලේ, තුඹුලේ. සුනිලේ**- 'සිසිල්' 'තුඹුල්' 'සුනිල්' ශබ්දයන් එළි පිණිස 'ඒ'කාර යුක්ත වැ සිටි සේ යි.

3. **සිලිලි**- 'සිලිල්' යනු එළි පිණිස, 'ඊ'කාර යුක්ත වැ සිටි සේ යි.

4. **නොකලි**- මෙයින් අර්ථ දෙකෙක් මෙ තන්හි ලැබිය හැකි වේ. නොකල්හි හෙවත් අකාලයෙහි වූ යනු එකෙකි. අනපේක්ෂිත වූ කල්හි ද සතුරනට මොහු ගෙන් භය පැමිණෙන බව එයින් හැඟැවෙයි. 'කල්‍ය නුවූ හෙවත් සිතට ප්‍රියකර නුවූ' යනු අනෙක් අර්ථය යි. කිය හෙණ හම් කා හට වුවත් අකල්‍ය මැ යැ. ඒ බව කිවමනා නොවන හෙයින්, මුලින් දක්වුණු අර්ථය යෝග්‍යතර වේ.

'නොකල්' යනු ද එළි පිණිස 'ඊ'යුක්ත කැරිණ.

4. **ඉපිලි**- 'උපුල්' (ඉපිලීමෙහි) ධාතුයෙන් වූ 'ඉපිලි' යන කෘදන්ත පදයෙහි අන්ත්‍යස්වරය එළි පිණිස දික් කැරිණ. 'උඩට නැගුණු' (ඉල්පුණු) යනු අර්ථ යි.

5. **බැම ලෙල්, ගන ලේ**- මෙහි දු 'ලේ' යනු 'ලේඛා' හෙවත් 'රේඛා' යන අර්ථ ඇත්තේ යැ. බැම රේඛාකාර හෙයින් මේ සේ දෙයි.

81. ස තු රු  සුර අඳුරු එක පැහැර දුරු කා  ළ
මි තු රු  තඹුරු වන නිරතුරු පුබුදු කා  ළ
අ තු රු  තුසර සිඳුවන දැකුමෙන් පහ  ළ
ල හි රු  සිරින් දිළිහිණි හිමි නෙත් සග  ළ

සුර සතුරු අඳුරු එක පැහැර දුරු කළ, මිතුරු තඹුරු වන නිරතුරු පුබුදු කළ, පහළ අතුරු තුසර දකුමෙන් සිඳුවන, ලහිරු සිරින්, හිමි නෙත් සගල දිළිහිණි.

**සතුරු සුර**– සුරශත්‍රු හෙවත් අසුර නමැති, **අඳුරු**– අන්ධකාරය, **එක පැහැර**– එකප්‍රහාරයෙන් හෙවත් එක විටැ මැ, **දුරු කළ**–දූරීභූත කළා වූ, **මිතුරු** මිත්‍ර නමැති, **තඹුරු වන**–තාමරස වනය, **නිරතුරු**– නිරන්තරයෙන්, **පුබුදු කළ**– ප්‍රබුද්ධ කළා වූ, **පහළ**– ප්‍රකාශ වූ, **අතුරු**- අන්තරාය නමැති, **තුසර**– තුෂාරය (පින්න), **දැකුමෙන්**– දර්ශනයෙන්, **සිඳුවන**- ශුෂ්ක කරන්නා වූ, **ලහිරු සිරින්**- තරුණ සූර්‍ය්‍යශ්‍රීන්, **හිමි**–ස්වාමිහු ගේ, **නෙත් සගල**– නෙත්‍ර යුගම තෙම, **දිළිහිණි**- ජ්වලිත වී යැ

අසුර නමැති අන්ධකාරය එක් වරැ මැ දුරු කළා වූ, මිත්‍ර නමැති නෙළුම්. වනය නිරන්තරයෙන් ප්‍රබුද්ධ කළා වූ, පහළ වූ අන්තරාය නමැති පින්න දැකිමෙන් මැ සිඳුවන්නා වූ, තරුණ සූර්‍ය්‍යයන් දෙ දෙනකු ගේ ආකාරයෙන්, (මේ) ස්වාමිහු ගේ ඇස් දෙක දිළිහුණේ යැ.

රාක්ෂසයනට සතුරු වැ දිව්‍යයනට මිතුරු වූයෙන් දෙවසඞ්ඛ්‍යායෙහි ලා ගැනුණ ද, ජන්මයෙන් රාක්ෂසයකු වන බැවින්, විභීෂණ දිව්‍යරාජයා ගේ ඇස් ඉතා රත් පැහැ ඇත්තේ යැ එ හෙයින් තරුණ සූර්‍ය මණ්ඩල දෙකක් වැනි වේ. මේ දිව්‍යරාජයා ගේ ඇස් අසුරයන් දුරු කරයි. ඒ, තරුණ සූර්‍ය්‍යයා අඳුරු දුරු කිරීම වැන්නැ. ඇස් මිතුරු සමූහය පුබුදු (සතුටු) කරයි. ඒ, තරුණ සූර්‍ය්‍යයා තඹුරු වන පුබුදු කිරීම වැන්නැ. ඇස්, අතුරු (අන්තරාය) සිඳුවයි (නැති කෙරෙයි.) ඒ, තරුණ සූර්‍ය්‍යයා පිනි සිඳුවනු වැන්නැ. මේ තුන් අයුරින් දිව්‍යරාජයා ගේ ඇස් තරුණ රිවි මඬුලු වැනි වේ.

ස්වාභාවික තරුණ සූර්‍ය්‍යයා නම් මේ ඇස් හා එකාන්තයෙන් සමාන වන්නේ නො වේ. කවර හෙයින් ද? තරුණ සූර්‍ය්‍යයා, එක පැහැර අඳුරු දුරු නො කෙරෙයි. සවස් වූ, කලැ අඳුරු පෙරළා පැමිණේ. එය නැවැතැ ද දුරු කළ යුතු වේ. තරුණ සූර්‍ය්‍යයා තඹුරු වන නිරතුරු පුබුදු නො කෙරෙයි. උදයැ පුබුදු වූ ද තඹුරු සවසැ හැකිළේ. තරුණ සූර්‍ය්‍යයා, තුෂර (පිනි) දැකුමෙන් නො සිඳුවයි. පිනි සිඳෙනුයේ සූර්‍ය්‍යයා දැකැ මඳ වේලාවක් ගත වූ විටැ යැ.

මේ දිව්‍යරාජයා වනාහි, එක පැහැර සුරසතුරන් (අසුරයන්) දුරු කෙරේ. මිතුරන් නිරතුරු පුබුදු (සතුටු) කෙරේ. එසේ පුබුදු වූ මිතුරෝ පෙරළා නො හැකිළෙත්. (නොසතුටට නො පැමිණෙත්) මේ තෙමේ අනතරාය දුටුකෙණෙහි මැ නැති කෙරෙයි.

මෙසේ වන බැවින් මේ දිව්‍යරාජයා ගේ ඇස් හා සමාන වනුයේ, අඳුරු එක පැහැර දුරු කරන්නා වූ ද, තඹුරු වන නිර තුරු පුබුදු කරන්නා වූ ද තුසර දැකුමෙන් මැ සිඳුවන්නා වූ ද, තරුණ රිවිමඬුලු යි 'එක පැහැර' 'නිරතුරු' 'දැකුමෙන්' යන වචනයන් ගෙන් ලැබෙන විශිෂ්ටාර්ථය මෙසේ අවබොධ කළ යුතු.

ඇස් කෙසේ අසුරන් දුරු කෙරේ ද? කෙසේ මිතුරන් පුබුදු කෙරේ ද? කෙසේ අතුරු සිඳුවා ද?

මේ දිව්‍යරාජයාට පෙනුණු නම්, අසුරයනට වනුයේ ඒකාන්ත විනාශය යි; මිතුරනට වනුයේ ඒකාන්ත සන්තොෂය යි; අවනත ලොකයාට වනුයේ ඒකාන්ත අන්තරාය ශමනය යි. එ හෙයින් ඇස් මැ මෙකී දෑ කරන්නේ නමැ.

**ටිප්පණි:-**

1. **සතුරු සුර අඳුරු-** පුරාතන ව්‍යාඛ්‍යානයෙහි, "සතුරු- විරුද්ධ වූ, සුර- දෙවතා නමැති, අඳුරු- අන්ධකාර" යි අරුත් පැවැසිණ. තේ අයුක්ත යැ. දෙවියනට දෙවියන් ගේ සතුරු විමෙක් නො ලැබේ. ජනවහයෙන් රාක්ෂස වුව ද, පැවැත්මෙන් දෙව් වන හෙයින්, මොහු අසුරයන් දුරු කළ පරිදි වනු යෙදෙයි.

2. **දුරු කළ- පුබුදු කළ- සිඳුවන-** දෙතැනෙකැ විශෙෂණ කෘදන්තය අතීතාර්ථයෙහි යොද, තුන් වන තන්හි වර්තමානාර්ථයෙහි යෙදූ සේ මැනැවි ද? 'දුරු කළ' යනුයෙන් අතීතයෙහි දුරු කොටැ කෙළවර වූ බවෙක් ද, 'පුබුදු කළ' යනුයෙන්, අතීතයෙහි පුබුදු කොටැ කෙළවර වූ බවෙක් ද හැඟේ. 'සිඳුවන' යනුයෙන්, (අතුරු තුසර) සින්දීම සව්භාව ගුණ යක් බව වැටැහේ. විභීෂණ දිව්‍යරාජයා දැනුත් මතුත් සතුරන් දුරු නො කෙරේ ද? මිතුරන් පුබුදු නො කෙරේ ද?

මොහු ගේ සියලු සතුරෝ දුරු කැරුණාහු වෙති; සියලු මිතුරෝ පුබුදු කැරුණාහු වෙති. දුරු කළ යුතු සතුරෙක් හෝ, පුබුදු කළ යුතු මිතුරෙක් හෝ නැත් මැ යැ. එ හෙයින් 'දුරු කළ' 'පුබුදු කළ' යන දෙ තන්හි අතීත කෘදන්තය යෙදූ සේ මැනැවි. අවශෙෂ ලොකයා ගේ අන්තරායයන්, මේ දිව්‍ය රාජ තෙමේ පෙරැ සින්දී යැ; දැනුදු සිඳුවයි; මතුදු සිඳුවයි. එ හෙයින් 'සිඳුවන' යන වර්තමාන කෘදන්තය යෙදූ සේ ද මනා මැ යැ.

3. **අතුරු-** මේ 'අන්තරාය' යන්නෙන් ආයේ යැ. දත් ඇතැමෙක් අන්තරාර්ථයෙහි 'අනතුරු' යන්නක් ලියති. නමුත් 'අනතුරු' යන්නෙන් අන්තරායාර්ථයෙක් නො ලැබේ. ලැබෙනුයේ අනන්තරාර්ථය යි. 'අන්තරාය' යන තන්හි දී 'ය'කාරය අධික යැ යි සිතා, 'අන්තරා' යන අපභ්‍රංශ වචනය ද ලියනු අවශ්‍යතායනාව නොකළ හැකි පෙරැළියක් නම් නැති,

4. **ලහිරු**- මෙහි 'ල' යනු බාලාර්ථයෙහි වෙයි. උදය කාලයෙහි සූර්ය්‍යා අළුතැ මැ දක්නා එ පැමිණි හෙයින් 'බාල' නම් වෙයි. එ කලැ සූර්ය්‍යා ගේ වර්ණය අතිරක්ත යැ.

5. **දිළිහිණි**- මේ 'දිළිස' ධාතුයෙන් නිපන. ආත්මනෙපදික වූ මේ ධාතුව දිළිසේ- දිළිසෙති- දිළිසිණි- දිළිසණු- ඈ පිසින් වරනැගේ. 'දිළිහිණි' යන තන්හි 'හ'කාරය 'ස'කාරයට ආදෙශ වූයේ යැ. මේ ධාතුයෙහි 'ස'කාර යට 'ය'කාරය ද ආදෙශ වෙ, එයින් දිළියේ- දිළියෙති- යනාදි රූපයෝ ලැබෙති.

**92. ය ස ගා න කල නැනැ නැනැ සිද්'ඟනන් සැ දී**
**නො ලගා එ හිමි දිගු තුඟු නැහැයට වොරැ දී**
**ස ම ගා රදුන් දෙවියන් සෙවුමින් නිසැ දී**
**මු ර ගා අහෝ මිණි කාලම වෙහෙස වි දී**

සිදු අඟනන් සැදී තැනැ තැනැ යස ගාන කළ, එ හිමි දිගු තුඟු වොරැදී නැහැයට නො ලගා, මිණි කාලම, රදුන් දෙවියන් සමගා නිසැදී සෙවුමින් මුර ගා, වෙහෙස විඳී අහෝ!

**සිදු අඟනන්**- සිද්ධාඞ්ගනාවන් විසින්, **සැදී**- අලඞ්කෘත වැ, **නැනැ නැනැ**-තන්හි තන්හි, **ගාන කල**- ගායනය කරන ලද්ද වූ, **එ හිමි**-ඒ සවාමිහු ගේ, **දිගු**- දීර්ඝ වූ, **තුඟු**-උත්තුඞ්ග වූ, හෙවත් උස් වූ, **වොරැදී**- විරාජමාන වූ, **නැහැයම**- නාසිකාවට, **නො ලගා**- ආසන්න නො වැ, **මිණි කාලම**-මණි කහාල තෙම (මැණික් හොරනෑව), **රදුන් දෙවියන්**-රජවරුන් දෙවතාවන් හා, **සමගා**- එක් වැ, **නිසැදී**- නිරන්තරයෙන්, **සෙවුමින්**- සෙවනය කෙරෙ මින්, **මුරගා**-උද්ඝොෂණය කොටැ, **වෙහෙස විඳී**- දුක් විඳියි. **අහෝ**!- ඛෙදයෙකි!

සිද්ධාඞ්ගනාවන් සැරැසී තන්හි තන්හි කීර්තිය ගායනය කළා වූ ඒ සවාමිහු ගේ දික් වූ උස් වූ නාසිකාවට ළං නො වී (ළං වන්නට බැරි වීම හෙතු කොටැ ගෙ නැ), මැණික් හොරනෑව, රජුනුත් දෙවියනුත් හා එක් වී, නිතර සෙවය කෙරෙමින් මූර ගා, දුක් ගනී අහෝ!

රජ ගෙදරැ ද දෙවොලෙහි ද තූර්‍ය්‍යවාදනයෙහි දී හොරනෑව ගනු සිරිති. නමුත් මෙය කවීන් විසින් අන් පරිද්දෙකින් ගැනිණ. විභීෂණ දෙවයා ගේ පැහැය, (ඉඳු නිල්) මිණියෙන් කළ හොරනෑව නට ද වඩා අතිශයින් රමණීය යැ. එ හෙයින් මැණික් හොරනෑව, ඒ දෙවයා ගේ නැහැයට ළං වියැ නොහැකි ව, "රජුන් ගේ දෙවි යන් ගේ පිහිටින් එසේ කළ හැකි වෙති" යි සිතා, ඔවුන් හා එක් වැ, නිරතුරු ඔවුනට සෙවය කිරීම් වශයෙන් මූර ගා, දුක් ගනී.

**විසඳුම්:-**

1. **යස ගාන කල නැනෑ නැනෑ සිද්'ගනන් සැදී-** ලොක යෙහි කාරුණ්‍ය මෛත්‍රී ආදි ගුණ මහිමයෙන් ද, ශූරවීර භාවයෙන් ද ප්‍රකට වූ වන් ගේ නම් ලෝ වැස්සෝ ප්‍රීතියෙන් කියති; අයති. ඇතැමෙක් ඔවුන් ගේ චරිතය වර්ණනා කරන ගීතිකාවන් බැඳ ගායනය කෙරෙති. මෙහි සිද්ධාඞ්ගනාවන් හැරැණි නන්හි නන්හි සිටැ, මේ දෙවයා ගේ ගුණ කීර්තිය ගීතව ගායනය කරන බව හැඟැවිණ.

2. **නො ලගා-** මෙහි 'ලගා' යනු 'ලග' ධාතුයෙන් නිපන් පූර්වක්‍රියා, නිපාත පද යි.

3. **සමගා-** 'සමග' (එක් වීමෙහි) ධාතුයෙන් නිපන් පූර්වක්‍රියා නිපාත යි.

4. **සෙවුමින්-** 'සෙවු' (සෙවුමෙහි) ධාතු යි. සෙවී- සෙවිති- සෙවී- ඈ විසිත් වරනැගේ.

88. **සි රි ස ර  හිගුල් විලැ සේ හස වැලෙ'ව ග   න**
**සු ර ව ර  සලෙල රත් ලවනතැ දල දුල   න**
**ම න හ ර  සඳ වලා පෙල කොලවරැ පෙනෙ   න**
**පැ හැ සර  ළසඳ යුවලෙක් ඈත් නම් එ මෙ   න**

සිරි සර හිගුල් විලැ ගන සේ හස වැල එව් සුර වර සලෙල රත ලවනත දුලන දල, මනහර සඳ වලා පෙල කොලවරැ පෙනෙන පැහැසර ළසඳ යුවලෙක් ඇත් නම්, එ මෙන.

**සිරිසර-** ශ්‍රීසාර වූ, **හිගුල් විලැ-** ජාතිහිඞ්ගුල තඩාගයෙහි (සාදිලිඞ්ගම් විලෙක්හි), **ගන-** සාන්ද්‍ර (ඝන) වූ, **සේ හස වැල එව්-** ශ්වෙත හංසාවලීන් මෙන්, **සුර වර-** දිව්‍යරාජයා ගේ, **සලෙල-** ලීලා සහිත වූ, **රත ලවනතැ-** රක්තාධරාන්තයෙහි (රතු වූ තොල් කෙළවරැ), **දුලන-** දිලියෙන්නා වූ, **දල-** දංෂ්ට්‍රාවෝ, **මනහර-** මනොහර වූ, **සඳ වලා පෙල කොලවරැ-** සන්ධ්‍යාවලාහක පඞ්ක්තියෙහි අවසානයෙහි, **පෙනෙන-** දෘශ්‍යමාන වන්නා වූ, **පැහැසර-** ප්‍රභාස්වර වූ, **ළසඳ යුවලෙක්-** බාලචන්ද්‍ර යුගලයෙක්, **ඈත් නම්-** විද්‍යමාන වී නම්, **එ මෙන-** ඒ හා සමාන යෝ යැ.

ශ්‍රීසාර වූ. සාදිලිංගම් විලෙකැ ඝන වූ සුදු හංස පේළි දෙකක් මෙන්, මේ දිව්‍යොත්තමයා ගේ ලෙළ දෙන රතු තොල් කෙළවරැ දිලිසෙන්නා වූ, දළ දෙක, (කෙබඳු ද යත් හොත්:-) මනොහර වූ, සැඳැ වලා පේළි කෙළවරැ පෙනෙන්නා වූ බබළන්නා වූ අභිනව චන්ද්‍ර රේඛා දෙකක් ඇත් නම්, ඒ හා සමාන යැ

මෙයින් වැනුණේ විභීෂණ දිව්‍යරාජයා ගේ දළ දෙක යැ. රාක්ෂසයනට වනාහි, මුඛයෙහි දෙකෙළවරින් පිටතට විහිදූ ගියා වූ වක් වූ දළ ඇතැයි යෙති. එ හෙයින් ජන්මයෙන් රාක්ෂසයකු වූ මේ දිව්‍යරාජයාට ද එ බඳු වූ දළ දෙකෙක් ඇති.

දිව්‍යරාජයා ගේ ඉතා රත්වූ තොල් කෙළවර පෙනෙන දළ දෙක මෙහි උපමෙය පක්‍ෂය යි. උපමාන පක්‍ෂ දෙකෙකි. සාදිලිංගම් විලෙහි වූ සත සුදු හංස පඞ්ක්ති දෙක එකෙකි සැඳෑ වලා පෙළ කෙළවරෙහි පෙනෙන්නා වූ අභිනව චන්‍ද්‍රරේඛා දෙක අනෙක යි. ඉතා රතු වූ තොල්, සාදිලිංගම් විලක් හා ද, සන්ධ්‍යාවලාහක පඞ්ක්තියක් හා ද සමාන යැ. දළ දෙක හංසාවලී දෙකක් හා ද, ළ සඳ යුවලක් හා ද සමාන වේ.

දෙවන උපමාන පක්‍ෂය නම් ලොකයෙහි නොලැබෙන් නෙකි. ළ සඳ යුවලෙක් නම් කොයින් ලැබේ ද? නො ලැබිය හැකි හෙයින් 'අද්භූත' නම් වූ මෙබඳු උපමානයක් ගැනීමෙන්, උපමෙයය වූ දළ දෙකට සමාන කළ හැකි කිසිවක් ලොකයෙහි නොලැබෙන බව හැඟැවෙයි. නමුත් මෙහි පළමු වන උපමාන පක්‍ෂයෙන්, එ බන්දක් ඇති බව හැඟැවිණ. මෙසේ කියැවුණු දෑයට විරුද්ධ වන සේ අන් දෑයක් කීම, සාහිත්‍ය ශාස්ත්‍ර නයින්, දෝෂයෙකි.

පිළිසඳුණි:-

1. සේ හස වැලෙ'ව් ගනා- මෙහි 'ගනා' යනුයෙන් "අතර තො පෙනෙන සේ හැසුණු" යන අර්ථය ලැබේ. සුදු හස් පෙළ ගන වැවක් වැ සිටි කලැ, ඒ දළ එමන් වෙයි.

2. දළ දුලනා- කෙසේ දුලන දළ දළ ද? "සිරිසර සිතුල් විලැ ගන සේ හස වැල එව් දුලන දළ"

3. ළසඳ යුවලෙක් ඇත් නම්- අභිනවචන්‍ද්‍රරේඛාව කොන තුල් වැ, මැදූ වක් වූයේ, මෙබඳු දළ හා අතිශයින් සමාන යැ. සඳ යුවළක් නොලැබෙනුයෙන් මෙහි "ඇත් නම්" යි යෙදිණ.

84\. සනා මිණි වලලු නැඟි රැස් මල් සැනැ ති
මනා දිගු ඇඟිලි නව තඹ ළපලු ඇ ති
දනා සැමැති දෙන පලඹ'න එ සුර ප ති
දිනා දිමුතු අතු සිරි සුර තුරු පැවැ ති

සනා මිණි වලලු නැඟි රැස් මල් සැන් ඇති, මනා දිගු ඇඟිලි නව තඹ ළපලු ඇති, දනා සැමැති දෙන එ සුර පති පලඹ අත, සුර තුරු පැවැති දිමුතු අතු සිරි දිනා.

සනා මිණි- සන නමණීමය වූ, වලලු- කටකයෙන්, නැඟි- උද්ගත වූ, රැස්- රශ්මි නමැති, මල් සැන් ඇති- පුෂ්පස්තවකයන් (මල් පොකුරු) ඇත්තා වූ, මනා-යහපත් වූ, දිගු දීර්ඝ වූ, ඇඟිලි- අඞ්ගුලි නමැති, නව- අභිනව වූ, තඹ- තාම්‍රවර්ණ වූ, ළපලු ඇති-තරුණ පල්ලවයන් (ලා දළු) ඇත්තා වූ, දනා-ජනයන් ගේ, සැමැති- අභිලාෂයන්, දෙන- ප්‍රදානය කරන්නා වූ, එ සුර පති-

ඒ සුරේන්ද්‍රයා ගේ, **පලඹ අත**- ප්‍රලම්බ හස්තය (එල්ලෙන්නා වූ අත), **සුර තුරු පැවැති**- කල්පවෘක්ෂයෙහි ප්‍රවෘත්ත වූ, **දිමුතු**- දීප්තිමත් වූ, **අතු**- ශාඛායෙහි, **සිරී**- ශ්‍රීය, **දිනා**- ජය ගනී.

රන්මිණියෙන් කැරුණු වළලුයෙන් නැගුණා වූ, රශ්මි නමැති- මල් පොකුරු ඇති, යහපත් දික් ඇඟිලි නමැති අළුත් තඹවන් ලා දළු ඇති, මිනිසුන් ගේ අභිලාෂයන් (ආශා) දෙන්නා වූ, ඒ දෙව් රජු ගේ එල්ලෙන අත, දිව්‍ය වෘක්ෂයෙහි පැවැත්තා වූ බබලන අත්තෙහි ශෝභාව පරදවයි.

දෙව් රජු ගේ දෑත කප් රුකෙහි අතු දෙකකටත් වඩා යහපත් වේ. දෑතෙහි රන් මිණි වළලුයෙන් නැගුණු රැස් කප් රුක් අතු වලැ මල් කැන් වැන්නැ. දෑත ද, කප් රුක් අතු මෙන් කැමැති දෑ දෙයි.

**ටිප්පණි:-**

1. **පලඹ'ත**- අතෙහි වැලමිටින් පහළ කොටස පලඹත යි. ප්‍රලම්බ වැ සිටිනා හෙයින් මේ නම් වෙයි.

2 **දිනා**- දුක්වුණේ, මල් කැන් හා ලපලු ඇති බව, කැමැති දෙනබව යන දෙපක්ෂයට මැ සාධාරණ ධර්ම යි. එ හෙයින් කිසැ සුතු "සමාන යැ" යනු යි. කවර හෙයින් "දිනා" යි කියැවිණි ද? සුර තුරෙහි අතු දෙනුයේ දෙවියන් ගේ කැමැති යි. සුර රජු ගේ දෑත ජනයා ගේ කැමැති දෙයි. දිනනුයේ මේ හේතුයෙනි.

85. පා නා සෙනෙහෙ සුසිනිඳු මඳ'ලස බැ ල්ම
ගා නා නිමහමෙ'ව දෙව'ගන නෙත් කැ ල්ම
නා නා සුරිඳු පුළුලු'ර සිරි සඳ ඇ ල්ම
නූ නා කෙළන ගල්'තල වැනි ඉඳු නි ල්ම

සෙනෙහෙ පානා සුසිනිඳු මඳ අලස බැල්මැ, දෙව් අඟන නිමහම් එව ගානා නෙත් කැල්මැ නානා, සුරිඳු පුළුල් උර, සිරි සඳ ඇල්ම නූනා කෙළනා, ඉඳුනිල් මැ ගල් අතල වැනි.

**සෙනෙහෙ පානා**- ස්නේහය ප්‍රකාශ කරන්නා වූ, **සුසිනිඳු**- සුස්නිග්ධ වූ, **මඳ අලස බැල්මැ**- මන්දාලස්‍ය නිරීක්ෂණයෙහි ලා, **දෙව අඟන**- දිව්‍යාඞ්ගනාවන් විසින්, **නිමහම් එව**- සමාප්ති කර්මයක් මෙන්, **ගානා**- ආලේප කරනු ලබන්නා වූ, **නෙත් කැල්මැ**- නෙත්‍ර කාන්තියෙහි, **නානා**- ස්නානය කරන්නා වූ, **සුරිඳු**- සුරේන්ද්‍රයා ගේ, **පුළුල් උර**- පෘථුල වූ උරඃස්ථලය, (කෙබඳු ද යත්:-) **සිරි සඳ**- ශ්‍රී කාන්තාව, **ඇල්ම**- අනුරාගය, **නූනා**- නුමුදා, **කෙළන**- ක්‍රීඩා කරන්නා වූ, **ඉඳුනිල් මැ**- ඉන්ද්‍රනීලමය වූ, **ගල් අතල වැනි**- ශිලාතලයක් වැන්නැ.

සෙනහස ප්‍රකාශ කරන්නා වූ අතිශයින් සිනිඳු වූ මදක් අලස වූ බැලීමෙහි දී, දිව්‍යාඞ්ගනාවන් විසින් (සිතුවමෙකැ අවකාශයෙහිදී කැරෙන) සමාපත්තිකර්මයක් මෙන් ගාන්නා වූ නෙත්‍රකාන්තියෙහි නාන්නා වූ, (ඒ) දෙව් රජු ගේ පුළුල් වූ ළය (කෙබඳු ද කිව හොත්) ශ්‍රීකාන්තාව ඇල්ම නුමුඳු (හෙවත් අඩක් නො කොටැ) ක්‍රීඩා කරන්නා වූ, ඉඳුනීල මාණික්‍යයෙන් මැ නිර්මිත වූ ගල් තලාවක් වැන්නැ

“ගල් තලාවක් මෙනැ”යි කීමෙන්, මේ දෙව් රජු ගේ ළය පළල් බව ද සමතල බව ද හැඟැවූ හ. දෙව් රජ කළු බැවින් ඉඳුනිල් මිණි ගලතලක් ගත් හ. ශ්‍රීමදහාවය හඟවනු පිණිස “ශ්‍රීකාන්තාව කෙලනා ගලතල වැන්නැ”යි කී හ. ශ්‍රීමදභාවය කිසි විටෙකැ නැති නොවන බව දක්වනු පිණිස “ඇල්ම නූනා කෙලන” යනු යෙදූ හ. දිව්‍යාඞ්ගනාවන් නිරතුරු මේ දෙව් රජු දෙසැ ආදරයෙන් බලන බව ප්‍රකාශ කරනු සඳහා, “සෙනෙහෙ පානා මදලස බැල්මැ, දෙවඟන නිමහම් එවි ගානා නෙත් කැල්මැ නානා” යනු, “පුළුලුර” යන්නට විශේෂණ කළ හ.

**විවරණ:-**

1. **පානා සෙනෙහෙ සුසිනිඳු මද'ලස බැල්ම–** ‘මද අලස බැල්ම’ නම් ලජ්ජායෙන් මෙන් මුහුණ සම්පූර්ණයෙන් නො හරවා, ඉඳුරා නො බලා, මදක් අලස වැ බැලීම යි. කාන්තාවක එසේ බලන විටැ බෙහෙවින් හැඟැවෙනුයේ සෙනහස යි. එ හෙයින් ඒ “සෙනෙහෙ පානා බැල්මැ”යි කී හ. මෙහි “බැලීමෙහි දී” යන අරුත්හි යෙදුණු ‘බැල්මැ’ යන තන්හි අගැ ‘ඇ’කාරය එළි පිණිසැ ‘අ’කාර බවට පැමිණැවිණ. ‘කැල්මැ’ යනු ද මේ හෙතුයෙන් ‘කැල්ම’ යි යෙදිණ.

2 **ගානා නිමහම'ව දෙව'ගන නෙත් කැල්ම නානා පුළුලු'ර–** මෙයින්, දෙවඟනන් ඒ පුළුලුර දෙස බෙහෙවින් ඇස් හෙළන බව හැඟැවිණ. පුළුලුර නෙත් කැල්මෙහි නහා නම් (සනාතය කෙරේ නම්), නෙත් කැල්ම ජලප්‍රවාහයක් මෙන් අධික ලෙස වැටියැ යුතු යැ.

3 **නිමහම්–** චිත්‍රරූපයෙකැ සම්පූර්ණ ශොභාව ඇති වනු පිණිස “සමාපත්තිකර්මයෙහි කරන ලද අඤ්ජන රේඛාවනැ” යි පුරාතන ව්‍යාඛ්‍යානයෙහි කී හ. එයින්, මෙය අඳුනින් කැරෙන බව හැයේ. ‘නිම+කම්’ යන තන්හි ‘ක’කාරයට ‘හ’කාරාදෙශ වීමෙන් නිමහම් යනු වී යැ. (නව+කම්) නවහම්, (වෙණෙද+කම්) වෙණෙදහම්, (බළ+කම්) බළහම්, යනාදිය ද මේ ක්‍රමයෙන් නිපදී

4 **පුළුලු'ර සිරි සඳ ඇල්ම නූනා කෙළන ගල'තල වැනි–** මෙයින් ඒ දෙව් රජහු ගේ සියලු කල්හි පවත්නා වූ ශ්‍රීමදභාවය සූචිත යි.

ශ්‍රී හෙවත් ලක්‍ෂ්මී තොමෝ විෂ්ණුහු ගේ ළයෙහි වසන්නී යැ. මැය යම් කිසිවකුහු ගේ ළයෙහි වසන බව කීමෙන් හැඟැවෙනුයේ ඔහු ගේ ශ්‍රීමත් බව යි. මෙහි ශ්‍රී හැම විටැ පවත්නා බව (දක්වෙනුයේ) “ඇල්ම නූනා කෙළනා”යි කීමෙනි. යම් කිසි තැනක් නිබර පුරුදු වමින් ඇල්ම නැති

වෙයි. ශ්‍රීය ගේ ව්‍යාසි මේ දෙව් රජු ගේ පුරවරයෙහි සොළසාව ඇති ඇල්ම කිසි විටෙකැත් නො මිදේ. කවර හෙයින් ද? ශ්‍රීයට එතරම් සුදුසු අන්‍යස්ථාන යක් නැති හෙයිනි.

5. **සිරි සඳ**- මෙ තන්හි දු 'සඳ' යනු උත්තමාර්ථයෙහි වේ. ස්ත්‍රී පුරුෂ ලිඞ්ගද්වයයෙහි මැ මේ 'සඳ' යනු නොවෙනස් වැ සිටී.

6. **නූනා**- නො+උනා = නු+උනා = නූනා. සවරපරරූපයෙන් හා 'උ+උ' දෙසට එක් ඌකාරයක් වීමෙන් සිද්ධ යි. 'උනා' යනු 'උන' (විද්‍යමයි) ධාතුයෙන් වූ පූර්වක්‍රියා නිපාත යි. 'උන' ධාතුව උනා- උනති- ඉනී- ඉන්නු- ඈ විසින් වරනැගේ.

7. **ඉඳුනිල් ම**- 'ඉන්ද්‍රනීලයෙන් මැ නිර්මිත වූ' යනු අර්ථ යි. ('මැ' යනු 'ම' වූ පරිදි පැහැදිළි යි.) මෙහි 'මැ' යනු අවධාරණාර්ථයෙහි නිපාත යි. එයින් කැරුණු යන අර්ථයෙහි යෙදෙන 'මුවා' ප්‍රත්‍යයය මෙයින් අන්‍ය යි. 'ඉඳුනිල්මුවා' යනු ඉඳු නිලින් කැරුණේ යැ. එහි ප්‍රධාන ද්‍රව්‍යය ඉඳුනිල් වුව ද, සවර්ණාදි අන්‍ය ද්‍රව්‍යයෙකුදු නො යෙදියැ හැක්කේ නො වේ. නමුත් "ඉඳු නිල් මැ" යි කී කලැ හැඟෙනුයේ ඉඳුනිල් පමණෙකි.

**86. ල කු ළු පුළුකුළු වට බිමැ එ සුර වි රැ**
**වෙ ර ළු මිණි කැලුම් පතරින් මෙවුල'තු රැ**
**නැ බු ළු සොඳුරැ සුසිලිවු වනොර රඹ තු රැ**
**බැ බැ ළු සිලිල් ඉසිනා විලසැ සිරි දූ රැ**

එ සුර විරැ නැබුළු සොඳුරැ සුසිලිවූ වනොර රඹ තුරැ, පුළුල් උකුළු වට බිමැ ලකුළු මෙවුල් අතුරැ වෙරළු මිණිකැලුම් පතරින්, බැබැළු සිලිල් ඉසිනා විලසැ සිරි දූරැ

**එ සුර විරැ**-ඒ දෙවවීරයා ගේ, **නැබුළු**-මහත් වූ, **සොඳුරැ**- සුන්දර වූ, **සුසිලිවූ**- සුශ්ලිෂ්ට වූ, **වනොර**- වෘත්තෝරු නමැති, **රඹ තුරැ**- රම්භා වෘක්ෂයෝ තුමූ, **පුළුල්**- පෘථුල වූ, **උකුළු වට බිමැ**- ශ්‍රෝණි වෘත්ත නමැති භූමියෙහි, **ලකුළු**- අලඞ්කෘත වූ, **මෙවුල් අතුරැ**- මෙඛලාන්තරයෙහි වූ, **වෙරළු මිණි කැලුම් පතරින්**- වෛදූර්‍ය මණි කාන්ති සමූහය කරණ කොටැ ගෙනැ, **බැබැළු**- භ්‍රාජිත වූ, **සිලිල් ඉසිනා විලසැ**- ජලසෙචනවිලාසයා ගේ, **සිරි**- ශ්‍රීය, **දූරැ**- ධැරුවාහු යැ.

ඒ දෙවෝත්තමයා ගේ මහත් වූ යහපත් වූ ඉතා සිලිටු වූ වට වූ ඌරු (කලවා) නමැති කෙසෙල් ගස්, පළල් වූ උකුළු වටය හෙවත් වට වූ උකුළු නමැති භූමියෙහි අලඞ්කෘත වූ මෙඛලාව අතුරෙහි වෛදූර්‍ය මැණික් රශ්මි සමූහය කරණ කොටැ ගෙනැ, බැබැළුණා වූ ජලය ඉසිනා ආකාරයේ ශෝභාව ඉසිලී යැ.

උකුළු වටා බැඳි මෙඛලා දමයෙහි වූ වෛදූර්‍යය් මැණික්වලැ කාන්ති සමූහය වට වූ ඌරු සුගන්ධියට වැටෙයි. නීලමණි වූ

වෛදූර්‍යමණීන් ගේ රශ්මිය ජලය වැන්නෑ. උෟරු කෙසෙල් ගස් වැන්නෑ. එ හෙයින්, කෙසෙල් ගස් දෙකකට ජලය ඉසිනා ආකාර යෙක් මෙයින් ප්‍රකාශ වේ.

**විසඳුම්:—**

1. **වමොර**- වට + උර. වට වූ උෟරු (කලවා).

2. **රඹ තුරූ**- තුරූහු. 'හ'කාරලොපයෙන් 'තුරූ + උ' යී සිටි කල, උ'කාර දෙකට එක් 'උෟ'කාරයක් වීමෙන් 'තුරූ' යනු වෙයි. මේ නයින් 'උහු' යන්නෙන් 'උෟ' යනු වෙයි. මේ පෙර විබත් බුහු බස ගත් තැනි.

නපුංසකලිඞ්ග වූ 'තුරූ' ශබ්දය පෙර විබත් බුහු බස ගත් කලැ 'තුරූ' යී සිටී. නපුංසකලිඞ්ග ශබ්දයන් නොගන්නා 'හු' විබත, මෙ තන්හි කවර හෙයින් ගැනිණි ද?

කාව්‍යභාෂායෙහි ඇතැම් විටැ මේ දක්නා ලැබේ. තිසර සන්දෙශයෙහි-

"තැවෙස් පමණ ගත් ලිය පියොවුරූහු පවා"

යන තන්හි, 'හු' විබත ගත් 'පියොවුරූ' ශබ්දය පෙනේ. ආචාර්‍ය ගුරුළු ගෝමීහු ද-

"අතැ සතර ඇඟිල්ලෝ ද පයැ පස් ඇඟිල්ලෝ ද"

යන තන්හි 'ඇඟිලි' ශබ්දය 'ඔ'විබත් ගත් පරිදි දක්වූහ. මේ සාමාන්‍ය රීතිය නො වේ.

නපුංසක ලිඞ්ග ශබ්දයන් බුහු බසැ සිටිනා කලැ ද, ඔවුන් උකත කරන ආඛ්‍යාත පදයෝ එක බසැ මැ සිටිති. එ හෙයින් "රඹ තුරූ...... සිරි දූරූ" යන තන්හි 'දූරූ' යන බහු වචන ආඛ්‍යාත පදය කෙසේ නම් නිවැරැදි වේ ද?

'ඔ' 'හු' යන විභක්තිහු නපුංසකලිඞ්ග ශබ්දයනට අයති නො වෙත්; පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග ශබ්දයනට අයති වෙත්. තමනට අයති නුවූ මේ ප්‍රථමා බහුවචන විභක්තීන් ගත් නපුංසකලිඞ්ග ශබ්දයෝ ද, ඒ විභක්තීන් අයති වූ පුංස්ත්‍රීලිඞ්ග ශබ්දයන් මෙන් මැ, බහුවචනයෙහි වූ ආඛ්‍යාතපදයෙකින් උකත වෙති. එ හෙයින් "ඇඟිල්ලෝ සිටිති"- "පියොවුරූහු සතොස් කෙරෙති" යන දෙ තන්හි ද ආඛ්‍යාතය බුහු බසැ මැ යෙදිණ.

3. **සිලිල් ඉසිනා විලසැ සිරි**- මෙයින් ගැනෙනුයේ, දිය ඉස්නා ආකාරයෙහි ශොභාව යි. 'සිරි' යනු ද, ඇතැම් තන්හි ආකාරාර්ථයෙහි යෙදේ. මෙහි 'විලස' යනු ආකාරාර්ථයෙහි යෙදිණ. එ හෙයින් මෙතන්හි 'සිරි' යන්නෙන් ගත යුත්තේ, 'ශොභාව' 'සෞන්දර්‍යය' හෙවත් 'රමණීයත්වය' යන අර්ථ යි.

67. වදනා සුරන් කිරුළ'ග රුවනෑ කැලුමෙ නා
බදනා කොමල ලතු විලස'ළ රතින් ම නා
මඩනා බැවින් සියපත එ තිමි පතුලෙ නා
බිසෙනා ළතඹ ශෝපලු සදිසි වෙවුල නා

වදනා සුරන් කිරුළු අග රුවනැ කැලුමෙනා බදනා කොමල ලතු විලස් අළු රතින් මිනා පතුලෙනා, එ තිමි සියපත මඩනා බැමින්, ළතඹ ශෝපලු බිසෙනා වෙවුලයා සදිසි.

**වදනා**- නමස්කාර කරන්නා වූ, **සුරන්**-දෙවියන් ගේ, **කිරුළ අග රුවනැ**- කිරීටාග්‍ර රත්නයෙහි, **කැලුමෙනා**- කාන්තිය කරණ කොටැ ගෙනැ, **බදනා**- බන්ධනය කරන්නා වූ, **කොමල**- කොමල වූ හෙවත් මනොඥ වූ, **ලතු විලස් අල**- අලක්ත විලාසය එළැවූ, **රතින්**- රක්ත වර්ණයෙන්, **මනා**- යහපත් වූ, **පතුලෙනා**- පාදතලයෙන්, **එ හිමි**- ඒ ස්වාමිහු, **සියපත**- පද්මය, **මඩනා බැවින්**- මර්දනය කරන හෙයින්, **ලතබ හෝපලු**- තරුණ වූ රක්තාශොක පල්ලවයෝ, **බියෙනා**- භීතියෙන්, **වෙවුලනා සදිසි** - කම්පිත වන්නවුන් හා සදෘශය හ.

වදින්නා වූ දෙවියන් ගේ වොටුනු අගැ වූ මාණික්‍යයන් ගේ කාන්තිය කරණ කොටැ ගෙනැ, ආලෙප කරනු ලබන්නා වූ, සතුටු උපදවන අලතා ආකාරය ප්‍රකාශ කළා වූ රත් පැහැයෙන් යහපත් වූ, (ඒ ස්වාමිහු ගේ) පතුලෙන් ඒ ස්වාමිහු නෙළුම් මල මැඩැ ගෙනැ සිටින හෙයින් නො හොත් පරදවන හෙයින්, අළුත් රතු අශොකදළු වෙවුලනා වැන්නැ.

දෙවියෝ විභීෂණ දිව්‍ය රජයා ගේ පා වඳිති. එ කලැ ඔවුන් ගේ වොටුනු අගැ වූ (රතු) මැණික් වලැ රශ්මිය පාද තලයට වැටේ. මේ කරණ කොටැ නෙත පාද තලයෙහි ලතු ගාතා ආකාරයෙක් ප්‍රකාශ වෙයි එ සේ ලතු ගාතා ආකාරය ප්‍රකාශ කළ රතු පාටින් යහපත් පතුලෙන්, ඒ දිව්‍ය රජ තෙම නෙළුම් මල මැඩැ ගෙනැ සිටී; නො හොත් පරදව යි. ඒ දැකැ අළුත් රතු අශොක දළුවට බිය සිතේ. "මෙ තරම් උතුම් වූ නෙළුම් මලට මෙසේ වන කලැ, මට නම් කෙසේ නො වේ ද?"යි සිතෙනු භයට හෙතු වේ. එසේ බිය ගෙනැ ඒ අශොක දළු වෙවුලන්නා වැන්නැ.

විභීෂණ දෙව් රජ පා පිහිටුවා ගෙනැ සිටිනුයේ පද්මාකාර පීඨයෙකැ යැ හෙවත් පිදුමෙකැ ආකාරය ඇති පා පුටුවෙකැ යැ. ඒ පා පුටුව ද පදුම නම් වෙයි. එ හෙයින් "එ හිමි පතුලෙන් සිය පත මඬිති" යි කී කලැ, පයින් පාදපීඨය වූ පද්මය මඩනා බව ද, පාද තලයේ ශොභායෙන් රක්ත පද්මය පරදවන බව ද, එක සේ හැඟෙයි. "සිය පත මඩනා බැවින්" යනු මෙහි ශ්ලෙෂ යි.

රතු අශොක දළු ඉතා මෘදු වන බැවින් සැලීම ස්වභාවය යි. මේ ස්වභාවයෙන් වන සැලීම, "බියෙන් වෙවුලනා වැන්නැ" යි කවීහු උත්‍ප්‍රෙක්ෂා කළ හ. (උත්‍ප්‍රෙක්ෂා කිරීම නම්, ස්වභාවයෙන් වන්නා වූ දැයක්, අන් කිසි හෙතුවෙකින් වන සේ සලකා ගැන්ම යි.)

දෙව් රජු ගේ පතුල්, රතු නෙළුම් මලට ද අළුත් රතු අශොක දළුවට ද වඩා ශොභාසම්පන්න බව මෙයින් හැඟැවිණ.

**විසඳුම්:-**

1. **බඳනා-** මෙහි මේ 'සාත්තා වූ' යන අර්ථ ඇත්තේ ය.

2. **සොබමල-** මේ 'මෘදු' 'මනොහර' යනාදි අර්ථයන්හි වැටේ. මේ තන්හි ලැබෙනුයේ මනොහරාර්ථය යි.

3. **ලතු-** රතු ලා සායට මේ නම වේ. පුරාතන ස්ත්‍රීහු මෙය දිය කොට පතුල්හි ගෑහ. ජම්බුද්වීපයේ ඇතැම් ස්ත්‍රීහු දැනුදු එසේ කෙරෙති. 'ලතු'- 'අලතා'- 'ලා'- යන නම් සමානාර්ථ යැ. 'ලතු' 'අලතා'- යන දෙක සංස්කෘත 'අලක්ත' යන්නෙන් ද 'ලා' යනු 'ලාක්‍ෂා' යන්නෙන් ද ආයේ යැ.

4. **මඬනා-** 'මඬ' ධාතුව ඇක්මීම යැ, මිර්කීම යැ, පෑරුදූවීම යැ යනාදි අර්ථයන්හි වැටේ. මෙහි ඇක්මීම යැ පෑරුදූවීම යැ යන දෙ අරුත මැ ගැළපේ.

5. **සියපත-** ඇතැම් දෙවරූපයෝ පද්මපීඨයක් මත්තෙහි සිටින සේ බැඳෙති. 'සියපත' යන්නෙන් මෙ තන්හි ගැනෙන එක් අර්ථයක් නම් මේ 'පද්මපීඨ' යනු යි. 'පදුම' යනු අනෙක් අර්ථය යි.

88. **වෙසෙසින් පහන් පැහැසර ගැඹුරු පිවිතු — රැ**
**බැලුවන් ඇලුම් කරවන සළි ද බියක — රැ**
**සිරි පින් රුවන් පිරි එ සුරිඳු සයුරු සු — රැ**
**මුවෙකින් කියා නිමැවියැ හැකි රුසි — රැ**

වෙසෙසින් පහන්, පැහැසර, ගැඹුරු, පිවිතුරු, බැලුවන් ඇලුම් කරවන, සළි ද බියකරු, සිරි පින් රුවන් පිරි, සයුරු අයුරු එ සුරිඳු රුසිරු, මුවෙකින් කියා නිමැවියැ හැකි ද?

**වෙසෙසින්-** විශෙෂයෙන්, **පහන්-**ප්‍රසන්න වූ, **පැහැසර-** ප්‍රභාස්වර වූ, **ගැඹුරු-** ගම්භීර වූ, **පිවිතුරු-** පවිත්‍ර වූ, **බැලුවන්-** අවලොකනය කළවුන්, **ඇලුම් කරවන-**ප්‍රේම ඇති කරවන්නා වූ, **සළි දු-**තැවැත්‍ ද, **බියකරු-** භයඞ්කර වූ, **සිරි-**ලක්‍ෂ්මිය ගෙන් හා, **පින්-** මඞ්ගලසම්මත වූ, **රුවන්-** රත්නයන් ගෙන් ද, නො හොත් **සිරි-** ශ්‍රී යැ, **පින් රු-** පුණ්‍ය ලක්‍ෂණ යැ **වන්-**වර්ණ යැ, යන මෙයින්, **පිරි-** පූර්ණ වූ, **සයුරු අයුරු-** සාගරය හා සමාන වූ, **එ සුරිඳු-** ඒ සුරෙන්ද්‍රයා ගේ, **රු සිරු-** රූපශ්‍රීය, **මුවෙකින්-** එකමුඛයෙකින්, **කියා-** කථනය කොට, **නිමැවියැ හැකි ද?** සමාප්ත කළ හැක්කේ ද?

අතිශයින් පැහැදුණා වූ, දීප්තිමත් වූ, ගැඹුරු වූ, පිරිසුදු වූ, බැලූ අය (තමාට) ප්‍රිය කරන්නා වූ නමුත් බියකරු ද වූ, ලක්‍ෂ්මිය ගෙන් හා මඞ්ගලසම්මත වූ රත්නත්‍රයන් ද, නො හොත් ශ්‍රීයෙන් ද පින් ලකුණින් ද (ශරීර) වර්ණයෙන් ද සම්පූර්ණ වූ, සාගරය වැනි වූ, ඒ දිව්‍ය රාජයා ගේ රූපශ්‍රීය එක කටින් කියා කෙළවර කළ හැකි ද?

ඒ දෙව් රජ සාගරය වැන්නා. දිව්‍ය රාජ සාගර යන උභය පක්‍ෂය මැ· විශෙෂයෙන් ප්‍රසන්න යැ, දීප්තිමත් යැ, ගැඹුරු යැ පිරිසුදු යැ, බැලුවනට ප්‍රියකර යැ, නමුත් බියකරු ද වෙයි. දෙව් රජ ශ්‍රීසෞභාග්‍ය යැ පුණ්‍ය ලක්‍ෂණ යැ ශරීර වර්ණ යැ යන මෙසින් පිරුණේ යැ. සාගරය ලක්‍ෂ්මිය ගෙන් ද මඞ්ගල සම්මත වූ, රත්නයන් ගෙන් ද පිරුණේ යැ.

ප්‍රථම ද්විතීය පාදයන්හි වූ විශෙෂණයෝ, පදවශයෙනුදු අර්ථවශයෙනුදු, දිව්‍යරාජ සාගර යන දෙපක්‍ෂයට මැ සාධාරණ වෙති. "සිරි පින් රුවන් පිරි" යනු දිව්‍යරාජ පක්‍ෂයෙහි එක් අර්ථයක් ද, සාගර පක්‍ෂයෙහි අනෙක් අර්ථයක් ද දෙයි.

**විපසණ්:-**

1. **වෙසෙසින් පහන්**– මෙහි ප්‍රසන්න භාවය නම් පැහැදි බව හෙවත් සුප්‍රකාශ වැ පෙනෙන බව යි. දෙව් රජු සාගරය මෙන් සුප්‍රකාශ වැ පෙනේ. 'පහන්' යන්නෙහි 'සතුටු වූ' යන අර්ථය ද, දිව්‍යරාජපක්‍ෂයට සුදුසු වේ.

**පහන්**– යනු 'පහද' (පැහැදුම්හි) ධාතුයෙන් වූ අතීතකෘදන්ත පද යි. 'පහද' ධාතුව අකර්මක වූ තන්හි පහදී- පහදිති- පහනි- පහනු- ඈ විසින් වරනැගේ. අතීත කෘදන්තපදය ද 'පහනු' යනු යි. එහි අන්ත්‍යස්වරලෝපයෙන් 'පහන්' යනු නිපන,

2. **පැහැසර**– දිව්‍යරාජ සාගර යන දෙපක්‍ෂය මැ එක සේ කාන්තිමත් බව මෙයින් හැඟැවිණ.

3. **ගැඹුරු**– දිව්‍යරාජයා ගේ ගම්භීරත්වය වනුයේ ගුණඥතාදිය නොමිනිය හැකි වන බැවිනි. සාගරයා ගේ ගම්භීරත්වය සුව්‍යක්ත යි.

4. **පිවිතුරු**– දුෂ්ටක්‍රියා- අසත්පුරුෂසෙවනාදීන් වැළැක්කෑ සිටි බැවින්, දෙව් රජ පවිත්‍ර යැ. අපවිත්‍ර ද දුරු කරන බැවින් සාගරය පවිත්‍ර වේ.

5. **බැලුවන් ඇලුම් කරවන සළි දු බියකරු**– ප්‍රසන්නභාව ප්‍රභාස්වරත්ව පවිත්‍රතා යනාදීන් දෙපක්‍ෂය මැ ඇලුම් කටයුතු වෙති. ගම්භීරත්වයෙන් දෙපක්‍ෂය මැ භයඞ්කර වෙයි. දෙව් රජු ගේ භයඞ්කරත්වයට තෙජස් ආදිය ද, සාගරයෙහි භයඞ්කරත්වයට චණ්ඩ සත්ත්වයන් ඇති බව ආදිය ද හෙතු වෙයි.

6 **සිරි පින් රුවන් පිරි**– දෙව් රජ ශ්‍රීයෙන් ද පුණ්‍ය ලක්‍ෂණයෙන් ද, ශරීරවර්ණයෙන් ද පිරුණේ යැ. මෙහි 'ශ්‍රී' නම්, සෞභාග්‍යසම්පත්ති ය යි. පුණ්‍ය ලක්‍ෂණ නම්, පුණ්‍යභාවය හඟවන්නා වූ ශරීරලක්‍ෂණ යි. 'රූ+වන්' යනු 'රුවන්'යි සන්ධි වෙයි. රූ+සිරි' යන්නෙන් 'රුසිරි' යනු මේ නයින් නිපන. සාගරය වනාහි ලක්‍ෂ්මිය ගෙන් ද, මඞ්ගලසම්මත වූ රත්නයන් ගෙන් ද සම්පූර්ණ යැ. මෙහි 'ලක්‍ෂ්මී' නම් ශ්‍රීකාන්තා යැ. ඕ සාගරයෙන් ආවා යැ. ස්වකීය වල්ලභ වූ විෂ්ණුහු 'සමුදුර දියට වැදූ නනනා දරණ වැලු පිටැ' සැතැපෙන කලැ, ඇය ගේ ද වාසස්ථානය සාගරය වෙයි. 'පින්

රුවන්' හෙවත් මඞ්ගලසම්මත රත්නයෝ නම් කෞස්තුභපාරිජාතාදිය හා මණිමුක්තාදීහු යි. 'පින්' යන්න පවිත්‍රාර්ථයෙහි ද වැටේ. එ හෙයින් 'පින් රුවන්' යන්නෙන් 'පවිත්‍ර රත්න යැ' යන අර්ථය ද ලැබේ.

7. **රුසිරු**- 'රූපශ්‍රී' යන්න සිංහලයෙහි 'රුසිරි' යි සිටියැ යුතු වේ. නමුත් 'රුසිරු' යන්න ද යෙදෙන බව මෙ තැනින් පෙනේ. මේ පෙරළීය එළිසම කව් බැඳීමෙන් නිපනැයි හැඟේ.

'සිත් කලු' යන අර්ථයෙහි වැටෙන 'රුචිර' යන්නෙන් 'රුසිරු' යන්න ද 'රූපශ්‍රී' යන්නෙන් 'රුසිරි' යන්න ද, සිංහලයට ආයේ යැ. 'රුසිරි' යන්න 'රුසිරී' යි ද සිටී. 'රුසිරු' 'රුසිරි' යන දෙක අවුල් කැරැ ගැන්මෙන් 'රූපශ්‍රී' අර්ථයෙහි ද 'රුසිරු' 'රුසිරු' යන ශබ්ද දෙක යෙදෙන්නට වී යැ.

**89. ලෙව හට තමන් නම කිව රිසි දෙන වි සිති**
**දෙව තුරු සුරබි සුර මිණි සරි ද කෙලෙ සිති**
**ප ව රෝ දුකුදු දුරැ ලන පොකුරඹ හ සිති**
**දෙ ව වෙද ඇසෙන පමණෙකි විශතුන් බ සිති**

තමන් නම කිව ලෙව් හට රිසි දෙන විසිහි දෙව් තුරු සුරබි සුර මිණි කෙලෙසිනි සරි ද? පව් රෝ දුකුදු පොකුරු අඹ හසිහි දුරැ ලන, දෙව් වෙද විශතුන් බසිහි ඇසෙන පමණෙකි.

**තමන් නම**- තමන් ගේ, (විභීෂණ යන) නාමය, **කිව**- උච්චාරණය කළ හොත්, **ලෙව් හට**- ලොකවාසීනට, **රිසි දෙන විසිනි**- අභිමතාර්ථය දානය කිරීම් වශයෙන්, **දෙව් තුරු**- දිව්‍ය වෘක්‍ෂය ද, **සුරබි**- කාමධෙනුව ද **සුර මිණි**- චින්තාමණිය ද, **කෙලෙසිනි**- කවර ප්‍රකාරයෙකින්, **සරි ද**-සමාන වේ ද? **පව් රෝ දුකුදු**-පාප රොග දුඃඛයන් **ද, පොකුරු අඹ හසිනි**- පුෂ්කරාම්බුව පරිද්දෙන් (පුෂ්කර හෙවත් පද්ම පත්‍රය ජලය දුරැ ලන්නාක් මෙන්), **දුරැ ලන**- දූරීභූත කරත් මැ හෙවත් දුරු කරන කල්හි, **දෙව් වෙද**- දෙව වෛද්‍යයන්, **විශතුන් බසිනි**- ව්‍යක්තයන් ගේ භාෂායෙන්, **ඇසෙන පමණෙකි**- ශ්‍රවණ විෂය වන මාත්‍රයෙක් මැ යි.

තමන් ගේ නාමය කියුව හොත්, ලොකයාට කැමැති කැමැති දෑ දෙන හෙයින්, දිව්‍ය වෘක්‍ෂ සුරභිධෙනු චින්තා මාණික්‍ය යන මොහු, කෙසේ නම්, (මේ දෙව් රජු හා) සමාන වෙත් ද? පාප රොග දුඃඛයන් ද නෙළුම් පත දිය සේ, දුරු කරත් මැ, දිව්‍ය වෛද්‍යයන්, පණ්ඩිතයන් ගේ වචනයෙන් ඇසෙන පමණෙකි.

මේ දෙව් රජ, තමා ගේ නම කී පමණින් මැ, ලොකයාට කැමැති කැමැති සම්පත් දෙන බව ද, දිව්‍ය වෛද්‍යයන් ද පරදවා, ලොකයා ගේ පවින් උපන් රොගදුඃඛයන් පවා දුරැ ලන බව ද මෙයින් හැඟැවිණ. දිව්‍යවෘක්‍ෂ- සුරභිධෙනු- චින්තාමාණික්‍යයන් ගෙන් අභිමත සම්පත්ති ලැබියැ හැක්කේ ඔවුන් වෙතට ගොස්

ගෞරව දක්වා යාච්ඤා කිරීමෙති. මේ දෙව් රජු ගේ නම කී පමණින් මැ කැමැති දෑ ලැබෙන හෙයින්, ඒ දිව්‍ය වෘක්ෂාදීහු මොහුට කෙසේ නම් සරි වෙත් ද? දිව්‍ය වෛද්‍යවරයෝ ද ත්‍රිදොෂයෙන් උපන් රොගදුඃඛයන් මැ දුරු කෙරෙති. පූර්ව ජන්මයෙහි කළා වූ පාප කර්මයෙන් උපන් රොග දුඃඛයන් නැති කිරීමෙහි ඔහු දු අපොහොසත්තු යැ. මේ දෙව් රජ වනාහි පවින් උපන් රෝදුකුදු නැති කෙරෙයි. එබඳු රොගයක් වූ තන්හි දෙව් වෙදුන් ගේ නම කියනු ඇසෙන පමණෙකි. රොග විනාශයට ඔවුන් ගෙන් නම් කිසි මැ පිහිටෙක් නැති.

1. **රිසි දෙන විසිනි**– 'රිසි දීමෙන්' යනු මෙහි නත්හි ගැනෙන අර්ථය යි. "'විසින්' යනු කතු විබත්හි පර වැ යෙදෙති" යි කියන්නහුට, මේ මදක් ගැටමුනු නැතෙකි. 'විසින්' යනු 'වස' යන නාමය 'ඉන්' විබත් ගැනී මෙන් නිපන. 'මා විසින්' යන්නෙහි අර්ථය නම් 'මගේ වශයෙන්' යනු යි. ඉතින් කතු විබත ගත්තේ 'මා'යනු ද? නැත හොත් 'විසින්' යනු ද? "අනුවල් පොත හවුරුදු හත් සියයකට පෙර ලියැවුණෙකැ" යි කියා එ පවණින් මැ සතුටු වන, නිරොගත සිත් ඇත්තවුනට මෙබඳු තැන් නො පෙනේ.

2. **දෙව් තුරු**– දිව්‍ය ලොකයෙහි ඇතැයි යන පසව වෘක්ෂයෝ 'දෙව් තුරු' (දෙවතරු– දෙවවෘක්ෂ) නම් වෙත්.

"පඤ්චෛතෙ දෙවතරවො මන්දාරඃ පාරිජාතකඃ
සන්තානඃ කල්පවෘක්ෂශ්ච පුංසි වා හරිචන්දනම්"

යනුයෙන් දැක්වුණු (1) මන්දාර, (2) පාරිජාත, (3) සන්තාන, (4) කල්පවෘක්ෂ, (5) හරිචන්දන යන මේ පසව දෙවවෘක්ෂයෝ යැ. මොවුනතුරින් කල්ප වෘක්ෂය කල්පිතාර්ථයන් (අභිමත දෑ) දෙති යි යෙති.

3 **සුරබි**– 'සුරභි' යනු අභිමතාර්ථදානය කරන ධෙනුවට නමි. මැය ද දෙව් ලොවැ ඇතැයි යෙති. කිරි මුහුදින් පහළ වූ චතුර්දශරත්නයන් ගෙන් එකෙකි.

4. **සුර මිණි**– මේ අභිමතාර්ථදානය කරතැයි යන මාණික්‍යයෙකි. 'චින්තාමණි' යනු සාමාන්‍යයෙන් මෙයට වැටෙන නම යි. දෙවියන් ගේ මැණිකක් වන හෙයින්, 'සුර මිණි' නම යෙදිණැයි හැගේ. චින්තාමාණික්‍යය දිව්‍යලොකයෙහි ඇති සේ සැලැකුණු බව—

"ද න දෙන සැටි අප ගෙන් දුනැ ගෙනෑ මෙබ ඳු
ද න දෙන රඟ කරව යි යන මෙන් පුරු ඳු
ද න දෙනු දුටැ මොහු සුර මිණි සුර තුරු ඳු
ද න නො ලැබෙන සුරපුර ගිය වැනි පසි ඳු"

යන හංස සන්දෙශ පද්‍යයෙන් පෙනේ. අලගියවන්න මුකවෙටි තුමෝ "චින්තාමාණික්‍යය ද කිරි මුහුදින් පහළ වී යැ" යි සිතූ හ. ඒ බව ඔවුන් ගේ—

"උ චි ඳු කිරණ අලලන සඳ නැගී සොබ න
න රි ඳු අමා සිතු මිණ සුර තුර රුණෙ න
සි හි ඳු වන තෙපල සින අනට යොදමි න
ප සි ඳු මෙ කිමි මැවු වැනි මහ බඹු විසි න"

යන පද්‍යයෙන් පළ වේ.

5 **පව් රෝ දුකුදු-** පාපමලයෙන් ඇති වන රෝ දුක් පව් රෝ දුකුයි. එයට ඔඳුබ නැති. 'දුක්+දු' යන තන්හි 'උ'කාරාගමයෙන් 'දුකුදු' යනු වී. සිදතෙහි නැතත් සවරාගමය සි යි.

6. **පොකුරඹ හසිනි-** පාළියෙහි 'පොක්ඛර' යනු පදමයට නම්. එයින් ආ 'පොකුරු' යනු ද ඒ අර්ථයෙහි වැටෙනුයේ මෙ තන්හි අභෙදොප චාරයෙන් පියුම් පත (නෙළුම් කොළය) හඟවයි. පදුමපත්‍ර තෙමේ ජලය නිරායාසයෙන් දුරු කෙරෙයි. 'හස්' යනු අංකාරාර්ථයෙහි වෙයි.

7. **දෙව් වෙද ඇසෙන පවණෙකි විශතුන් බසිනි-** මෙහි 'විශතුන් බස්' නම් වෙදපුරාණාදිය කළවුන් ගේ ද, කවීන් ගේ ද, වචන යි. වෙදපුරාණාදියෙහි මේ දෙවවෙද්‍යයන් ගේ නම් සඳහන් වේ. කවීහු ද නොයෙක් විටැ ඒ නම් දක්වත්. එ හෙයින් "මෙබඳු දෙවවෙද්‍යයෝ ඇත්තා හ" යනු අසන්නට ලැබේ.

**දෙව වෙද්‍යයෝ** නම් දෙවියනට වෙද කම් කරන්නෝ යැ. ඔහු සූර්යපුත්‍ර යමජයෝ (නිවුන්නු) යැ; 'අශ්වින්' (අශ්වපුත්‍ර) 'නාසත්‍ය' (න+අසත්‍ය= අසත්‍ය නොවන) 'කුමාර' 'ස්වර්වෛද්‍ය' යනාදි නාමයන් ගෙනුදු ගැනෙති; වෙද කමෙහි අතිදක්‍ෂයෝ යැ. ඔහු වරක් වෘද්ධ වැ මරණාසන්න වූ 'ච්‍යවන' නම් ඍෂිහු තරුණබවයට පැමිණවූ හ.

සූර්යයා ගේ භාර්යා වූ 'සංඥා' තොමෝ සිය පිය නිවෙසට යැමට වරක් සැමියා ගෙන් සමු ඉල්වා, නොලත් හෙයින් තමා වැනි මෑ වූ අන්‍ය ස්ත්‍රියක මවා ඇය සැමියා වෙතැ රඳවා ගියා යැ. මේ බව නොදත් සූර්ය තෙමේ, ස්වප්‍රියාව පෙරලා ආ කලැ, ඇය නො පිළිගත. සංඥා විපිළිසර වැ, වෙළඹ වෙසක් ගෙනැ ඒ ඒ තන්හි ගියා යැ. පසු කාලයෙකැ කරුණු තත්වූ පරිද්දෙන් දත් සූර්ය තමා බිරින්දූ වෙළඹ වෙසින් හැසිරෙන බව දැකැ, තෙමේ අස් වෙසින් ගොස් ඇය හා විසී යැ. මෙසේ වැදැ ලත් යමජදරුවෝ 'අශ්විත' නම් දෙවවෙද්‍යයෝ වූ හ.

90. ම න් පිනවන යස සිරි තෙද නැණ විපු ල
සෙන් සුදු ජය රජ බව තනතුරු සිය ල
දෙ න් නෙත් පැතු විටැ සුබ වැඩ දිගා බ ල
පි න් නම් සත කල දෙව් රජ මැ යැ මෙ ක ල

මන් පිනවන විපුල යස සිරි තෙද නැණ සෙන් සුදු ජය රජ බව තනතුරු, සියල සුබ වැඩ දිගු ආ බල, පැතු විටැ දෙන්නෙන්, සත කල පින් නම්, මේ කලැ දෙව රජ මැ යැ.

**මන් පිනවන-** චිත්තානන්දකර වූ, **විපුල-** මහත් වූ, **යස-** කීර්ති යැ, **සිරි-** ඓශ්වර්ය යැ, **තෙද-** තෙජස යැ, **නැණ-** ඥානය යැ, **සෙන්-** සේනාව යැ, **සුදු ජය-** යුද්ධයෙහි ජය යැ, **රජ බව-** රාජ භාව යැ. **තනතුරු-** ස්ථානාන්තර යැ යන, **සියල-**සියල්ල ද, **සුබ වැඩ-**මඞ්ගලාභිවෘද්ධිය ද, **දිගු ආ-**දීර්ඝායුෂ ද, **බල-** ශක්තිය ද; **පැතු විටැ-** ප්‍රාර්ථිත කාලයෙහි, **දෙන්නෙන්-** ප්‍රදානය කරන

හෙයින්, **සත කළ**- සත්ත්වයා විසින් කරන ලද, **පින් නම්**-පුණ්‍යය නම්, **මෙ කලැ**- මෙ කාලයෙහි, **දෙව් රජ මැ යැ**- (මේ) දිව්‍යරාජයා මැ යි.

සිත සතුටු කරන්නා වූ මහත් වූ කීර්තිය යැ, ඓශ්වර්‍ය්‍යය යැ, තේජස යැ, ශූරය යැ, සේනාව යැ, යුද්ධයෙහි ජය යැ, රජ සිරි යැ තනතුරු යැ යන සියල්ල ද, යහපත් වූ අභිවෘද්ධිය ද, දීර්ඝායුෂ ද, ශාන්තිය ද, ප්‍රාර්ථනා කළ කල්හි දෙන හෙයින්, සත්ත්වයා විසින් (පූර්ව ජාතියෙහි) කරන ලද පින නම්, මේ කාලයෙහි (මේ විශිෂ්ට) දිව්‍ය රාජයා මැ යැ.

"සත්ත්වයන් කළ පිනෙහි ඉෂ්ට විපාකය නම් මේ දෙව් රජ යැ" යි නො කියා, ඵලොපචාරයෙන් "පින නම් දෙව් රජ මැ යැ" යි කී හ.

**විශේෂණ:-**

1. **මන් පිනවණ**- 'පිනවන' යනු 'පින' (සන්තොස්හි) ධාතුයෙන් නිපන් වර්තමාන ප්‍රයොජ්‍ය කෘදන්ත පද යි. 'පින' ධාතුව අකර්මක යි. එ හෙයින් ප්‍රයොජ්‍යයෙහි යෙදිණ. මෙහි පි යේ මත යි. මන පිනවනුයේ යසසිරි යනාදිය යි.

**91.** **තු න් ලෝ තමා නතු කළ රවුළු සොහොවු රැ**
**තු න් කල් බලා රම්ඳුව වූ ඉවු මිතු රැ**
**තු න් වේ ඇදුරු පුලත්‘සි කුලැ මිණි මිතු රැ**
**තු න් විමෙකැ මැ වඳු එ සුරිඳු පා තඹු රැ**

තුන් ලෝ තම් නතු කළ රවුළු සොහොවුරු, තුන් කල් බලා රම්ඳුව ඉවු මිතුරු වූ, තුන් වේ ඇදුරු පුලත් ඉසි කුලැ මිණි මිතුරු, එ සුරිඳු පා තඹුරු, තුන් විමෙකැ මැ, වඳු.

**තුන් ලෝ**-ලොකත්‍රයය, **තමා**- තම හට, **නතු කළ**-වශග කළා වූ, **රවුළු**- රාවණයා හට, **සොහොවුරු**- සහෝදර වූ, **තුන් කල් බලා**- කාලත්‍රයය පරීක්ෂා කොටැ, **රම්ඳුව**- රාමචන්ද්‍රයා හට, **ඉවු මිතුරු වූ**-ඉෂ්ට මිත්‍ර වූ, **තුන් වෙ**-ත්‍රිවෙදයෙහි, **ඇදුරු**- ආචාර්‍ය්‍ය වූ, **පුලත් ඉසි**- පුලස්ති මහර්ෂිහු ගේ, **කුලැ**- වංශයට, **මිණි මිතුරු**- මණි මිත්‍ර (මැණික් පහනක්) වූ, **එ සුරිඳු**- ඒ සුරෙන්ද්‍රයා ගේ, **පා තඹුරු**- පාද පද්මයට, **තුන් විමෙකැ මැ**- වාරත්‍රය යක් මැ, **වඳු**-නමස්කාර කරව.

තුන් ලොකය තමාට යටත් කොටැ ගත්තා වූ රාවණයා ගේ සහෝදර වූ, තුන් කාලය බලා රාම කුමාරයා හට ප්‍රිය මිත්‍ර වූ, තුන් වෙදයට ආචාර්‍ය්‍ය වූ පුලස්ති ඍෂිහු ගේ වංශයට මැණික් පහනක් වූ, ඒ දිව්‍ය රජයා ගේ පාද නමැති පියුම්, තුන් වාරයක් මැ වඳුව.

සකල ලොකත්‍රයය දිනූ රාවණයාට සහෝදර වූ බව කීමෙන්, බලවත් බව නිසා වැඳියැ යුතු බව දක්වූ හ. "රාවණ නම් පරදාර හරණය කළ දුෂ්ටයෙකැ; එ හෙයින් බලවත් වුව ද දුෂ්ටයකුට කවර හෙයින් නමස්කාර කළ යුතු ද?" යන චෝදනාව සලකා, රාම කුමාරයාට ඉෂ්ට මිත්‍ර වූ බව සඳහන් කිරීමෙන්, යුක්ති පක්ෂය භජනය කළ ධර්මිෂ්ඨයකු වන බැවින් වැඳියැ යුතු බව හැඟවූ හ. "පුලස්ති සෘෂිහු ගේ කුලය බබළවන්නෙකැ" යි පැවැසීමෙන්, මැඳුම් ලබන බ්‍රාහ්මණ වංශයෙහි උපන් හෙයින් වැඳියැ යුතු බව ප්‍රකාශ කළ හ. මෙසේ තුන් අයුරෙකින් මැ වැඳියැ යුත්තහු "තුඟ් විටෙකැ මැ වඳුම්"යි අවසාන කොටැ කී හ

**විපසණ:-**

1. **තුන් ලෝ නමා නතු කළ රවුළු සොහොවුරු-** රාවණ තෙම පුලස්ති සෘෂිහු ගේ පුත්‍ර වූ විශ්‍රවස්හු ගේ පුතෙකැ. ඔහුට හිස් දසයෙකි; අත් විස්සෙකි; සතර පයෙකි. හෙතෙම බ්‍රහ්මයා පහදවනු පිණිස, හවුරුදු දසදහසක් උග්‍ර වූ තපස් කෙළේ යැ. එක් එක් හවුරුදු දහසැ කෙළවරැ තමා ගේ එක් එක් හිස සියතින් කපා බ්‍රහ්මයාට පිදී යැ. දස වන හවුරුදු දහසැ කෙළවරැ, ඔහු දස වන හිස කපන්නට සැරසෙනු හා සමග මැ බ්‍රහ්ම තෙමේ පැහැදැ, ඔහු ගේ ආයාචනා පරිදි, ඔහු දෙවියකු විසින් හෝ අන්‍ය වූ අසුරාදි භූතයකු විසින් හෝ නොමැරිය හැක්කකු කෙළේ යැ. මිනිසුන් නො සැල කිය යුතු වන බැවින්, රාවණ තෙම ඔවුන් විසින් නොමැරිය හැකි බවක් නො ඇදී යැ. මේ වරලාභයෙන් ගර්විත වූ හෙතෙම සකල ලොකය පෙළී යැ. දෙවියෝ ඔහු ගේ මෙහෙවරට ආ හ. මහාභූතයෝ ද ඔහුට සේවය කළෝ යැ. ඉන් මුළු තුන් ලොව මැ දිනී යැ.

එක් වරක් ඊශ්වරවාසස්ථාන වූ කෛලාසය අතින් ඔසවන්නට තැත් කෙළේ යැ. ඊශ්වර ඔහු ගේ අත් මිරිකෙන සේ පර්වතය මැඩී යැ. රාවණ මහ හඬින් ගුගුරමින් දහසක් හවුරුදු ඊශ්වරයාට ස්තොත්‍ර කෙළේ යැ. මෙසේ රාව පැවැත්වූයෙන් ඊශ්වර ඔහුට 'රාවණ' නාමය දීන. ස්තොත්‍රයෙන් ප්‍රසන්න වැ ඔහු ඒ දුකින් මුදු මිදී යැ.

පසු කාලයෙකැ රාවණ, රාම කුමාරයා ගේ භාර්යා වූ සීතාව පැහැරැ ගෙනැ ආ බැවින්, කුපිත වූ රාම කුමාරයා විසින් යුද්ධයෙහි දී මැරිණ.

2. **තුන් කල් බලා රම්ඳුට වූ ඉටු මිතුරු-** අතීත වර්තමාන අනාගත යන කාලත්‍රයය තුන් කලි. අතීතය බලා නම් සොහොයුරු රාවණයා අනැ වරද බව දැන. වර්තමානය බලා රාක්ෂසයන් වැනසෙන සේ දැන. අනාගතය බලා මිදු වූ ද සහනයක් ලැබීමට නම් යුක්තියෙහි පිහිටා රාමයා හා මිත්‍ර විය යුතු බව දැන. මෙසේ දැනැ විභීෂණ, රාමයාට ඉෂ්ටමිත්‍ර වී.

රම්ඳු- (රම් + ඉඳු) හෙවත් 'රාමචන්ද්‍ර' නම් අයෝධ්‍යායෙහි දශරථ රජහු ගේ දෙටු පුත් යැ. ජනක රජු ගේ දූ වූ අතිශය රූපසෞභාග්‍යයෙන් යුක්ත වූ සීතාව රාමචන්ද්‍රයා ගේ භාර්යා වූව. දශරථ රජු ගේ 'කෛකෙයී' නම් වූ තුන් වන බිසොව අඹකීය පුත් භරත කුමාරයාට රාජ්‍යය ඉල්වූයෙන්, පියා ගේ කැමැත්ත වූ පරිදි රාම කුමර ප්‍රවාසයට හා, ලක්ෂමණ කුමරු ද සමඟ වනයට ගියේ යැ. රාවණ රජ දිනෙක කුමරුන් නැති විටෙකැ, සීතාව පැහැරැ ගෙනැ පැලැ යැ. රාම කුමර හනුමත් සුග්‍රීව ආදි වානරයන් ගේ සහායත්වය ලැබැ,

සයුරු සරහා සෙතක් බැඳ, ලංකාවට අවුත් රාවණයා යුද්ධයෙහි දී මරා සීතාව හැරගෙන ගියේ ය. හේ අයෝධ්‍යාවෙහි බොහෝ කලක් දැහැමින් ජන රඤ්ජනය කෙළේ.

රාවණයා විසින් පෙළනු ලැබූ දෙවියන් තමන් දුකින් මුදන ලෙස විෂ්ණු දෙවියා යැදී බව ද, මනුෂ්‍යයකු හැර අන් කිසිවකු විසින් රාවණයා නො මැරිය හැකි වන බැවින්, විෂ්ණු දෙවියා, රාවණසංහාරය පිණිස දශරථ රජුට පුතු වැ උපන් බව ද රාමායණාදියෙහි දක්වේ.

'රම්ඳු' යන තන්හි 'ඉඳු' යනු මනුපර්‍යාය යි.

3 **තුන් වෙ ඇදුරු**- මේ 'පුලතිසි' යන්නට විශේෂණ යි. ඍග් යජුස්, සාමන් යන වේදත්‍රයයට අංගී වන බැවින් පුලස්ති ඍෂිහු හට 'තුන් වෙ ඇදුරු' යනු යෙදෙයි (1) ඍග්වේදය නම් මණ්ඩල දශයකට බෙදුණු ඡන්දොබද්ධ ස්තොත්‍රරාශියෙකි. මේ, දඹදිව් වැස්සන් ගේ අතිපුරාණ ග්‍රන්ථ යැ යි සැලැකේ. යාගයන්හි දී මේ ස්තොත්‍රයෝ කියැවෙති. (2) යජුර්වේදය යාගමන්ත්‍ර සමූහයෙකින් යුක්ත යි. මේ මන්ත්‍ර සමූහය කෘෂ්ණ සහ ශුක්ල යැ යි දෙ කොටසකට බෙදේ. (3) සාමවේදය යාගස්තොත්‍රගීතිකා සමූහයෙකි. මෙය බ්‍රාහ්මණ නම් වූ කොටස් අටෙකින් යුක්ත යැ.

4 **පුලතිසි කුලැ මිණි මිතුරු**- "පුලස්ති ඍෂිහු ගේ වංශය නමැති ගෘහයට මැණික් පහනක් වූ" යනු අර්ථ යි. දෙවියනට සතුරු වූ රාවණයා පුලස්තිවංශයා අපකීර්තියට පමුණුවා අඳුරු කෙළේ යැ. නමුත් විභීෂණ, දෙවියනට මිත්‍ර වැ, යළි දු ස්වකීය වංශය නමැති ගෙය ආලෝක කෙළේ යැ. යම් සේ ගෙය පහනින් ශොභාසම්පන්න වේ ද, එමෙන් මැ පුලස්ති වංශය විභීෂණ දෙවයා කාරණ කොටැ ගෙනැ කීර්තිමත් විය. එ හෙයින් හේ 'පුලතිසි කුලැ මිණි මිතුරෙක්' මැ යැ.

**'පුලස්ති'** නම් මහාබ්‍රහ්මයා ගේ සිතින් උපන් ඍෂිවරයෙකි හේ ප්‍රජාපතීන් කෙනෙකු ද, සප්තර්ෂීන් කෙනෙකු ද ඇතුළත් යැ. 'පුලස්ත්‍ය' යනු ද නම වේ.

**'කුල'** යනු මෙ තන්හි 'වංශ' 'ගෘහ' යන අර්ථ දෙක්හි මැ වැටේ. එ හෙයින් ශ්ලෙෂ යි.

'සහාය' 'සුයී' 'ප්‍රදීප' යනාදි අර්ථයන්හි වැටෙන **'මිතුරු'** සදින් මෙ තන්හි ලැබෙනුයේ ප්‍රදීපාර්ථ යි. මිණියෙන් කැරුණු මිතුරු මිණි මිතුරු (රත්නප්‍රදීප) යි.

## (12) සමෙදහස.

**92.** අනතුරු බලා අදහස අවසර විග ස
සුහුසුළු නොවී සලකා පසු පලමු බ ස
පෙරදුරි කොටැ සුරිඳුට කියු වදන් ගො ස
සැල කර න ගිය කවයුතු සිටැ එකත් ප ස

අනතුරු අදහස අවසර විගස බලා, සුහුසුළු නො වී, පසු පලමු බස සලකා, එකත් පස සිටැ, සුරිඳුට කියු වදන් ගොස පෙරදුරි කොටැ, නගිය කව්යුතු, සැල කර.

**අනාතුරු-** අනන්තර වැ හෙවත් (ඊට) පසු වැ, **අදහස-** (සුරේන්ද්‍රයා ගේ) අධ්‍යාශය ද, **අවසර විගස-** අවකාශ ක්ෂණය ද, **බලා-** අවලෝකනය කොට, **හුහුසුලු නොවී-** හිඳුගිලි (ඉක්මන්) නො වැ, **පසු පලමු බස-** පරවූ ද පූර්ව වූ ද වචනය, **සලකා-** විමර්ශනය කොට, **එකත්පසැ සිට-** එක් පාර්ශ්වයෙක් හි සිටින වැ, **තිසු වදන් ගොස-** ස්තුති වචන ඝෝෂණය, **පෙරදූරි කොට-** පූර්වංගම හෙවත් පෙරටු කොට, **තා ගිය කටයුතු-** තා ගියා වූ කාර්ය්‍යය, **සැල කර-** ආරෝචනය කරව හෙවත් දන්වව.

(දිව්‍ය රාජයා ගේ පා වැඳීමට) අනතුරු වැ, අදහස ද අවකාශයක් ඇති මොහොත ද බලා, ඉක්මන් නො වී, පසු පලමු වචන විමසා, එක් පාර්ශ්වයෙක්හි සිට, දිව්‍ය රාජයාට ස්තුති වචන කීම පෙරටු කොට, තා ගියා වූ කටයුතු දන්වව.

**විවරණ:-**

1. **අනාතුරු-** (අ+අතුරු) අතුරු නො තබා අනතුරු. අව්‍යයනාමාඛ්‍ය පදයෙකි. 'බලා' යන පූර්වක්‍රියා නිපාතයට විශේෂණ වෙයි. ඇතැමෙක් තත්භාවබෝධය නො කොට අනන්තරශබ්දාර්ථයෙහි ද 'අනතුරු' යනු යොදති.

2. **අදහස-** සුරිඳු ගේ අදහස. ඒ වේලායෙහි දී සන්දේශය ඇසීමට කැමැති අකැමැති බව යනාදිය.

3. **අවසර විගස-** අන් කටයුතු ආදියෙන් සම්බාධයක් නැති වැ, අවකාශයක් ඇති වූ මොහොත. 'විගස' යනු ක්ෂණාර්ථයෙහි වැටෙන නාමපදයෙකි.

4. **හුහුසුලු නො වී සලකා පසු පලමු බස-** හුහුසුලු වීම නම් හිඳුගිලිභාවයෙන් යුක්ත වීම යි. ඇතැම් තැනෙක ඒ හුදුසු වෙයි; මෙ තන්හි හුසුදුසු යැ. ඉක්මන් වූ කල, අග මුල නො ගැලපෙන වචන ද කියැවෙයි. එ සේ නොවන පිණිස ඉක්මන් නො වියැ යුතු බව ද, "පසු වැ කියන වචනය පලමු කී වචනය හා ගැලපේ ද" යනාදිය සැලකියැ යුතු බව ද හැඟවූ හ.

5. **පෙරදූරි කොට සුරිඳුට තිසු වදන් ගොස-** 'තිසු වදන් ගොස' නම් ස්තුතිවචන ශබ්ද නගා කීම යි. පෙරදූරි කිරීම නම් මුල් කිරීම යි. අන් කිසිවක් කියන්නට පලමු ස්තුතිවාක්‍යයක් කියන ලෙස මෙයින් අනුශාසනය කළ හ.

6. **එකත්පසැ සිට-** දෙස් අටෙකින් දුරු වැ සිටි කල එකත් පසැ සිටියා නම් වෙයි. ඒ දෙස් අට—

"න පච්ඡතො න පුරතො නාපි ආසන්නදූරතො
න කච්ඡෙ නො පටිවාතෙ න චා'පි ඔනතු'න්නතෙ
එතෙ දොසෙ විවජ්ජෙත්වා එකමන්තං'ති වුච්චති"

යනුවෙන් දක්වන, "පිටු පස, ඉදිරි පස, ලඟ, දුර, සුළං එන අත, සුළං යන අත, මිටි තැන, උස් තැන යන මේ දෙස් හැර එකත් පසැ යැ යි කියති" යනු අර්ථ යි.

93. තර සර සුනෙර තද තෙද දිමුතු දිවසු ර
පුව තර ගැඹුරු සමුදුර කැලුම් නිල'ඹ ර
සොම්බර පවර නිසයුර නුවණැ සුර ගු ර
සුර වර සැරද විහිසණ නම් කැලණි පු ර

තර සරු සුනෙර, තද තෙද දිමුතු දිවසුර, පුවතර ගැඹුරු සමුදුර, කැලුම් නිල් අඹර, සොම් බරු පවර නිසයුර, නුවණැ සුර ගුර, කැලණි පුරු විහිසණ නම් සුර වර, සැර දෙ.

**තර**- ස්ථිර වූ, **සරු**- සාර භාවයෙහි, **සුනෙර**- මහාමේරු පර්වතය, **තද තෙද**- සන්බාධ වූ තේජසෙහි, **දිමුතු**- දීප්තිමත් වූ, **දිව සුර**- සූර්ය, **පුවතර**- ප්‍රසිද්ධ වූ, **ගැඹුරු**- ගාම්භීර්යයෙහි, **සමුදුර**- සමුද්‍රය, **කැලුම්**- කාන්තියෙහි, **නිල් අඹර**- නීලාකාශය, **සොම් බරු**- සෞම්‍ය භාරයෙහි, **පවර**- උතුම් වූ, **නිසයුර**- නිශාකරය, **නුවණැ**- ඥානයෙහි, **සුර ගුර**- බෘහස්පතිය, **කැලණි පුරු**- කල්‍යාණී පුරයෙහි, **විහිසණ නම්**- විභීෂණ නම් වූ, **සුර වර**- දේවෝත්තමය, **සැර දෙ**- බොහෝ කාලයක්, **ජීවත් වව.**

ස්ථිරවූ සාරභාවයෙහි මහාමේරු පර්වතයාණෙනි, තද වූ තේජසෙහි බබලන්නා වූ සූර්යයාණෙනි, ප්‍රසිද්ධ වූ ගැඹුරු බැවෙහි සමුද්‍රයාණෙනි, කාන්තියෙහි නිල් වූ ආකාශයාණෙනි, බර වූ හෙවත් අධික වූ සෞම්‍ය ගුණයෙහි උතුම් වූ චන්ද්‍රයාණෙනි, ඥානයෙහි සුරාචාර්යයාණෙනි, කල්‍යාණී පුරයෙහි විභීෂණ නම්වූ දෙවෝත්තමයාණෙනි, බොහෝ කල් ජීවත් වව.

පූර්ව පද්‍යයෙහි, "පෙරදැරි කොටැ සුරිඳුට තියු වදන් ගොස" යි කී හෙයින්, පෙරදැරි කළ යුතු වූ ස්තුති වාක්‍යය මෙයින් දැක්වූ හ. එක් එක් ගුණයෙහි ලං සමාන වනුවන් ගේ නමින් ආදියෙහි ආමන්ත්‍රණය කොටැ, කෙළවරු සුරරද නමින් අමතා, ආශිර්වාද කළ හ.

**ටිප්පණී:-**

1. **තර සර සුනෙර**- මෙහි සාරය නම් ශක්තිය යි. "ස්ථිර වූ ශක්තියෙහි මහාමේරුව" යි ආමන්ත්‍රණය කළ කලැ ලැබෙනුයේ, "ස්ථිර වූ ශක්තිය කරණ කොටැ ගෙනැ මහාමේරුව වැනි වූ තැනැත්ත" යන අර්ථ ය යි. 'තර' යන විශේෂණයෙන් මේ දිව්‍යරාජයා ගේ ශක්තිය නොවෙනස් වැ පවත්නා බව හැඟැවිණ. පස් වන (ආධාර) විබත් ගත් 'සරු' යන පදයෙහි අන්ත්‍යස්වරය එළි පිණිස 'අ'කාර බවට පමුණුවන ලද. 'සොම් බරු' යන තන්හි දු මේ පෙරළිය වී.

'සුනෙර' හෙවත් මහාමේරුව නම්, "මහාසාගර මධ්‍යයෙහි පිහිටි යැ" යි ඇතැම් පුරාතනයන් සැලැකූ පර්වතයෙකි. "එහි උස එක් ලක්‍ෂ අට සැට දහසක් යොදුනැ" යි ද "ඉන් අඩක් මුහුද ගැලී සිටියේ යැ" යි ද, 'මුදුන්හි තව්තිසා දෙව් ලොව් හා පත්ලෙහි අසුර භවනය පිහිටි යැ" යි ද කියත්. මහ මෙර මඳකුදු නො සැලී සිටුනා හෙයින්, ස්ථිර වූ ශක්තියට කවිහු එය උපමා කෙරෙති.

2. **පාද පොදු දිමුතු දිවගුර**- තේජස නම් තවත ගුණය යි. මේ ගුණයෙන් සූර්යා අග්‍ර වන හෙයින්, උපමානයට ගේ ගැනිණ.

3. **නැලුම් නිල'ඹර**- විභීෂණ දිව්‍යරාජයා ශරීරවර්ණයෙන් ආකාශයට සමාන වන හෙයින් මෙසේ කීහ.

4. **සොමි බර පවර නිසගුර**- 'සොමි' නම් සෞම්‍ය ගුණය යි. 'බර' යනු අධිකාර්ය දීමට යෙදිණ. සෞම්‍යත්වයෙන් සඳ නොපරදනා හෙයින් ඒ උපමිත යි.

5. **නුවණැ සුර ගුර**- බෘහස්පති තෙමේ දෙවියනට ගුරු වෙයි. මහත් නුවණ ඇති හෙයින්, නැණවත්නට උපමාන කැරෙයි.

6. **සුරවර සැරද**- 'සුභෙර' 'ගැඹර' 'පවර' යන පද හා සම්බන්ධ වැ සිටුනා පිණිස 'සැරද' යනු 'සද සැර' යි ගෙනැ කළ ශුද්ධියෙකුදු වෙයි. 'සද සැර' යනු අතිශයින් ශාස්ත්‍රීය වතුදු, පොත්හි නොඅං හෙයින් ද, 'සැරද' යන්නෙහි අර්ථය නොඅඩු වැ ලැබෙන හෙයින් ද, මෙහි වෙනසෙක් නො කැරිණ.

94. රජ කුල සුපුල් විලැ රජ හස වන් සර නා
පෙර මල 'විසා වන රුසිරින් මන නඳ නා
හැම කල විපුල සව් සැපතින් නොඅඩු ව නා
තෙද බල විකුම් ගුණ මිණ' බරණින් තෙවු නා

රජ කුල සුපුල් විලැ සරනා රජ හස වන්, මන නදනා රුසිරින්, පෙර මල්අවිසා වන්, හැම කලැ විපුල සව් සැපතින් නො අඩු වනා, තෙද බල විකුම් ගුණ මිණි බරණින් තෙවුනා- (මතු සම්බන්ධ යි.)

**රජ කුල**- රාජවංශ නමැති, **සුපුල් විලැ**- සුප්ඵුල්ල වූ (පද්ම) තඩාගයෙහි, **සරනා**- සඤ්චරණය කරන්නා වූ, **රජ හස වන්**- රාජහංසයකු වැනි වූ. **මන නදනා**- මනෝනන්දනීය වූ, **රුසිරින්**- රූපශ්‍රියෙන්, **පෙර මල්අවිසා වන්**- පූර්ව පුෂ්පායුධයා වැනි වූ, **හැම කලැ**- සියලු කාලයෙහි, **විපුල**- මහත් වූ, **සව් සැපතින්**- සකල සම්පත්තියෙන්, **නොඅඩු වනා**- ඌන නොවන්නා වූ, **තෙද බල විකුම් ගුණ**- තේජෝබල වික්‍රම ගුණ නමැති, **මිණි බරණින්**- මණ්‍යාභරණයන් ගෙන්, **තෙවුනා**- විරාජමාන වූ, (මතු සම්බන්ධ යි.)

95. ගරු තර නන්නුරු තුනයා නමැ'ති මැ ති
සිහි කැර. නිතර මහ පුද පඬුරැ දී රැ ති
නො විසිර ඔබට දන්වන ලෙස කී සිතැ ති
සුර වර මදක් කල් එ පවත් ඇසිසැ යු ති

ගරුතර නන්නුරු තුනයා නමැති මැති නිතර සිහි කැර. රුති මහ පුද පඬුරු දී, සිතු ඇත, නො විසිරැ ඔබට දන්වන ලෙස, කී සුරවර, එ පවත් මදක් කල් ඇසිසැ යුති.

**ගරු තර**- අතිශයින් ගරු වූ, **තන්නුරු තුනයා නම් ඇති මැති**- තන්නුරු තුනයා නම් වූ මන්ත්‍රී තෙම, **නිරතුරු**- නිරන්තරයෙන්, **සිහි කොට**- (ඔබ වහන්සේ) සමරණය කොට, **රුති**- අභිමත වූ. **මහ පුද පඬුරු**- මහත් වූ පූජාප්‍රාභෘතයන්, **දී**- දානය කොට, **සිතැ ඇති**- සිතෙහි වූ අභිප්‍රායය, **නො විසිර**- විසිරී නො කොටැ හෙවත් සාවධාන වැ, **ඔබම**- ඔබ වහන්සේට, **දන්වන ලෙස**- සැල කරන මෙන්, **කී**- කීයේ යැ. **සුරවර**- දෙවෝත්තමයාණෙනි, **එ පවත්**- ඒ ප්‍රවෘත්තිය, **මඳක් කල්**- ස්වල්ප කාලයක් මුළුල්ලෙහි, **ඇසිය සුති**- ශ්‍රවණය කටයුතු යැ.

94 වන 95 වන පද්‍යයන් ගෙන් යුග්මකයෙක් වෙයි. 95 වන පද්‍යයෙන්, තන්නුරු තුනයා නම් අමාත්‍ය තුමා විභීෂණ දෙවියාට දන්වන්නට කී ප්‍රවෘත්තියක් ඇති බව ද, 94 වන පද්‍යයෙන් ඒ තන්නුරු තුනයා නම් අමාත්‍යයා කෙබඳු කෙනෙක් ද යනු ද, කී හ.

(94) රාජ කුලය නමැති මනා වැ පිපුණු වූ විලෙහි හැසිරෙන රාජහංසයකු වැනි වූ, සිත් පිනවන්නා වූ රූපශ්‍රිය කරණ කොටැ ගෙනැ පුරාතන අනඞ්ගයා වැනි වූ, සියලු කල්හි මහත් වූ සියලු සම්පත්තීන් අඩු නොවන්නා වූ, තෙජෝබල වික්‍රම ගුණ නමැති රත්නාභරණයෙන් බබලන්නා වූ, (95) ඉතා ගරු වූ තන්නුරු තුනයා නම් අමාත්‍ය තෙම, නිතර (ඔබ වහන්සේ) සිහි කොටැ, කැමැති වූ මහත් පුද පඬුරු දී, එකග සිතින් ඔබ වහන්සේට දන්වන ලෙස සිතෙහි ඇත්ත (සිතෙහි ඇති අදහස) කීයේ යැ. දෙවෝත්තමයාණෙනි, ඒ ප්‍රවෘත්තිය ස්වල්ප වේලාවක් අසනු වොත් යහපති.

**විපසණ:- (94)**

1. **රජ කුල සුපුල් විලැ රජ හස වන් ස න**- තන්නුරු තුනයා ඇමැති තුමා, රාජකුලය නමැති මනා සේ පිපුණු විලෙහි හැසිරෙන රාජ හංසයකු වැන්නැ. මෙයින් හැඟැවෙනුයේ මේ ඇමැති තුමා නිසා රාජකුලය විශේෂයෙන් ශෝභාවත් වන බව යි. පිපුණු වූ නෙළුම් මල් ඇති විලෙකැ රාජ හංසයකු හැසිරීම මහත් අලඞ්කාරයෙකි. එමෙන් මැ රාජකුලයෙහි මෙබඳු ඇමැති තුමකු ඇති වීම, ඒ කුලයට මහත් ගෞරවයක් ගෙනෙයි.

2. **පෙර මල්විසා වන් රූ සිරින් මනනඳන**- මල් අවි වූයේ යමකුහට ද හේ මල්'වි යි. මේ අනඞ්ගයාට නම් එවි. පුරාතන කාමීනු සිතෙහි උපදනා ශෘංගාර දෙවියකු කොටැ ගෙනැ, අඞ්ගයක් හෙවත් ශරීරයක් නැති හෙයින් 'අනඞ්ග' යැ, සිත මත් කරවන හෙයින් 'මදන' යැ, සිත කැළඹන හෙයින් 'මන්මථ' යැ, මරන හෙයින් 'මාර' යැ, රාගය වන හෙයින් 'කාම' යැ, සිත්හි උපදනා හෙයින් 'මනසිජ' යැ. යනාදි වශයෙන් නම් දුන් හ. පසු කාලයෙකැ මේ දෙවියා සම්පූර්ණ කරනු පිණිස, ඔහුගේ දුනු දඬුව උක් ගසෙකැ යි ද, දුනු දිය මී මැසි වැලෙකැ යි ද, හී මල් පසෙකැ යි ද, ධ්වජය මත්ස්‍යයෙකැ යි ද,

භාර්යාව 'රති' යැ යි ද, යහළුවා වසන්තකාලය යැ යි ද, කී හ. ශර නොහොත් හී ලෙස ගැනෙන මල් පස නම් -

"අරවින්දමශෝකඤ්ච චූතඤ්ච නවමල්ලිකා
නීලෝත්පලඤ්ච පඤ්චෛතෙ පඤ්චබාණස්‍ය සායකාඃ"

යනුයෙන් දැක්වුණු (1) නෙළුම්, (2) අශෝක, (3) අඹ, (4) ගස්පෙති ද සමන්, (5) නිල් මානෙල් යන මේ යැ. මල් පසෙකැ නාමින් මෙසේ දැක්වුණේ, රාගය කරණ කොට ගෙනැ සිතෙහි උපදනා අවස්ථා පසැයි ඒ පස නම් —

"උන්මාදනස්තාපනශ්ච ශෝෂණඃ ස්තම්භනස්තථා
සම්මෝහනශ්ච කාමස්‍ය බාණාඃ පඤ්ච ප්‍රකීර්තිතාඃ"

යනුයෙන් කියැවුණු (1) උමතුව, (2) තැවීම, (3) වියැළීම, (4) ගල් ගැසුණාක් මෙන් අත්පා අකර්මණ්‍ය වීම, (5) මුළාව, යන මේ යැ.

බුද්ධ චරිතයෙහි 'මාරයුද්ධයෙහි' යි දැක්වුණේ මේ අනඞ්ගයා මැඩැ පැවැත්වීමම සිහිත් කැරුණු යුද්ධය යි.

මෙහි පෙර මලවියා ගැනුණේ කවර හෙයින් ද?

වරක් අනඞ්ගයා ඊශ්වරයා විසින් දැවිණ. දැවෙන්නට පෙරැ හේ අතිශයින් විසිතුරු වූ රූපසම්පත්තියෙන් යුක්ත වූයේ යැ. දෙවියන් ගැදමෙන් ඊශ්වරයා ගෙන් යළි දු දිවි ලැබැ ගත් නමුත් අනඞ්ග තෙමේ පෙරැ මෙන් රූපසම්පත්තියෙන් යුක්ත නො වී යැ. එ හෙයින් මෙහි ලා 'පෙරැ මල'වියා' ගැනිණි.

අනඞ්ගයා ඊශ්වරයා විසින් දැවුණු පරිදි කිසේ යැ යත්:—

පෙරැ තාරක නම් අසුරයෙක් මහා තපස් කොට, ඉපැද සත් දිනක් ඉක්මැවුවකු විසින් නොමැරිය හැකි වන සේ මහාබ්‍රහ්මයා ගෙන් වර ලද. ඉක්බිති හේ මහාබල වැ තුන් ලොව පෙළී සැ..දු තට පැමිණි දෙවියෝ ඔහු මඩිනා ලෙස බ්‍රහ්මයා යැදිය හ. "ඊශ්වරයා හට පුත්‍රකු වුව හොත්, හේ තාරකයා උපන් සත් දිනෙන් මරන්නේ යැ" යි බ්‍රහ්ම කී. මේ ඇසූ දෙවියෝ, ඊශ්වරයා රාගයෙන් මත් කොට, හිමාලයපුත්‍රී වූ උමාව ගේ සමීපයට පමුණුවන ලෙස, අනඞ්ගයා යෙදූ හ. අනඞ්ග "මැනැවැ" යි කියා ගොස්, දිනක් උමාව මලින් ඊශ්වරයා පුදමින් සිටියැ දී, 'සම්මෝහන' නම් වූ තමා ගේ ශරයට ඊශ්වරයා ලක් කෙළේ යැ. ඊශ්වරයා ගේ ධෛර්‍යය ලිහිල් වී යැ. එයට හේතු සිලන ඊශ්වර, දණ බිම ඇණැ දුනු දිය සැක දැක්වා ඇදූ මිදි මත මැ සිටි අනඞ්ගයා දැක, කුපිත වැ, තමා ගේ ලලාටාක්ෂියෙන් වහ්නිජ්වාලාවක් නිකුත් කොට, ඔහු භස්ම කෙළේ යැ.

අනඞ්ගයා භස්ම වුව ද, දෙවියන් ගේ අභිමතාර්ථසිද්ධිය නුවූයේ නො වේ. ඊශ්වර පාර්වතිය පාවා ගත. ඔවුනට උපන් 'ස්කන්දකුමාර' නම් පුත් ඉපැද සත් දින ක් නො ඉක්මවා, දෙවසේනාව පිරිවරා ගොස් තාරකයා මැරී යැ.

දෙවියන් ගේ යැදුම් පරිදි, ඊශ්වර තමා ගේ ආවාහදිනයෙහි අනඞ්ගයාට දිවි දින.

3. කොඳසිල සිකුම් ගුණ මිණි බරණින්- පත්නුරැ තුනයා ඇමැති කුමාට රත්නාභරණ වනුයේ තේජෝබලවික්‍රම ගුණ යි. හේ රත්නාභරණයෙන් නොපලඳනේ නො වේ. නමුත් බෙහෙවින් ශෝභමාන වනුයේ

තෙජෝබලවික්‍රම ගුණ කරණ කොට ගෙන යැ. එ හෙයින් තෙජෝබල වික්‍රම ගුණ නමැති රත්නාභරණයෙන් ඔහු බබලන බව කියැවිණ.

'තෙද' නම් කිමෙක් ද යනු පෙරැ දක්විණ. 'බල' නම් ශක්තිය යි. 'විකුම්' නම් වීරභාවය යි. 'ගුණ' යනුයෙන් දයාක්ෂමාදිය ගැනේ. ගුණයත් ආභරණ වන බව පැවැසිණ—

"නරස්‍යාභරණං රූපං රූපස්‍යාභරණං ගුණාඃ
ගුණස්‍යාභරණං ඥානං ඥානස්‍යාභරණං ක්ෂමා"-යි.

4. **තෙවුන**- 'තෙවු' (බැබැළුම්හි) ධාතුයෙන් වූ වර්තමාන විශෙෂණ කෘදන්තපද යි. 'තෙවු' ධාතුව තෙවී- තෙවිති- තෙවි- ඈ විසින් වරනැගේ.

**ටිප්පණි**:— (95)

1 **ගරුතර**- (සංස්කෘත- 'ගුරුතර') අතිශයින් ගරු වූයේ ගරුතර යි. 'ගරු' යන්නෙහි අර්ථ නම් 'උසස්'- 'මහත්'- 'බුහුමන් කළ යුතු'- 'පිදිය යුතු' යනාදිය යි.

2. **නන්නුරු තුනයා නමැති මැති**- පැරැකුම්බා රජුණත් දූ ලෝකනාථා කුමරිය ගේ ස්වාමි වූ ද්‍රාවිඩ කුමාරයා යැ. දෙවෙනි ජයබාහු නමින් රජ වූයේ මොහු ගේ පුත්‍රයා යැ.

'නන්නුරු තුනයා'යනු දෙමළ 'නන්නූර් තුණෛනයාර්'යන්නෙන් ආයේ යැ.

3. **නො විසිරැ**- 'අන්‍යවිෂයිත නො වැ' හෙවත් 'අන් දූයකට ඇදුණු සිත ඇත්තකු නො වැ' යනු අර්ථ යි. "මේ සඳෙස කියන කලැ, සිත එහි මැ යොදා කියව" යි නියම කැරුණු බව මෙයින් හැඟැවිණ

'විසිරැ' යි සිටියැ යුතු තන්හි, අනන්‍ය 'ඇ'කාරය එළි පිණිස 'අ'කාර බවට පැමිණි යැ. 'විසිරැ' යනු 'විසුරු' (විසිරීමෙහි) අකර්මක ධාතුයෙන් සිද්ධ වූ පූර්වක්‍රියා නිපාත යි. මේ ධාතුව වරනැගෙනුයේ විසුරී- විසුරිති- විසිළි- විසුළු- ඈ විසිනි.

4. **සිතැති**- සිත+ඇති. මෙහි 'ඇති' නම් ඇත්ත යි, හෙවත් ඇති වූ දූය යි.

**ඉක්බිති පද්‍ය සතෙකින් යුත් කුලකයෙක් වෙයි.**

**96. රිවි කුල ළමැණි ගොත් පිරිසුදු ගුවන් මැ ද**
**පැහැ දුල සර කල් පත් සහසකර බ ද**
**කිවි කැල ගලට මුතු හර වන් යස පබ ද**
**සිරි කල කුල නිවෙස් දියැ පතල තද තෙ ද**

රිවි කුල ළමැණි ගොත් පිරිසුදු ගුවන් මැදූ සර කල් පත් පැහැ දුල සහසකර බඳ, යස පබඳ කිවි කැල ගලට මුතු හර වන්, සිරි කල කුල නිවෙස්, තද තෙද දියැ පතල— (මතු සම්බන්ධ යි.)

**රිවි කුල**-සූර්‍යවංශයෙහි වූ, **ළමැණි ගොත්**-ලම්බකර්ණගොත්‍ර නමැති, **පිරිසුදු**- පරිශුද්ධ වූ, **ගුවන් මැදූ**- ගගන මධ්‍යයෙහි, **සරා කල්**- ශරත්කාලයෙහි, **පත්**- පැමිණියා වූ, **පැහැ දුල**- ප්‍රභායෙන් ජ්වලිත වූ, **සහසකර බඳ**- සහස්‍රකිරණයා බඳු වූ, **යස පබඳ**-

යශඃප්‍රබන්ධය (කීර්ති සමූහය), **කිවි කැල**- කවි සමූහයා ගේ, **ගලම**- ග්‍රීවාවට, **මුතු හර වන්**- මුක්තාහාරයක් වැනි වූ, **සිරි කල**- ශ්‍රී කාන්තාව ගේ, **කුල නිවෙස්**- කුලනිවාස වූ, **තද තෙද**-ඝනබද්ධ වූ තේජස, **දිසැ**-ලෝකයෙහි, **පතල**-ව්‍යාප්ත වූ- (මතුසම්බන්ධ යි.)

**97.** හ ළ දුසිරිත් දැනැ තෙවලා මුනිඳු බ ණ
කොළ පත් සියල් අවි සිප් කව් නළු සත’ ණ
බ ළ මොළ රුපුන් දප මැඩැ පෑ උපා නැ ණ
කා ළ මුළු ලක් දිව එක සේ සත් සෙව ණ

තෙවලා මුනිඳු බණ දැනැ දුසිරිත් හළ, සියල් අවි සිප් කව් නළු සත් අණැ කොළ පත්, උපා නැණ පෑ ඔළ මොළ රුපුන් දප මැඩැ, මුළු ලක් දිව එක සේ සත් සෙවණැ කළ— (මතු සම්බන්ධ යි.)

**තෙවලා මුනිඳු බණ**- ත්‍රිපිටක බුද්ධ වචනය, **දැනැ**- අවබෝධ කොටැ, **දුසිරිත්**- දුශ්චරිතයන්, **හල**- අත්හැරියා වූ, **සියල් අවි සිප් කව් නළු සත් අණැ**-සකලායුධශිල්ප කාව්‍ය නාට්‍ය හා ශාස්ත්‍ර නමැති සමුද්‍රයෙහි, **කොළ පත්**- කොටිප්‍රාප්ත වූ, **උපා නැණ**- උපාය ඥානය, **පෑ**- ප්‍රකාශ කොටැ, **ඔළ මොළ**- ප්‍රචණ්ඩ වූ, **රුපුන්**- ශත්‍රූන් ගේ, **දප**- දර්පය, **මැඩැ**- මර්දනය කොටැ, **මුළු ලක් දිව**- සමස්ත ලඞ්කා ද්වීපය, **එක සේ සත් සෙවණැ**- එක ශ්වේතච්ඡත්‍රච්ඡායායෙහි, **කළ**- (ස්ථාපිත) කළා වූ- (මතු සම්බන්ධ යි.)

**98.** සත නෙතැ දුන් රූ සිරි රස අ ඳුන්වන
පත නර ලොවැ පුරඳර සිරි හ ඳුන්වන
විකුමෙන් දඹදිවැ නිරිඳුන් මු ඳුන්වන
අප පැරකුම් නිරිඳුට දූ ළ ඳුන්වන

රූ සිරි සත නෙතැ දුන් රස අඳුන් වන, නර ලොවැ පත පුරඳර සිරි හඳුන්වන, විකුමෙන් දඹදිවැ නිරිඳුන් මුඳුන් වන,. අප පැරකුම් නිරිඳුට දූ ළඳුන් වන— (මතු සම්බන්ධ යි.)

**රූ සිරි**- රූපශ්‍රීය, **සත**- සත්ත්වයන් ගේ, **නෙතැ**- නේත්‍රයෙහි, **දුන්**- දානය කළා වූ, **රස අඳුන් වන**- රසාඤ්ජනයක් හා සමාන වූ, **නර ලොවැ**- මනුෂ්‍ය ලෝකයට, **පත**- පැමිණියා වූ, **පුරඳර**- පුරන්දරයා ගේ හෙවත් ශක්‍රයා ගේ, **සිරි**- ශ්‍රීය, **හඳුන් වන**- ප්‍රත්‍යභිඥානය කරවන්නා වූ, **විකුමෙන්**- වික්‍රමය කාරණ කොටැ ගෙනැ, **දඹදිවැ**- ජම්බුද්වීපයෙහි, **නිරිඳුන්**-නරේන්ද්‍රයනට, **මුඳුන් වන**- මස්තකප්‍රාප්ත වන්නා වූ, **අප පැරකුම් නිරිඳුට**-අප ගේ පරාක්‍රම බාහු නරේන්ද්‍රයා හට, **දූ ළඳුන් වන**- දුහිතෘ වන්නා වූ— (මතු සම්බන්ධ යි.)

99. සිරි සඳ වන් සව සිරි දියුණු වැ රඳ  නා
සිතු මිණි වන් සැදි සැදි හට දනින් දෙ  නා
සර සවි වන් නුවණින් පහල වැ පෙනෙ  නා
නව සඳ වන් ලෙව වැසි අදරින් වඳ  නා

සව් සිරි දියුණු වැ රඳනා සිරි සඳ වන්, සැදි සැදි හට දෙනා දනින් සිතු මිණි වන්, නුවණින් පහළ වැ පෙනෙනා සරසවි වන්, ලෙව් වැසි අදරින් වඳනා නව සඳ වන්,— (මතු සම්බන්ධ යි.)

**සව සිරි**- සකල ශ්‍රීය හෙවත් සියලු සම්පත, **දියුණු වැ**- ද්වි ගුණ වැ, **රඳනා**- රඤ්ජමාන වූ, **සිරි සඳ වන්**- ශ්‍රී කාන්තාව හා සමාන වූ, **සැදි සැදි හට**- යාචකයු කල කල අයට, **දෙනා**- දානය කරනු ලබන්නා වූ, **දනින්**- ධනයෙන්, **සිතු මිණි වන්**- චින්තාමණියක් හා සමාන වූ, **නුවණින්**- ඥානයෙන්, **පහල වැ පෙනෙනා**- ප්‍රකාශ වැ දෘශ්‍යමාන වූ, **සරසවි වන්**- සරස්වතී හා සමාන වූ, **ලෙව වැසි**- ලෝක වාසීන්, **අදරින්**- ආදරයෙන්, **වඳනා**- නමස්කාර කරනු ලබන්නා වූ, **නව සඳ වන්**- අභිනව චන්ද්‍රයා හා සදෘශ වූ,— (මතු සම්බන්ධ යි.)

100. සෙහෙළින් කෙරේ සකි සැප සමග සි  ත්මේ
කුලුණින් දූසිදසුන් වෙතැ වසින ව  ත්මේ
රකිමින් පතිනි දම් සහපත් සිරි  ත්මෙ
සිගිතෙන් නිපන් වන් දස පින් පැවැ  ත්මේ

සෙහෙළින් කෙරේ සකිසැපසමගසිත්මේ, කුලුණින් දූසිදසුන් වෙතැ වත් මේ වසිනා, පතිනි දම් මේ සහපත් සිරිත් රකිමින් දස පින් පැවැත්මේ සිගිතෙන් නිපන් වන්,— (මතු සම්බන්ධ යි.)

**සෙහෙළින් කෙරේ**- සඛීජනයා කෙරෙහි, **සකිසැපසමග සිත්මේ** - සඛීසම්පත්තිසමග්‍රචිත්තමය වූ, **කුලුණුන්** - කරුණා යෙන්, **දූසිදසුන් වෙතැ**- දුසිදසයන් කෙරෙහි, **වත් මේ**- වස්තු නමැති මේඝය, **වසිනා**- වර්ෂණය කරන්නා වූ, **පතිනි දම්**- පතනී ධර්මය ද, **මේ**- මේධ්‍ය හෙවත් පවිත්‍ර වූ, **සහපත් සිරිත්**-මනොඥ වූ චාරිත්‍රයන් ද, **රකිමින්**- රක්ෂණය කෙරෙමින්, **දස පින්**- දශ පුණ්‍යයෙහි, **පැවැත්මේ**- ප්‍රවර්තනයෙහි, **සිගිතෙන්**- කල්පනා යෙන්, **නිපන් වන්**- උපන්තියක වැනි වූ,- (මතු සම්බන්ධ යි.)

101. මි හි රි තෙපලැ තන් වැසි කිව් සාව් පුරැ  දු
ඉ ති රි බැති පෙමැති පෙල දහමෙහි මුති  දු
නො හැරි පෝයැ අට සිල් රැකුම පිරිසු  දු
ස සි රි ළලකුඩය දේවි හට පසි  දු

මිහිරි තෙපලැ හත් වැසි, කිවි සාමී පුරුදු, මුනිඳු පෙළ දහමෙහි ඉතිරි බැති පෙම් ඇති, පෝයැ පිරිසුදු අට සිල් රැකුම නොහැරි, පසිඳු සසිරි උලකුඩය දේවී හට— (මතු සම්බන්ධ යි.)

**මිහිරි තෙපලැ**- මධුර වචනයෙහි, **හත් වැසි**- සන්තවාසී හෙවත් නොපිටිසර වූ, **කිවි සාමී**- කවිකර්මයෙහි, **පුරුදු**- පරිචිත වූ, **මුනිඳු**- සර්වඥයන් වහන්සේ ගේ, **පෙළ දහමෙහි**- පාලි ධර්මයෙහි, **ඉතිරි**- අතිරික්ත වූ හෙවත් අධික වූ, **බැති පෙම් ඇති**- භක්තිප්‍රෙම ඇත්තා වූ, **පෝයැ**- උපවසථ දිනයෙහි, **පිරිසුදු**- පරිශුද්ධ වූ, **අට සිල් රැකුම**- අෂ්ටාඞ්ගශිලරක්‍ෂණය, **නොහැරි**- වර්ජනය නොකළා වූ, **පසිඳු**- ප්‍රසිද්ධ වූ, **සසිරි**- සශ්‍රීක වූ, **උලකුඩය දේවී හට**- උලකුඩය හෙවත් ලොකනාථා නම් වූ රාජ කුමාරිකාව හට— (මතු සම්බන්ධ යි.)

102\. දි ත් රුපු කිරුළු මල් දම් සුවඳ මී වැ ස
තෙ ත් සිරි පා යුත් සුරිඳුනි තිලෝ ඇ ස
සි ත් පිනවන ඇති ආ සිරි නුවණ ය ස
පු ත් රුවනක් සොඳ දුන මැනැවි නිසි ලෙ ස

දිත් රුපු කිරුළු මල් දම් සුවඳ මී වැසැ තෙත් සිරි පා යුත් තිලෝ ඇස සුරිඳුනි, සිත් පිනවන, ආ සිරි නුවණ යස ඇති, සොඳ පුත් රුවනක්, නිසි ලෙස දුන මැනැවි.

**දිත් රුපු**- දෛත්‍යශත්‍රුන් ගේ හෙවත් අසුරශත්‍රුරන් ගේ, **කිරුළු**- කිරීටයන්හි වූ, **මල් දම්**- මාලාදාමයන් ගේ, **සුවඳ**- සුගන්ධවත් වූ, **මී**- මධුව හෙවත් මකරන්දය, **වැසැ**- වර්ෂණය කොට, **තෙත්**- ආර්ද්‍ර වූ හෙවත් තෙමුණා වූ, **සිරි පා යුත්**- ශ්‍රීපාදයෙන් යුක්ත වූ, **තිලෝ ඇස**- ත්‍රෛලොක්‍ය නෙත්‍ර වූ, **සුරිඳුනි**- සුරේන්ද්‍රයාණෙනි, **සිත් පිනවන**- චිත්තප්‍රීණනය කරවන්නා වූ, **ආ**- ආයුෂ ද, **සිරි**- සම්පත් ද, **නුවණ**- ඥානය ද, **යස**- කීර්තිය ද, **ඇති**- ඇත්තා වූ, **සොඳ**- සුන්දර වූ, **පුත් රුවනක්**- පුත්‍ර රත්නයක්, **නිසි ලෙස**- යොග්‍ය වූ පරිද්දෙන්, **දුන මැනැවි**- ප්‍රදානය කළ මැනැව.

"පැරකුම්බා රජු ගේ දූ වූ ලොකනාථා කුමාරිකාවට, සුරේන්ද්‍රයාණෙනි, පුත් රුවනක් දුන මැනැවැ" යි පද්‍ය සතෙකින් මේ කී පරිදි යි. "කෙබඳු පැරකුම්බා රජුගේ දූ වූ ද" යනු, 96 වන 97 වන 98 වන පද්‍යයන්ගෙන් ද, "කෙබඳු වූ ලොකනාථා කුමාරිකාවට ද" යනු, 99 වන 100 වන 101 වන පද්‍යයන් ගෙන් ද, "කෙබඳු සුරිඳු ද?" යනු හා, "කෙබඳු පුත් රුවනක් ද?" යනු, 102 වන පද්‍යයෙන් ද කියැවිණ.

(96) සූර්ය වංශයට අයත් ලම්බකර්ණ ගොත්‍ර නමැති නිර්මල වූ ආකාශ මධ්‍යයට ශරත්කාලයෙහි පැමිණියා වූ ප්‍රභායෙන් බබලන්නා වූ සූර්යයා වැනි වූ, කීර්ති සමූහය නම් ජන සමූහයා ගේ ග්‍රීවාවට මුක්තාහාරය වැනි වූ, ශ්‍රීකාන්තාව ගේ කුලනිවාසය වූ, තද වූ තේජස ලෝකයෙහි පතළා වූ, (97) සර්වඥයන් වහන්සේ ගේ ත්‍රිපිටක ධර්මය දැන, දුශ්චරිත දුරු කළා වූ, සියලු ආයුධ ශිල්ප කාව්‍ය නාට්‍ය ශාස්ත්‍ර නමැති සාගරයෙහි කෙළවරට පැමිණියා වූ, උපාය ඥානය පෙන්වා ඉතා චණ්ඩ වූ සතුරන් ගේ එඩි බිඳ, සකල ලඞ්කා ද්වීපය එක් සේ සත් සෙවණෙහි පිහිටිවූ, (98) රූපශ්‍රීය සත්ත්වයා ගේ ඇසෙහි දුන් රසාඤ්ජනයක් වැනි වූ, මනුෂ්‍ය ලෝකයෙහි පැමිණි ශක්‍රයා ගේ ආකාරය හඳුන්වන්නා වූ, වික්‍රමයෙන් සකල ජම්බුද්වීපයෙහි රජුනට අග්‍ර වන්නා වූ, අප ගේ පරාක්‍රම නරේන්ද්‍රයාට දූ වන්නා වූ, (99) සියලු ඓශ්වර්යය දියුණු වී රඳන්නා වූ ශ්‍රීකාන්තාව වැනි, යාචක කල කල අය හට දෙන්නා වූ ධනය කරණ කොට ගෙන චින්තාමාණික්‍යය වැනි, ඥානය කරණ කොට ගෙන පහළ වී පෙනෙන්නා වූ සරස්වතිය වැනි, ලෝකවාසීන් ආදරයෙන් වඳින්නා වූ අළුත් සඳ වැනි, (100) යෙහෙළින් කෙරෙහි, යහළු නමෙහි සැපතින් සම්පූර්ණ වූ සිතින් මැවුණු, කරුණායෙන් දුසිදුසයන් කෙරෙහි වස්ත්‍ර නමැති වැස්ස වසින්නා වූ, පතිව්‍රතා ධර්මයත් සිරිසුඳ යහපත් සිරිතුත් රකිමින් දශපුණ්‍යක්‍රියායෙහි පවත්නා සිහියෙන් උපන්නියක වැනි, (101) මිහිරි වචන කීමෙහි දක්ෂ වූ, කාව්‍යබන්ධනයෙහි පුරුදු, බුදුන් වහන්සේ ගේ පාලි ධර්මයෙහි අධික භක්ති හා ප්‍රේම ඇති, පෝය දිනයෙහි පිරිසුදු අට සිල් රැකීම නොවැරැද්දූ, ප්‍රසිද්ධ, ශ්‍රීමත්, ලෝකනාථා රජකුමාරිකාවට, (102) අසුර සතුරන් ගේ හෙවත් දෙවියන් ගේ වොටුනුවලැ මල් දම්හි වූ පුවද (මල්) පැණි වැසැ තෙමුණු ශ්‍රීපාද ඇති තුන් ලොවට ඇසක් වූ සුරේන්ද්‍රයාණෙනි, (ලෝකයා ගේ) සිට සතුටු කරවන්නා වූ, ආයුෂ හා සම්පත් හා නුවණ හා කීර්ති හා ඇත්තා වූ, යහපත්, පුත්‍ර රත්නයක්, සුදුසු ලෙස දුන මැනැවි.

**විපසණ්:-** (96)

1 රිවිකුල **ලමැණි ගොත්** පිරිසුදු ගුවන් මැ ද
පැහැදුල **සරා කල්** පත් සහසකර බ ද

මේ පද්‍යාර්ථයෙන් ලැබෙන සාමාන්‍ය අර්ථය ද, 18 වන ("රිවි බිම්බා පුරු" යනාදි) පද්‍යයෙන් ලැබෙන අර්ථය ද, සමාන වෙයි. මෙහි සූර්ය වංශයට අයත් ලම්බකර්ණ ගොත්‍රය ආකාශය කොට ද, පැරැකුම්බා රජ සූර්යයා කොට ද ගැනිණ. ආකාශය සූර්යයා කරණ කොට ගෙන බබළන්නාක් මෙන්, ලම්බකර්ණ ගොත්‍රය පැරැකුම්බා රජු කරණ කොට ගෙන බබළන බව මෙයින් හැඟැවෙයි,

'ලමැණි' හෙවත් 'ලම්බකණ්ණ' යනු ශ්‍රී මහාබෝධිශාඛාව සමග පැමිණි සුමිත්‍ර කුමරුන් ගෙන් පැවැත ආ රාජපරම්පරාවෙහි නාමය යි. ඒ කුමරුට බිසෝ වූවා 'හත්ථාළ්හක' නම් ආරාමයෙහි විසූ 'සුමනා' නම් කුමරිය යි. මේ පරම්පරාවට 'ගණවැසි' යනු ද නම වෙයි. සද්ධර්මරත්නාකරයෙහි— "කුම්භයෙන් සම්භව වැ ගණී වූ හෙයින් ගණවැසි වංශ යැ යි කියා ද, උභයකුලපරිශුද්ධ වංශගුණයුක්තආචාරශීලයශස්තේජසින් මහත් වැ අලාමක වැ ලම්බකණ්ණ වැ පැවැත ආ හෙයින් ලම්බකණ්ණ වංශ යැ යි කියා ද-" යනාදීන් 'ගණවැසි' යන් නාම ද 'ලමැණි' යන් නාම ද අරුත් දක්විණ. පළමු වැන්න කෙසේ වුව ද, දෙවැන්නට කී අරුත් අතිශයින් ව්‍යාකූල යැ. භද්‍රාරාමයෙහි විසූ සුමනාව ගෙන් පැවැත ආ හෙයින් 'ගණවැසි' නම ද, වංශයෙහි ආදි පුරුෂයා ගේ කන් දික් වූ හෙයින් 'ලම්බකණ්ණ' නම ද, වූ බව සිතිය හැකි වේ. 'ලමැණි' යනු 'ලම්බකණ්ණ' යන්නෙන් ආයේ යැ.

ලම්බකර්ණගෝත්‍රයා ගේ පරිශුද්ධත්වය හැඟැවීමට, උපමානය වූ 'ගුවන්' යන්නට 'පිරිසුදු' යනු විශේෂණ කැරිණ.

'සරා කල්' හෙවත් ශරත්කාලය වප් ඉල් දෙමසින් යුක්ත යැ. මේ කාලයෙහි ආකාශය නිර්මල යැ. එ හෙයින් චන්ද්‍ර සූර්යයෝ අතිශයින් ප්‍රභා සම්පන්න වෙති.

2. **බඳ**- මේ 'බඳු' යනු මැ යැ.

3. **කිවි කැල ගලම මුතු හර වන් යස පබඳ**- මුතු හර නම් අලංකාර කැමැත්තවුන් විසින් ආදරයෙන් සෙවුනා ලබන්නෙකි. "මේ රජු ගේ කීර්ති සමූහය කවිසමූහයා ගේ ග්‍රීවාවට මුතු හර වැන්නැ"යි කීමෙන්, කවීන් විසින් මොහු ගේ කීර්තිය ආදරයෙන් සෙවුනා ලබන බව හැඟැවුනු. මොහු ගේ කීර්ති සමූහය අනෙක කවීන් විසින් ගද්‍යපද්‍යබන්ධනයෙන් වර්ණිත වූ බැවින් මේ යෙදෙයි.

4. **සිරි සැල කුල නිවෙස්**- කුල නිවෙස් නම් ස්වකීය පරම්පරාවට අයත් වූ නිවාසය යි. "පැරැකුම්බා රජ ශ්‍රී කාන්තාවට කුලනිවාසයක් වැන්නැ" යි කීමෙන්, ශ්‍රී කාන්තාව මේ රජු කෙරෙහි මහත් ආදරයෙන් වසන බව හෙවත් මේ රජ සන්තානයෙන් ශ්‍රීමත් බව හැඟැවුනු.

**විපණ්:— (97)**

1. **තෙවලා මුනිඳු බණ**- බුදුන් ගේ ධර්මය විනය යැ සූත්‍ර යැ අභිධර්ම යැ යන පිටක තුනට බෙදේ. 'පිටක' යනුයෙන් සිංහලයට එනුයේ 'වලා' යනු යි.

2. **සොළ පත් සියල් අවි සිප් කව් නළු සතණ**- සියලු ආයුධ ශිල්ප ද, කාව්‍ය නාට්‍ය ශාස්ත්‍ර ද, සාගරයෙක් නම්, පැරැකුම්බා රජ ඒ සාගරයා ගේ පර තෙරට මැ ගියේ යැ "සකල ආයුධ ශිල්ප කාව්‍ය නාට්‍ය ශාස්ත්‍ර යන මෙයින්, පැරැකුම්බා රජ නො දත් දෙයක් නම් නැති" යනු මෙයින් හැඟැවුනු.

**'කාව්‍ය'** නම් ගද්‍යමය වූ හෝ පද්‍යමය වූ වාක්‍යයන් සිත් අලවන පරිදි රචනය කරන අයුරු උගන්වන ශාස්ත්‍රය යි.

**'නාට්‍ය'** නම් නෘත්‍යගීතවාද්‍යයන් පිළිබඳ වැ භරත නම් ඍෂීන් විසින් නිපදවන ලද ශාස්ත්‍රය යි.

'අණ' යනු පාලි 'අණ්ණව' (සංස්කෘත-'අර්ණව') යන්නෙන් ආයේ යැ. 'සාගරය' යනු අර්ථ යි. මේ අර්ථයෙහි 'අණවු' යනු ද ලැබේ.

3. **පැ උපා නැණ**– උපායඥාන නම් සාම, දාන, භේද, දණ්ඩ, යන චතුරුපාය දැන්ම යි. 'සාම' නම් සමඟි වීම යි. 'දාන' නම් සිත් ගන්නා පිණිස යම් යම් දෑ දීම යි. 'භේද' නම් ඔවුනොවුන් බිඳිවීම යි. 'දණ්ඩ' නම් සුදුසු කලැ පහර දීම යි.

4. **කල මුළු ලක්දිව එක සේ සත් සෙවණ**– සකල ලංකාද්වීපය එක රාජ්‍යයකට යටත් කළ බව මෙයින් හැඟැවිණ. ශ්වේතච්ඡත්‍රය (සුදු කුඩය) නම් රාජ්‍යයේ ප්‍රධාන ලක්ෂණය යි. එක් රජකුට අයත් රටෙක ඇතියේ එක් ශ්වේතච්ඡත්‍රයෙකි. පැරකුම්බා රජු ගේ කාලයෙහි සකල ලංකාද්වීපයට මැ ඇති වූයේ ඔහු ගේ ශ්වේතච්ඡත්‍රය පමණෙකි. එක් ශ්වේතච්ඡත්‍රයෙකින් සකල ලංකාව නො වැසියැ හැකි නමුත්, ඒ ශ්වේතච්ඡත්‍රය අයත් රජහු ගෙන් මුළු රට මැ රැකෙන හෙයින්, "මුළු ලක් දිව එක සේසත් සෙවණැ කළ" යනු යෙදෙයි

රජුට අයත් වූ විශේෂ ලක්ෂණයෙන් යුක්ත වූ ශ්වේතච්ඡත්‍ර එකක් මැ වූ නමුත්, "අන් අයට අයත් සුදු කුඩ නො තිබිණැ" යි නො සිතියැ හැකි වේ. මෙහි මැ, 28 වන පද්‍යයෙහි-

"දුල සැරැ සේ සත් මිණි බරණ කිරණින"

යන්නෙන්, සපුමල් කුමරු ද සේ සතක් නංගා ගෙනැ ආ බව දැක්විණ.

ශ්වේතච්ඡත්‍ර තුනක් වූ බව ද ඇතැම් තැනෙකින් පෙනේ. කාව්‍යශේඛර යෙහි-

"මඟුලැතුට නං වා
සේ සත් තුන මැ නං වා
මහත් යස පෙත් වා
නමඳවා බෝ වෙහෙර ගෙත් වා"

යනු එබඳු තැනෙකි.

**ටිප්පණී:— (98)**

1. **සත නෙතැ දුන් රූසිරි රස අඳුන් වන**–රසාඤ්ජනය ඇසට සුව එළවන්නේ යැ. මේ රජු ගේ රූපශ්‍රීය ද දුටු දුටු අය ගේ ඇසට සුව දෙන වන්නේ යැ. රූ සිරි රස අඳුන් යන දෙකින් එක මැ කාර්‍ය සිදු වන බැවින්, මොහු ගේ රූපශ්‍රීය සත්ත්වයන් ගේ ඇසට රසඳුනෙකි. දුටුදුටුවන් පහදවන මනොහර රූපසම්පත්තීන් යුක්ත බව මෙයින් දැක්වූ හු.

2. **පත නර ලොවැ පුරඳර සිරි හඳුන්වන**– "ශක්‍රයා දෙව් ලොවැ වෙසේ; මේ රජ නර ලොවැ වෙසෙයි; වෙනස මෙපමණෙකි; අන් සියළු අයුරින් මේ රජ ශක්‍රයා හා නො වෙනස් යැ" යනු මෙහි භාව යි. මනුෂ්‍යලොකයට පැමිණි ශක්‍රයා හැදිනැ ගැනීමට හෙවත් "මෙබඳු යැ" යි දැනැ ගැනීමට රිසි වී නම්, මේ රජු දුටු කලැ ඒ සමෘද්ධ වේ.

'පුරඳුරු' යනු පාලි සංස්කෘත දෙක්හි සමාන වූ 'පුරන්දර' යන්නෙන් ආයේ යැ. ශක්‍ර, තමා ගේ වජ්‍රායුධයෙන් පුරයන් දරණය විදරණය කරන් හෙන් පුරන්දර නම් වී, පුරඳුරු යනු 'පුරඳර' යි ද සිටී.

**විසඳුම්:-** (99)

1. **සිරි සඳ වන් සව සිරි දියුණු වැ රඳන-** සකල ශ්‍රීය ද්විගුණ වැ හෙවත් අධික වමින් රඳනා හෙයින් ලොකනාථා දෙවිය ද සිරි කත ද සමාන යැ" යනු කී පරිදි යි. ශ්‍රී කාන්තාව මෙන් ලොකනාථා දෙවිය ශ්‍රී සම්පත්තීන් යුක්ත බව මෙයින් හැඟැවූ හු.

2. **සිතු මිණ වන් යැදි යැදි හට දනින් දෙන-** චින්තාමාණික්‍යය මෙන් ලොකනාථාව ද යාච්ඤා කළ කළ අයට ධනදානය කරන බව මෙයින් කියැවිණ. ඇතැමෙක් "යැදි යැදි හට" යනු සුපාඨය සේ ගෙනැ "යාච්ඤා කළා වූ යාචක සමූහයාට" යී අරුත් බෙණෙති. සේ අනුචිත යැ. 'යැදි' නම් යාච්ඤා කරන්නාහු මැ යැ. එ හෙයින් "යැදි" යන විශෙෂණය නුවුවමනා යැ. යදි නොවන්නාහු ද ඇතැම් විටැ යදිති. "යදි හට දෙන" යනුයෙන් ඔවුනට නොදෙන බව හැගෙන හෙයින් ඒ ලොකනාථාව ගේ දාන ගුණයට හීනතා වෙකි. "යැදි යැදි හට දෙන" යනුයෙන් යාච්ඤා කළා වූ කවරක්හු හට වුව ද දෙන බව හැගෙයි.

3. **සරසවි වන් නුවණින් පහල වැ පෙනෙන-** සරස්වතිය ලොකයාට අදෘශ්‍යමාන යැ. ලොකනාථාව වනාහි දෘශ්‍යමාන යැ. මේ වෙනස වන නමුත්, නුවණින් ලොකනාථාව සරස්වතියට සමාන වෙයි, එ හෙයින් ප්‍රකාශ වැ පෙනෙන්නා වූ සරස්වතිය වැනි බව හැඟැවූ හු. "සමානත්වය වනු සේ කිමෙකින් ද" යනු දක්වනු පිණිස "නුවණින්" යනු කී හු.

4. **නව සඳ වන් ලෙව වැසි අදරින් වඳන-** අභිනව චන්ද්‍රයා වැඳීම ලොකචාරිත්‍ර යි. කීයේ මැ නු-

"ප්‍රථමවයසි චන්ද්‍රඃ සර්වලොකෛකවන්ද්‍යඃ"-යි?

"ප්‍රථම වයසෙහි හෙවත් බාලාවස්ථායෙහි සිටියා වූ චන්ද්‍ර තෙමේ, සකල ලොකයා විසින් අවශ්‍යයෙන් වැඳියැ යුත්තේ යැ" යනු අර්ථ යි. මෙසේ වැන්දැ යුතු වූ අභිනව චන්ද්‍රයාට මෙන්, ලොකනාථාවට ද, ලොකවාසීන් ආදරයෙන් නමස්කාර කරන බව මෙයින් දක්විණි.

**විසඳුම්:-** (100)

1. යෙහෙළින් කෙරෙ **සකිසැපසමඟසිත්මෙ-** සකින් ගේ සැප සකිසැප. සකිසැපයෙන් සමඟ වූයේ සකිසැපසමඟ, සකිසැපසමඟ වූයේ ද එ මැ සිත් වූයේ ද සකිසැපසමඟසිත්, සකිසැපසමඟසිතින් මැවුණේ සකිසැපසමඟසිත්මය. 'මය' යනු 'මෙ' යී වීමෙන් 'සකිසැපසමඟසිත්මෙ' යනු ලැබේ. 'සකි සැප' නම් යෙහෙළියන් ගේ සැපත යි. ඒ යෙහෙළියන් ගේ සැපයෙන් සමග්‍ර වූ හෙවත් සම්පූර්ණ වූ සිත 'සකිසැපසමඟසිත' යි. එයින් මැවුණු රුව හැඟැවීමෙන්, යෙහෙළියනට ලොකනාථාව පෙනෙන පරිදි දක්වූ හු. ඇය ඔවුනට පෙනෙනුයේ මස් ලේ පිරුණු සිරුරින් යුත් ස්ත්‍රියක මෙන් නො වේ; යෙහෙළියන් ගේ සැපය ගැනැ මැ සැලැකීමෙන් සම්පූර්ණ වූ සිතින් නිර්මිත වූවක මෙනි. ලොකනාථාව සියලු කල්හි අනූන වූ පිරිසුදු වූ සැප මැ ගෙනැ දෙන්නා වූ යහළු කමින් යුක්ත බව මෙයින් සූචිත යි,

"සකිසැපසමඟසිත්මෙ" යන්නට පුරාණ සන්නයෙහි "සවකීය සම්පත්ති යෙහි සමඟ වැ පවත්නා වූ චිත්තයක් මැ ඇති" යී අරුත් පැවැසිණ. මෙයින් සැබෑ යහළු කමෙක් හැඟැවේ ද?" යනු විමැසියැ යුත්තෙකි. මෙබඳු තැනෙකැ මේ අර්ථයෙහි 'සකි' යනු ද චින්ත්‍ය යි.

2. **රකිමින් පතිනි දම්** යහපත් සිරිත් මේ
**සිඟිනෙනන්** නිපන් වත් **දස පින්** පැවැත් මේ

ලොකනාථාව දස පින් පැවැත්මේ සිඟියෙන් **උපන්නියක** වැන්නෑ. කෙසේ දස පින් පැවැත්මේ සිඟියෙන් ද? පතිනීධර්මය හෙවත් පතිව්‍රතාධර්මය ද යහපත් වූ පිරිසුදු වූ සිරිත් ද රකිමින් දස පින් පැවැත්මේ සිඟියෙනි. පතිව්‍රතාධර්මය හා යහපත් පිරිසුදු සිරිත් රකිමින් දශපුණ්‍යක්‍රියායෙහි පැවැත්ම නොකඩ වැ මැ කරන බව මෙයින් දක්ත යි.

**'පතිනි දම්'** පතිව්‍රතාධර්මය යි. පතිහු කෙවක් හිඳිහු විසින් විසි වූ පරිදි පාවා ගන්නා ලද්දී පතිනි (පත්නී) යි. ඇය ගේ දම් හෙවත් ඇය විසින් රැකියැ යුතු දම් පතිනි දම්. පත්නියක විසින් අන් සියල්ලට මැ වඩා රැකියැ යුතු පතිව්‍රතාධර්මය වන බැවින් එය පළමු කොටැ දක්වූ ය.

'යහපත් සිරිත් මේ' යන තන්හි **'මේ'** යනු සංස්කෘත 'මේධ්‍ය' යන්නෙන් හෝ පාලි 'මෙජ්ඣ' යන්නෙන් හෝ ආයේ යැ. 'පිරිසුදු' යනු අර්ථ යි.

**'සිඟිනෙනන්'** යනු 'සිඟි' ශබ්දය 'එන්' විභක්ති ගත් තැනි. මධ්‍යයෙහි 'න'කාරාගම යි. 'නෙන්' යනු මැ විභක්ති යැ යි ද කියත්. 'සිඟියෙන්' යනු සාමාන්‍ය ව්‍යවහාරයෙහි ලැබෙන පරිදි යි.

ඇතැමෙක් 'සිඟිනෙන්' යනු 'සිඟිණෙන්' යි ලියා 'සිඟිනුවණින්' යි අරුත් පවසති. 'නුවණ' යන අර්ථය දෙන ශබ්දයෙක් 'සිඟිණෙන්' යන තන්හි නැති. 'ඤාණ' ශබ්දයෙන් 'ණෙ' යන්නෙක් නො ලැබේ. ලැබුණ ද 'සිඟිණෙ' යන්න වරනැඟුණු කලැ, 'සිඟිණෙන්' යන්නෙක් කෙසේ ලැබේ ද? මෙහි ලා 'නුවණින්' යනු නුවුවමනා යැ. යම් කිසිවක් අධික කොටැ කරනු දුටු "එහි සිඟියෙන් උපන් වැන්නෑ" යනු මිසැ, "එහි සිඟිනුවණින් උපන් වැන්නෑ" යන්නක් කියනු නො ඇසේ. අධික කොටැ කන, අධික කොටැ නිදන, අය බලා, "මේ කන සිඟියෙන් උපන් වැන්නෑ; මේ නිදන සිඟියෙන් උපන් වැන්නෑ" යනු මැ කියති; කන සිඟිනුවණින් උපන් වැන්නෑ" යනාදියක් නො කියති.

**'දස පින්'** නම්–

"දානං සීලං ච භාවනා පත්තිපත්තානුමොදනා
දෙසනා සවණං පූජා වෙය්‍යාවච්චං පසංසනා"

යනුයෙන් දැක්වුණු (1) දන්, (2) සිල්, (3) භාවනා, (4) පින් දෙනු, (5) පින් අනුමෝදන් වනු, (6) බණ දෙසනු, (7) බණ අසනු, (8) පූජා, (9) වතාවත් කරනු, (10) පසසනු, යන මේ යැ.

**විසඳුම්:-** (101)

1. **මිහිරි තෙපලැ නන්වැසි**– ග්‍රාමීණයෝ (පිටිසරයෝ) වනාහි අනුන් සිත් ගන්නා මිහිරි වචන කීමෙහි අසමර්ථයෝ යැ. මේ ශිෂ්ටචාරිත්‍රය නාගරිකයනට නම් ඉතා පුරුදු යැ. එ හෙයින්, ලොකනාථාව මධුර වචන කීමෙහි නාගරික බව හෙවත් දක්ෂ බව හැඟැවීමට "මිහිරි තෙපලැ නන්වැසි" යනු කී හ. මෙහි 'නන්' යනු සංස්කෘත 'ස්ථාන' යනු හා සම්බන්ධ යැ. සංස්කෘතයෙහි 'ස්ථාන' යනු නගරාර්ථයෙහි ද වැටේ. 'නන්වැසි' යන තන්හි වූ 'නන්' යනු ද නගරාර්ථය දෙයි. එ හෙයින් 'නන්වැසි' යනු 'ස්ථාන වාසී' හෙවත් 'නාගරික' යන අර්ථ ඇත්තේ යැ.

2. **කිවි සාම නම් පුරුදු**– 'කිවි සාම නම් ගද්‍යපද්‍යබන්ධනාදිය යි.

3. **ලෙලකුඩය**- 'ලොකනාථා' යනු දෙමළ බසට පෙරළුනු කලැ මේ එයින් ලැබෙන නම යි.

**විපසණ**:- (102)

**1. දි ත් රුපු කිරුළු මල් දම් සුවඳ මී වෑ ස**
**තෙත් සිරි පා යුත් සුරිඳුනි තිලෝ ඇ ස**

දිතිය ගේ පුත්‍ර වන හෙයින් අසුරයෝ දෛත්‍ය නම් වෙති. මේ දෛත්‍ය සමූහයට සතුරු වන හෙයින් දෙවියනට 'දිත් රුපු' (දෛත්‍ය ශත්‍රු) යන්නු නම් වේ. දෙවියන් විභීෂණ දිව්‍යරාජයා ගේ සිරිපා වැඳීමට හිස බිමැ තුබූ කල්හි, හිසෙහි පැලැඳි කිරීටයෙහි වූ මල් දම් වලැ සුවඳවත් මල් පැණි සිරිපා පිටැ වැවේ. එයින් සිරිපා තෙත් වෙයි. මෙයින් දෙවියන් මහත් ගෞරවයෙන් හිස බිමැ තබා විභීෂණ දෙවයා ගේ ශ්‍රීපාදයන් වඳනා බව සූචිත යි.

'තිලෝ ඇස' යනුයෙන් විභීෂණ දෙවයා ස්වර්ගමර්ත්‍යපාතාල යන ලොක ත්‍රයයට නෙත්‍රයක් මෙන් ප්‍රිය බව ද, ඔහු කරණ කොටැ ගෙනැ, තුන් ලෝ වැස්සන් ඇසෙකින් මෙන් වැඩ අවැඩ දක්නා බව ද හැඟැවිණ.

2. **පුත් රුවනක්**- මෙහි 'රුවන්' (රත්න) ශබ්දය ශ්‍රෙෂ්ඨාර්ථයෙහි වැටේ. ඒ ඒ වර්ගයෙහි ශ්‍රෙෂ්ඨ වූයේ රත්න නම්. හස්ති රත්න, අශ්ව රත්න රාජ රත්න යනාදි තන්හි දු 'රත්න' ශබ්දය මේ අරුත්හි යෙදිණ.

මෙසේ "**ලොකනාථාවට** පුතකු දුන මැනැවැ"යි ආරාධනා කොටැ, පූර්වයෙහි දු බිසොවකට දුන් පුතකු ගැනැ සිහිපත් කර වන්නාහු "**බිසොවට පළමු රත්නාවලි නම්**" යනාදිය කියත්.

**103. බිසොව ම පළමු රත්නාවලි නම් සොඳු රු**
**ස හ තු ම දෙවූ හිමි දිවැසින් කුලුණු පි රු**
**මෙ ලක ම ඉසුරු වී පැරැකුම රජ කුම රු**
**පළ කොම කිමෙකැ ඔබ සොඳ තෙද බල මහ රු**

පළමු රත්නාවලි නම් සොඳුරු බිසොවට හිමි කුලුණු පිරු දිව ඇසින් සහතුම දෙවූ පැරැකුම් රජ කුමරු මෙ ලකට ඉසුරු වී. ඔබ සොඳ මහරු තෙද බල පළ කොටැ කිමෙකැ?

**පළමු**- පූර්ව කාලයෙහි, **රත්නාවලි නම්**- රත්නාවලී නම් වූ, **සොඳුරු**- සුන්දර වූ, **බිසොවට**- රජ මෙහෙසියට, **හිමි**- ස්වාමිහු විසින්, **කුලුණු පිරු**- කරුණාපූර්ණ වූ, **දිව ඇසින්**- දිව්‍ය චක්ෂුසින්, **සහතුම**- සන්තොෂසහිත වැ, **දෙවූ**- ප්‍රදානය කරවන ලද්දා වූ, **පැරැකුම් රජ කුමරු**-පරාක්‍රම රාජ කුමාර තෙම, **මෙ ලකට**- මේ ලංකාවට, **ඉසුරු වී**- ඊශ්වර (අධිපති) වූයේ යැ. (එසේ හෙයින්) **ඔබ**- තුඹ වහන්සේ ගේ, **සොඳ**- යහපත් වූ, **මහරු**- මහාර්ඝ වූ, **තෙද බල**- තෙජෝබලය, **පළ කොටැ**-ප්‍රකාශ කොටැ, **කිමෙකැ?**- කවර අර්ථයෙක් ද?

පෙර රතනාවලී නම් වූ යසපත් බිසොවට සවාමීන් වහන්සේ විසින්, කරුණායෙන් පිරුණු දිව්‍යනෙත්‍රයෙන් (බලා) සන්තොෂ සහිත වැ දෙවා වදාරන ලද්ද වූ, පරාක්‍රම රාජ කුමාර තෙම, මේ ලඞකාවට අධිපති වූයේ යැ. (එ හෙයින්) ඔබ වහන්සේ ගේ, මනොඥ වූ මහාහී වූ තෙජෙබලය (තව තවත්) ප්‍රකාශ කොටැ (වන අර්ථය) කිමෙක් ද? "ඔබ වහන්සේ ගේ තෙජෙබලය ප්‍රකාශ වීමට එ පමණෙක් මැ ඇතැ; තවත් වර්ණනා කිරීම නුවුවමනා යැ" යි යුු සේ යි.

**විසඳුම්:-**

1. **බිසොවට පළමු රත්නාවලි නම් සොඳුරු-** මහාවිජය බාහු රජහු ගේ දූ වූ මේ රතනාවලී තොමෝ රුහුණෙහි රජය කළ මානාභරණ රජු ගේ බිසෝ යැ. මැය ගේ පින් පරාක්‍රමබාහු කුමාරයා මහාපරාක්‍රමබාහු නමින් 'මෙ ලකට ඉසුරු' වූ පරිදි ඉතිහාසයෙන් දන්නේ යැ.

104. එ සෙයින් දසමන් මහනෙල් කුසුම් ගෙ **නා**
පු ද මි න් එ සුර වර සිරි සරණ වඳිමි **නා**
බු හු ම න් කරන රජ දූ සඳුම මෙ කිය **නා**
දු න පි න් සමග යස සිරි වඩි පුත් රුව **නා**

එ සෙයින් දසමන් මහනෙල් කුසුම් ගෙනැ පුදමින්, එ සුර වර සිරි සරණ වඳිමින බුහුමන් කරන, මෙ කියන රජ දූ සඳුම, පුත් රුවන දුන, පින් සමග යස සිරි වඩී.

**එ සෙයින්-** ඒ (රතනාවලී බිසොව කළ) පරිද්දෙන්, **දසමන් මහනෙල් කුසුම් ගෙනැ-** ජාතිසුමන උත්පල පුෂ්පයන් ඇරැ ගෙනැ, **පුදමින්-**පූජා කෙරෙමින්, **එ සුර වර-**ඒ දෙවොත්තමයා ගේ, **සිරි සරණ-** ශ්‍රී චරණයට හෙවත් ශ්‍රීපාදයට, **වඳිමින-** නමස්කාර කෙරෙමින්, **බුහුමන් කරන-** බහුමාන කරන්නා වූ, **මෙ කියන-** මේ යථොක්ත වූ, **රජ දූ සඳුම-**රාජදුහිතෘචන්ද්‍රිකාවට, **පුත් රුවන-** පුත්‍ර රත්නය, **දුන-** ප්‍රදානය කළ හොත්, **පින් සමග-** පුණ්‍යය හා එක් වැ, **යස සිරි-** කීර්ති ශ්‍රිය, **වඩී-** වර්ධනය වන්නේ යැ.

ඒ (රතනාවලී බිසොව) මෙන්, දැසමන් මානෙල් මල් ඇරැ ගෙනැ පූජා කෙරෙමින්, (රතනාවලී බිසොවට පුත්‍රයකු දුන්නා වූ) ඒ දිව්‍යොත්තමයා ගේ ශ්‍රී පාදය වඳිමින් මහත් ගෞරව කරන්නා වූ, මේ කියනු ලබන්නා වූ උතුම් රජ දුවට, (මේ යදිනු ලබන) පුත්‍ර රත්නය දුන හොත්, පින් සමග කීර්තිශොභාව ද වැඩෙයි.

"පෙරැ රතනාවලී බිසොව දැසමන් මහනෙල් මල් ගෙනැ පුදමින් විභීෂණ දෙවොත්තමයා වූ ඔබ ගේ ශ්‍රීපාදය වඳිමින් බුහු මන් කොටැ, සකලශ්‍රීලඞකාද්වීපය එකච්ඡත්‍ර කළා වූ පරාක්‍රමබාහු

නම් පුත්‍රරත්නය ලදුව; මේ ලෝකනාථාව ද, රත්නාවලී බිසොව මෙන් මැ, දූසමන් මහනෙල් මල් ගෙනැ පුදමින්. එබඳු පුත්‍ර රත්නයක් දුන් ඒ දෙවෝත්තමයා ගේ මැ ශ්‍රීපාදය වඳිමින්, බුහුමන් කෙරෙයි; දූන් මෙසේ කරන්නිය රත්නාවලිය නුවූව ද ඒ සමාන මැ යැ; ගන්නා මලුත් එක මැ යැ; පූජාවත් එක මැ යැ; වැඳැ යදිනු ලබන දෙවෝත්තමයාත් ඔබ මැ යැ; බහුමානයත් එක මැ යැ; එ හෙයින් එ කලැ දුන්නාක් මෙන් මැ, මෙ කලැ ද, මේ යදිනු ලබන පුත්‍ර රත්නය දුන මැනැවැ; එසේ කළ හොත් ඔබට පිනුත් සිදු වෙයි; ඔබ ගේ කිතියත් වැඩෙයි" යනු මේ කී පරිදි යි.

**විශේෂ:-**

1. **ඒ සුර වර**- ඒ රත්නාවලී බිසොව විසින් වැඳැ පුද යාචඤා කරනු ලැබූ දෙවෝත්තමයා, එ නම් ඔබ වහන්සේ.

2. **පින් සමඟ යස සිරි වඩි**- අභිලාෂ දානයෙන් දානමයපුණ්‍යය සිද්ධ වෙයි. එ තරම් ලෝකාර්ථයක් කළ කලැ, "මේ දෙවියෝ මෙබන්දක් කළහ" යන කීර්ති ඝෝෂය ද පැතිරෙයි.

'**වඩි**' යනු ඡන්දස රැකෙන පිණිස 'වඩී' යන්නෙහි අන්ත්‍යස්වරය හ්‍රස්ව කිරීමෙන් සිද්ධ යැ.

3. **පුත් රුවන**- වරක් යැදි හෙයින් 'පුත් රුවනක්' යි අනියමින් නො කියා, මෙසේ නියමින් කියන ලද. මේ නම්, 102 වන පද්‍යයෙහි කී ලකුණින් අනූන වූ පුත්‍රරත්නය යි.

ප්‍රියාව හා පුත්‍රයා විසින් ආරාධනය කැරුණු කලැ බරවූ ද කටයුතු කරනු ලෝකචාරිත්‍ර යි. එ හෙයින් විභීෂණදෙවයා ගේ බිසෝ දෙවියන් ලවා ද, දෙව් රජුට මේ ප්‍රවෘත්තිය කියවනු කැමැත්තාහු "මෙ හසුන්" යනාදිය කියත්.

105. මෙ හසුන් සුරිඳු හට සැල කැරැ මෙ ලෙසා
වඳිමින් බැතින් පැදකුණු කොටැ තො ලෙසා
දකිමින් බිසෝ දෙවියන් නො වැ ල ලෙසා
කියමින් යදින් සකි සඳ මෙ මැ ලෙ ලෙසා

මෙ හසුන් සුරිඳු හට මෙසේ(යා) සැල කැරැ, බැතින් වඳිමින් තොසේ(යා) පැදකුණු කොටැ, ලසේ(යා) නො වැ බිසෝ දෙවියන් දකිමින්, මෙ මැ ලෙසේ(යා) කියමින්, සකි සඳ, යදින්.

**මෙ හසුන්**-මේ සන්දේශය, **සුරිඳු හට**-සුරේන්ද්‍රයා හට, **මෙසේ යා**- මෙ පරිද්දෙන්, **සැල කැරැ**- විඥාපනය කොටැ හෙවත් දන්වා, **බැතින්**- භක්තියෙන් යුක්ත වැ, **වඳිමින්**- නමස්කාර කෙරෙමින්, **තොසේ යා**- සන්තොෂයෙන් යුක්ත වැ, **පැදකුණු කොටැ**- ප්‍රදක්ෂිණා කොටැ, **ලසේ යා නො වැ**- ඒ ස්ථානයෙහි

ප්‍රමාද නො වී, **බිසෝ දෙවියන්**-(ඒ සුරරජුයා ගේ) මහිෂී වූ දෙවතාවන්, **දකිමින්**- දර්‍ශනය කෙරෙමින්, **මෙ මැ ලෙසේයා**- මේ පරිද්දෙන් මැ, **කියමින්**- කථනය කෙරෙමින්, **සකි සඳ**- මිත්‍ර චන්ද්‍රය හෙවත් මිත්‍රොත්තමය, **සදින්**- යාවඤා කරන්.

මේ සන්දේශය දිව්‍යරජයාට මෙසේ දන්වා, භක්තියෙන් වඳිමින් සන්තොෂයෙන් ප්‍රදක්ෂිණා කොට, (එහි) පමා නො වී, බිසෝ දෙවියන් දැක, මේ ආකාරයෙන් මැ කියමින්, උතුම් මිත්‍රය, යාවඤා කරන්.

**විසඳුම්:-**

1. **පැදකුණු කොටැ**- පිදියැ යුතු දෙසට දකුණත හැරී සිටිනසේ වටා යෑම 'පැදකුණු කිරීම' නමි,

2. **මෙ මැ ලෙසේ යා**- විශිෂ්ණ දිව්‍යරජයාට කී පරිද්දෙන් මැ,

106. පැහැපත් පුන් සඳෙ'ව කිරි සමුදුරැ පල ට
සිය ගොත් බබලවන දෙව් රජ කුමර හ ට
නැවැතැත් එකලා වැ අවසර ලැබුණු වි ට
මෙ පවත් කියව සැල කරනුව සුර රදු ට

කිරි සමුදුරැ පලව පැහැ පත් පුන් සඳ එව්, සිය ගොත් බබලවන දෙව් රජ කුමර හට, නැවැතැත් එකලං වැ අවසර ලැබුණු විටැ, මෙ පවත්, සුර රදුට සැල කරනුව, කියව.

**කිරි සමුදුරැ**- ක්ෂීරසාගරයෙහි, **පලට**- ප්‍රකට වූ, **පැහැපත්**- ප්‍රභාප්‍රාප්ත වූ, **පුන් සඳ එව්**-පූර්ණ චන්ද්‍රයා මෙන්, **සිය ගොත්**- ස්වකීය ගොත්‍රය, **බබලවන**-දීප්තිමත් කරවන්නා වූ, **දෙව් රජ කුමර හට**-දෙවරජ කුමාරයාණන් හට, **නැවැතැත්**-යළි දු, **එකලා වැ**- තනි වැ, **අවසර ලැබුණු විටැ**- ප්‍රස්තාවය ඇති කාලයෙහි, **මෙ පවත්**- මේ ප්‍රවෘත්තිය, **සුර රදුට**-සුර රජයා හට, **සැල කරනුව**- විඥාපනය කරනු සඳහා, **කියව**- කථනය කරව.

කිරි මුහුදෙහි ප්‍රකාශ වූ ප්‍රභාසම්පන්න වූ පූර්ණ චන්ද්‍රයා මෙන්, ස්වකීය (පෞලස්ත්‍ය) ගොත්‍රය බබලවන්නා වූ දිව්‍යරාජකුමාරයා හට, යළිත්, තනි වැ අවසර ලැබුණු කලැ, මේ ප්‍රවෘත්තිය, දිව්‍යරාජයාට දන්වනු පිණිස, කියව.

**විසඳුම්:-**

1. පැහැපත් පුන් සඳෙව් කිරි සමුදුරැ පල ට
සිය ගොත් බබලවන දෙව් රජ කුමර හ ට

කිරි මුහුද ඉතා සුදු යැ. එයින් මැ උපන් චන්ද්‍රයා සම්පූර්ණ වැ පහළ වූ කල්හි, ඒ කිරි මුහුද අතිශයින් ශොභාසම්පන්න වෙයි; එමෙන් මැ ප්‍රසිද්ධ

වූ ද මේ දිව්‍යරාජයා ගේ ගොත්‍රය, දිව්‍යරාජකුමාරයා කරණ කොටැ ගෙනැ, එබා ලා ප්‍රසිද්ධියට පැමිණෙයි.

2. නෑවෑනෑත්- නැවැනැ + ද = නැවැනැ + දි- නැවැනෑත්.

3. කරනුව- මේ අපරක්‍රියා නිපාත යි. 'නුව' ප්‍රත්‍යය යි.

## (13) ආශීර්වාදය.

අවසානයෙහි දු සන්දේශ හාරකයාට ආශීර්වාද කරන්නාහු "මේ සියලුම අදහස" යනාදිය කියත්:—

107\. මේ සිය ලු මෑ අදහස කුලුණින් ගිහි ණී
සේ සිය පත සලසා උදයෑ දින ණී
නෑ සිය ඉවු මිතුරෑ සමඟින් සෑල ළිහි ණී
වා සිය පවතු සිතු ලෙස සෑපතින් පෑමි ණී

මේ සියලු මෑ අදහස, ගිහිණි කුලුණින්, දිනමිණි උදයෑ සියපත සේ සලසා, සෑල ළිහිණී, නෑ සිය ඉවු මිතුරෑ සමඟින්, සිතු ලෙස පෑමිණි සෑප තින්, වා සිය පවතු.

**මේ**- උක්තප්‍රකාර වූ, **සියලු මෑ අදහස**-සකල අධ්‍යාශයය මෑ, **ගිහිණි**- ගහන වූ, **කුලුණින්**- කරුණායෙන්, **දිනමිණි**- දින මණිහු ගේ හෙවත් සූර්යා ගේ, **උදයෑ**- උදයයෙහි (ප්‍රාතඃ කාලයෙහි), **සියපත සේ**- ශතපත්‍රයක් හෙවත් පද්මයක් මෙන්, **සලසා**- සංසිද්ධියට පමුණුවා, **සෑල ළිහිණි**- එම්බා ශාරිකා පක්ෂිය, **නෑ සිය ඉවු මිතුරෑ සමඟින්**- ඥාතීන් ද ස්වකීයයන් ද, ඉෂ්ටමිත්‍රයන් ද හා එක් වැ, **සිතු ලෙස**- සිත් වූ පරිද්දෙන්, **පෑමිණි**- ප්‍රාප්ත වූ, **සෑපතින්**- සම්පත්තීන්, **වා සිය**- වර්ෂ ශතයක්, **පවතු**- ජීවත් වව.

මේ සියලු මෑ අදහස, මහත් වූ කරුණායෙන්, සූර්යෝදයයෙහි පියුමක් මෙන් සලසා, සෑල ළිහිණිය නෑදෑ ඉටු මිතුරන් හා එක් වැ, සිත් වූ පරිදි ලැබුණා වූ සම්පත්තියෙන් (යුක්ත වැ), හවුරුදු සියයක් ජීවත් වව.

**විපසණි**:-

1\. මේ සිය ලු මෑ අදහස කුලුණින් ගිහි ණි
සේ සිය පත සලසා උදයෑ දිනමි ණී

නැතුවණා වූ ද පියුම සූර්යෝදයයෙහි විකිදී ප්‍රබොධයට පැමිණෙයි, එමෙන් සඞ්ක්ෂිප්ත කොටැ කියැවුණා වූ ද සන්දේශය දක්ෂ වූ දූතයා ගෙන් ඉතා විස්තර ලෙස කියැවෙයි. එ හෙයින් "සැකෙවින් කියන ලද්දූ වූ ද මේ අදහස උදයෑ පියුමක් මෙන්, විකාසභාවයට පමුණුවා, හෙවත් සම්පූර්ණ ලෙස විස්තර කොටැ, අර්ථ සිද්ධිය වන ලෙස සලස්ව" යි මේ කී සැටි යි. පුරාණ සන්න යෙහි දු— "යම් සේ හිරු උදා වූ පමණින්, ඒ හිරුහු ගේ අනන්‍ය ප්‍රයෝගයක්

නැති වැ, පද්‍ම හෙම පත්‍රවිකාසනාදි කාර්යයෙන් යුක්ත වැ ප්‍රබුද්ධ වේ ද, එසේ මැ මෙහි කීවා වූ වචන සඞ්ක්‍ෂේප වුව ද, විස්තර වශයෙන් ප්‍රකාශමාන රූප කොටැ, තමා ගේ ස්වාභාවික ප්‍රඥායෙන් අනුක්‍රම කාර්ය ද විස්තර පරීක්‍ෂා කිරීමෙන් නිෂ්පන්නියට පමුණුවා" යනු කියන ලද.

'දිනමිණි' නම් සූර්යයා යැ. දිනට හෙවත් දවසට රත්න වන හෙයින් හේ 'දිනමිණි' නම් වේ.

2. **නෑ සිය**- "ඥාති ජනයා හා සවකීය පරිවාර ජනයා හා" යනු පුරාතන ව්‍යාඛ්‍යාන යි. ඥාතීහු ද සවකීයයෝ මැ යැ. මෙහි 'නෑ' යන්නෙන් ඥාතීන් කියැවුණෙන්, 'සිය' යන්නෙන් ඉතිරි සවකීයයෝ ගැනෙති. "'නෑ' යනු ද 'සිය' යනු ද එකාර්ථ යැ; මෙසේ එකාර්ථවත් වචන එක් කොටැ යෙදීම සිංහල සිරිතෙකැ" යන මතයෙක් ද වෙයි.

---

## පුරාණ ව්‍යාඛ්‍යාවසානයෙහි පෙනෙන කවි තුනෙහි පදවි:-

පැරකුම් රජුට පන්තිස් වන නවම් ම ස
මනරම් කැර බඳුනු මෙ හසුන් නො වී ල ස
අයැදුම් ලෙසට සිදු කැර කිවිඳු අදහ ස
දෙවි රම් මිතුරු දිනි ගබ බිසොවට සක ස

පැරකුම් රජුට- පරාක්‍රමබාහු නරේන්ද්‍රයා හට, පන්තිස් වන- පඤ්චත්‍රිංශ වර්ෂයෙහි, නවම් මස- මාඝ මාසයෙහි, මෙ හසුන්- මේ සන්දේශය, මනරම් කැර- මනෝරම්‍ය කොටැ, බඳුනු- බන්ධනය කරන් මැ, රම් මිතුරු- රම්‍යමිත්‍ර වූ, දෙවි- දෙව තෙමේ, කිවිඳු- කවීන්ද්‍රයා ගේ, අදහස- අධ්‍යාශයය, අයැදුම් ලෙසට- ආයාචනය වූ පරිද්දෙන්, ලස නො වී- අප්‍රමාද වැ, සිදු කැර- සිද්ධ කොටැ, සකස- මනා කොටැ, බිසොවට- ලෝකනාථා දෙවියට, ගබ- ගර්භය, දිනි- දුන්නේ යි.

---

ස තිස් වන නවමැ පුර අස්ලිස නක ත
ප හස් ලැබැ සුපුන් සඳ සුබ'තුරු පෙනෙ ත
ස හස් කර කුලට වැඩ වන ලෙස සත ත
වෙසෙස් රජ කුමර විලසින් දූකුම් ප ත

සතිස් වන- ෂට්ත්‍රිංශ වර්ෂයෙහි, නවමැ- මාඝ මාසයෙහි, අස්ලිස නකත- අශ්ලේෂා නක්‍ෂත්‍රයා ගේ, පහස් ලැබැ- ස්පර්ශය ලබා, සුපුන් සඳ- සම්පූර්ණ චන්ද්‍රයා, සුබ අතුර- නාභෝමධ්‍යයෙහි, පෙනෙන- දෘශ්‍යමාන වන් මැ, සහස්කර කුලට- සහස්‍රකිරණයා ගේ කුලයට හෙවත් සූර්යවංශයට, සතත- නිරන්තරයෙන්, වැඩ වන ලෙස- අභිවෘද්ධි වන පරිද්දෙන්, වෙසෙස්- විශිෂ්ට වූ, රජ කුමර- රාජකුමාර තෙම, විලසින්- (දෙහ) විලාසයෙන්, දූකුම් පත- දර්ශන ප්‍රාප්ත වී හෙවත් මවු කුසින් බිහි වී,

3. සිතු ලෙස සැපතින් පැමිණ- "සිය් වූ පරිදි සම්පත් ලැබ" යනු මෙයින් ගත යුතු අර්ථය යි.

## සැල ළිහිණි විවරණය නිමි.

---

මා හෘදයාස ඉත්‍යස්‍ය කාව්‍යස්‍යාර්ථාවබොධනෙ
ශිෂ්‍යාණාං මුනිදසො'ද්දෙතද්විවරණං මුදා

---

කඳවුරු කුල මැඳුරැ මිණි පහනෙ'ව් සුසැ දී
නැණ ගුරු සබස සමය ද දනුමෙත් වොරැ දී
රජ ගුරු විජයබා පිරුවත් හිමි පැහැ දී
මෙ මියුරු පදැති සැල ළිහිණිය අස්න යෙදී

- කඳවුරු කුල මැඳුරැ- සකාඛාචාර වංශ නමැති මන්දිරයෙහි, සුසැදි- සුසජ්ජිත වූ, මිණි පහන් එව්- මණි ප්‍රදීපයක් බඳු වූ, නැණ, ඥානයෙන්, ගුරු- වාචස්පතිහු (වැනි) වූ; ස බස- ෂඩ්භාෂාවන් හා, සමය ද- ස්වසමය පරසමයයන් ද, දනුමෙත්- පරිඥානයෙන්, වොරැදි- විරාජමාන වූ, රජ ගුරු- රාජ ගුරු වූ, විජයබා පිරුවත් හිමි- විජයබාහු විහාරාධිපති ස්වාමි තෙම, පැහැදී- ප්‍රසන්න වැ, මියුරු පද ඇති- මධුර වූ පද්‍යයන් ගෙන් යුක්ත වූ, සැල ළිහිණිය අස්න- ශාරිකා සන්දෙශය, යෙදී- රචනය කෙළේ යි.